# කෝ අපේ අසල්වැසියෝ?

## අළුත්ගම කෝලාහලය සහ එහි විපාක

### අළුත්ගම, දර්ගා නගරය, වැලිපැන්න හා බේරුවල සිද්ධි අධ්‍යයන චාරිකාවේ වාර්තාව

**නීතිය හා සමාජ භාරය විසින් දරන ලද ප්‍රයත්නයකි**

**පර්යේෂණ කණ්ඩායම:**

ෆර්සානා හනීෆා, හරිනි අමරසූරිය, විශාඛා විජේනායක, ගිහාන් ගුණතිලක

© **නීතිය හා සමාජ භාරය, 2015**

මෙම ලේඛනය හා එහි ප්‍රකාශක නියමාකාරයෙන් හඳුන්වා දීමෙන් අනතුරුව වාණිජ්‍යය නොවන පරමාර්ථයන් සඳහා පමණක් මෙම වාර්තාවේ අන්තර්ගතය හෝ එහි කොටස් උපුටා ගැනීම හා පිටපත් කිරීමට සිදු කිරීමට අවසර ඇත.

ISBN 978-955-1302-68-9

**කවරයේ ඡායාරූපය:**

ත්‍යාගි රුවන්පතිරණ,

ග්‍රවුන්ඩ්විව් හී පළවූ පරිදි

**සිංහල පරිවර්තනය:**

හර්ෂණී කෝනල්

**ප්‍රකාශක:**

නීතිය හා සමාජ භාරය,

3, කින්සි ටෙරසය,

කොළඹ 00800,

ශ්‍රී ලංකාව

දුරකථනය: +94 (0) 11 268 48 45

ෆැක්ස්: +94 (0) 11 2686843

වෙබ්: www.lawandsocietytrust.org

# ස්තුතිය

*කෝ අපේ අසල්වැසියෝ?* යනු 2014 ජුනි මාසයේදී අළුත්ගම, දර්ගා නගරය, වැලිපැන්න සහ බේරුවල ප්‍රදේශවල කලහකාරී පිරිස් විසින් මුස්ලිම් ප්‍රජාව වෙත කරන ලද පහර දීම් අලළා නීතිය හා සමාජ භාරය විසින් සම්පාදනය කරන ලද පර්යේෂණාත්මක වාර්තාවකි.

පර්යේෂණ කණ්ඩායම ගිනිගත් වෙළෙඳසැල් සහ නිවෙස් කරා සංචාරය කළ අවස්ථාවේදී, පරම්පරා ගණනාවක් එකිනෙකට සමීපව ජීවත් වූ දෙපාර්ශ්වයේම සාමකාමී ජනතාව සිය කණගාටුව මෙන්ම සිදු වූ දෙය තේරුම් ගත නොහැකි බව ප්‍රකාශ කළහ. පුද්ගලයන් කිහිප දෙනෙක්ම පැවසුවේ ඔවුන්ට තම අසල්වැසියන් දෙස බැලීමට හෝ "අනෙක් අය" සමඟින් ඇසට ඇස ගැටීමට ඉඩ හැරීමට හෝ නොහැකි බවයි.

මෙම වාර්තාවෙන් ඔවුන්ගේ කථා සහ ඔවුන් දුටු සහ අත් විඳි කරුණු පිළිබඳව වාර්තා කරනු ලබයි. පර්යේෂණය දියත් කළ කණ්ඩායම මෙහෙයවනු ලැබූයේ ආචාර්ය ෆර්සානා හනීෆා (කොළඹ විශ්වවිද්‍යාලයේ මානවවිද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය), ආචාර්ය හරිනි අමරසූරිය (විවෘත විශ්වවිද්‍යාලයේ මානවවිද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය) සහ විශාඛා විජේනායක (යාපනය විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ සහකාර කථිකාචාර්ය) යන අය විසිනි. කණ්ඩායම විසින් දෙවරක් ප්‍රදේශයට සිදු කරන ලද ගමන් වලදී රාජ්‍ය නිළධාරීන් සහ ප්‍රජා මූලිකයන් සමඟ කථා කළ අතර, එහිදී පාර්ලිමේන්තුවෙන් ඇතුළත හා පිටත දේශපාලන නායකයන් විසින් කරන ලද ප්‍රකාශයන් රැස් කරන ලදී. ගිහාන් ගුණතිලක (නීතිඥ සහ වෙරිටේ පර්යේෂණ ආයතනයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂක) විසින් මෙම වාර්තාවේ කෙටුම්පත කියවා වැදගත් අදහස් හා යෝජනා ලබාදුන් අතර, දිල්හාරා පතිරණ විසින් ප්‍රකාශන සංස්කරණය සඳහා අවශ්‍ය සහාය සපයන ලදී. අප සැම අත්දුටු බලාපොරොත්තු විරහිතභාවය මැනවින් ග්‍රහණය කරගත්, ත්‍යාගි රුවන්පතිරණ විසින් ඡායාරූවට නගන ලදුව ග්‍රවුන්ඩ් ව්‍යුහි පළ වූ ඡායාරූපයක් යොදා ගනිමින් හර්ෂණී කෝනල් විසින් පිටකවරය සකසන ලදී.

නීතිය හා සමාජ භාරය මෙවැනි "භයානක" කටයුත්තක නිරත වූයේ ඇයි දැයි බොහෝ දෙනෙක් අපගෙන් විමසූහ. මෙයට අපගේ පිළිතුර වනුයේ, නීතියේ ආධිපත්‍යය, සමාජ සාධාරණත්වය සහ මානව හිමිකම්

වෙනුවෙන් කැප වී සිටින සංවිධානයක් වශයෙන් නිහඬව බලා සිටීම අපට කළ නොහැක්කක් බවයි. එම ප්‍රජාවන් අතර පැතිරී පැවතුණ බිය කෙතරම්දයත්, කලහකාරී පිරිස් පහර දුන් ප්‍රදේශවලින් බොහෝ දුරස්ව සිටි අය පවා අප වෙත අදහස් ප්‍රකාශ කළේ සැකමුසුවය. මෙම වාර්තාව ප්‍රසිද්ධියට පත් කිරීම, මීට සමගාමීව දියත් වූ මෙවන් අනෙක් පර්යේෂණ වාර්තාවන් ද මුදා හැරීමට හේතුවනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

සිද්ධිය සිදු වූ වහාම සිය මිතුරන්ගේ සහ පවුලේ සාමාජිකයන්ගේ අනතුරු ඇඟවීම් පිළිබඳව ද නොතකා, තම පෞද්ගලික ආරක්ෂාව පිළිබඳව හෝ නොතකා විපතට පත් වූ ප්‍රජාව වෙත ගොස් ගැටළුව පිළිබඳව සොයා බැලීමට කැපවූ පර්යේෂණ කණ්ඩායම වෙත මාගේ කෘතඥපූර්වක ස්තුතිය පුද කර සිටිමි. තවද පහර දීම් නිමවූ වහාම සම්මුඛ සාකච්ඡාවලට පැමිණීමට එකඟ වූ සියලුම දෙනාට මෙන්ම නිළධාරීවාදය තුළ සිය පැවැත්මට තර්ජන එල්ල විය හැකිව තිබියදීත් අලාභ හානි පිළිබඳ නිල දත්ත වාර්තා සැපයූ රාජ්‍ය නිළධාරීන්හට මාගේ කෘතඥතාව තවදුරටත් පළ කර සිටිමි.

විපතට පත් වූ පුද්ගලයින් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීමට පහසුකම් සලසමින් නීතිය හා සමාජ භාරයේ කණ්ඩායමට අධ්‍යයනය කිරීමට ලැබුණු වීඩියෝගත කළ සම්මුඛ සාකච්ඡා දත්ත, සිදුවීමෙන් අනතුරුව පටිගත කල යම් අවස්ථා යනාදිය ලබා ගැනීමට සහය දැක් වූ යහපාලනය සඳහා වන ජාතික පෙරමුණේ සාමාජිකයන්හට මාගේ කෘතඥතාව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. මෙම සිද්ධීන් සමග බැඳුණු පුළුල් පසුබිම සහ සංවේදී බැඳීම් පිළිබඳ නජා මොහොමඩ් මහතාගේ තිබූ අවබෝධය, මෙම අධ්‍යයනයෙන් සාක්ෂාත් කරගැනීමට බලාපොරොත්තු වූ ගැඹුරු අරුත් ළඟා කරගැනීමට දායකත්වයක් සැලසී ය. මෙවන් සිදුවීම් නැවත සිදු නොවීමට වගබලා ගැනීමට ස්වයං අධ්‍යයනයේ සහ ආවර්ජනයෙහි යෙදිය හැකි ජනතාව උනන්දු කරවන්නාවූ පොදු කථිකාවක් ඇති කිරීමේ පරමාර්ථයෙන් මෙම වාර්තාව සිංහල බසට හා දමිළ බසට පරිවර්තනය කිරීමට අපි අපේක්ෂා කරමු.

මාලා ලියනගේ<br>
විධායක අධ්‍යක්ෂ,<br>
නීතිය හා සමාජ භාරය,<br>
කොළඹ, ශ්‍රී ලංකාව.<br>
2014 දෙසැම්බර්.

# පටුන

පිටුව

1 වන පරිච්ඡේදය
හැඳින්වීම 7
ක්‍රමවේදය 9
2 වන පරිච්ඡේදය
බොදු බල සේනාව 16
ශ්‍රී ලංකාවේ ඉතිහාස කතාව තුළ භික්ෂූන්ගේ භූමිකාව 16
බොදු බල සේනාව පිළිබඳ තොරතුරු 18
බොදු බල සේනාව හඬ අවදි කරයි 19
දේශපාලනඥයන් සමඟ බොදු බල සේනාවේ පවතින සම්බන්ධතාව 21
'හලාල් එපා' බොදු බල සේනාව කියයි 22
බොදු බල සේනාව සහ සාහසික අතපෙවීම් 24
2014 වර්ෂය සහ සිදුවන්නට යන දේවල් පිළිබඳ පෙරනිමිති 25
3 වන පරිච්ඡේදය
සිද්ධි මූලය 29
රැස්වීම 34
පෙරහැර 36
4 වන පරිච්ඡේදය
ප්‍රචණ්ඩත්වය : පීඩාවට පත්වූවන්ගේ සාක්ෂි 38
දර්ගා නගරයෙන් අසන්නට ලැබුණු කතා 40
සීනවත්ත 41
හමුදා පාර 47
පතිරාජගොඩ 51
අධිකාරීගොඩ 54
අළුත් පාර (ෆතා හජියර් මාවත) 61
මිහිරිපැන්න පාර 62
වැලිපිටිය 64
අළුත්ගම නගරය 68
වැලිපැන්න 71
බේරුවල 73
වෛද්‍යවරයාගේ කතාව 75

සිදුවීම් පිළිබඳ කතාවලින් කළ මූලික සොයා ගැනීම් සහ
ප්‍රදේශයේ නිරීක්ෂණ 78
සිතියම් I : කළුතර දිස්ත්‍රික්කයේ සිද්ධිය ඇති වූ ප්‍රදේශ 83
සිතියම II : දර්ගා නගරයේ සිද්ධිය ඇති වූ ප්‍රදේශ 83
5 වන පරිච්ඡේදය
සිද්ධියෙන් පසු තත්ත්වය 84
අළුත්ගම සිදුවීමට රජයේ ප්‍රතිචාරය 84
2014 ජුනි 15 වන දින දෙහිවල මුස්ලිම් පල්ලියේ රැස්වීම 84
ජුනි 16 වන දින කළුතර කච්චේරියේදී පැවති රැස්වීම 85
අළුත්ගම කෝලාහලය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ
නියෝජිතයන්ගේ නිල ප්‍රකාශ 86
අළුත්ගම සිද්ධිය සම්බන්ධයෙන් විපක්ෂය වන එක්සත්
ජාතික පක්ෂයේ ප්‍රතිචාරය 92
අළුත්ගම සිද්ධිය පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණ (ජ.වි.පෙ.)
දක්වන ලද ප්‍රතිචාර 96
දෙමළ ජාතික සන්ධානය 97
"අළුත්ගම පිළිබඳ 'සත්‍ය කතාව'" 97
බිම් මට්ටමේ කතා සමඟ සැසඳීම 100
සිද්ධිය සම්බන්ධයෙන් මුස්ලිම් පාර්ලිමේන්තු
මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිචාරය 104
සිද්ධිය සම්බන්ධයෙන් වන අනෙකුත් දේශීය හා
අන්තර්ජාතික ප්‍රකාශන 106
6 වන පරිච්ඡේදය
අළුත්ගම කෝලාහලය පිළිබඳ මාධ්‍යය ආවරණය 107
සාම්ප්‍රදායික මාධ්‍යය 107
සමාජ මාධ්‍යය 110
7 වන පරිච්ඡේදය
අළුත්ගම කෝලාහලයෙන් පසුඃ නීතිමය ප්‍රතිචාර 114
නිගමන සහ නිර්දේශ 117
නිගමන 117
නිර්දේශ 122
ඇමුණුම I 126
ඇමුණුම II 129

# 1 වන පරිච්ඡේදය

## හැඳින්වීම

යුද්ධයෙන් සාමයට පියනැගූ දුෂ්කර සංක්‍රාන්ති සමය තුළ, ශ්‍රී ලංකාවේ මැදුම් තලයේ සිදු වූ ඛේදනීය සංසිද්ධිය ලෙස මුස්ලිම් විරෝධී මනෝභාවයන් ඇතිවීම දැක්විය හැකිය. මුස්ලිම් ජනගහණයෙන් සියයට නවයක ප්‍රතිශතයක් රට පුරා කුඩා ප්‍රජාවන් වශයෙන් විසිරී ජීවත් වන අතර රටේ නැගෙනහිර, උතුරු මැද සහ බස්නාහිර පළාත්වලට එහිදී සැලකිය යුතු අවධානයක් යොමුව ඇත. යුද්ධයෙන් ශ්‍රී ලංකා රජයේ හමුදාව විසින් ලද යුධ ජයග්‍රහණයෙන් පසු, වැඩි සැලකිළි ලබන 'අනෙකුන්' යනු තවදුරටත් දෙමළ ජාතිකයින් පමණක්ම නොව මුස්ලිම්වරුන්ද ඊට අයත් වන බව සලකන සිංහල බෞද්ධ දේශාභිමානී කණ්ඩායම් කිහිපයක් මතු විය. 2011 අග භාගයේ පමණ පටන්, විවිධ කණ්ඩායම් විසින් යම්කිසි ක්‍රමානුකූල ආකාරයකට මුස්ලිම් විරෝධී ආකල්ප ව්‍යාප්ත කර ඇත. 2014 ජුනි සිදුවීම මෙම වෛරී මනෝභාවයන්ගේ වඩාත් ආසන්නතම, වඩාත් ප්‍රචණ්ඩ සහ පුළුල් ලෙස කතාබහට ලක් වූ සිදුවීමයි. අළුත්ගම සිදුවීමෙන් පසු නීතිය හා සමාජ භාරය විසින් යහපාලනය සඳහා වන ජාතික පෙරමුණේ සහභාගීත්වය ද ඇතිව මෙම වාර්තාව පිළියෙල කරන ලදී. අළුත්ගම ප්‍රදේශයේ සිදු වූ කරුණු මෙමගින් වාර්තා කෙරෙන අතර, ශ්‍රී ලංකාවේ වඩාත්ම කථා බහට ලක් වූ අඳුරුතම හෝරාවන් අතරින් එකකදී ප්‍රජාතන්ත්‍රවාදය හා බහුවිධතාවය සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී ලංකාවට ඇති විභවයට ප්‍රමුඛස්ථානය දෙන්නා වූ දෘෂ්ටි කෝණයක සිට මෙම වාර්තාව සකසා තිබේ. මෙම ප්‍රයත්නයට සම්බන්ධ වූ පර්යේෂකයන් තෝරාගනු ලැබූයේ බහුවිධතාවය හා ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධ ප්‍රශ්නවලට ඔවුන්ගේ ඇති ප්‍රත්‍යක්ෂ වූ බැඳීම මතය.

2014 ජුනි මාසයේදී ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශයේ නගර කිහිපයක් වන අළුත්ගම, දර්ගා නගරය, වැලිපැන්න සහ බේරුවල යන ප්‍රදේශවල මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා ව්‍යාප්ත වනු දක්නට ලැබුණි. පසුගිය

වසර දෙක මුළුල්ලේ බොදුබල සේනාව (බී.බී.එස්.) සහ එහි සමීපතමයන් විසින් අනලස්ව ඇති කරන ලද වෛරී මතවාදයන් මගින් මෙම කාලය මුළුල්ලේ වරින් වර රටපුරා මුස්ලිම් ප්‍රජාවන්ට විරුද්ධව ප්‍රචණ්ඩ ක්‍රියා ඇති කරන ලදී.[1] 2014 ජුනි 15 වන හා 16 වන දිනයන්හීදී ක්‍රමානුකූල හා සංවිධානාත්මක ආකාරයෙන් ගලා ආ ප්‍රචණ්ඩත්වයක් පරිද්දෙන් මෙම මතවාදය පුපුරා ගියේය. මෙයට මුල් වූ කරුණ ලෙස සලකනුයේ බෞද්ධ භික්ෂු නමක් හා භික්ෂුවට පහර දුන්නා යයි පවසන මුස්ලිම් තරුණයින් තිදෙනෙකු අතර ඇති වූ හබයයි. සිදුවීමෙන් පසු එයට පිළිතුර වශයෙන් පැවති විශාල මහජන රැස්වීමට මූලිකත්වය දැරුවේ බොදුබල සේනාවේ මහා ලේකම්, පූජ්‍ය ගලගොඩඅත්තේ ඥානසාර හිමියන්ය. එහිදී එහිමියන්ගේ බොහෝමයක් ප්‍රකාශ ජාතිවාදී හා ජනතාව කුපිත කරවන සුළු ඒවා විය.

15 වන දින සන්ධ්‍යාවේ ප්‍රදේශය මුළුල්ලේ පුරා පොලිස් ඇඳිරි නීතිය දැමීම සමගින් ඇරඹුණු මුස්ලිම් ජනතාවට එරෙහි ප්‍රචණ්ඩත්වය දින දෙකක් පුරා පැවතියේය. මෙම කාලය අතරතුර කොල්ලකෑමට හා ගිනි තැබීමට මෙන්ම විනාශය ලක් වූයේ මුස්ලිම් ජනතාවගේ සහ පතිරාජගොඩ, මිහිරිපැන්න සහ වැලිපැන්න විසූ ඇතැම් සිංහල ජනතාවගේ නිවෙස් හා ව්‍යාපාර පමණක් නොවන අතර, ඒ සමගම රටේ සිංහල හා මුස්ලිම් ප්‍රජාවන් අතර සම්බන්ධතාවය ද දැඩි ලෙස හානියට ලක් විය. නීතිය බලගැන්වීමේ ආයතන හා රජය සමගින් පොදුවේ එම ප්‍රදේශයේ මුස්ලිම් ජනතාවගේ වූ සම්බන්ධතාවය වෙනස් වූ අතර, මුස්ලිම්වරුන්ගේ ප්‍රතිරූපය විනාශයට ලක් විය. මෙම වාර්තාව තුළින් සිදුවීම හා බලපෑමට ලක් වූ ප්‍රජාවට ඉන් අත් වූ ඵලවිපාක පිළිබඳව වාර්තා කිරීමට වෑයම් කරයි. බහුතරයක් මුස්ලිම් ජනතාවගෙන් සමන්විත, එසේම සිංහල ජනතාව ද ඇතුළත් වූ ප්‍රජාවට සිදු කරන ලද සංවිධානාත්මක පහර දීමේ වර්තමාන සාක්ෂි සහ එම ප්‍රහාරයෙන් ඇති වූ විපාකවලට ප්‍රජාවන් දෙකම ගොදුරු වූ බව මෙම වාර්තාව තුළින් කතාබහට ලක් කරනු ලබයි. රජයේද විරුද්ධත්වයක් නොමැතිව බොදු බල සේනාව සහ එහි සහචරයන් විසින් ප්‍රචාරය කරන ලද, ජාතික මට්ටමේ වූ එක්තරා මුස්ලිම් විරෝධී න්‍යාය පත්‍රයක්

1 මුස්ලිම්වරුන් සඳහා වන මහලේකම් කාර්යාලය (Secretariat for Muslims (SFM)), 2013 සිට පැවති වෛරී මතවාදයන් පිළිබඳ ලේඛන.

සාක්ෂාත් කරගැනීමේ අරමුණින් මෙම ප්‍රහාර ව්‍යාප්ත කරන ලද බව අපගේ හැඟීමයි. අළුත්ගම සහ මෙම සිද්ධියෙන් බලපෑමට ලක් වූ අනෙකුත් ප්‍රදේශවල පදිංචි ජනතාව යනු තම න්‍යායපත්‍රය ඉදිරියට ගෙනයාමට එම කණ්ඩායම් යොදාගත් මෙවලම් පමණක් වේ.

ශ්‍රී ලංකාව යුද්ධයෙන් පසු අත්කරගත් සාමය රැක ගැනීමට මහත් වෙහෙසක් දරණ මෙවන් සමයක මේ ආකාර සිදුවීම් ඇතිවීම ඉතා කණගාටුදායකය. ක්ෂේත්‍ර චාරිකාවලින් ලද සාක්ෂි අනුව, මාධ්‍ය ආවරණ මෙන්ම දේශපාලනඥයන්ගේ හා සිවිල් සමාජයන්ගේ ප්‍රතිචාර තුළින් හැඟවෙන්නේ මෙය ලංකාව මුහුණ දුන් විශාල අර්බුදයක් බවයි. දර්ගා නගරයේ ප්‍රහාරය සම්බන්ධයෙන් රජය විසින් දිගින් දිගටම මුස්ලිම් ජනතාවට වරද පැටවීම මෙන්ම මෙම ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදු වූ ආකාරය පිළිබඳව වගකීම භාර ගැනීමට රජය ප්‍රතික්ෂේප කිරීම, ඇසින් දුටුවන්ගේ සාක්ෂි වලට අනුව නීතිය බලගැන්වීමේ ආයතන විසින් කලහකාරී පිරිස්වලට වියරුවෙන් හැසිරෙන්නට ඉඩ හැර ඔවුන්ට සහාය වීම (දුස්සහාය) යනාදිය රටේ අතීතයේ ඇති වූ කළු ජූලිය හෝ 1983 දෙමළ කෝලාහලය නැවත වරක් සිහිපත් කරවන තවත් සංවිධානාත්මක කැරැල්ලක් බඳුය.

සම්මුඛ සාකච්ඡාවට ලක් කරන ලද මුස්ලිම් සිවිල් සමාජ නියෝජිතයින් මෙම අළුත්ගම සිදුවීම අවසානයක් ලෙස නොදකින අතර, මෙය ආරම්භයක් ලෙස සලකන ඔවුහු මෙයටත් වඩා දරුණු ප්‍රචණ්ඩකාරී තත්ත්වයක් වුව ද ඇතිවිය හැකි යැයි අපේක්ෂා කරති.

## ක්‍රමවේදය

මෙම වාර්තාව, අළුත්ගම සිදුවීම සිදුවී අවසන් වූ වහාම එම ප්‍රදේශයට ගිය ඇතැම් මුස්ලිම් ක්‍රියාකාරීන්ගෙන් ලද සාක්ෂි එකතු සහ පර්යේෂණ කණ්ඩායම විසින් සාක්ෂි ලබාගැනීම සඳහා අළුත්ගම, බේරුවල සහ වැලිපැන්න ප්‍රදේශ වල සති තුනක් පුරා දියත් කළ (මුළු දවස පුරාම) ක්ෂේත්‍ර චාරිකා තුනක් මත පදනම්ව ඇත. මෙම තොරතුරුවල ඌනපූරණය කොළඹ අදාළ පරදු දරන්නන් සමගින් සිදුකළ සම්මුඛ සාකච්ඡා මඟින් සපයා දී ඇත. අවශ්‍ය කරන පුවත්පත් වාර්තා, සඟරාවල පළ වූ වාර්තා සහ 'ට්විටර්' කෙටි පණිවුඩ ආදිය මෙහිදී

උපයෝගී කරගෙන ඇත. මෙම ප්‍රචණ්ඩත්වයේ ආසන්න බව (හදිසිය) සහ බොහෝමයක් දෙනා අත්දුටු කම්පනය මෙන්ම අනාගතයේදී මෙම ප්‍රදේශයේ ජීවත්වීම පිළිබඳව මිනිසුන් දක්වන්නාවූ අදහස් ග්‍රහණය කර ගැනීමට අපි උත්සාහ දැරුවෙමු. අප කණ්ඩායම විසින් දේපළ හානි වූ සිංහල හා මුස්ලිම් දෙපාර්ශවයම සමඟම සාකච්ඡා කරන ලද අතර, මෙම සිදුවීම පීඩාවට පත්වූවන්ට කුමන ආකාරයෙන් බලපා ඇත්ද යන්න නිර්ණය කර ගැනීමට එමගින් උත්සාහ දරන ලදී. දර්ගා නගරයේ මුස්ලිම් නිවෙස්වලට සිදු වූ පහරදීම්වලට අමතරව, පතිරාජගොඩ සිංහල වැසියන්ට අයිති නිවාස හයක් සහ මිහිරිපැන්න පාරේ එක් නිවසක් ද පහරදීම්වලට ලක්ව ඇත. මෙම පහරදීම් ද සිදුව ඇත්තේ දර්ගා නගරයේ පහර දීම් සිදුවන අවස්ථාවේදී ම ය. අධිකාරිගොඩ එක් සිංහල නිවසකට මෙයින් පසුව පහර දී ඇති අතර, ඇතැම් විට එය ද මෙම සිදුවීමට සම්බන්ධ වනවා විය හැකිය. පරම්පරා ගණනාවක් තිස්සේ සිංහල හා මුස්ලිම් ජනතාව එක්ව විසූ ප්‍රදේශයක් වන මෙම ප්‍රදේශය සැලකිල්ලට ගත් කල, සමාජ ජාල තුළින් ව්‍යාප්ත කළාවූ මුස්ලිම් විරෝධී ව්‍යාපාර හේතුවෙන් මෙන්ම පිටස්තරයන් හා මෙයට ගොදුරු වූ පුද්ගලයන් දන්නා හඳුනන අය විසින් නිරත වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියා හේතු කොටගෙන සම්බන්ධතාවයන්හි සිදු වූ බිඳවැටීම් පිළිබඳව වාර්තා කිරීම වැදගත් බව අපි සිතුවෙමු.

මෙහිදී පීඩාවට පත් වූ පුද්ගලයින්ගේ කතාවලට අප විසින් සැලකිය යුතු ඉඩක් ලබාදී ඇත්තේ ජීවිත කාලයක් මුළුල්ලේ දුක් මහන්සියෙන් උපයාගත් භාණ්ඩ හා දේපළ විනාශ වී යාමත් පොලීසියෙන් හා විශේෂ කාර්ය බලකායෙන් උපකාර පැතු කල තමන්ම ප්‍රතික්ෂේප වූවා යැයි ඔවුන්ට දැනුනු හැඟීමක් සමගින් ඇති වූ කම්පනය සහ තමන්ව පාවාදීමට ලක් වූ බවට ඔවුන් තුළ ඇති හැඟීමත් ග්‍රහණය කරගැනීම පිණිසය. එම නිසා රජයේ අනුබලය ඇතිව මෙම විනශාය සිදු වූවා දෝයි ඔවුහු සැක කරති. පොලීසියේ හා විශේෂ කාර්ය බලකායේ සරණ පතා ගිය මුස්ලිම් ජනතාව බලපෑමට ලක් වූ එනම්, ප්‍රතික්ෂේපයට ලක්වූ හා ඇතැම් විට අපවාදයට ලක් වූ ආකාර පිළිබඳ අවස්ථා ගණනාවක්, වගකිව යුතු පාර්ශ්වයන් මෙවන් අවස්ථාවලදී හැසිරෙන ආකාරය පෙන්වා දීමට අප විසින් මෙම වාර්තාවට

ඇතුළත් කර ඇත. කලාපය මුළුල්ලේම ගිනි තැබීම්, මංකොල්ලකෑම් හා කොල්ලකෑම් සිදු වූ ආකාරය හා ඒවායේ සමානතාවන් විදහා දැක්වීමටද අප විසින් මෙම වාර්තාව උපයෝගි කර ගෙන තිබේ. මෙම රටා මගින් අවශ්‍යයෙන්ම හඳුනාගත යුතු සංවිධානාත්මක ප්‍රචණ්ඩ ක්‍රියාවන්ගේ ස්වාභාවය පෙන්නුම් කරනු ලබයි.

අප අළුත්ගම දර්ගා නගරය හා වැලිපැන්නේ ඇතැම් තෝරාගත් ප්‍රදේශවල අපගේ සම්මුඛ සාකච්ඡා පවත්වන විට එහි තදබල ලෙස හමුදා හා විශේෂ කාර්ය බලකා සෙබළුන්ගේ ආරක්ෂාව යොදා තිබුණි. එනිසා පුද්ගලයින් (සාකච්ඡාවට සම්බන්ධ වූ) නිරන්තරයෙන්ම ඔවුන්ගේ නම් පරීක්ෂණ කණ්ඩායමට පැවසීමට මැලිකමක් දැක්වීය. සිදුවීම වූ වහාම රටේ පුවත්පත් නතු කර ගනිමින්, ඔවුන්ට විශේෂිත තොරතුරු දැක්වීම ආදියට බල කරමින් මෙම සිදුවීම සම්බන්ධයෙන් වූ තොරතුරු පාලනය කිරීමට රජය විසින් ක්‍රියා කල ආකාරය ආදිය විශේෂයෙන් සැලකිල්ලට ගනිමින්, අප කණ්ඩායම ද පුද්ගලයන්ගේ හා ප්‍රදේශවල නම් වාර්තාවේ සඳහන් කිරීමේදී වරණීය වීමට තිරණය කළෙමු.

## සිදුවීම්වල කාලනිර්ණය

**2014 මැයි 8:** වයස අවුරුදු පනහක සාප්පු සේවකයකු විසින් සිය පුතාව ලිංගික අපයෝජනයට ලක් කල බවට වයස අවුරුදු හතක දරුවෙකුගේ මවක් විසින් චෝදනා එල්ල කරනු ලැබීය. පොලීසියට හා සාප්පුවට විරුද්ධව බෞද්ධ භික්ෂූන් පිරිසක් විසින් රැළියක් (විරෝධතාවක්) පවත්වන ලදී.

**2014 මැයි 9:** ළමයාව අපයෝජනයට ලක් කලා යැයි පවසන පුද්ගලයා සේවය කළ, නගරයේ මුස්ලිම් පුද්ගලයෙකුට අයත්ව තිබූ විසිතුරු භාණ්ඩ සැලක් ගිනි තැබීම. අළුත්ගම නොසන්සුන්බව ඉහළව පැවතිණ.

**2014 ජුනි 12:** පෝය දින - අයගම සමිත ස්වාමීන් වහන්සේගේ රියදුරු මහතා සහ මුස්ලිම් තරුණයන් අතර දබරය. (ආරක්ෂක ලේකම්වරයා පසුව ඩේලි මිරර් පුවත්පත වෙත කරන ලද සම්මුඛ සාකච්ඡාවකදී

ප්‍රකාශ කොට ඇත්තේ, ඔහු මෙම ප්‍රදේශය කලහකාරී ප්‍රදේශයක් බව දැන සිටි බව සහ සිද්ධිය පිළිබඳව දැනගත් වහාම තත්ත්වය දරුණු වීම වැළැක්වීමට ඔහු විසින් පොලිස් ස්ථානාධිපතිවරයාව එම ප්‍රදේශයට පිටත් කර හැරිය බවයි.)

**2014 ජූනි 13:** ජුම්මා යාඥා අවස්ථාවෙන් පසුව ප්‍රදේශය තුළ ඇති විය හැකි ප්‍රචණ්ඩකාරී තත්ත්වයන් පිළිබඳව අළුත්ගම පොලීසිය හා මුස්ලිම් දේවස්ථාන කමිටුව අතර රැස්වීම. ජුම්මා යාඥා අවසානයේ සන්සුන්ව විසිර යාමට මුස්ලිම් ජනතාව උනන්දු කරවන ලදී. මුස්ලිම් වෙළෙඳ සැල් කිහිපයකට හා එක් සිංහල වෙළෙඳ සැලකට රාත්‍රියේදී ගල්මුල් ප්‍රහාර එල්ල විය. එලෙසම බොදු බල සේනා ෆේස්බුක් පිටුවෙහි බොදු බල සේනා භික්ෂු ගලබොඩඅත්තේ ඥානසාර හිමියන්ගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පැවැත්වීම පිළිබඳ නිවේදනයක් විය.

**2014 ජූනි 15:** ශිරාස් නූර්ඩීන් විසින් සම්බන්ධීකරණය කරන ලද මුස්ලිම් සිවිල් සමාජ නියෝජිත මණ්ඩලය අළුත්ගම පොලිස් ස්ථානාධිපතිවරයාව මුණ ගැසෙයි. බොදු බල සේනාවෙන් පැවැත්වීමට නියමිත රැස්වීම පැවැත්වුව හොත් සිදුවිය හැකි ප්‍රචණ්ඩකාරී තත්ත්වය පිළිබඳව ඔවුන් කතා කළ විට, විශේෂ කාර්ය බලකායේ හා පොලීසියේ රැකවරණය ලැබෙන බව නියෝජිත මණ්ඩලයට එහිදී තහවුරු කරන ලදී.

- ප.ව. 3.00 - බොදු බල සේනාව විසින් ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට මුල පුරන ජාතිවාදී කථනයන් රැගත් රැස්වීම අළුත්ගම නගරයේදී පවත්වන ලදී.
- ප.ව. 5.00 - රැස්ව සිටි පිරිස රැස්වීම නිම වී, විශාල මුස්ලිම් පිරිසක් වීදි පුරා එක්ව සිටින, මුස්ලිම් පල්ලියට ආසන්න, දර්ගා නගරය මධ්‍යයේ පිහිටි පතිරාජගොඩ දෙසට ගමන් කළහ.
- ප.ව. 5.30 - පිරිස විසින් ගල් ප්‍රහාර එල්ල කරන ලදී. පෙරහැරේ පැමිණි සිංහල පිරිස හා දර්ගා නගරයේ ප්‍රධාන මුස්ලිම් පල්ලිය ඉදිරිපස පාරේ සිටි මුස්ලිම් පිරිස එකිනෙකාට ගල්මුල් ප්‍රහාර එල්ල කර ගත්හ. පළමු ගල එල්ල කළ කෙනා

කවුරුන්දැයි සෙවීමට යාම ආරවුලට මඟ පෑදීය. පොලීසිය විසින් පිරිස පලවා හැරීමට කඳුළු ගෑස් භාවිතා කරන ලදී.

- ප.ව. 6.30 - පොලීසිය විසින් ඇඳිරි නීතිය ප්‍රකාශයට පත් කරන ලදී.

- ප.ව. 6.45 - ප්‍රහාරය '(නගර) සීමා ප්‍රදේශ' වල පටන් ගැණුනි. ඇසින් දුටුවන් වාර්තා කරන අන්දමට පිරිස ආයුධ සන්නද්ධව, සංවිධානාත්මකව හා ඇතැම් අවස්ථාවල මත්භාවයෙන් (බීමත්ව) සිට ඇත. පුවත්පත් වාර්තාවල සඳහන් වනුයේ, සිද්ධියෙන් පසු අත් අඩංගුවට ගනු ලැබූවන් අතර භික්ෂූන් දෙදෙනෙක් ද සිටි බව සහ ඔවුන් බීමත්ව සිට ඇති බව පොලීසිය විසින් තහවුරු කර ඇති බවක් වේ.[2] ප්‍රහාරය පටන් ගන්නේ අධිකාරිගොඩ, පතිරාජගොඩ (සිංහල නිවාස), සීනවත්ත සහ දර්ගා නගරයේ නව වීදියෙන් සහ අළුත්ගම නගරයේ සාප්පුවලින් ය.

  මුස්ලිම් පිරිස් අධිකාරිගොඩ සහ සීනවත්තේ කලහකාරී පිරිස්වලට විරුද්ධව ආරක්ෂණ ක්‍රියාමාර්ගයක් ගත්හ. හමුදා පාරේ පිහිටා ඇති සිය නිවෙස්වලට කලහකාරී පිරිස් ඇතුළු වීම නැවැත්වීමට ගිය අවස්ථාවේ මුස්ලිම් පුද්ගලයන් දෙදෙනෙකු සහ කලහකාරී පිරිස් අතර ගැටුමක් සිදු වූ බව වාර්තා විය.

- ප.ව. 8.00 - කලහකාරී පිරිස් වැලිපිටිය මුස්ලිම් පල්ලිය ඉදිරිපිට සිටිනු දක්නට ලැබුණි. එහෙත් ඔවුහු ඉක්මනින්ම විසිර ගියහ.

- ප.ව. 8.00 - මුස්ලිම් තරුණයන් විසින් සිංහල කලහකාරී පිරිස්වලින් පලිගැනීමක් ලෙස අධිකාරීගොඩදී පහරදෙන ලදී. මෙම පලිගැනීමේදී එක් සිංහල නිවාසයකට ද හානි විය.

- ප.ව. 8.00 - (දෙහිවල) මුස්ලිම් සිවිල් සමාජ විසින් හමුදා බුද්ධි අංශයත් සමඟ හමුවක් සූදානම් කරන ලදී. ප්‍රචණ්ඩ ක්‍රියා නැවැත්වීමට පියවර ගන්නා බවට ඔවුන් විසින් සහතික

2 ද අයිලන්ඩ් පුවත්පත, DEW questions failure to take preventive action, 2014 ජුනි 19, පි. 1.

වන ලදී. කලහකාරී පිරිස් වඩා බලවත් බවත් හමුදාවට ඔවුන් පාලනය කිරීමට බලයක් නොමැති බවත් පවසමින් ඒ එකඟත්වය පසුව අවලංගු කරන ලදී.

- ප.ව. 10.00 - පොලිස් මාධ්‍යය ප්‍රකාශක අජිත් රෝහන මහතා සිරස ප්‍රයිම් ටයිම් නිවුස් වැඩ සටහනෙහිදී "ඇඳිරි නීතිය ප්‍රකාශයට පත් කර ඇති බව හා වාර්තා වලට අනුව තත්ත්වය සාමාන්‍ය අතට පත් කර ඇත" යනුවෙන් සඳහන් කරන ලදී.

- ප.ව. 11.00 - අළුත්ගම සිට ආපසු යමින් සිටි පිරිස අඹේපිටිය සහ බේරුවල පිහිටි කඩසාප්පු හා නිවාසවලට පහර දෙති.

- ප.ව. 11.00 - කලහකාරීන් විශාල පිරිසක් වැලිපිටිය මාර්ගයේ රැස්ව සිටියහ. පදිංචිකරුවෝ - කාන්තා, පුරුෂ හා ළමුන් සියලු දෙනා - ආරක්ෂාව පිණිස මුස්ලිම් පල්ලියට එක් වූහ. පුරුෂයෝ කලහකාරී පිරිස් ඉදිරියට පැමිණීම වැළැක්වීමට උත්සාහ ගත්හ. දෙපිරිස අතර පැය එක හමාරකට ආසන්න කාලයක් මුළුල්ලේ ගැටුම් පැවතුණි.

- ප.ව. 12.45 - පහරදීම් පිළිබඳ අසන්නට ලැබුණු අතර තුවාල ලැබූවන් වැලිපිටිය මුස්ලිම් පල්ලියට කඩිනමින් ගෙන යන ලදී.

  කලහකාරී පිරිස නගරයට ඇතුළු නොවී වැලිපිටිය ප්‍රදේශයෙන් විසිර ගියහ.

- ප.ව. 1.30 - තුවාල වූවන් රෝහලට ගෙන යාම පිණිස පොලිස් ජීප් රථ වැලිපිටියට පැමිණියහ.

**2014 ජුනි 16ඃ**

සිද්ධිය ඇති වූ ප්‍රදේශවල ඇඳිරි නීතිය තවදුරටත් ක්‍රියාත්මක විය.

- පෙ.ව. 9.30 - ප්‍රචණ්ඩ ක්‍රියාවන් පාලනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළුතර කච්චේරියේ දී රැස්වීමක් පැවැත්විණ. ඥානසාර හිමියන්ද මෙම රැස්වීමට සහභාගි විය. එහිදී තීරණය වූයේ තත්ත්වය පාලනය කිරීම සඳහා

නැගෙනහිරින් (නැගෙනහිර පළාතේ සේවයේ නියුතු) සෙබළුන් කැඳවීමටයි. පහර දීම් හේතුවෙන් අත් අඩංගුවට ගත් 11දෙනාගෙන් 7දෙනෙක් නිදහස් කරන ලෙස බොදුබල සේනාව ඉල්ලා සිටියහ. ඥානසාර හිමියන් මාවනැල්ලේ පැවැත්වීමට නියමිත රැස්වීම නැවැත්වීමට සහතික වීම මත පොලිස් ස්ථානාධිපතිවරයා විසින් එයට එකඟ විය. භික්ෂුවක් අපවත් වූ බවට තිබෙන කටකතාව අසත්‍ය බවට ප්‍රකාශයක් කරන මෙන් මුස්ලිම් නියෝජිතයෝ පොලිස් ස්ථානාධිපතිවරයාගෙන් එහිදී තවදුරටත් ඉල්ලා සිටියහ.

- පෙ.ව. 11.30 - බේරුවල සාප්පුවක් ගිනි තැබීම.

- ප.ව. 2.00 - (ආසන්නව) කොළඹින් පැමිණි ගිලන් රථයක් දර්ගා නගරයට ඇතුළු විය. කලහකාරී පිරිස් තවමත් අවට සැරිසැරූහ.

- ප.ව. 5.00 - පොලිස් ස්ථානාධිපතිවරයා විසින් පුවත්පත් සාකච්ඡාවක් පවත්වමින්, තත්ත්වය තම පාලනය යටතේ (සාමාන්‍ය තත්ත්වයේ) පවතින බව සහ පහරදීම් හේතුවෙන් කිසිදු භික්ෂුවකගේ ජීවිතයක් අහිමි නොවූ බවද ප්‍රකාශයට පත් කරන ලදී.

- ප.ව. 11.30 - වැලිපැන්න ගොවිපලකට පහර දෙන ලදී.

- ප.ව. 11.45 - වැලිපැන්න නගරයට පහර දෙන ලදී.

මිහිරිපැන්න, තුඩුව සහ මතුගම සිදු වූ ප්‍රහාර හා සිද්ධීන් මෙන්ම වාර්තා වී ඇති පරිදි ජුනි 15 වන දින නියෝජ්‍ය අමාත්‍ය ෆයිසර් මුස්තාෆා මහතාව නලීමියා ආයතනයේ රඳවා ගැනීම ඉහත කාලනිර්ණය තුළ ඇතුළත් කර නොමැත.[3]

3 http://dbsjeyaraj.com/dbsj/archives/30652 බලන්න

# 2 වන පරිච්ඡේදය
# බොදු බල සේනාව

## පසුබිම

බොදු බල සේනාව සහ එහි සහචර කණ්ඩායම් මඟින් පශ්චාත් යුධ සමය තුළ ඉතා සාර්ථකව ව්‍යාප්ත කරන ලද මුස්ලිම් විරෝධී මනෝභාවයන්ගෙන් වෙන්කොට ජුනි 15 සහ 16 දින වලදී ඇති වූ සිදුවීම් සලකා බැලිය නොහැක. පශ්චාත් යුධ ජයග්‍රහණ සමයේ නව සිංහල බෞද්ධ ජාතිකත්වයේ අත්‍යන්ත, පරම සහ භයංකාර 'අනෙක්' පාර්ශවය ලෙසට මුස්ලිම් ජනතාව රාමු කිරීම පිළිබඳව 2 වන පරිච්ඡේදය තුළින් සාකච්ඡා කෙරේ.

## ශ්‍රී ලංකාවේ ඉතිහාස කතාව තුළ භික්ෂූන්ගේ භූමිකාව

ශ්‍රී ලංකාව තුළ බුදු හිමියන්ගේ ඉගැන්වීම්වල ආරක්ෂකයන් හා පතළ කරන්නන් වශයෙන් බෞද්ධ භික්ෂූන් බෞද්ධ ජනතාව අතර ගෞරවයට පාත්‍ර වී සිටී. ඉතිහාසය පුරා ඇතැම් භික්ෂූන් විසින් ඔවුන්ට ලැබී ඇති මෙම ගෞරවනීය ස්ථානය ශ්‍රී ලංකාවේ දේශපාලනික විඥානය තුළ තම ප්‍රතිරූපය බල පවත්වා ගැනීමට උපයෝගී කරගෙන ඇත.

සංඝ සමාජය ඔවුන්ගේ අනුගාමිකයන් වෙනුවෙන් රජයේ සහයෝගය බලාපොරොත්තු වේ. ශ්‍රී ලංකා ඉතිහාසයේ වැදගත්ම කොටස වන පූර්ව යටත් විජිත යුගය පිළිබඳව වාර්තා කර ඇති මහාවංශය, භික්ෂුවකගේ දෘෂ්ටිකෝණයෙන් ඉදිරිපත් කරන ලද කතාවකි.[4] තිසරණී ගුණසේකර විසින් සඳහන් කර ඇති පරිදි මහාවංශය හුදෙක් 'සිංහල ජනතාවගේ සදාචාරාත්මක ආචාරධර්මීය දර්ශනය (දැක්ම) ව්‍යාප්ත කිරීම තුළින් සිංහල සාමාන්‍ය දැනුම හැඩ ගැස්වීම' පමණක් සිදු නොකරන අතර, එය සිංහල බෞද්ධාගම පිළිබඳ කෘතියේ භූමිකාවද නිරූපණය කරයි.[5] එළාර රජුට විරුද්ධව දුටුගැමුණු රජු විසින් ගෙන ගිය සටනේදී මිය ගිය දහසක් දෙනා වෙනුවෙන් කම්පා වූ දුටුගැමුණු

4 ජේම්ස් ජේ හියුස්, "Buddhist Monks and Politics in Sri Lanka", Presented at Spring Institute for Social Science Research University of Chicago in 1987.

5 තිසරණී ගුණසේකර, 'Occupied by Extremism', LankaNewspapers.com, 2009 මාර්තු 29.

රජතුමා අස්වසන්නට පැමිණි භික්ෂූන් පිරිසක් විසින් පැවසූ වදන් වශයෙන් මහා වංශයේ මෙසේ සඳහන් වන බව ඇය පවසන්නීයඃ 'මෙම මහා නැඟී සිටීමේදී නිවනට යන තාගේ මඟට කිසිඳු අවහිරයක් නැත. අහෝ ස්වාමිනි, ඔබ අතින් මෙහි මරා දමා ඇත්තේ මිනිසුන් එකකුත් භාගයක් පමණි. එකකු තිසරණයේ සරණ ගොස් ඇත. අනෙකා ශික්ෂාපද පහ පිළිගෙන ඇත' එහෙයින්, ඉතිහාසයේ සිටම ඔවුන් පිටස්තරයන් වශයෙන් සලකනු ලැබූවන්ට විරුද්ධව සිදුවන ප්‍රචණ්ඩත්වයන් සාධාරණීකරණය කිරීමට සිංහල බෞද්ධ ජාතිකත්වය උත්සාහ දරා ඇත.

පිටස්තර බලවේග මගින් පැහැදිලිවම බලය පැහැර ගැනීමක් පැවති යටත් විජිත සමය මුළුල්ලේ, භික්ෂූන් විසින් විජාතික ආධිපත්‍යයන්ගෙන් ස්වයංනිර්ණ බලය තහවුරු කර ගැනීමෙහිලා බෙහෙවින් ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කරන ලදී.[6] කෙසේ නමුත්, අනගාරික ධර්මපාලතුමාගේ වාගලංකාර මගින් පරම සිංහල බෞද්ධ අනන්‍යතාව පරමාදර්ශනය කළ අතර යටත් විජිතවාදයට එරෙහි ප්‍රචාරක ව්‍යාපාරයන් ගෙන යාමට අමතරව ශ්‍රී ලංකාව තුළ වාසය කරන සුළු ජාතීන් හුදෙකලා කිරීමට කටයුතු කළේය. 1956 දී එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ මහජන එක්සත් පෙරමුණ මගින් බහුජනයාගෙන් අංශ පහක් එනම්, සඝ, වෙද, ගුරු, ගොවි, කම්කරු යන අංශවල සිංහල බෞද්ධ පුබුදුව ප්‍රධාන දේශපාලනයට මුහු කිරීමට මහත් උනන්දුවෙන් කටයුතු කරන ලදී. බණ්ඩාරනායක මහතාගේ මැතිවරණ ජයග්‍රහණය සිංහල බෞද්ධ දේශපාලන සංස්කෘතියේ නැඟී ඒමට රාජ්‍ය මට්ටමින් ලැබුණු අනුමැතියක් විය.[7] මින් ඉදිරියට, විද්වත් ගුණදාස අමරසේකර සහ නලින් ද සිල්වා යන මහත්වරුන් විසින් ඓතිහාසික ශිෂ්ටාචාරාත්මක පදනමක් ඇති සිංහල බෞද්ධ ජාතිකත්ව රාජ්‍යයක පැවැත්ම පිළිබඳව නැවතත් නැවත ප්‍රකාශ කර තිබේ.[8]

2001 දී පූජ්‍ය බද්දේගම සමිත හිමියන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට තේරී පත් වූ ප්‍රථම බෞද්ධ භික්ෂුව වූ අතර, 2004 දී ජාතික හෙළ උරුමයෙන්

6 එම.

7 ඒ. ආර්. එම්., ඉම්තියාස්, "Politicization of Buddhism and Electoral Politics in Sri Lanka". තුළඃ රියාස්, ඒ. (සංස්.), Religion and Politics in South Asia, (ලන්ඩන්ඃ රූට්ලිෆ්, 2010).

8 ජූඩ් ලාල් ප්‍රනාන්දු, 'Religion, Conflict and Peace in Sri Lanka: The Politics of Interpretation of Nationhoods',LIT බර්ලින් (2013), පි.115.

භික්ෂූන් 200 දෙනෙක් ඉදිරිපත් කර ඉන් 9 දෙනෙකු පාර්ලිමේන්තුවට පත් කිරීමට සමත් විය. මෙය ජාතික තලයෙන් සිංහල බෞද්ධ අනන්‍යතාවක් සත්‍ය වශයෙන්ම ඇති කිරීමට සංඝ සභාවේ මැදිහත් වීම කියාපාන නව මුල පිරුමකි.[9] ජාතික හෙළ උරුමය තුළින් කරලියට ආ ගලගොඩඅත්තේ ඥානසාර හිමියන් එම පක්ෂය එතරම් කැළිකාරී නොවන බව පවසමින් ඉන් ඉවත්ව යාමට ප්‍රථම පක්ෂයේ ප්‍රධාන සංවිධායක වශයෙන් ක්‍රියාකරමින් තම හැකියාවන් මුවහත් කරගත්තේය.[10]

## බොදු බල සේනාව පිළිබඳ තොරතුරු

බොදු බල සේනාව 2012 මැයි 07 වන දින පිහිටුවන ලදී. බොදු බල සේනාවේ විධායක කමිටුව - බොදු බල සේනා ප්‍රධානී, පූජ්‍ය කිරම විමලජෝති හිමි; බොදු බල සේනා ලේකම්, පූජ්‍ය ගලගොඩඅත්තේ ඥානසාර හිමි; අනෙකුත් විධායක නිළධාරීන්, පූජ්‍ය හපුතලේ පඤ්ඤාසාර හිමි, පූජ්‍ය විතාරන්දෙණියේ නන්ද හිමි සහ ඩිලන්ත විතානගේ (ගිහි සාමාජික) යන අයගෙන් සමන්විත වේ.[11]

'වර්ල්ඩ්විව්' අන්තර්ජාතික ආයතනය විසින් නෝර්වේ රාජ්‍යයට සංවිධානය කරන ලද චාරිකාවක් සඳහා බොදුබල සේනාවේ සාමාජිකයන් තිදෙනෙකු 2011 අප්‍රේල් මාසයේදී එනම් සංවිධානය ආරම්භ වීමට වසරකට පමණ පෙර සහභාගී වීම සම්බන්ධයෙන් බොහෝ මතිමතාන්තර (අනුමාන) පවතී.[12] බොදු බල සේනාව විසින් ස්ථිර වශයෙන්ම නෝර්වේ රජයෙන් කිසිදු අරමුදලක් ලබා නොමැති බව පවසා ඇත.[13] මෑතකදී එනම් 2014 ජුනි 20 වන දින, කරන ලද ප්‍රකාශයකින් නෝර්වේ රජය විසින් මූල්‍ය, සදාචාරාත්මක හෝ සංකල්පීය වශයෙන් බොදු බල සේනාවට සහාය වීම ප්‍රතික්ෂේප කොට ඇත. තවදුරටත් ඔවුන් ප්‍රකාශ කර ඇත්තේ කිසිදු වාතාවරණයක් යටතේ නෝර්වේ රාජ්‍යය ආගමික සම්බන්ධතාවන්ට හා සාමකාමී

9 මහින්ද, දීගල, "Politics of the Jathika Hela Urumaya Monks: Buddhism and Ethnicity in Contemporary Sri Lanka", Published in Contemporary Buddhism 5 (2) 2004: පි. 83-103.

10 "Gnanasara Thero is Freely Roaming the Streets and Challenging Police Dare Arrest Him", Tamils Guide, 2014 ජූලි 16 දින ටැමිල් ගයිඩ් බලන්න.

11 "Genesis of Bodu Bala Sena", Asian Tribune, 2013 අප්‍රේල් 7 දින ඒෂියන් ට්‍රිබියුන් බලන්න.

12 "Making Sense of Bodu Bala Sena", The Island, 2014 අප්‍රේල් 25 දින ද අයිලන්ඩ් බලන්න.

13 "Genesis of Bodu Bala Sena", Asian Tribune, 2013 අප්‍රේල් 7 දින ඒෂියන් ට්‍රිබියුන් බලන්න.

සහජීවනයට විරුද්ධව ක්‍රියා කරන සංවිධානවලට සහාය නොවන අතර එය ශ්‍රී ලංකාව හෝ වෙනත් ඕනෑම රටක් විය හැකි බවය.[14]

බොදු බල සේනාව සිය ප්‍රථම ජාතික සම්මේලනය 2012 ජූලි 28 වන දින භික්ෂූන් 1200ක් හා භික්ෂුණියන් 300කගේ සහභාගිත්වයෙන් බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී.[15] බොදු බල සේනාවේ ප්‍රධානී සහ නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ පූජ්‍ය කිරම විමලජෝති හිමියන් විසින් සම්මේලනයේදී සම්මත වූ සම්මුතීන් පහ ඉදිරිපත් කළහ. සම්මුතීන් පහෙන් පළමුවැන්න වූයේ, රජයට සිංහල බෞද්ධ ජනගහණයේ වර්ධන වේගය අඩුවීම කෙරෙහි දැඩි අවධානය යොමු කිරීමත් පවුල් සැලසුම් ශල්‍යකර්ම නැවැත්වීමත් එවන් ශල්‍යකර්ම සිදු කරන වෛද්‍යවරුන් සහ පුද්ගලයන්ට රජය විසින් දෙනු ලබන උසස් වීම්, ගෙවීම් ආදිය නැවැත්වීමත් වේ. දෙවැන්න, පවතින නීති පද්ධතිය රෝම - ලන්දේසි ක්‍රමය මත පදනම්ව පවතින බැවින් සහ ඉංග්‍රීසි නීතිය සිංහල බෞද්ධයන්ගේ අයිතිවාසිකම් හා අනන්‍යතාව ආවරණය කිරීමට හා ආරක්ෂා කිරීමට ප්‍රමාණවත් නොවන බැවින් නීතිය සංශෝධනය කිරීමට තීරණය කිරීමයි. තුන්වැන්නෙන්, ඔවුන් ආගමික අධ්‍යාපනයට මුල්තැනක් ලබා දෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් සිදු කිරීමට යෝජනා කරන ලදී. හතරවන යෝජනාව තුළින් ඉල්ලා ඇත්තේ, රජයට 1959 නොවැම්බර් මස බුද්ධ ශාසන කොමිසම් වාර්තාවේ නිර්දේශයන් ක්‍රියාවට නංවන ලෙසයි. පස්වැන්නෙන් යෝජනා කරනු ලබන්නේ බුද්ධ ධර්මය පිළිබඳ පවතින පොත්පත් සහ අනෙකුත් ද්‍රව්‍යයන් පිළිබඳව අධීක්ෂණය කිරීමට නියාමන ක්‍රමයක් ඇති කිරීම සහ ධර්මයට හානි කරන අය නැති කර දමන ලෙසයි.[16]

## බොදු බල සේනාව හඬ අවදි කරයි

පෙර සිටම බොදු බල සේනාව දේශීය වශයෙන් හා අන්තර්ජාතික වශයෙන් ඉස්ලාමීය 'අන්තවාදය' පිළිබඳ විවිධ විරෝධතාවයන්ට

---

14 "Statement regarding the alleged connection between Bodu Bala Sena and Norway", 2014 ජුනි 20, www.norway.lk බලන්න.

15 "Buddhist clergy wants birth control operations banned", 2012 ජූලි 29 දින ද අයිලන්ඩ් බලන්න.

16 එම.

සම්බන්ධව සිටියහ. ඔවුන් බදුල්ලේදී මුජාහිඩීන් ත්‍රස්තවාදී සංවිධානයෙන් (Mujahideen terrorist group) බුද්ධගයාවේ සිදු කරන මිලේච්ඡ ක්‍රියාවන්ට විරුද්ධව විරෝධතාවක් දියත් කරන ලදී.[17] මින් පෙර බොදු බල සේනාව විසින් ඇති කළ නොසන්සුන්කාරී අවස්ථාව ඇති වූයේ බුවැලිකඩ දීය. මහනුවරට නුදුරු නගරයක් වන මෙහිදී වෑන් රථයක් මග අවුරමින් ගමන්ගත් බව පවසමින්, බසයක ගමන් ගත් සිංහල තරුණයන් පිරිසක් මුස්ලිම් පිරිසක් සමග ගැටුමක් ඇති කර ගත්හ. ප්‍රතිඵලය ලෙස වාහන අනතුරට ලක් වීමෙන් මුස්ලිම් අය කිහිප දෙනෙක් තුවාල වී රෝහල්ගත කරන ලදී.[18] මුස්ලිම් විරෝධී පෝස්ටර නගරය මුළුල්ලේ අලවා තිබූ අතර, බෞද්ධ කොඩිය බලහත්කාරයෙන් මුස්ලිම් නිවෙස් සහ ව්‍යාපාරවලට ඉහළින් ඔසවන ලදී. එමෙන්ම බෞද්ධ ආගමික දම් දෙසුමක් (බණ) රැගත් ශබ්ද විකාශන යන්ත්‍ර මුස්ලිම් ව්‍යාපාර ගොඩනැගිල්ලක සවිකර තිබේ. වරදකරුවන් නැවැත්වීමට හෝ ඔවුන්ට දඩුවම් දීමට පොලිස් විශේෂ කාර්ය බලකායට හැකියාවක් තිබී නැත.[19]

2012 අප්‍රේල් මාසයේදී, දඹුල්ල නගරයේ මුස්ලිම් පල්ලියකට භික්ෂූන්ද ඇතුළුව බෞද්ධයන් 2000 ක් පමණ කඩා වැදී එය නීති විරෝධීව ඉදි කර ඇති බව පවසමින්, පල්ලිය බිඳ හෙලන බව පවසමින් ගිනි අවුළුවන වර්ගයේ බෝම්බ ප්‍රහාරයක් එල්ල කරන ලදී.[20] පල්ලිය ප්‍රතිස්ථාපනය සඳහා අගමැතිතුමා විසින් නියෝග නිකුත් කළ අතරතුර, නැගෙනහිර පළාතේ මුස්ලිම් ජනතාව ප්‍රහාරයට විරෝධය පළ කරමින් උද්ඝෝෂණයක් දියත් කළහ.[21] ඥානසාර හිමි විසින් නැගෙනහිර පළාතේ මුස්ලිම් අන්තවාදීන්ට විරුද්ධව, නැගෙනහිර වෙනම රාජ්‍යයක් පිහිටුවීමට උත්සාහ දරනවාය යන දෝෂාරෝපණය එල්ල කර ඇත.[22]

---

17 "Bodu Bala Sena protest", 2012 ඔක්තෝම්බර් 25 දින ඩේලිමිරර් බලන්න.

18 "Sri Lankan Buddhist chauvinists provoke violence against Muslims", World Socialist Web Site, 2013 ජනවාරි 9 බලන්න.

19 එම.

20 "Sri Lankan Muslims Stricks over Dambulla Mosque", 2013 ජනවාරි 9 දිනWorld Socialist Web Site, බලන්න.

21 එම.

22 එම. ගලගොඩඅත්තේ ඥාණසාර හිමි විසින් 2012 නොවැම්බර් මස මෙම ප්‍රකාශයන් කරන ලද්දේ නැගෙනහිර පළාතේ, හඳුනා නොගත් පිරිසක් විසින් බෞද්ධ විහාරයකට සිදු කළ විනාශය හේතුවෙනි.

2012 වර්ෂයේ අවසානය වන විට බොදු බල සේනාව නිල නොලත් පොලිස් බලකායක් වශයෙන් ඔවුන්ගේ අනන්‍යතාව ප්‍රකාශ කර තිබුණි.[23] නීතියේ බලයක් නොමැතිව නීතිය ක්‍රියාත්මක කිරීමට යාමේ ඔවුන්ගේ කටයුතු තවදුරටත් ව්‍යාප්ත කරමින් මුස්ලිම් සිසුන්ට අනුග්‍රහය දක්වමින් විභාග ප්‍රතිඵල වෙනස් කළ බවට චෝදනා කළ බොදු බල සේනාව 2013 ජනවාරි 7 වන දින, හල්ෆ්ස්ඩ්‍රොප්හි පිහිටි ශ්‍රී ලංකා නීති විද්‍යාලයට පෙළපාළියකින් ගමන් ගත්හ.[24] අධිකරණ අමාත්‍ය රවුෆ් හකීම් මහතා මෙයට සහාය වූ බවට ඔවුන් විසින් චෝදනා එල්ල කරන ලදී.[25] එසේම 2013 ජනවාරි 21 වන දින 'බෞද්ධ බාර්' එකක් පවත්වනවා යැයි පවසමින් ඔවුන් විසින් බේරුවල හෝටලයක් වටලන ලදී.[26]

## දේශපාලනඥයන් සමඟ බොදු බල සේනාවේ පවතින සම්බන්ධතාව

මල්වත්ත මහා නායක අති පූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල හිමි විසින් බොදු බල සේනාවට එවන ලද ලිපියක, සංවිධානයේ ක්‍රියාකාරකම් වලට ඔහුගේ ආශිර්වාදය ලබා දෙමින්, බලධාරීන්ගේ දෑස් සත්‍යයට විවර කොට, සංගණන හා සංඛ්‍යා දත්ත වාර්තාවලින් පෙන්නුම් කරන පරිදි බෞද්ධ ජනග්‍රහණයේ හා බෞද්ධ සිද්ධස්ථාන සංඛ්‍යාවේ විශාල අඩුවීම දෙස බැලීමට කාලය දැන් පැමිණ ඇති බව සඳහන් කරනු ලබයි.[27] 2012 දෙසැම්බර් 25 වන දින ඔවුන් ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා[28] සමඟ හමුවක් පැවැත්වූ අතර,

---

23 එම.

24 "Law school entrance delayed by a week", 2013 ජනවාරි 8 දින හිරු ප්‍රවෘත්ති බලන්න,

25 "Muslim students have passed due to their skill; Hakeem", 2012 දෙසැම්බර් 20 දින ලංකා සී නිවුස් බලන්න, ශ්‍රී ලංකා නීති විද්‍යාලය මගින් ගෙනයන අධ්‍යාපන ප්‍රතිපත්ති, විභාග සහ විභාග ප්‍රශ්න පත්‍ර සැකසීම් සමඟ තමන්ට කිසිදු ආකාරයක සම්බන්ධයක් නොමැති බව අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරන ලදී.

26 "Hotel managers arrested over 'Nirvana style' dinner event", 2013 ජනවාරි 27 දින සන්ඩේ ටයිම්ස් බලන්න.

27 "Malwatte Mahanayake welcomes Bodu Bala Sena", 2013 ජනවාරි මස Forum for Peaceful Co-existence Sri Lanka, බලන්න, 1. ලිපියෙහි පහත දෑද සඳහන් වේ: "කිරම විමලජෝති නායක ස්ථවිරයන් සහ ගලගොඩඅත්තේ ඥාණසාර හිමියන්ගේ නායකත්වයෙන් භික්ෂූන් කණ්ඩායමක් විසින් ගෙන ඇති පියවර ජාතිය අවදි කරලීමට ගෙන ඇති කාලෝචිත ක්‍රියාවකි. සත්‍යය නම් සිංහල බෞද්ධ පැවිද්දන් සහ ගිහියන් මෙන්ම ථේරවාද සම්බුද්ධ ශාසනය ජාතික හා අන්තර්ජාතික වශයෙන් අභියෝග වලට මුහුණපානු ලබයි. බෞද්ධයන්ගේ අයිතීන් නගා සිටුවීමට සහ ආවෘත මනස් අතර භික්ෂූන් පිළිබඳව පවතින වැරදි අදහස් බැහැර කිරීමට බොදුබල සේනාවට සෑම බලතලයක්ම පවතී."

28 "Sri Lankan Buddhist chauvinists provoke violence against Muslims", 2013 ජනවාරි 9 දින World Socialist Web Site බලන්න.

මසකට පසු එනම්, 2013 ජනවාරි 28 වන දින ඔහුගේ සහෝදරයා වන ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාව අරලිය ගහ මන්දිරයේදී හමු වී තිබේ.[29] බොදුබල සේනාවෙන් සිදු කරන මුස්ලිම් විරෝධී ප්‍රචාරයන් වැළැක්වීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගන්නා බවට රජයට චෝදනා කරමින්, කෑගල්ල මන්ත්‍රී කබීර් හෂීම් මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් එක්සත් ජාතික පක්ෂ නියෝජිතයන් පිරිසක් බොදු බල සේනාවේ භික්ෂූන් හතර දෙනෙකු හමුවිය.[30] රට තුළ "අන්තවාදී කණ්ඩායම්" ක්‍රියාත්මක වන බවට අනතුරු ඇඟවීම සඳහා 2013 පෙබරවාරි මාසයේදී බොදු බල සේනාව හමුදාව සහ පොලීසිය හමු විය.[31]

2013 මාර්තු 9 වන දින, ආරක්ෂක ලේකම්වරයා විසින් ගාල්ලේ වංචාවල, පිලානෙහි 'මෙත් සෙවණ' නමින් බොදු බල සේනාවේ සංස්කෘතික හා පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කරන ලදී.[32] භික්ෂූන්හට හා ගිහියන්හට මෙහිදී පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක වේ. ආරක්ෂක ලේකම්වරයා විසින් බුද්ධශාසනයේ අභිවෘද්ධියට බොදු බල සේනාවෙන් සිදුවන සේවාව මෙහිදී ඇගයූබවක් මෙත් සෙවණේ ප්‍රධානී, පූජ්‍ය ඇල්පිටියේ විජිත හිමි විසින් ප්‍රකාශ කළ බව වාර්තා වී ඇත.[33] මෙම අවස්ථාවට ආරක්ෂක ලේකම්වරයාගේ සහභාගිත්වය තුළින්, බොදු බල සේනාව හමුදාවේ ආයුධයක් නැතහොත් නිර්මාණයක් වන බවට අටුවාචාරීන්ගේ නිගමනය තහවුරු කරන බව පෙනීයයි.

## 'හලාල් එපා' බොදු බල සේනාව කියයි

2013 ජනවාරි 2 වන දින බොදු බල සේනාව විසින් 'හලාල් තහනම් කරනු' යනුවෙන් විරෝධතා ව්‍යාපාරයක් දියත් කරන ලදී.[34] 2013 පෙබරවාරි 17 වන දින සම්මත වූ මහරගම ප්‍රකාශයත් සමඟ මෙම

---

29 ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ සමඟ ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන, බනිජතෙල් කර්මාන්ත අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන, ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග සහ ආරක්ෂක ප්‍රධානී ගාමිණී සෙනරත්ද රැස්වීමට සහභාගි වන ලදී. "President Rajapaksa stresses need for respecting rights of all communities", 2013 ජනවාරි 28 දින ද අයිලන්ඩ් බලන්න.

30 "UNP, Bodu Bala Sena in pow-wow", 2013 පෙබරවාරි 13 දින ඩේලි එෆ්ටී බලන්න.

31 "Army asks for Evidence", 2013 මාර්තු 01 දින ද සන්ඩේ ලීඩර් බලන්න.

32 "Gota inaugurates BBS Meth Sevana", 2013 මාර්තු 10 දින සිලෝන් ටුඩේ බලන්න,

33 එම.

34 "Sri Lankan Buddhist chauvinists provoke violence against Muslims", 2013 ජනවාරි 9 දින World Socialist Web Site බලන්න.

විරෝධතාවයට තවත් ජවයක් එක් වුණි.[35] ප්‍රකාශය තුළ කරුණු 10 ක් අන්තර්ගතය. හලාල් ආහාර සඳහා නිකුත් කරන සහතිකය අවලංගු කිරීම ඉන් එකක් වේ. 'හලාල් තහනම් කරනු' යන පාඨ රැගත් පුවරු දරා සිටින පිරිසක් වෙත බොදුබල සේනාව ප්‍රකාශ කරනු ලැබූයේ, ඔවුන් හලාල් සහතික තහනම් කිරීමට 2013 මාර්තු 31 දක්වා රජයට කල් ලබා දෙන බවයි. ඔවුන් විසින් අවධාරණය කළ අනෙකුත් කරුණු වූයේ, ශ්‍රී ලාංකීය කාන්තාවන් මැද පෙරදිග යැවීම, මැද පෙරදිග අරමුදල් වලින් මුස්ලිම් පල්ලි ඉදි කිරීම, සිංහල ජනගහණ වර්ධනය පාලනය කිරීම උදෙසා ඉලක්ක කර ඇති යැයි ඔවුන් විසින් පවසන ඇතැම් උපත් පාලන ක්‍රමවේදයන් සහ ඔවුන් විසින් 'ගෝනි බිල්ලෝ' වශයෙන් නම් කරන ලද මුස්ලිම් කාන්තාවන්ගේ ඇඳුම ආදියයි.[36]

හලාල් සහතිකයට විරුද්ධව බොදුබල සේනාව විසින් ගෙන යනු ලබන ප්‍රචාරයන්ට පිළිතුරු වශයෙන්, බෞද්ධ හා ඉස්ලාම් ආගමික පූජකවරුන් දෙපාර්ශවයම ශ්‍රී ලංකා වාණිජ්‍යය මණ්ඩලයේ සහයෝගයෙන් 2013 මාර්තු 11 වන දින සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී හමුවක් පැවැත්වීය.[37] සමස්ථ ලංකා ජම්ඉයියතුල් උලමා සංවිධානය විසින් මතවාදයට තුඩුදුන් හලාල් ලාංඡනය තවදුරටත් පාරිභෝගික භාණ්ඩවල අසුරනයේ අනිවාර්යයෙන් ප්‍රදර්ශනය කිරීම අවශ්‍ය නොවනබව ප්‍රකාශයට පත්කරන ලදී.[38] 2013 මාර්තු 12 වන දින බොදු බල සේනාව විසින් ඉහත ප්‍රකාශය ගැටලුවට විසඳුමක් වශයෙන් භාර ගැනීම ප්‍රතික්ෂේප කරන ලදී. එවන් රැස්වීමකට සහභාගී වූවන්ට දොස් නැගූ ඔවුහු, ප්‍රශ්නයට පවතින එකම විසඳුම හලාල් ලාංඡනය සම්පූර්ණයෙන්ම තහනම් කිරීම බව අවධාරණය කලහ.[39] කෙසේ නමුත්, 2013 මාර්තු 17 වනවිට ඥානසාර හිමියන් විසින් මහනුවර

35 "Bodu Bala Sena gives ultimatum to Ban Halal certification", 2013 පෙබරවාරි 18 දින මිරර් බලන්න.

36 "This is a Sinhala country, Sinhala Government": Bodu Bala Sena", 2013 පෙබරවාරි 18 දින ඩේලි එෆ්ටී බලන්න.

37 " Losing the Ideas Battle", 2013 මාර්තු 14 දින ඩේලි එෆ්ටී බලන්න.

38 එම. වාර්තාව මඟින් තවදුරටත් ප්‍රකාශ කර සිටිනුයේ: "ශ්‍රී ලංකා මණ්ඩලයේ සභාපතිවරයා විසින් අදාළ ලාංඡනය රහිත නිෂ්පාදන ලබා ගෙන, හැකි ඉක්මනින් විකිණීමට යොදන ලෙස සිය සභිකයන්ට උපදෙස් දී ඇති අතර එවිට ගැටළුව අවසානයේදී අනෙක් ගැටළු ගොඩටම වැටී හලාල් නිසාවෙන් ඇතිවූ නොසන්සුන් තත්ත්වය එලෙසින් සමථයකට පත්වනු ඇති බවයි. මහාචාර්ය බෙල්ලන්විල විමලරතන හිමි වැනි නාහිමිවරු ආගමික කණ්ඩායම් අතර පවතින ගැටළු ගුටි බැට දීම් වෙනුවට සාකච්ඡා මාර්ගයෙන් විසඳිය හැකි බව යන පොදු මතයට එකඟ විය.

39 එම.

පැවති රැළියකදී ප්‍රකාශ කරනු ලැබූයේ ඔවුන් හලාල් ප්‍රශ්නය සාර්ථකව ජයගත්බව සහ ඊළඟට ඇත්තේ කුරගල බෞද්ධ ආරාම සංකීර්ණයේ පවතින මුස්ලිම් පල්ලිය ඉවත්කිරීමේ කාර්යය බවයි.[40] පසුව පානදුරේදී, බොදු බල සේනාවෙන් පවසා සිටියේ තමන්ට හලාල් ප්‍රශ්නය විසඳා දෙන බවට ආරක්ෂක අමාත්‍යාංශය සහතික වූ බවයි.[41]

## බොදු බල සේනාව සහ සාහසික අතපෙවීම්

බොදු බල සේනාව විසින් ප්‍රශ්න ඇති කරනු ලබන එකම ආගමික සුළුතරය (කණ්ඩායම) මුස්ලිම් ජනතාව පමණක් නොවේ. 2013 මාර්තු මාසයේදී බොදු බල සේනාව ඇතුළුව සියයක පමණ කලහකාරී පිරිසක් පාදිලිවරයෙකුගේ නිවසක් වට කර, නිවසට පිටතින් ටයර් පුළුස්සමින් නිවස පිටත සිට නිවැසියන්ට නින්දා සහගත වචනවලින් කෑගසන ලදී.[42] 2013 මාර්තු 24 දින පානදුරේදී ඔවුන්ගේ සම්මේලනය පවත්වමින් කියා සිටියේ ශ්‍රී ලංකාව බහුජාතීය හෝ බහු ආගමික රටක් නොව, සිංහල බෞද්ධ රටක් බවයි. ඥානසාර හිමි කියා සිටියේ රටේ ක්‍රියාත්මක වන ක්‍රිස්තියානි හා මුස්ලිම් අන්තවාදී කණ්ඩායම්වලට විරුද්ධව පෙළ ගැසීමට රට සූදානම් විය යුතු බවයි.[43]

ප්‍රසිද්ධ ඇඟළුම් අලෙවිසැල් දාමයක් වන ෆැෂන් බග් ආයතනයට 2013 මාර්තු 28 වන දින පහර දීමෙන් පසු මුස්ලිම් ජනතාවට විරුද්ධව පැවති ප්‍රචණ්ඩ ක්‍රියාවන් තවත් වර්ධනය විය.[44] වීඩියෝ දර්ශනවලින් පෙන්වා දෙන්නේ බෞද්ධ භික්ෂූන් විසින් පිරිස්වලට මූලිකත්වය දෙමින් ඉදිරියෙන් ගමන් ගත් අයුරු හා පැපිලියානේ භාණ්ඩ ගබඩාවට ගල් ප්‍රහාර එල්ල කළ ආකාරයයි. එහෙත් පොලීසියට මෙම තත්ත්වය දික් ගැසීම නැවැත්වීමට නොහැකි විය.[45] සිද්ධියට ප්‍රථම, බොදුබල සේනාව විසින් මුස්ලිම් සාප්පුවලට යාම වර්ජනය කරන ලෙස පවසමින් මිනිසුන්ට කෙටි පණිවුඩ යවන ලද අතර, ජාතික හෙල උරුමය විසින්,

---

40 "Sri Lanka's Buddhist extremists vow to remove Muslim mosque in Kuragala", 2013 මාර්තු 18 දින කලම්බෝ පේජ් බලන්න.

41 "BBS insists Lanka not multiracial", 2013 මාර්තු 24 දින කලම්බෝ ගැසට් බලන්න.

42 http://world-asia-21840600/ බලන්න.

43 "BBS insists Lanka not multiracial", 2013 මාර්තු 24 දින කලම්බෝ ගැසට් බලන්න

44 "Sri Lanka crowd attacks Muslim warehouse in Colombo", BBC, 2013 මාර්තු 29.

45 එම. මෙම වීඩියෝ දර්ශන http://www.bbc.com/news/world-asia-21973292 වෙබ් අඩවියෙන් නැරඹිය හැකිය.

"සිංහල බෞද්ධයන් විසින් මෙවන් මුස්ලිම් අන්තවාදීන්ට අමතක නොවන පාඩමක් ඉගැන්වීමට අධිෂ්ඨාන කරගත යුතුය" යනුවෙන් ප්‍රකාශයක් කර ඇත.[46] කෙසේනමුත් බොදුබල සේනාව ප්‍රහාරය හෙලා දැක ඇති අතර, එහි වගකීම භාර ගැනීම ප්‍රතික්ෂේප කර ඇත.[47]

2013 අප්‍රේල් 19 වන දින තමන් බොදු බල සේනාවෙන් ප්‍රශ්න කරන්නාවූ බෞද්ධයන් යයි කියා ගත් ෆේස්බුක් කණ්ඩායම විසින් සංවිධානය කරන ලද සාමකාමී ඉටිපහන් සත්‍යග්‍රහයට බොදු බල සේනාවෙන් පහර දෙන ලදී.[48] මෙම කටයුත්ත සංවිධානය කර තිබුණේ සුභාෂිතයේ එන 'සම්මා වචන' (යහපත් වචන) සංකල්පය හා බැඳුණු කවි ගායනා කිරීමටය. බොදු බල සේනා නියෝජිතයන් මෙයට විරුද්ධ වූ අතර, පොලීසිය විසින් සත්‍යග්‍රහයට සහභාගීවූවන්ගෙන් දෙදෙනෙකු ප්‍රශ්න කිරීම සඳහා ගෙන යන ලදී. එලෙසම පිරිස විසිර නොගියහොත් සියලුම දෙනාව අත් අඩංගුවට ගැනීමට ප්‍රධාන පොලිස්පතිවරයා විසින් නියෝග කර ඇති බවද වාර්තා වී ඇත.[49]

2013 ජූලි මාසයේදී මහියංගනය මුස්ලිම් පල්ලියක බැතිමතුන් වෙත අමු ඌරු මස් සහ ගල්වලින් පහර දුන් අවස්ථාවේදී, අමාත්‍ය රවුෆ් හකීම් මහතා බොදුබල සේනාව විවේචනය කරමින් සිය කටහඬ අවදි කළේය.[50] ඔහු පවසා සිටියේ මුස්ලිම් ජනතාවට විරුද්ධව සිදු වූ ප්‍රහාරය සංවිධානාත්මක එකක් බව සහ බොදුබල සේනාවේ මහලේකම් පූජ්‍ය ගලගොඩඅත්තේ ඥානසාර හිමියන්, "විවෘතවම ප්‍රදේශයේ වෛරී විරෝධතා ව්‍යාපාරයන් පතුරන බවයි". මෙහිදී පොලීසිය විසින් කිසිදු අත් අඩංගුවට ගැනීමක් සිදු නොකළ බව පෙන්වා දෙමින්, ආගමික අන්තවාදය කෙරෙහි රජයේ පවතින පිළිගත නොහැකි ආකල්ප පිළිබඳව ඔහු විසින් තවදුරටත් කණගාටුව පළ කරන ලදී.[51]

---

46 එම.

47 "BBS condemns the attack" 2013 මාර්තු 29 දින ඩේලි මිරර් බලන්න.

48 "On 'Nightclub Buddhists': The Disrupted Vigil", 2013 අප්‍රේල් 21 දින ද සන්ඩේ ලීඩර් බලන්න.

49 එම. මෙහි තවදුරටත් වාර්තා වී තිබුණේ, "සිද්ධියෙන් පසු, ඩිලන්ත විතානගේ විසින් මාධ්‍යයට කැළඹුම් සහගත පණිවුඩයක් මුදා හැර ඇත. 'ශ්‍රී ලංකා ජාතික ගීය විකෘති කරන ව්‍යාජ භික්ෂූන් (එල්. ටී. ටී. ඊ. යට අනුබල දුන්) අත් අඩංගුවට ගන්න.'"

50 "Mahiyangana mosque closed after attacks: raw pork and stones thrown at worshippers", 2013 ජූලි 29 දින ද රිපබ්ලික් ස්කේවෙයාර් බලන්න,

51 එම.

## 2014 වර්ෂය සහ සිදුවන්නට යන දේවල් පිළිබඳ පෙරනිමිති

2014 වර්ෂයේදී හික්කඩුව ප්‍රදේශයේ දේවස්ථානවලට පහර දීමත් සමඟ බොදුබල සේනාවේ ප්‍රචණ්ඩකාරී ගමන් පථයේ මං සලකුණු තවදුරටත් පුළුල් වන ලදී. බොදුබල සේනාව සහ එහි ආධාරකරුවන් පිරිසක් විසින් ප්‍රදේශයේ පල්ලිවලට පහර දෙන ලදී. තත්ත්වය පාලනය කිරීමට පොලීසිය යෙදවූවත්, පිරිස අධික වූ බැවින් එය සමනය කිරීමට පොලීසිය අපොහොසත් විය.[52] 2014 අප්‍රේල් 9 වන දින ඥානසාර හිමි සහ ඔහුගේ ආධාරකරුවන් ජාතික බල සේනාව සහ මුස්ලිම් දේවගැතිවරු විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණයක් වටලන ලදී.[53] වීඩියෝ දර්ශන මඟින් පෙන්වා දෙන්නේ බොදුබල සේනාවේ මහලේකම් ඉතා කලහකාරී ලෙස පැමිණ සිටියවුන්ට අපහාස කරමින්, මුස්ලිම් අය ඔවුන්ගේ ප්‍රශ්න බෞද්ධ හිමිවරුන් සමඟ සාකච්ඡා නොකළ යුතු බව පැවසූ අන්දමයි.[54] මාර්තු මාසයේදී, මහනුවර අස්ගිරියේ දී බොදු බල සේනාවට අයත් භික්ෂූන්ගේ ප්‍රධානත්වයෙන් 250 ක පමණ කලහකාරී පිරිසක් ප්‍රොතෙස්තන්ත ක්‍රිස්තියානි පාදිලිවරයෙකු හා ඔහුගේ බිරිඳට පහර දෙන ලදී.[55]

2014 ජුනි 10 වන දින, අළුත්ගම හා බේරුවල සිද්ධි සිදුවීමට මදක් පෙරාතුව, ශ්‍රී ලංකාවේ නීතිඥ සංගමය විසින් නීතිපතිවරයා වන පාලිත ප්‍රනාන්දු මහතාගෙන් බොදුබල සේනාවේ ක්‍රියාකාරකම්වලට විරුද්ධව ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඉල්ලීමක් කරන ලදී. බොදු බල සේනාව මෙම ලිපියට පරිභව කරමින්, ලිපියේ අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් නීතිඥ සංගමයට විවාදයකට ආරාධනා කළහ.[56] මේ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් පෙනී යයි.

---

52 මෙම වීඩියෝ දර්ශන https://www.youtube.com/watch?v=c84C_m4kD6c වෙබ් අඩවියෙන් නැරඹිය හැකිය.

53 මෙම වීඩියෝ දර්ශන Footage available at https://www.youtube.com/watch?v=LFSgzuNy-BCA වෙබ් අඩවියෙන් නැරඹිය හැකිය.

54 එම.

55 "ක්‍රිස්තියානි පූජකවරයෙක් බෞද්ධ අන්තවාදීන් අතින් පහර කෑමට ලක්ව ඇත" 2014 මාර්තු 14 දින UCAN බලන්න. එහි තවදුරටත් සඳහන්ව තිබුණේ බෞද්ධ භික්ෂූන් විසින් සබරගමුව පළාතේ වැසියන්ට පාදිලිවරුන්ට සහාය වීමට හෝ ඔවුන් සමඟ කාලය ගත නොකරන ලෙස නියම කරමින් තර්ජනය කර ඇති බවයි.

56 "Video: BBS challenges BASL to debate on letter sent to AG", 2014 ජුනි 10 දින ඩේලි මිරර් බලන්න.

වෛරී කථනයන් වැළැක්වීමට රාජ්‍ය ප්‍රතිපත්තියක් ගෙන ඒම සම්බන්ධයෙන් වසරකටත් වැඩි කාලයක් තිස්සේ කතාබහ කළත්, තවමත් එය ඉෂ්ට වී නොමැත. අන්තවාදීන්ගෙන් සැදුම්ලත් කණ්ඩායම් තහනම් කිරීම පිළිබඳ කැබිනට් පත්‍රිකාවක් සකස් කෙරෙමින් පවතින බවට වූ චෝදනා 2013 අප්‍රේල් මාසයේදී, ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍ය වාසුදේව නානායක්කාර මහතා විසින්, ප්‍රතික්ෂේප කරන ලදී. එමෙන්ම ඔහු විසින්, "මෙය ප්‍රජාතන්ත්‍රවාදී රටක්. සංවිධානවලට තම අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියක් තිබෙනවා" යනුවෙන් ප්‍රකාශ කළ බවක් සඳහන් වේ.[57] ජාතික හෙළ උරුමය මෙම කැබිනට් පත්‍රිකාව තරයේ ප්‍රතික්ෂේප කරන ස්ථාවරයක පිහිටා සිටියි.[58]

බොදුබල සේනාව විසින් අන්‍යයන් පිළිබඳ සැලකීමකින් තොරව බලය පාවිච්චි කරන්නට වීම රජයේ සාමාජිකයින්ගේ කිසිදු දෝෂ දර්ශනයකට ලක් නොවීම, භික්ෂූන් විසින් ප්‍රසිද්ධියේම නීතිය කඩ කරන අවස්ථාවන්වලදී ඔවුන් අත් අඩංගුවට නොගැනීම - එනම්, ෆැෂන් බග් ගබඩාවට පහර දුන් අවස්ථාවේදී සහ 2014 ට පෙර සිටම සිදු කරන ලද ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන්ට විරුද්ධව කිසිදු පියවරක් නොගැනීම යනාදියෙන් ගම්‍ය වනුයේ, බොදු බල සේනාවේ සහ එහි සහචරයන්ගේ මතවාද සහ ක්‍රමවේද රාජ්‍ය තන්ත්‍රය විසින් නිහඬවම පිළිගන්නා බවයි. ඇතැම් මුස්ලිම් සිවිල් සමාජ සංවිධාන රජයේ නියෝජිතයන් - විශේෂයෙන් ආරක්ෂක ලේකම්වරයා හා සමඟ සම්බන්ධ වෙමින්, මුස්ලිම් ජනතාව මුහුණපාන්නාවූ ප්‍රශ්නවලට විසඳුම් ලබා ගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කරමින් සිටිති. අර්බුදකාරී තත්ත්වයන්වලදී - එනම් හලාල් ප්‍රශ්නයේදී හා ෆැෂන් බග් ගබඩාවට පහර දුන් අවස්ථාවේදී මුස්ලිම් ජනතාවට මේ සම්බන්ධයෙන් විසඳුමක් ලබා දීමට ආරක්ෂක ලේකම්වරයා පැමිණියේය. ඇතැම් මුස්ලිම් සංවිධාන මේ සඳහා සාම්ප්‍රදායික ප්‍රවේශයන්ද අනුගමනය කරති. එනම්, ඔවුහු නීතියේ පිහිට පැතීමට සහ වෛරී සිදුවීම් පිළිබඳව ප්‍රලේඛනයන් සකස් කරමින් ජාත්‍යන්තර ප්‍රජාවට අවශ්‍ය තොරතුරු වඩාත් විද්‍යාමාන කිරීමට කටයුතු කරමින් සිටිති. මුස්ලිම් දෙමළ ජාතික සන්ධානයේ නායක සහ බොදු බල සේනාව විවේචනයට ලක්

57 "Sri Lankan minister denies cabinet paper aimed at banning extremist organizations", 2013 අප්‍රේල් 7 දින කලම්බෝ පේජ් බලන්න.

58 එම.

කළ ප්‍රමුඛ දේශපාලන කටහඬක් වූ අසාද් සාලි මහතාව 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගන්නා ලදී.[59] මෙවන් සිද්ධීන් බොදු බල සේනාවට විරුද්ධව ක්‍රියා කරන අයට අත් වන ඵලවිපාක පිළිබඳව පූර්වාදර්ශයක් සපයයි.

2014 ජූනි සිදුවීම ඉහත සන්දර්භය තුළ වටහා ගත යුතුය. එමනිසා, මෙම සිදුවීමට මුහුණදුන් පිරිසට එය මහත් කම්පනයක් වූවත්, මෙය ශ්‍රී ලංකාවේ හෙළිදරව් කරන ලද බොහෝමයක් සිදුවීම් බලා සිටියවුන්ට එතරම් අලුත් දෙයක් නොවීය. මුස්ලිම් විරෝධී මනෝභාවයන් සහ සමාජ හා සංස්කෘතික මාධ්‍යයන්ගේ ගෙනහැර දැක්වීම් මෙන්ම බොදු බල සේනාවේ මෙන්ම රාවනා බලය හා සිහල රාවය වැනි ඔවුන්ගේ ආධාරකරුවන්ගේ නොනවතින ප්‍රචණ්ඩකාරී ක්‍රියාකාරකම්වලින් පෙනී යන්නේ ඔවුන් විසින් මෙවන් ප්‍රචණ්ඩත්වයක් (සැහැසියාවක්) බොහෝ කල් සිටම බලාපොරොත්තුවෙන් සිටි බවක් වන බව කිව හැකිය.[60]

59 “Sri Lanka: The Arrest and Detention of AzathSalley”, Asian Human Rights Commission, 2013 uehs 6; “AazathSalley Arrested”, 2013 මැයි 2 දින කලම්බෝ ගැසට් බලන්න.

60 https://www.colombotelegraph.com/index.php/hate-incidents-report-what-is-to-come-for-muslims-in-sri-lanka-are-ominous-muslim-secretariat/

# 3 වන පරිච්ඡේදය

## සිද්ධි මූලය

අළුත්ගම ඇතිවූ නොසන්සුන්බව 15 වෙනිදා ඇති වූ කලබලයට පෙර සිටම කැකෑරෙමින් පැවතුණකි. උදාහරණයක් වශයෙන්, මැයි 9 වෙනිදා අළුත්ගම නගරයේ කඩවීදියේ ඇති වූ සිද්ධියකින් මුස්ලිම් ව්‍යාපාරිකයෙකුට අයත්ව තිබූ විසිතුරු භාණ්ඩ වෙළෙඳ සැලක් ගිනි තැබීම ගත හැකිය. මෙම ගිනි තැබීම සිදු වූයේ, වෙළෙඳ සැලේ සේවය කරන සේවකයෙක් අවුරුදු හතක් වයසැති සිය පුතාව ලිංගිකව අපයෝජනයට ලක් කළ බව කාන්තාවක් විසින් චෝදනා නැගීමෙන් අනතුරුවය. සිද්ධිය උසාවිය ඉදිරියට ගෙනෙන ලදී. ගිනි තැබීමෙන් පසුව, වෙළෙඳ සැලේ හිමිකරුවා විසින් රූපවාහිනියේ පැවති සම්මුඛ සාකච්ඡාවකදී ප්‍රකාශ කළේ ගිනි තැබීම තමන් සමඟ පැවති ඊර්ෂ්‍යාවට ඔහුගේ තරඟකරුවන් විසින් සිදු කරන ලද්දක් බවයි. පසුව බීබීසීය සමඟ පැවති සම්මුඛ සාකච්ඡාවක දී ඔහු විසින් ප්‍රදේශයේ නොසන්සුන්කාරී තත්ත්වය පිළිබඳව හා ප්‍රජාවන් (මිනිසුන්) අතර සම්බන්ධතාවන් තවදුරටත් පිරිහීම පිළිබඳ ඔහුගේ මතය මෙන්ම මෙය ප්‍රදේශයේ ගිනි ගන්නා අවසාන මුස්ලිම් වෙළෙඳ සැල වනු ඇතැයි යනුවෙන් ඔහු ප්‍රාර්ථනා කරන බව ද ප්‍රකාශ කරන ලදී. නඩුවේදී දරුවාගේ මවගේ ප්‍රකාශවල සඳහන් පරිදි පොලීසිය විසින් මෙහිදී අකාර්යක්ෂමව කටයුතු කළ අතර, දරුවාගේ මව පවසන පරිදි ඔවුන් නියම කලට ප්‍රශ්නයට පිළිතුරු ලබා දී නොමැත.

ලිංගික අපහරණය පිළිබඳ සිද්ධිය සම්බන්ධ සත්‍යතාව, ඒ පිළිබඳ පොලිස් පරීක්ෂණයක් පවතින බැවින් ප්‍රකාශයට පත් කළ නොහැකි අතර, උසාවියේ ඒ පිළිබඳ නඩුවක් ද විභාග වීමට නියමිතය. සැකකරු ඇප මත මුදා හැර ඇත. කලින් සිදු වූ සිදුවීම් වල ප්‍රතිඵලයක් ලෙස පොලිස් ස්ථානය ඉදිරිපස පිරිස් එකතු වූ අතර, අනතුරුව වෙළෙඳ සැල ඉදිරියට ගොස් වෙළෙඳ සැල් හිමියාට වෙළෙඳ සැල වසා ඉවත්ව යන ලෙස දන්වා ඇත. වෙළෙඳ සැල් හිමියා එසේ කිරීම ප්‍රතික්ෂේප කර ඇත. එදින රාත්‍රියේ දී වෙළෙඳ සැල අළු

ගොඩක් බවට පත් විය. එතැන සිදු වූ දෙය පිළිබඳ කතාන්දරය ජනවාර්ගිකත්වය පිළිබඳව හා ඉදිරියේ දී සිදු වන්නට යන සිද්ධි සමුදාය පිළිබඳ පෙර නිමිත්තකි. උදාහරණයක් ලෙස, වෙළෙඳ සැල් හිමියා මෙන්ම අප විසින් කතා කළ අළුත්ගම සියලුම මුස්ලිම් පිරිස් පැවසුවේ ආරක්ෂක කැමරා (CCTV) වලින් එහි කිසිදු අකටයුත්තක් සිදු නොවූ බව තහවුරු වන බවයි.

කෙසේ නමුත්, ආරක්ෂක කැමරාවල කිසියම් ආකාරයක අයුතු දෙයක් සිදු වන බව සටහන් වී ඇති බව දරුවාගේ මව විසින් සඳහන් කළ බව රාවය පුවත්පතේ වාර්තා කර ඇත.[61] කෙසේ නමුත් පොලීසිය කෙරෙහි සහ සිද්ධියේ සෑම අංගයක්ම මෙහෙය වූ ආකාරය සම්බන්ධයෙන් දෙපාර්ශ්වයම අතිශයින් කණගාටු විය. පූජ්‍ය ඥානසාර හිමියන් 15 වෙනිදා පැවැත් වූ කථාව තුළ හා පුන පුනා සිද්ධිය පිළිබඳව කරන ලද විවිධ විග්‍රහ කිරීම්වල දී - විශේෂයෙන් ජාතික හෙළ උරුමයේ පාර්ලිමේන්තු මන්ත්‍රී චම්පික රණවක මහතා විසින් කරන ලද විස්තර තුළින් මෙහි සිදු වූ පරිහානියේ තරම ගෙන හැර දක්වා ඇත.[62]

කැළඹීමට මූලික හේතුව වශයෙන් බොහෝ දෙනා සැලකුවේ පතිරාජගොඩදී මුස්ලිම් තරුණයන් තිදෙනා හා භික්ෂු නමගේ වාහනයේ රියදුරු මහතා අතර ඇති වූ හබය බවයි. එහිදී ආරවුලට මූලික වී ඇත්තේ භික්ෂු නමට පහර දුන්නේද නැතිද යන කරුණයි. මුස්ලිම් තරුණයන්ගෙන් කෙනෙක්, "කෙට්ටු උස කෙනා" යයි හඳුන්වන තැනැත්තා, තම අතට පහර දුන්බව භික්ෂුව විසින් ප්‍රකාශ කරන වීඩියෝ පටයක් මෑතකදී ජාතික හෙළ උරුමය විසින් මුදා හරින ලදී.[63] සිද්ධිය සිදුවීමෙන් අනතුරුව සිද්ධියට සම්බන්ධ මුස්ලිම් තරුණයන් දෙදෙනාට පොලීසියට භාර වී භික්ෂූන්ගෙන් සමාව ඉල්ලන ලෙසට පොළඹවමින්, මුස්ලිම් අයගේ පාර්ශ්වයෙන් ද "හානිය පාලනය කිරීම" උදෙසා විවිධ ක්‍රියාමාර්ග ගත් බව මුස්ලිම් ජනතාවගෙන් අපි අසා දැන ගතිමු. හොඳ හිත (සද්භාවය) රැකීමේ

---

61 ජුනි 13 වෙනි දින දරිශා බැස්ටියන් ඩේලි එෆ්ටී ඉංග්‍රීසි පුවත්පතේ වාර්තා කර තිබුණේ, හිරිහැරයන් පිළිබඳ සාක්ෂි සීසීටීවී කැමරා වලින් සම්භ නොවූ බවයි. නඩුව මේ වන විට උසාවියේ විභාග වෙමින් පවතී.

62 2014 ජුනි 21 වන දින ජාතික හෙළ උරුමයේ මාධ්‍යය සාකච්ඡාව බලන්න.

63 ජුනි 21 මාධ්‍යය හමුවේදී පෙන්වන ලද අළුත්ගම සත්‍යය කතාව නම් වීඩියෝ පටය බලන්න. එය https://www.youtube.com/watch?v=HrBgKWapYFA වෙබ් අඩවියෙන් නැරඹිය හැක.

ක්‍රියාවක් වශයෙන් පොලීසියට ගිය සිද්ධියට සම්බන්ධ පුද්ගලයන් දෙදෙනා හා ඔවුන්ගේ සහෝදරයෙකුව, පොලිස් නිළධාරීන් සිටියදීම භික්ෂූන් ඉදිරියේ දණ නැමීමට සලස්වා ඇති අතර, එක් ප්‍රකාශයකට අනුව, ඔවුන්ට අළුත්ගම පොලිස් ස්ථානයේ පොලිස් නිළධාරීන් හා එක්රැස් වී බලා සිටියවුන් හා සමීපතමයන් ඉදිරිපිටදීම භික්ෂුව විසින් කම්මුලට පහර දී ඇත.[64]

ජුනි 12 වන දින සිද්ධියෙන් (හබයෙන්) පසු, සිකුරාදා දර්ගා නගරයේ සමූහ යාච්ඤාවට එක්වන මුස්ලිම් පිරිසගෙන් කලබල මතු වනු ඇතැයි ප්‍රදේශයේ වගකිවයුත්තන් විසින් අපේක්ෂා කරන්නට ඇත. සිකුරාදා දින උදෑසන, මුස්ලිම් දේවස්ථාන කමිටු සාමාජිකයන් ඇතුළු කමිටුවේ නායකවරයාට හා දර්ගා නගරයේ බහු-ආගමික ව්‍යාපාරිකයන්ගේ සංගමයට (සංගමයේ සිංහල ලේකම්වරයාද ඇතුළුව) කළුතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලය වෙත පැමිණීමට දන්වා තිබුණි. අප වෙත අදහස් දැක්වූ අය පැවසුවේ ඔවුන් සහකාර පොලිස් අධිකාරී අනුර සේනානායක මහතා සහ හමුදා බුද්ධි අංශයේ මේජර් මොහොමඩ් මහතා හමු වූ බවයි. ඔවුන් පැවසුවේ සිකුරාදා ජුම්මා යාච්ඤා වලින් පසුව කිසිදු අනිසි ක්‍රියාවක් සිදු නොවීමට වග බලා ගැනීමට එහිදී උපදෙස් දුන් බවයි.

අපේ තොරතුරු සපයන්නා වන ජුම්මා දේවස්ථානයේ භාරකරු පැවසුවේ, කිසිදු සිදුවීමක් හටනොගන්නා බව සහතික කිරීමට ඔවුන් පෙ.ව. 11.45 සිටම මාර්ගයට වී සිට පරික්ෂාකාරීව සිටීමට සහ ප්‍රචණ්ඩත්වයන් ඇති වීම වැළැක්වීමට කටයුතු කරන ලෙස මිනිසුන්ට උපදෙස් දුන් බවයි. ජුම්මා යාච්ඤාව පවත්වන ස්ථානය වන ප්‍රධාන පාරේ පිහිටා තිබූ මහා පල්ලිය (පෙරිය පල්ලි) වෙනුවට මදක් අභ්‍යන්තරයට වන්නට පිහිටි සාවියා පාරේ තෙරු පල්ලි දේවස්ථානයේ යාඤාව පැවැත්වීමට ඔවුන් විසින් සැලසුම් කොට මිනිසුන් එතනට යොමු කළ බවද පවසන ලදී. තවද මිනිසුන්ට යාච්ඤාවෙන් පසු මහා මාර්ගයේ එක්රැස් නොවන ලෙසද, අතුරු මාර්ග හරහා සිය නිවෙස්වලටද, ව්‍යාපාරික ස්ථානවලටද යන ලෙස පවසා තිබේ. අපේ

64 තුන්වෙනි සහෝදරයා වන මවුලවීවරයා විසින් තමන් දණ ගසා සිටී අතරතුරදී පා පහරක් එල්ල කිරීම සම්බන්ධයෙන් පොලීසියට හා භික්ෂුවට විරුද්ධව ක්‍රියා කරන ලෙස පැමිණිලි කර ඇති බව ශූරා සභාවේ මාධ්‍යය දිග හැරුමෙන් පසුව පෙන්වා දෙන ලදී.

තොරතුරු සපයන්නාට අනුව, 13 වෙනිදා ද ප්‍රදේශයේ විශාල විශේෂ කාර්ය බලකා සෙබළුන් පිරිසක් සිට ඇත.

රැස්වීමට සහභාගී වූ මුස්ලිම් පිරිස ඔවුන්ගේ ස්ථාවරය අධිකාරීන් වෙත පැහැදිලි කර දෙන ලදී. පිරිස විසින් ආරක්ෂක ප්‍රධානීන්හට දර්ගා නගරයට ඇතුල් වන ස්ථාන තුනෙහි එනම්, අතීතයේදී මෙවන් වාර්ගික ප්‍රචණ්ඩ ක්‍රියා හටගත් ස්ථාන වශයෙන් කිවහැකි ස්ථානවලට, වැඩිපුර ආරක්ෂාවක් යොදවන ලෙස උපදෙස් ලබා දී ඇත. එම ස්ථාන නම් අඹ ගහ හන්දිය, වැලිපිටිය සහ කන්දෙ විහාරය අසල සිවු මං සන්ධියයි. පොලීසිය විසින් එම ප්‍රදේශ පිළිබඳ තොරතුරු සටහන් කරගෙන ඇත. බොදුබල සේනාව විසින් 15 වෙනිදා පැවැත්වීමට නියමකරගෙන තිබුණු රැස්වීම පිළිබඳවද ඔවුන් සාකච්ඡා කර ඇති අතර එය ප්‍රචණ්ඩ ක්‍රියා වලට මුල් වනු ඇතැයි යනුවෙන් ද ප්‍රකාශ කර ඇත. එහෙත් ඔවුන් විසින් කියා ඇත්තේ රැස්වීම පැවැත්වීම වැළැක්වීම හොඳ අදහසක් නොවනු ඇති බව මෙන්ම එය තවත් ප්‍රශ්න ඇති කිරීමට හේතුකාරක වනු ඇති බව හා අහිතකර සිදුවීම් ඇති වීම වැළැක්වීම සඳහා වැඩිපුර විශේෂ කාර්ය බලකා සෙබළු 1200 දෙනෙක් යොදවා උපරිම ආරක්ෂාව සැපයීම ප්‍රමාණවත් වනු ඇති බවත්ය. 13 වෙනිදා ජුම්මා වලින් පසු කිසිදු කලබලයක් නොපැවතුණත්, රාත්‍රියේ ගැටුම්කාරී තත්ත්වයක් පැවතුණි. අඹගහ හන්දියේ පිහිටි සිංහල වෛද්‍යවරියකට හා ඇයගේ පුතාට හිමි සාප්පුවකට ගල් ප්‍රහාර එල්ලකර ඇති අතර, අළුත්ගම මුස්ලිම් ව්‍යාපාරිකයෙකුට හිමි මල්ලිකාස් වෙළෙඳ ආයතනයටද ගල් ප්‍රහාර එල්ල කොට සාප්පු දෙකේ ම ඉදිරිපස විදුරු කුඩු කර දමා ඇත. අපේ තොරතුරු සපයන්නා පැවසූ පරිදි, අළුත්ගම සහ දර්ගා නගරයේ ඇතැම් ස්ථානවල විශේෂ කාර්ය බලකායෙන් යොදවා සිටි නමුත්, ඔවුන්ට උපදෙස් දී තිබූ පූර්වෝපායන් අනතුරු සහගත ප්‍රදේශවලදී යොදා ගෙන නොමැත.

ජුනි 15 වන දින බේරුවල ශාසනාරක්ෂක බල මණ්ඩලය විසින් සංවිධානය කරන ලද රැස්වීමකට බොදු බල සේනාවෙන් සහභාගී වන බව දැනුම් දුන් කල, අළුත්ගම තුළ හා ඉන් බැහැර විවිධ පාර්ශ්වයන් - එනම්, මුස්ලිම් සිවිල් සමාජ සහ ආගමික නායකයන් සහ ප්‍රදේශයේ

දේශපාලනඥයන් විසින් පවතින තත්ත්වය තවත් උත්සන්න නොවන ලෙස ක්‍රියා කරවීමට උත්සාහ දරණ ලෙස බලධාරීන්ගෙන් ඉල්ලීම් කිරීමට උත්සාහ දරා ඇත.

ඉස්ලාම් ආගමික සංවිධාන හා සිවිල් සමාජ සංවිධාන නියෝජිත කණ්ඩායමක්, 15 වෙනිදා අළුත්ගමදී ඇති විය හැකි ප්‍රචණ්ඩ තත්ත්වයන් පිළිබඳව ජ්‍යෙෂ්ඨ සහකාර පොලිස් අධිකාරී අනුර සේනානායක මහතා සමඟ සාකච්ඡා කිරීම සඳහා කළුතරට ගොස් ඇත.[65] 15 වෙනිදා ජාතික ශූරා සභාවේ (National Shoora Council - NSC) මාධ්‍ය ප්‍රකාශය මඟින් පිරිස විසින් රජයට පවසා සිටියේ "බෞද්ධ ජාතිකත්ව කණ්ඩායම් විසින් අද දින පැවැත්වීමට සැලසුම් කරගෙන සිටින, ජාතිවාදය අවුස්සන ප්‍රකාශයන් කිරීමට ඉඩ නොදෙන්න" යනුවෙන් වේ. එමගින් ප්‍රදේශය තුළ තවදුරටත් අනිසි නොසන්සුන්භාවයන් ඇති විය හැකි බවත් නායකයන් එම ගැටලු සමගියෙන් විසඳා ගත යුතු බවත් ඔවුන් විසින් තවදුරටත් යෝජනා කළ බවද සදහන් කරන ලදී.[66]

පොලිස්පතිවරයා මුණ ගැසීමට ගිය නියෝජිත මණ්ඩලයේ සාමාජිකයන් විසින් පර්යේෂණ කණ්ඩායමට පසුව සඳහන් කළ පරිදි, පොලිස්පතිවරයා විසින් නියෝජිතයන්ට සහතික වෙමින් පවසා ඇත්තේ ඔවුන් රැස්වීම පැවැත්වීමට ඉඩ ලබා දෙනු ඇති බවත්, එහි සැහෙන පොලිස් හා විශේෂ කාර්ය බලකා සෙබළුන් යොදවා කිසිදු අනිසි අන්දමේ ක්‍රියාවක් සිදු නොවන්නට වගබලා ගන්නා බවත් වේ. අළුත්ගම ජනතාව අපට දන්වා සිටියේ ඔවුන් සහාය පතා මුස්ලිම් මන්ත්‍රීවරුන් ඇතුළු ජ.වි.පෙ. නායකත්ව සාමාජිකයින්ට කථා කළ බවත් මෙහි ප්‍රමාණවත් තරම් ආරක්ෂාව සපයා ඇති බැවින් වැදවීමට කිසිදු හේතුවක් නොමැති බව එම දේශපාලනඥයන් සහතික කළ බවත් වේ. මුස්ලිම් සිවිල් සමාජ නියෝජිත මණ්ඩලයේ ඇතැම් සාමාජිකයන්

---

65 මුස්ලිම් කොංග්‍රසයේ මාධ්‍ය දිගහැරුමට අනුව, මෙම නියෝජිත මණ්ඩලය සම්බන්ධීකරණය කරන ලද්දේ නීතිඥ ශිරාස් නූර්ඩීන් විසින් සහ පහත පිරිසෙන් එය සමන්විත විය: සමස්ථ ලංකා ජම්ඉයියතුල් උලමාවරු නියෝජනය කරමින් ශූක් මුර්ෂිඩ් මුලාෆර් (Ex-Co Member), ශූක් ෆාසිල් ෆාරූක් (Ex-Co Member), ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සිලය නියෝජනය කරමින් එන්.එම්.අමීන් (සභාපති) සහ අස්කර් ඛාන් (ලේකම්), කොළඹ මුස්ලිම් දේවස්ථාන එකතුව නියෝජනය කරමින් එම්.අර්.එම්.රිකාස් (සභාපති-මරදාන), එම්.රමීස් නාලිර් (සභාපති-දෙහිවල/ගල්කිස්ස), වාකෆ් මණ්ඩලය නියෝජනය කරමින් අර්කම් උවායිස් (සභාපති), තරුණ මුස්ලිම්වරුන්ගේ සංගමය නියෝජනය කරමින් කේ.එන්.ඩීන් (ජාතික සභාපති) විය.

66 ඉස්මායිල් අසීස් විසින් අත්සන් තබන ලද ශූරා සභා ප්‍රකාශනය ජුනි 15 වන දින මුදා හරින ලදී, මහලේකම් ජා.ශූ.ස.

පැවසුවේ පොලිසියේ සහ විශේෂ කාර්ය බලකායේ සෙබළු විශාල ප්‍රමාණයක් ප්‍රදේශයේ සිටීම හේතුවෙන් ඔවුන් 15 වෙනිදා අළුත්ගමින් පිටත් වූයේ යම්තාක් දුරකට හෝ අස්වැසිල්ලක් ඇතිව බවයි. අළුත්ගම කඩ හිමියන් සඳහන් කළේ එහි සැලකිය යුතු මට්ටමක විශේෂ කාර්ය බලකා භටයන් ප්‍රමාණයක් සිටි බැවින් තරමක ආරක්ෂාවක් ඔවුන්ට දැණුන බවයි.

15 වෙනිදා රැස්වීම සම්බන්ධයෙන් පලකළ දැන්වීමේ බොදු බල සේනාවේ සහ සිංහල රාවයේ ලාංඡනය දක්වා ඇති නමුත් පසුව සඳහන් කර ඇත්තේ බොදුබල සේනාව නොව බේරුවල ශාසනාරක්ෂක බල මණ්ඩලය විසින් එම රැස්වීම සංවිධානය කළ බවත් වේ. දැන්වීමේ එකී තොරතුරු සඳහන් නොවීය.

පෝස්ටරයේ සඳහන්ව තිබූයේ:

> සිංහලයිනේ! මූසල මරක්කල ත්‍රස්තවාදී ලෙබ්බේලා සංඝයා වහන්සේට පහර දී උතුම් පොසොන් පොහොය දිනය කෙලෙසා අවසන්ය. කතා කිරීමට තවත් යමක් ඉතිරිව නැත.
> අවසන් තීරණය ප්‍රකාශයට පත් කෙරෙන මහා බොදු සමුළුව ජුනි 15 ඉරිදා අළුත්ගම නගරයේදී සවස 3.00 ට පවත්වනු ඇත.

මුස්ලිම් ප්‍රජා නියෝජිතයන් පමණක් නොව බොහෝමයක් දෙනා, ආරාධනයේ මැද කොටසේ පැවති වචන ලීලාවෙන් නොසන්සුන්කාරී තත්ත්වයක් පැතිර යාමේ ඉඩකඩ පිළිබඳව සැක පළ කරන ලදී. බොදු බල සේනාවෙන් සංවිධානය කරනු ලබන රැස්වීම නවත්වන ලෙස බලධාරීන් වෙත දන්වනු ලැබූවන් අතර, මුස්ලිම් සිවිල් සමාජ නියෝජිතයන්ට අමතරව, කුමාර වෙල්ගම සහ රෝහිත අබේගුණවර්ධන යන අමාත්‍යවරුන්වද ඇතුළත් වන බව 2014 ජුනි 15 වන දින සිදුකළ ශූරා සභාවේ මාධ්‍යය නිවේදනයක දී සඳහන් කර තිබේ.[67]

## රැස්වීම

මාධ්‍යය මඟින් රැස්වීමට පුළුල් ප්‍රචාරයක් ලැබුණු අතර, භික්ෂුවගේ භාෂණය කුපිත කරවන සුළු ප්‍රකාශයන්ගෙන් පිරී තිබුණි. රැස්වීමට

67 එම.

ආරක්ෂක භටයන් යෙදවීම පිළිබඳව ඔහුගේ කෝපය පිට කරමින්, රටේ ආරක්ෂක සේනාවන් තවමත් සිංහල හමුදාව සහ සිංහල පොලිස් භටයන් බව මතක තබා ගන්නා ලෙස ඔහු සියල්ලන්ටම ප්‍රකාශ කළේය. වාර්ගිකත්වයේ බලපෑම සහිතව භික්ෂුව විසින් කරන ලද ආයාචනාවන් පසුව විශේෂ කාර්ය බලකාය මඟින්ද අනුමත කළ බවක් ප්‍රචණ්ඩත්වය පැවති කාලය අතරතුර ඔවුන් මුස්ලිම් ජනතාවට එතරම් සහාය නොවීමෙන් පෙනී යයි.

එසේම භික්ෂුව විසින් තවදුරටත් ප්‍රකාශ කලේ, මුස්ලිම් ජනතාව නීතියට යටත් නොවුවහොත්, අළුත්ගම හා බේරුවල ඇති ඔවුන්ගේ කඩ සාප්පුවලට කිසිදු ආරක්ෂාවක් නොමැතිවනු ඇති බවයි. තවද අධිකරණ අමාත්‍යවරයා වශයෙන් මුස්ලිම් පුද්ගලයෙකු පත්කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට ද දොස් පවරණ ලදී. පතිරාජගොඩ පූජ්‍ය අයගම සමිත නම් තරුණ ස්වාමීන් වහන්සේට පහර දීමෙන්, බුදුදහමට සිදුවූ අවමානය පිළිබඳව ද මෙම රැස්වීමෙන් හා කථනයන්ගෙන් සාකච්ඡාවට බඳුන් කරන ලදී. හිමිනම විසින් මෙය මුස්ලිම් අය බෞද්ධයන්ට හිංසා කළ සිදුවීම් මාලාවක උච්ඡ ස්ථානය බව ප්‍රකාශ කරන ලදී. මෙහිදී ඔහු පැමිණ සිටි ජනකායට ඉතා පැහැදිලි වචනවලින් අළුත්ගම නගරයේ මසකට පෙර මුස්ලිම් පුද්ගලයෙකු තරුණ පිරිමි දරුවකුගේ ලිංගික අවයව අතපත ගෑම සම්බන්ධයෙන් චෝදනාවට ලක්වූ ආකාරය සිහිකර දෙන ලදී. බෞද්ධයන්ට මුස්ලිම් ජාතිකයින්ගෙන් වන වැරදි පිළිබඳව කතා කිරීමට අවසරයක් නොමැතියැයි ඔහු පැවසූ අතර ඔවුන් (බෞද්ධයන්) එසේ කළොත් ඔවුන් ජාතිවාදියෝයැයි හංවඩු ගසනු ඇත යනුවෙන්ද පැවසීය. (මෙහිදී භික්ෂුව සැබැවින්ම ඔව්! අපි ජාතිවාදියෝ! යයි පවසන ලදී) එකදු සිංහලයකුට හෝ අතක් තැබුවහොත් එය සියළුම මුස්ලිම්වරුන්ගේ අවසානය වනු ඇතැයි ඔහු පැවසීය. අවදිවී, ජාතිය හා ආගම බේරා ගැනීමට වගකීමෙන් යුතුව කටයුතු කරන ලෙස (රැස්වීම හරහා බෞද්ධයන්ගෙන්) ඉල්ලා සිටින ලදී.

මෙම අවස්ථාවට සහභාගි වූ ගායක මධුමාධව අරවින්ද වේදිකාවේ රැඳී සිටි විනාඩි කිහිපයේදී සඳහන් කළේ පෘතුගීසි සමයේ මුස්ලිම් මිනිසුන්ට රැකවරණය සැලසූ සිංහල රජු වන සෙනරත් රජුට ඔහු ශාප කරන බව සහ අසූ (1980) ගණන්වල මිලියනයක් වූ මුස්ලිම්

පිරිසට අද වනවිට මිලියන දෙකක් දක්වා වර්ධනය වීමට ඉඩ සලසා දෙන්නාවූ සිංහලයන්ගේ අදූරදර්ශීභාවය පිළිබඳව පසුතැවෙන බවත්ය. ඔහු විසින් තවදුරටත් ප්‍රකාශ කළේ මුස්ලිම් ජනතාව සිංහල ජනතාව සමඟ එක්ව සිටින්නේ නම්, එනම් බොදු බැතිගී සඳහා ප්‍රසිද්ධ මුස්ලිම් ගායක මොහිදීන් බෙග් මහතා මෙන් සිටියහොත් ඔවුන්ට සාමයෙන් විසිය හැකි බවයි. එහෙත් ඔවුන් (මුස්ලිම් ජනතාව) ඔවුන් එසේ නොසිටියහොත් ඔවුන්වද හරිනු ලබන්නේ මුල්ලිවයිකාල්! වලට බව ඔහු විසින් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.[68]

පූජ්‍ය ඥානසාර හිමියන් සිය කථනය අවසන් කරමින් "මින් පස්සේ කොතනක හෝ එක කහ සිවුරකට හරි අත තබා තිබුණොත්, පොලීසියට යන්න වුවමනාවක් නැහැ. කැලෑවේ නීතියට ඉඩදෙන්න" යනුවෙන් පැවසීය.

## පෙරහැර

අළුත්ගම - මතුගම පාරේ පිහිටි මහ පල්ලිය නැතහොත් ප්‍රධාන මුස්ලිම් පල්ලිය පසු කරමින් ගමන් ගත් පෙරහැර පිළිබඳව වීඩියෝ දර්ශනවල, රජයේ ප්‍රකාශවල සහ දේශපාලන පක්ෂවලින් පැවැත්වූ මාධ්‍යය සාකච්ඡාවල සාකච්ඡාවට ගැණුනි. සමාජ වෙබ් අඩවි මුළුල්ලේ ව්‍යාප්ත වූ සංස්කරණය නොකළ දර්ශන මෙන්ම සංස්කරණය කළ වීඩියෝ දර්ශන වලින්, ප්‍රචණ්ඩත්වය ඇති කිරීමට මුල් වූ පළමු ගල ගැසුවේ මුස්ලිම්වරුන්ද සිංහලයින්ද යන ප්‍රශ්නය ඉස්මතු කර තිබුණි. එහි වූ වීඩියෝ පට දෙකක් පිළිබඳව විශේෂයෙන් අප විසින් අදහස් පළ කළ යුතු යැයි සිතමු. එක් සංස්කරණය නොකළ දර්ශනයක පෙනෙන්නට තිබුණේ, ආරම්භක පිරිස ප්‍රධාන මාර්ගය දිගේ පෙරහැරෙන් ගමන් කරන අතර, තරුණයන් විසින් ගල් ඇහිඳ ගැනීමට බිමට පහත් නොවීම ගල් ගසනු ලබන ආකාරයයි. මුස්ලිම් සංවාදකයන් විසින් මෙම වීඩියෝ දර්ශනය වෙත අපගේ අවධානය යොමු කරන ලද්දේ පිරිස සංවිධානාත්මකව පැමිණි බවට සාක්ෂියක් වශයෙන් වේ. ඔවුන් ගල් ගෙන ආවා යැයි සිතෙන උර හා පොදි තරුණයන් අත

68 2014 ජුනි 15 වන දින බොදු බල සේනාව විසින් පැවැත්වූ රැළියේ වීඩියෝ දර්ශනයන්ගෙනි. වීඩියෝ පටය https://www.youtube.com/watch?v=66MNrsQLmgA වෙබ් අඩවියෙන් දැකබලා ගත හැක.

තිබුණි. කොල්ලකෑමේ සහ ප්‍රචණ්ඩත්වයේ සංවිධානාත්මක ස්වභාවය පිළිබඳව ඔවුන්ට ඇති අත්දැකීම් හේතුවෙන්, මෙය පටන් ගත්තේ කවුද යන කථාව කෙරෙහි මුස්ලිම්වරුන් පොදුවේ එතරම් උනන්දුවක් නොදැක්වූහ. සීනවත්ත පල්ලියේදී එක් පුද්ගලයෙකු විසින්, පැවසුවේ පළමු ගල ගැසුවේ කවුරුන්ද යන කතාව මෙහිදී වැදගත් නොවේ, මන්ද ගල් ගසන්නට පෙර සිටම සීනවත්තේ යම්කිසිවෙකුට හිමි වෑන් රථයක් පාරේ ගිනි ගනිමින් පැවතුණා යනුවෙන් වේ. මෙය ගල් ගැසුවා යයි චෝදනා කරන ප්‍රධාන පල්ලියට සෙනඟ ළඟාවීමට ප්‍රථම සිදුවූවක් ය. වෑන් රථය පෙර සිටම ගිනි ගත්තාද නැතහොත් පසුව සිදුවූවක්ද යන්න පිළිබඳව අපහට කාලය නිර්ණයක් සිදු කළ නොහැකි වූ නමුත් පාරේ දැවී ගිය වෑන් රථයේ සුන්බුන් ප්‍රධාන පල්ලිය අභිමුව දුටුවෙමු.

ඉහත කී වීඩියෝ පටයෙන්ම පෙනෙන පරිදි මුස්ලිම්වරුන් සිටින දෙසින් ගල් ප්‍රහාර නැගුණු බවට එක් සිංහල සංවාදකයෙක් විසින් කරන ලද ප්‍රකාශය මඟින් අපගේ අවධානය නැවත වරක් අදාළ වීඩියෝ පටය වෙත යොමු කරවන ලදී. සිදුවීමෙන් මසකට පසු මුදා හරින ලද දෙවන වීඩියෝ පටය හඬ, වචන පේළි සහිත ශිර්ෂ පාඨ සහ විවිධ කැමරා කෝණ වලින් ගත් දර්ශන මුසුකර පෙන්නුම් කරන එකකි. මෙම වීඩියෝ පටය මුස්ලිම් හා සිංහල පිරිසගේ සම්පූර්ණ දර්ශනයන් පෙන්නුම් කරන අතර, විශේෂයෙන්ම මෙහිදී විශේෂ කාර්ය බලකායේ සහ පොලිසියේ අක්‍රියතාවයද හසුකරගෙන ඇත. මෙහි ගල් විසි කරන මුස්ලිම් අය බොහෝ දෙනෙකුගේ දර්ශන සපයයි. එමෙන්ම වීඩියෝවේ වචන මඟින් මුස්ලිම් අය "අහිංසක නොවන" බව පෙන්වීමට උත්සාහ දරයි. මෙහි රූප රාමුව තුළ ඝන දුම් වලාවක් පෙන්වමින් එය "ගිනි ගන්නා සිංහල ගමක්" වශයෙන් ශීර්ෂ පාඨ සපයනු ලබයි. අද වන විට පවා ජාතික මට්ටමේ සාකච්ඡා සඳහා තොරතුරු සැපයෙන්නේ එකිනෙක පරයා ඉස්මතු වීමට වෙර දරන මෙවන් තොරතුරු දැක්වීම් මගින් වේ.

සිද්ධියෙන් පසු පැවති විවිධ ප්‍රචාරණ හරහා නිරූපණය කළාක් මෙන් මුස්ලිම් අය කිසිදු අවස්ථාවක තමන් "අහිංසක" යැයි පවසා නොමැති බව මෙහිදී ප්‍රකාශ කළ යුතුය. ඇත්ත වශයෙන්ම මෙය අප සමඟ කථා

කළ බොහෝ දෙනෙකුට අදාළ විය. පෙරහැර හා පහර දීම් පිළිබඳව කථා කරන විට, බලපෑමට ලක් වූ මුස්ලිම් පිරිස් ක්ෂණිකවම ඉස්මතු කර දැක්වූයේ ඔවුන් තමන්ගේ ආරක්ෂාව පිණිස ක්‍රියා කළ බවයි. උදාහරණයක් වශයෙන්, පෙරහැර සම්බන්ධයෙන් එක් පුද්ගලයෙක් අපට පැවසුවේ "පලස්තීනයේ මෙන්" සිංහල පිරිස් ආයුධ සන්නද්ධව හා සූදානම්ව පැමිණි නමුත්, තමන්ට පහර දුනහොත් ප්‍රතිප්‍රහාර එල්ල කිරීමට මුස්ලිම්වරුන් සතුව තිබුණේ ගල් පමණක් වූ බවයි. තවත් එක් උදාහරණයක් ගතහොත්, සීනවත්තේ එක පුද්ගලයෙක් පැවසුවේ, ප්‍රදේශයේ ජනතාවට ඔවුන්ගේ ආරක්ෂාව සලසා ගැනීමට හැකිව තිබුණු නමුත් විශේෂ කාර්ය බලකාය විසින් ඔවුන් වළක්වමින් කලහකාරී ආයුධ සන්නද්ධ පිරිස්වලට උදව් වූ බවයි. වැලිපිටිය, සීනවත්ත හා අධිකාරිගොඩදී සහ හමුදා පාරේදී කලහකාරී පිරිස් නැවැත්වීමට පුද්ගලයන් උත්සාහ දරා ඇති බවට සාක්ෂි අපි දුටුවෙමු. මෙහි ප්‍රතිඵලය වූයේ දෙදෙනෙකු මිය ගොස් බොහෝ දෙනා තුවාල වීමයි.

# 4 වන පරිච්ඡේදය

## ප්‍රචණ්ඩත්වය : පීඩාවට පත්වූවන්ගේ සාක්ෂි

පීඩාවට පත්වූවන්ගෙන් ලබාගත් සවිස්තරාත්මක සාක්ෂි මෙම කොටස තුළ අඩංගු වේ. පීඩාවට පත්වූ පුද්ගලයන්ගේ අත්දැකීම් එත්තු ගැන්වීමට සහ සැබැවින්ම සිදුවූ ප්‍රචණ්ඩකාරී සිදුවීම් හා එහි ප්‍රතිවිපාක පිළිබඳ දළ විශ්ලේෂණයක් පුළුල් පාඨක ප්‍රජාවට ලබා දීම පිණිස මෙම පරිච්ඡේදය අන්තර්ගත කිරීම වැදගත් බව අපි සිතුවෙමු. යුද්ධයෙන් ඔබ්බට යමින් ප්‍රජාතන්ත්‍රවාදී සාමයක් කරා යාමට ශ්‍රී ලංකාව තුළ ඇති වූ ඉතා දුෂ්කර පරිවර්තනය පිළිබඳව ඇති සාමාන්‍ය දැනීමේ කොටසක් බවට මෙම සිදුවීම පත්වනු ඇතැයි අපි අපේක්ෂා කරන්නෙමු. පරිච්ඡේදය අවසාන කොටසේ අප විසින් පුද්ගලයන්ගෙන් ලබා ගත් කතාවල ප්‍රධාන කොටස් සාරාංශගත කර ඇත. මෙම පරිච්ඡේදය පර්යේෂණ කණ්ඩායම විසින් සංචාරය කළ පහර දීම්වලට ලක් වූ ප්‍රදේශ පදනම් කරගෙන පෙළ ගැසී ඇත. කොළඹ දී සහ දුරකතන ඇමතුම් මඟින් කරන ලද සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් ලබා ගත් තොරතුරුද මෙයට අන්තර්ගත කොට ඇත.

අළුත්ගම කඩ වීදිය සහ දර්ගා නගරය යන ප්‍රදේශ වල කලබලය ඇති වූ අවස්ථාවේදීම ඊට සමගාමීව වෙනත් ස්ථාන කිහිපයකද ප්‍රචණ්ඩකාරී සිදුවීම් ඇති වී තිබූ බව සම්මුඛ සාකච්ඡා තුළින් පර්යේෂණ කණ්ඩායමට දැන ගන්නට ලැබුණි. පෙරහැර ගමන් ගැනීමේදී පසු කරගෙන ගිය ප්‍රධාන මාර්ගයට මදක් දුරින් මෙම ප්‍රදේශ පිහිටා තිබුණි. මෙම ප්‍රදේශවලට ද සන්නද්ධ කල්ලි විසින් (දර්ගා නගරයේ පහර දීම්වලට) සමාන ආකාරයෙන් පහරදී ඇත. දර්ගා නගරයේ සීනවත්ත, හමුදා පාර, අළුත් පාර, අධිකාරීගොඩ, වැලිපිටිය සහ මිහිරිපැන්න ප්‍රදේශ පහර දීම්වලට ලක් විය. මීට අමතරව, අළුත්ගම නගරයේ මුස්ලිම් ව්‍යාපාර ගිනි තැබීම් සහ කොල්ලකෑම්වලට ලක් වී ඇත. දර්ගා නගරයේ ප්‍රහාරයට ලක් වූ ප්‍රදේශය හඳුන්වනු ලැබූයේ "මායිම් ප්‍රදේශ" වශයෙනි. මෙය දර්ගා නගරයේ සිංහල නිවෙස්වලට සමීපයෙන් මුස්ලිම් ජනතාව වාසය කළ ප්‍රදේශයයි. මෙම

ප්‍රදේශයේ මුස්ලිම් නිවෙස්වලට කරන ලද පහරදීම්වලට අමතරව, පතිරාජගොඩ සිංහල නිවාස හයකටද පහර දී ඇති ආකාරය අපි දුටුවෙමු. පතිරාජගොඩ පිහිටා ඇත්තේ, දැඩිව හානියට පත් මුස්ලිම් ජනතාව වාසය කරන ප්‍රදේශවලට සැලකිය යුතු දුරකින් වුවත් එය මුස්ලිම් නිවාසවලින් වට වී පවතින ප්‍රදේශයකි. මීට අමතරව, අළුත්ගම නගරය පිහිටා ඇත්තේ ගාලු මාර්ගයේ අළුත්ගම-මතුගම මාර්ගයට එපිට දර්ගා නගරයට මුහුණලා ය. අධිකාරීගොඩ එනම්, මුස්ලිම් නිවාස සැලකිය යුතු ප්‍රමාණයකට හානි සිදු වූ ප්‍රදේශයේ එක් සිංහල නිවසකට ද පහර දීම් සිදු වී ඇත. මිහිරිපැන්න මාර්ගයේ, බෙන්තොට ගඟට මායිම්ව පිහිටි, සිංහල පුද්ගලයෙකුට අයත්ව තිබූ නිවාඩු නිකේතනයකට ද පහර දී ගිනි තබා තිබුණි.

බේරුවල දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් හානි වීම් පිළිබඳ ආගම් අනුව වෙන්කළ සංඛ්‍යා දත්ත සපයන ලදී. මෙහි අළුත්ගම, දර්ගා නගරය, වැලිපැන්න සහ බේරුවල ප්‍රදේශවල සිදු වූ හානි පිළිබඳව වාර්තා වී ඇත. මතුගම හා කළුතර දිස්ත්‍රික් ලේකම් බල ප්‍රදේශවල සිදු වූ හානි මෙහි වාර්තා වී නොමැත.

## නිවෙස්වලට සිදු වූ හානි

| | මුස්ලිම් | සිංහල |
|---|---|---|
| මුළුමනින් හානි වූ නිවාස | 31 | 2 |
| ස්වල්ප වශයෙන් හානි වූ නිවාස | 195 | 20 |

## ව්‍යාපාර වලට සිදු වූ හානි

| | මුස්ලිම් | සිංහල |
|---|---|---|
| මුළුමනින් හානි වූ ව්‍යාපාර | 69 | 5 |
| ස්වල්ප වශයෙන් හානි වූ ව්‍යාපර | 52 | 9 |

## දර්ගා නගරයෙන් අසන්නට ලැබුණු කතා

### සීනවත්ත

සීනවත්ත යනු මුස්ලිම් ජනතාව හා සිංහල ජනතාව ඉතා කිට්ටුවෙන් ඇසුරු කළ, මිශ්‍රව අසල්වැසියන් වශයෙන් ජීවත් වූ ප්‍රදේශයකි. අපි ප්‍රදේශයේ සිටි එකම මුස්ලිම් පිරිස වන ගෘහස්ථයන් තුනකින් (න්‍යෂ්ටික පවුල් තුනකින්) යුත් එක් විස්තෘත පවුලක් සමග කතා කළෙමු. ඔවුන්ට නිවසක් හා වෙළෙඳ ස්ථානයක් අහිමිව තිබුණි. පෙර දින රාත්‍රියේ පවුලේ මංගලෝත්සවයක් පැවැත්වුණ බැවින් පවුලේ සියලුම දෙනා ඇතුල් පාරක පිහිටි එක් නිවසකට රැස්ව සිට ඇත. ප්‍රහාරයට ලක්වූ නිවස සහ සාප්පුව පිහිටා තිබුණේ ප්‍රධාන මාර්ගයේ ය. පැය භාගයක් ඇතුළත තරුණ කණ්ඩායම් තුනක් හෝ හතරක් පමණ පැමිණ "තම්බි" යනුවෙන් අපහාසාත්මක වචන කෑගසා තිබේ.

සාක්ෂි කරුවෝ මෙසේ පැවසූහ :

> "මුලින්ම එක කණ්ඩායමක් ආවා. ඒකට නායකත්වය දුන්නේ භික්ෂූන් වහන්සේලා දෙන්නෙක්. ඒගොල්ලො ගල් ගහලා ගෙදර ඔක්කොම ජනෙල් ටික කැඩුවා. ඊට විනාඩි 15 කට පස්සේ තවත් කණ්ඩායමක් ආවා. ඊටත් විනාඩි කිහිපයකට පස්සේ තුන්වෙනි කණ්ඩායමක් ආවා. ඒගොල්ලො තමයි ගොඩක්ම දරුණු. ඒ අය හැම දෙයක්ම කඩලා, පොඩිකරලා, පුච්චලා දැම්මා. පස්සේ අපි ගින්න නිවන්න හදනකොට තවත් කණ්ඩායමක් ආවා. ඒ අය අවුරුදු 15 විතර තරුණ පිරිමි ළමයි වගයක්. විශේෂ කාර්ය බලකායෙන් ඒ අයව එළවලා දැම්මා. ඒවගේම තවත් පිරිසක් ඒගොල්ලන්ගේ මුහුණු ආවරණය කරගෙන ඇවිත් ගෙවල්වල තිබුණ බඩු බෑග්වල දමාගෙන අරන් ගියා."

විශේෂ කාර්ය බලකා සෙබළුන් අවට සිටි නමුත් තම නිවස ගිනි ගන්නා විට උදව් ඉල්ලීම පිණිස සෙබළුන් වෙත ගිය අවස්ථාවේ ඔවුන් තමන්ට පැවසුවේ ඔවුන් වෙනත් රාජකාරියක් සඳහා එහි පැමිණි බව සහ ඔහුට උදව් කළ නොහැකි බව යැයි මෙහිදී සාක්ෂිකරුවා විසින් සඳහන් කරන ලදී. ඔහු තවත් වරක් උදව් ඉල්ලීමට ගොස් ඇති අතර,

එවිට ඔහුට පවසා ඇත්තේ, "මල්ලි උඹලා ඇති කර ගත්තු දේවල් උඹලාම බලා ගනිල්ලා" යනුවෙනි.

කලහකාරී පිරිස් ඉවත්ව ගිය පසු සහ ගින්න මැඩ පැවැත්වුණු පසු ඔවුන් කාන්තාවන් සහ දරුවන් ද රැගෙන පල්ලි වෙත ගොස් ඇත. ඔවුන් ඉවත්ව ගිය පසු, නිවෙස කඩා එහි තිබූ කබඩ් ඇර මුදල් හා රන් ආභරණ කොල්ලකා තිබුණි.

ගිනි ගෙන තිබූ නිවසේ සහ සාප්පුවේ මැද ඇඳුම්, පොත් සහ අනෙකුත් ඇවිලෙනසුළු ද්‍රව්‍ය රැස්කළ පිරිස එයට ගිනි තබා දමා පුළුස්සා ගොස් තිබුණි. ඇසුරුම හෝ ඉවත් නොකළ අලුත් රෙදි සෝදන යන්ත්‍රයක් ඇතුළුව රැගෙන යා හැකි වටිනා ද්‍රව්‍ය කොල්ලකා තිබුණි. වෙළෙඳ සැලේ තිබූ ඡායා පිටපත් යන්ත්‍රය සහ ස්කෑන් යන්ත්‍රය පොරෝ පහරවලින් විනාශ කර දමා තිබුණි. මෙයින් බලපෑමට ලක් වූ එක් පුද්ගලයෙකු විසින් පැවසුවේ, මේක මංකොල්ල කෑමක්, මිස ජාතිවාදයක් නෙවෙයි යන වචන පෙළ වූ අතර මෙම වදන් පෙල අපගේ චාරිකාවලදී අපට නිතර අසන්නට ලැබුණු වදන් පෙළක් විය.

> "මේක මහා මංකොල්ල කෑමක් - මේක කිසිම ජාතියක්/ආගමක් ගැන නෙවෙයි".

එම ප්‍රදේශයේ ජීවත් වූ විශ්‍රාමික රජයේ සේවකයෙක් පහත ප්‍රකාශය කරන ලදී:

> "ඇඳිරි නීතිය ක්‍රියාත්මක වෙලායි තිබ්බේ. ඒ වගේම පාරෙන් එහා පැත්තේ තිබුණ නිවස ගිනි ගන්නා විට විශේෂ කාර්ය බලකා සෙබළුන් බයික් (යතුරු පැදි) වලින් යමින් සිටියා. මම ඔවුන්ට නිවස ගිනි ගන්නා තැන පෙන්නුවා. මේ සිදුවීම් වලට කලින් පවා විශේෂ කාර්ය බලකාය වාහනයකින් ගියා. ඒත් ඒ අය මේ පිළිබඳව කිසි තැකීමක් කළේ නැහැ. පොලීසිය පවා මේ ගැන ගණන් ගත්තේ නැහැ. මේ සියල්ල සිද්ධ වී අවසාන වූ පසු, අපේ සිංහල අසල් වැසියෝ ඇවිත් පැවසුවේ, ඔවුන් මෙහි අවුරුදු 52 ක් තිස්සේ ජීවත් වූ අතර කිසිදු ප්‍රශ්නයක් ඇති නොවූ බව හා මේ ගැන ඔවුන් කණගාටු වන බවයි. මට දැන් අවුරුදු 55 යි."

(එලෙසම ඔහු විසින් තවදුරටත් පැවසුවේ අසල් වැසියන්ගේ උපකාරයෙන් ඔහු ගින්න නිවා දමූ බවයි.)

සිද්ධිය විස්තර කරමින් පැවසුවේ, තවත් පුද්ගලයෙකු විසින් කලබලය පටන් ගත් පසු ඔවුන්ගේ නිවෙස්වලට විශේෂ කාර්ය බලකා සෙබළුන් පැමිණ ඔවුන්ට පල්ලියට යන ලෙස දැන්වූ බව සහ නිවෙස්වලට භටයින් විසින් ආරක්ෂාව සපයන බව සඳහන් කළ බවයි. විශේෂ කාර්ය බලකා භටයින් විසින් පවසා ඇත්තේ ඔවුන්ට පුද්ගලයින්ගේ ආරක්ෂාව පිළිබඳව සහතිකයක් ලබා දිය නොහැකිමුත්, ඔවුන් විසින් නිවෙස් ආරක්ෂා කර දෙන බවයි. එමනිසා මිනිස්සු නිවෙස් හැර පල්ලියට ගියහ. එහෙත් නැවත නිවෙස්වලට පැමිණ විනාශ කර දමා තිබූ නිවෙස් දුටු ඔවුන්ට, හැඟුණේ තමන්ව මුලා කර කලහකාරී පිරිස්වලට නිදහසේ සිය නිවෙස්වල ඇති වටිනා දේපළ කොල්ලකෑමට සහ ඔවුන්ගේ නිවෙස් ගිනි තැබීමට ඉඩ සලසා දී ඇති බවකි.

කොල්ලකෑම් පිළිබඳව කතා කරමින් පුද්ගලයෙකු විසින් මෙසේ පැවසීය:

> "අපි අපේ දුවගේ විවාහයට රත්තරන් බඩු වගයක් එකතු කරලා තිබුණා. එයා වෙනුවෙන් රත්තරන් පවුම් 9 ක මාලයක් හදලා තිබුණා. පිරිස් විසින් සියලුම රත්තරන් බඩු කොල්ලකා ගොස් තිබුණා. ඒ වගේම එහි පිටරටින් ගෙනාපු පිගන් බඩු වගයක්ද තිබුණා. ඔවුන් ඒවායෙන් භාගයක් අරගෙන ඉතිරිය පොඩිකර, කඩා බිඳ දමා, බිමට විසි කර දමා තිබුණා. අපේ වටිනා බඩු දාලා තිබුණේ ඇල්මා සේප්පුවක. ඔවුන් ඒක කඩලා බඩු ටික අරගෙන තිබුණා."

එම ප්‍රදේශයේම තවත් පුද්ගලයෙක් පැවසුවේ:

> "මෙය සවස 6 ත් 6.30 ත් අතර තමයි සිදු වුණේ. ඔවුන් මගේ බඩු බාහිරාදිය (වස්තුව) ගිනි තැබුවා පමණක් නොවේ ගෙදර තිබුණු බඩු හොරකම් කරගෙනත් ගියා. මාස දෙකකින් මම මගේ දුවව විවාහ කර දෙන්නයි ඉන්නේ. දුවගේ විවාහයට එකතු කරපු සල්ලිත් හොරකම් කරගෙන ගියා. දැන් මම ආර්ථික අතින් ගොඩක් අපහසු තත්ත්වයකයි ඉන්නේ. මගේ සියලුම බඩු භාණ්ඩයි, වත්කමුයි මංකොල්ල කාලා, විනාශ කරලා දැම්මා. කරුණාකරලා

ඔබතුමා මේ කතා රජයට සහ මුස්ලිම් සහෝදරයන්ට කියන්න උත්සාහ කරන්න.”

තවත් අවස්ථාවක, අදහස් පළ කළ එක් පුද්ගලයෙක් පැවසුවේ ඔවුන් අපරාධකරුවන්ව දුටු බව සහ අසල්වැසියන් ඔවුන්ට උදව් නොකළා පමණක් නොව තමන්ට පහර දෙන්නන් අතර ද සිටි බවයි.

මේක මගේ ගෙදර, මේක මගේ වාහනය (පිළිස්සුණු නිවසක් සහ වාහනයක් දෙසට අත දිගු කරමින් පවසන ලදී). ඔවුන් මේ ඔක්කොම දේපළ විනාශ කරලා අපේ ජීවිතත් විනාශ කරලා දැම්මා. ඒත් මේවා පිටස්තරයන් විසින් නෙවෙයි කළේ. මේවා කළේ අපිම උපකාර කරපු, කන්න බොන්න දීපු සහ අනෙකුත් දේවල් වලින් උපකාර කරපු අයම තමයි.

තුවාල ලැබූ සහ විශේෂ කාර්ය බලකාය විසින් උපකාර කිරීම ප්‍රතික්ෂේප කරන ලද තවත් පුද්ගලයෙකු මෙසේ පැවසීය:

ඔවුන් අතේ බලගතු අවි ආයුධ තිබුණා. මම ඒවායින් එකකින් පහර කා තුවාල වුණා (ඔහුගේ හිස පෙන්වමින්). මේ තියෙන්නේ මම ඉස්පිරිතාලේ හිටිය බව ඔප්පු කරන මගේ බෙහෙත් තුණ්ඩුව. මගේ හිස සම්බන්ධයෙන් මේ වාර්තාව මගේ ළඟ තියෙනවා. මම හිසට පහර කාලා ලේ ගලනකොට කවුරුත් හිටියේ නැහැ මාව ඉස්පිරිතාලෙට ගෙනි යන්න. එහි තිබුණේ විශේෂ කාර්ය බලකායේ ජීප් රථයක් විතරයි. මම ඔවුන්ට පිංසෙණ්ඩු වුණා මාව ඉස්පිරිතාලයට ගෙනි යන්න කියලා, එහෙත් ඔවුන් පැවසුවේ ඒ වෙලාවේ ඔවුන්ට කිසිවක් කළ නොහැකි බවයි.

තවත් අයෙක්, එනම් කාන්තාවක් විසින් කළ පහත ප්‍රකාශයෙන් ප්‍රචණ්ඩකාරී අවස්ථාවන් වලදී එම ස්ථාන අවට රැඳී සිටී සන්නද්ධ හමුදාව ඒවා මැඩ පැවැත්වීමට ක්‍රියා නොකළ බව සනාථ කරනු ලබයි:

හමුදාව හිටියේ පන්සල ළඟ - එය මෙතන සිට මීටර් 300 පමණ දුරක්. අපට කියා සිටියේ මේ ප්‍රදේශයටත් විශේෂ කාර්ය බලකාය මඟින් ආරක්ෂාව සපයාවි කියායි. ඒත් සිද්ධිය ඇති වෙන කොට ඔවුන් කිසිවෙකුත් මෙහි සිටියේ නැහැ. විශේෂ කාර්ය

බලකායේවත්, පොලීසියේවත් කවුරුත්ම හිටියේ නැහැ. ඒත් ඔවුන් මගේ කඩේට පහර දෙන කොට මම දැක්කා පොලිස් ජීප් එකක් මහා හයියෙන් පහු කරගෙන යනවා. මම ඔවුන්ව හොඳින්ම දැක්කා. මේ ඔක්කොම දේවල් සිද්ධ වෙන කොට විශේෂ කාර්ය බලකායෙන්වත්, පොලිසියෙන්වත් අපිට උදව් නොකළා පමණක් නෙවෙයි, අපරාධකාරයින්ට විරුද්ධව කිසිම ක්‍රියා මාර්ගයක් ගත්තෙත් නැහැ. ඔවුන් හැම දෙයක්ම පොඩි කරලා, පුච්චලා යනකන් කිසිම කෙනෙක් මේ පළාතට ආවේ නැහැ.

අපරාධකරුවන්ගේ විස්තර පිළිබඳව ඇයගෙන් විමසූ කල්හි ඇය පවසා සිටියේ ඔවුන් සියලුම දෙනා තමන්ගේ අසල්වැසියන් බවයි. එහි බොහොමයක් තරුණ පිරිමි ළමයි සිටි බව ඇය පැවසුවාය. එසේම කලහකාරී පිරිස ඉදිරියට ගොස් කතා කර තමන්ව බේරා ගැනීමට උත්සාහ ගත් තම අසල් වැසියන් පිළිබඳවද ඇය විසින් තවදුරටත් සඳහන් කරන ලදී.

ඔව්, ඒ අය ඇවිත් මට උදව් කළා. ඒගොල්ලො ඉස්සරහට ඇවිත් කට්ටිය එක්ක තර්ක කරලා අපිව ආරක්ෂා කළා. ඒගොල්ලො පිරිසට කිවුවා අපිට හිරිහැර කරන්නවත්, දේපළ වලට හානි කරන්නවත් එපා, අපි හොඳ මිනිස්සු කියලා. පිරිස ඒ අයට පරුෂ වචන වලින් බැණ වදිමින් පැත්තකට යන ලෙස පැවසුවා. එම නිවසේ දරුවකු ලැබීමට සිටි සිංහල කාන්තාවක් ද සිටියා. ඇයත් ඉදිරියට පැමිණ පිරිසට කිවුවා මේ අය හොඳ මිනිස්සු, ඒගොල්ලන්ටවත් ඒගොල්ලන්ගේ දේපළවලටවත් හානි කරන්න එපා කියලා. පිරිස ඇයටත් කන් දුන්නේ නැහැ. සියලුම මුස්ලිම් නිවෙස් හා වාහන වලට හානි පමුණුවමින් පොඩි කර දැමුවා. මගේ සාප්පුව මගේ ඇස් ඉදිරිපිටම කඩලා බිඳලා විනාශ කරලා දැම්මා.

තවද තම ආරක්ෂාව සලසා ගැනීමට උත්සාහ දරමින්, කලහකාරී පිරිස් එලවා දැමීමට උත්සාහ දැරූ පුද්ගලයන් පිළිබඳව කතා කළ පුද්ගලයෙකුද අපට හමු විය.

මෙතනින් බොදු බල සේනාව පෙරහැරක් ගියා, එහෙම නේද? ඒක පහු කරගෙන ගියාට පස්සේ ලොකු පන්සලට ගල් ගැසුවා

කියලා දෝෂාරෝපණයන් එක්ක ගොඩක් නොසන්සුන්කාරී තත්ත්වයක් තිබුණා. ඒක සිද්ධ වෙනකොට මම හිටියේ ගේට්ටුව ළඟ. ඒ වේලාවේදීම සිංහල මිනිස්සු කණ්ඩායමක් ගල් සහ පොලු අරගෙන මේ පැත්තෙන් ඉදිරියට ගියා. ඒ අය ඔක්කොම අපි හඳුනනවා. සමහර ගැහැණු අයද ඔවුන් අතර සිටියා. මම ගේට්ටුව ළඟ හිටිය නිසා ඒ අයට ගෙවල් වලට ගල් ගහන්න එපා කියලා කිව්වා. ඒ අය මට, නෑ මිස් අපි එහෙම කරන්නේ නැහැ කියලා ගේ ඇතුළට යන්න කිව්වා. ඒ පිරිස අතරත් ගෙවල්වලට ගල් ගහන්නවත් පල්ලිය ඇතුළට යන්නවත් එපා කියලා කියපු අය හිටියා. කොහොම වුණත්, එතන එක්කෙනෙක් දෙන්නෙක් පල්ලියට ගල් ගහලා තිබුණා. ගල් ගැහුවට පස්සේ පල්ලිය ඇතුළෙ හිටපු තරුණයන් කිහිප දෙනෙක් එළියට ආවා කවුද ගල් ගැහුවෙ කියලා බලන්න. අපිට පුළුවන්ද ඒගොල්ලො මුකුත් නොකරයි කියලා බලාපොරොත්තු වෙන්න?

ඒත්, පල්ලිය ඇතුළෙ ඒ වෙලාවේ හිටියේ තරුණයින් තුන් දෙනෙක් පමණයි. ඒ අය පිරිස පිටුපස්සෙන් දුවන් ගිහින් ඔවුන් එළවමින්, ගල් ගසන්නට පටන් ගත්තා. පල්ලියට පහර දුන්නාට පස්සේ අපිට ඔවුන් නිකන් බලන් සිටීවි කියලා හිතන්න බැහැ. තරුණයින් එකට එක කරන්න ගත් නිසා සෙනඟ දුවන්න පටන් ගත්තා. ඒගොල්ලන් දුවන්න ගත්තට පස්සේ, ගේට්ටුව ඇරලා මේ කාර් එකට ගලුයි බෝතලුයි විසි කරන්න ගත්තා. මේ කාර් එකට විතරක් නෙවෙයි, අනික් පැත්තේ තිබුණ මගේ සහෝදරියගේ වාහනයටත් අලාභයි, ඒවගේම පල්ලෙහා පාරේ තිබුණ බියුටි සැලෝන් එකකටයි, තව කඩ කිහිපයකටත් ගල් ගහලා පොඩි කෙරුවා. අර තරුණයින් තුන් දෙනා නොහිටියා නම් කට්ටිය ඇතුළට ඇවිත් කාර් එක අනිත් පැත්ත හරවලයි යන්නේ. අපිට ඒ තරුණයින් තුන් දෙනාට වැරැද්දක් කියන්න බැහැ. ඒ අය මේ සීමාවෙන් එහාට ගියේ නැහැ.

තවත් පුද්ගලයෙක් තමන් අත්දුටු දෙය පවසමින් කියා සිටියේ, පිරිස හරියටම 6.27 ට මස්ජිද් පාර, රෝහල පාර හන්දියේ එකතු වූ බවයි. (එම පුද්ගලයා නිරාහාරව සිටීමේ උපවාසය නිමා කිරීමේ අදහසින්

නිතරම ඔරලෝසුව දෙස බලමින් සිටි බැවින් සිද්ධිය සිදු වූ වේලාව ඔහු හරියටම දැන සිටියේය.) එහි ආසන්න වශයෙන් 20-25 ක් පමණ දෙනා පොලු මුගුරු අත තබා ගෙන සිටි බව ඔහු ප්‍රකාශ කර සිටියේය. මෙම පිරිස දර්ගා නගරයේ අළුත්ගම-මතුගම පාරෙන් ගිය පෙළපාලියෙන් වෙන්ව සිටියහ. ඔහු තවදුරටත් කියා සිටියේ එතනට රැස්වූ පිරිසට නායකත්වය සැපයුවේ රතුපාට ටී-ෂර්ට් එකක් (කමිසයක්) සහ කලිසමක් හැඳගත් කාන්තාවක් බවයි. ඇය නිතරම ගනේගම ප්‍රදේශයේදී ඔහු විසින් දැක ඇති කාන්තාවක් බව ඔහු ප්‍රකාශ කළේය.

එසේම, කෝලාහලයෙන් සිය කුඩා වෙළෙඳසැල, ෆාමසිය, වාහන දෙක සහ නිවස අහිමි වූ තවත් පුද්ගලයෙක් ද තම අත්දැකීම විස්තර කළේය. ඔහු පැවසුවේ පොලීසිය හා විශේෂ කාර්ය බලකාය බලා සිටියදීම ඔහුට ඔහුගේ වෑන් රථය විනාශ කරන සැටි බලා සිටීමට බල කළ බවයි. ඔවුන් වෑන් රථයට පොලු මුගුරු වලින් පහර දී වීදුරු බිඳ, පසුව වෑන් රථය පෙරළා එය ගිනි ගන්නට එයට පන්දමක් විසි කළ බව එම පුද්ගලයා පැවසුවේය. ඔහු පැවසුවේ, සිය වෑන් රථයට ගිනි තැබූ පුද්ගලයාගේ මුහුණ ඔහුට හඳුනා ගත නොහැකිමුත්, එම පුද්ගලයා රථයට ගිනි තැබූ පසු පොලිස් නිළධාරියෙක් විත්, ඔහුව ඉවතට ඇදගෙන ගොස් ප්‍රදේශ සීමාවෙන් ඔහුව ඉවත් කිරීමට කටයුතු කළ ආකාරය තමන් බලා සිටි බවයි. තමන් විශේෂයෙන්ම මෙහිදී ඉලක්කයක් වී සිටි බව තවදුරටත් ඔහු පැවසුවේය. කලහකාරී පිරිස් ඔහුගේ නිවසටද ගොස් ගරාජයේ තිබූ ඔහුගේ තවත් වෑන් රථයකට ගිනි තබා ඇත. එය පිටට පෙනෙන්නට නොතිබුණ වාහනයකි. ඔහු පැවසුවේ ප්‍රදේශවාසීන්ගෙන් එම පිරිස් වෙත මුස්ලිම් මිනිසුන්ගේ වත්කම් පිළිබඳව තොරතුරු ගොස් තිබූ බවයි. එලෙසම එම පුද්ගලයා පවසා සිටියේ ප්‍රදේශයේ සිටි මුස්ලිම් ජනතාවට තමන්ගේ ආරක්ෂාව සලසා ගැනීමට හැකියාව තිබූ බවයි. එහෙත් ඔවුන්ට විශේෂ කාර්ය බලකාය පිළිබඳව සැකයක් නොතිබුණු අතර විශේෂ කාර්ය බලකාය පැවසූ දේවල් පිළිබඳව ඔවුනට විශ්වාසයක් පැවතිණ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ගමේ සියලුම මුස්ලිම් මිනිසුන් පල්ලිය තුළ කොටු වී සිටී අතර මේ පුද්ගලයා තනි වී තිබේ. කිසිම මුස්ලිම් වැසියෙකුට ඇඳිරි නීතිය වේලාවේදී එළියට පැමිණීමට අවසර නොතිබුණ බවත්, "එහෙත් අපිව මෙලෙස බලෙන් තබාගෙන සිටියදී

අපේ ඇස් ඉදිරියෙන්ම අනිත් අය නිදහසේ පාරේ ගමන් කරනවා අපි දැක්කා. අපිට පාරෙන් අනිත් පැත්තටවත් පනින්න අවසර නැතිව තියෙද්දී අපි ඉස්සරහින්ම මෝටර් සයිකල්වල නැගලා සයිකලේ පසුපසත් කට්ටිය තියාගෙන ගියා" යයි ඔහු පැවසීය.

මෙය මුස්ලිම් ජනතාවගේ ආර්ථිකයට ඕනෑකමින්ම කරන ලද පහර දීමක් බව ඔහු පැවසුවේය. ඔහු තමන්ගේ ව්‍යාපාරය සාර්ථක කර ගැනීමට මඟපාදා ගැනීමට ඉතා මහන්සි වූ අතර බොහොම වැදගත් අයුරින් ජීවත් වූ බව පැවසීය. එහෙත් මෙම සිදුවීම තමන්ගේ මාර්ගයට විශාල බාධාවන් රැසක් දමා ඇත. "අපේ මාර්ගය නැවත සලසා දීමේ වගකීම රජය විසින් භාරගත යුතුයි. එච්චරයි මට කියන්න තියෙන්නේ."

## හමුදා පාර

පහත ප්‍රකාශය දර්ගා නගරයේ හමුදා පාරේ තනිව වාසය කරන මධ්‍යම පාන්තික වැඩිහිටි මුස්ලිම් කාන්තාවක් විසින් කරන ලද්දකි.

> මම ගේ ඇතුළෙ ආගම කියමින් හිටියෙ, ජනෙල් බිඳෙන සද්දෙ ඇහෙන කොට. මගේ නෑදෑයෝ කිවුවා මොකක් හරි කලබලයක් වෙන්න ඇති කියලා. මම මගේ කාමරය ඇතුළෙන් දොර වහගෙන හිටියෙ, ඒත් ඒ අය දොර කඩාගෙන ඇතුළට ආවා. එදා මගේ ගෙදර චණ්ඩි 500 ක් විතර හිටියා. ඒගොල්ලෝ හැම දෙයක්ම කඩලා බිඳලා දැම්මා. ඒගොල්ලො කූඩු වල හිටපු කුරුල්ලන්ව පවා මරලා දැම්මා. මගේ තාත්තාගේ පින්තූරයත් ඒ අය පොඩි කරලා දැම්මා.
>
> මම බේරුණේ ඒ අයත් එක්ක කතා කරපු නිසායි. මම දන්නෙ නැහැ මට ඒගොල්ලන්ට කතා කරන්න කොහෙන් හයියක් ආවද කියලා, ඒත් මම ඒ අයත් එක්ක කතා කළා. ඒගොල්ලො මට අත තිබ්බෙ නැහැ. මම ඒකට හරිම ස්තුතිවන්තයි. සමහරෙක් මට පහර දෙන්න හදන විට, අනෙක් අය කිව්වා, නැහැ එයාට ගහන්න එපා, එයා අහිංසකයි කියලා. ඉතින් ඒ අයගේ හිත්වල පුංචි හරි තෙතමනයක් ඇති. මම දන්නෙ නැහැ කොහොමද මම

තනියම ගෙයින් එළියට ආවේ කියලා. ඔවුන් මාව හමුදා පාරේ මීටර් 100 ක් විතර ඉස්සරහින් හිටපු විශේෂ කාර්ය බලකායේ අයට භාරදීලා කිව්වා, මෙයාව ආරක්ෂිතව ගෙනියන්න, මෙයා අහිංසකයි කියලා. හමුදාවේ අය මගෙන් ඇහුවා මට කොහෙටද යන්න ඕනෙ කියලා. පුදුමෙකට වගේ මට මගේ යාළුවාගේ නොම්බරය මතක තිබුණා. ඒගොල්ලො කිව්වා මාව එහෙට ඇරලවන්නම් කියලා. එතකොට මම කිව්වා මට තනියම යන්න බැහැ, මම කවදාවත් කොහෙවත් තනියම ගිහින් නැහැ කියලා. එතකොට එක නිළධාරියෙක් (ස්ථානාධිපති) කිව්වා එයා මාව මගේ යාළුවාගේ ගෙදරට එක්කගෙන යන්නම් කියලා. ඔවුන් මට හොඳින් සැලකුවා. ඒගොල්ලන්ට මං ගැන දුක හිතෙන්න ඇති.

මගේ දෙමව්පියන් ජීවතුන් අතර හිටියා නම් මට මේ දේවල් සිද්ධ නොවෙන්න තිබුණා. ඒ අය එහෙනම් මාව බලා ගන්නවා. මම අහිංසකයි. මම දන්නෙ නැහැ ඇයි මෙහෙම දෙයක් මට සිද්ධ වුණේ කියලා.

හමුදා පාරේ සිටින, විශාල ආර්ථික අලාභ හානියක් සිදුවූ ප්‍රවාහන සේවා ව්‍යාපාරයක් පැවති එක් පියෙක් සහ පුතෙකු සමඟ ද අපි කතා කළෙමු. ඔවුන් පිරිස සමඟ කතාබස් කොට සිය දේපල ආරක්ෂා කර ගැනීමට සහ ඔවුන් සමඟ ගැටී තම ආරක්ෂාව සලසා ගැනීමට ද උත්සාහ දරා ඇත. පහත ඇත්තේ ඔවුන්ගේ කතාවයිඃ

පියාඃ

හවස හතට විතර ඒගොල්ලො ගේට්ටුව කඩාගෙන ගේ ඇතුළට ආවා. අපි ඒ අය නවත්වන්න අපේ උපරිමය කළා. අපි ඔවුන්ට කතා කළා, ආයාචනා කළා, අපේ වාහනවලටයි, ගෙදරටයි ගිනි තියන්න එපා කියලා. ඒත් ඒගොල්ලො අපිට අපහාසාත්මකව බැණ වැදුණා. අපි ඔවුන් සමඟ දබර කරලා බේරෙන්න උත්සාහ කළා. අපි පැනලා යන්න හැදුවත් පිරිස එන්න එන්නම වැඩි වුණා. මේ කලබලෙන් මමයි මගේ පුතායි දෙන්නම තුවාල වුණා. ඔවුන් වත්තේ හැම තැනම ඇවිදලා අතට අහුවෙන හැම දෙයක්ම විනාශ කළා. ඔවුන් මෝටර් බයික් දෙකෙන් තෙල්

අරගෙන, මිදුලේ තිබුණ ලොරි වලටයි වෑන් වලටයි ගිනි තිබ්බා. ඒගොල්ලො අපේ සේරම වටිනා දේවල් හොරකම් කරගෙන අනිත් සියල්ලම විනාශ කරලා දැම්මා. අපේ ඔක්කොම ලියකියවිලි - ඔප්පු, උප්පැන්න සහතික සේරම විනාශ කළා.

පුතා:

මගේ තාත්තා මෙහෙ අවුරුදු 40ක් තිස්සේ එයාගෙම ඉඩමේ ජීවත් වුණ කෙනෙක්. අපි මේ ස්ථානයේ ගොඩක් කල් ඉඳලයි ව්‍යාපාර කටයුතු කරන්නේ. ඒගොල්ලො මේ තැන විනාශ කරන කොට වාහන 7, මෝටර් සයිකල් 3 සහ මුළු නිවසම විනාශ කළා. අපිට අඳින්නවත් ඇඳුමක් නැහැ. ඒගොල්ලො අපේ ඔක්කොම වටිනා බඩු, මුදල් සහ රන් භාණ්ඩ හොරකම් කළා. ඒ අයට ගන්න පුළුවන් හැම දෙයක්ම ගෙදරින් ගත්තා. ඒගොල්ලන්ගේ චේතනාව වුණේ පුළුවන් හැමදේම කොල්ලකාලා, හොරකම් කරලා අතුරුදහන් වෙන එකයි. අපිව මරණ එක නෙවෙයි ඒ අයගේ චේතනාව වුණේ. මේ පහර දීම හවස 7ට විතර පටන් අරන්, 50ත් 60ත් අතර පිරිසක් අපේ නිවස වට කරලා පහර දීම කරගෙන ගියා. මගේ තාත්තයි මමයි කට්ටිය ඇතුළට එන එක නවත්තන්න පොර බැදුවා. ඒගොල්ලන්ට ඇතුළට එන්න පැය 3ක් විතර ගියා. මගේ පවුලේ අයත් ඇතුළෙ හිර වුණා. ඒකයි අපි පොර බැදුවේ. ඒක ගොඩක් වෙලා තිබුණා.

හමුදාවෙනුයි පොලීසියෙනුයි ආවේ නැහැ. විශේෂ කාර්ය බලකායේ අයවත් හිටියේ නැහැ. එතන එක ආරක්ෂකයෙක් හරි පොලීසියෙන් හරි හිටියා නම් අපිට අපේ හැම දෙයක්ම බේර ගන්න තිබුණා. අපේ ගේට්ටුවට වුණත් ගලකින් වත් ගහන්න බැරි වෙන්න තිබුණා. බලන්න, මේ සීරීම් සහ තුවාල දිහා (ඔහුගේ හිස, අත, උරහිස, පපුව සහ තුනටිය පෙන්වමින්). මගේ තාත්තාත් ගල් සහ යකඩ පොලු වලින් ගුටි කෑවා. එයා හෘද රෝගියෙක්, ලඟදි තමයි බයිපාස් එකක් (හදවත් සැත්කමක්) කළේ. එයා නිකන් පැනඩෝලුයි, වේදනා නාශකයි විතරක් ගන්නවා මුකුත් වෛද්‍ය නියමයක් නැතිව. දැන්, අපිට ඒක වුණත් දරන්න අමාරුයි. අපිට අපේ හැඳුනුම්පත පවා නැති වුණා.

මම හිතන්නේ සමහර අය අවට ප්‍රදේශ වලින් පැමිණි කට්ටියයි. අනිත් අය අඳුරන අය නෙවෙයි. මම ඔවුන් කලින් දැක තිබුණේ නැහැ. අපි මුස්ලිම් අයත් එක්ක විතරක් නෙවෙයි සිංහල අය එක්කත් කිට්ටුවෙන් ආශ්‍රය කළා. අපිට කවදාවත් හිතුණේ නැහැ ඒ අය අපිත් එක්ක වෛරෙන් හිටියෙ කියලා. මුස්ලිම් හෝ සිංහල අපි හැමෝම මිනිස්සු, ඒත් මේකද ශ්‍රී ලංකාවේ මිනිස්සුන්ට සලකන විදිහ? මගේ පවුලේ කට්ටිය ඇතුළෙ හිර වුණාම ඒගොල්ලන්ව එළියට ගන්න අපිට අවස්ථාවක් දුනනේ නැහැ.

හමුදා පාරේ වාසය කරන තවත් පුද්ගලයෙක්:

ඒගොල්ලො 7 ට විතර ගෙවල් කුඩු කරන්න පටන් ගත්තා. විශේෂ කාර්ය බලකායේ අය මේ හන්දියේ හිටියා. මම ගිහින් කිවුවා කට්ටිය ඇවිත් ගෙවල් කඩමින් වාසි ප්‍රයෝජන ගන්නවා, ඒක නිසා කරුණාකරලා එතනට එන්න කියලා. ඒගොල්ලො කිවුවා මට යන්න, ඒගොල්ලො ඒක බලා ගන්නම් කියලා. ඒ අය ආවේ නැති වුණාම මම දෙවෙනි පාරටත් ගියා. ඒ වෙලාවෙදීත් ඒ අය එච්චර සැලකිල්ලක් දැක්වුවේ නැහැ, මට අපහාසාත්මක වචන වලින් බැණ වැදුණා. "උඹේ, ***** පලයන් යන්න මෙතනින්" යයි ඔවුන් පැවසුවා. තුන්වෙනි පාර මම ගිහින් එයාට කිවුවාම, ඒ වචන වලින්ම මට බැණලා, හැම තිස්සෙම මම ෂර්ට් මාරු කරන් ඇවිත් වෙනත් පුද්ගලයො වගේ පෙනී ඉන්නවා කියලා මට අනතුරු ඇඟෙව්වා. ඒ අතරතුර කට්ටිය ගේ කුඩු කරලා ගිනි තියලා තිබුණා.

අපේ සමහර කොල්ලො එකතු වෙලා පහර දෙන්නන්ව එළවලා දැම්මා. ඒක නිසා ඒගොල්ලො පැනලා දිව්වා, පස්සේ විශේෂ කාර්ය බලකායෙ අය ආවෙත් ඒ අය දිව්ව පැත්තෙන්ම තමයි. විශේෂ කාර්ය බලකායෙ අය වෙඩි තිබ්බා. හැබැයි ඒ පහර දීපු අයට නෙවෙයි අපිටයි.

දරුවන් සමඟ සිය නිවස ඇතුළේ සිර වූ කාන්තාවකගේ සාක්ෂිය:

හදිස්සියේම හවස 6.30ට විතර කට්ටියක් අපේ ගේට්ටුවට ගල් ගහන්නයි, යකඩ පොලු වලින් ගහන්නයි පටන් ගත්තා. ඒ

වෙලාවෙ මම ගෙදර ළමයි එක්ක තනියමයි හිටියේ. දරුවන්ගෙන් එක්කෙනෙක් තරුණ ගැහැණු ළමයෙක් සහ අනිත් කෙනා පුංචි පිරිමි ළමයෙක්. අපි බය වෙලා නාන කාමරයට දුවලා ගිහින් දොර වහ ගත්තා. ඊට පස්සෙ ඒගොල්ලො ගිහින් ආපහු සැරයක් ආවා. ඒ අය ආපහු ඇවිත් අපිට පරුෂ වචන වලින් බැන්නා. ඔවුන් මහා සද්දෙන් පරුෂ වචන වලින් අපිට බැණ වදිමින් එළියට එන්නයි කිව්වා. ඒගොල්ලො කෑගැහුවා, ඒගොල්ලො ඇවිත් තියෙන්නෙ ආයුධත් එක්කයි, අපිව මරන්න ඕනෙයි; ඒ වගේම කොහොම හරි අපිව මරනවා කියලා. ටික වෙලාවකට පස්සේ අපිට ඇහුණා මිනිස්සු ගොඩක් කෑගහන සද්දෙයි, ජනෙල් වීදුරු බිඳෙන සද්දෙ වගේම දොරවල්, කබඩ් සහ බඩු මුට්ටු කැඩෙන සද්දයි ඇහුණා. පස්සේ අපිට තේරුණේ නැහැ මොනවාද සිද්ධ වෙන්නෙ කියලා ඒත් හදිස්සියේම අපිට ගිනි ඇවිලෙන සහ ගිනි දළු වල සද්දේ ඇහුණා. ඒ අය කෑගැහුවා ඒගොල්ලො ගිනි තියලයි තියෙන්නේ, හැංගෙන්නෙ නැතිව ඉස්සරහට ඇවිත් සටන් කරන්න කියලා. අපිට ඇහුණා ගින්දර පුපුරමින් පැතිරෙන සද්දේ. අපිට බේරෙන්න විදිහක් තිබුණේ නැහැ. ඒ වගේම අපිට එළියට එන්නත් විදිහක් තිබුණේ නැහැ ළමයි නිසා. මම අඬමින් අල්ලා දෙවියන්ට යාච්ඤා කළා. මම දෙවියන්ට කණ්නලව් කරමින් ඇහුවා, අපේ අවසානය මේ විදිහට සිද්ධ කරන්නද ඔබතුමාට ඕනේ, මේකද ඔබතුමාගේ කරුණාව? කියලා. මගේ පුතා ඒ වෙලාවේ ඇහුවා "අපි මැරෙන්නද යන්නේ?" කියලා. මගේ ළඟ එයාට දෙන්න උත්තරයක් තිබුණේ නැහැ. මම කිව්වා එයාට අල්ලා දෙවියන්ට යාච්ඤා කරන්න කියලා. එයාට විතරයි අපිව බේරන්න පුළුවන්, නැත්නම් අපි මැරෙයි කියලා. එතකොට මගේ දුව කිව්වා අපි මැරෙන්න කලින් කියන යාච්ඤාව කියමු කියලා.

(පසුව ඔවුන්ට නිවසින් එළියට එන්න හැකි වී තිබුණි)

## පතිරාජගොඩ

අපි පතිරාජගොඩ පදිංචි, මෙම සිද්ධියෙන් බලපෑමට ලක් වූ සිංහල පවුල් හමුවීමට ගියෙමු. එහි සිංහල පවුල් 6 ක් පදිංචිව සිටියහ. සියලු දෙනාම එකිනෙකාට ඥාති සම්බන්ධතා සහිත පෙදරේරුවන්ගේ

පවුල්ය. ඔවුන්ගේ නිවෙස් වලට 16 වෙනිදා සවස 6.45ට පමණ පහර දී ඇත. ඔවුන්ගෙන් කෙනෙක් පැවසූ පරිදි 250ක පමණ පිරිසක් ඔවුන් සිටින ස්ථානයට පැමිණ කණ්ඩායම් හතරකට බෙදී ගොස් ගෙවල්වලට පහර දීමට පටන් ගෙන තිබුණි. එක් කාන්තාවක් පැවසුවේ ඔවුන් දොළොස් දෙනෙක් එක් කාමරයකට වැදී දොරවල් වසා ගෙන සිටි බව සහ පිරිස කුමක් කළේද යන්න නොදැක්ක බවයි. පිරිමි අයගෙන් කෙනෙක් පැවසුවේ පිරිස කණ්ඩායම් හතරකට බෙදී ගොස් නිවෙස් හතරට පහර දුන් බවයි. නිවසේ සිටි පුද්ගලයන් පැවසුවේ පැමිණි පිරිසගෙන් පිරිසක් පිටස්තරයන් බව සහ සමහර දෙනෙක්ව ඔවුන් හඳුනන බවයි. එසේම ඔවුන් අසල්වැසි මුස්ලිම් පිරිස බවද සඳහන් කරන ලදී. අනෙක් අයව කටහඬවල්වලින් ඔවුන් හඳුනාගෙන ඇත. සමහරෙක් කාමරයේ සැඟවී ඇති අතර, අනෙක් අය පලා ගොස් ඇත. ඔවුන් නැවත පැමිණෙන විට නිවෙස් ගිනි ගෙන තිබුණි. ඔවුන් පැවසුවේ සිය නිවෙස් වල පිළිස්සෙන ටයර් හමු වූ බවයි.

තම නිවාස ආසන්නයේම පදිංචි මුස්ලිම් අසල්වාසීන් මෙම පහරදීමට වගකිවයුතු යැයි ඔවුහු සිතති. මෙය පෞද්ගලික හේතුවක් නිසාවෙන් සිදු කරන ලද පහර දීමක් ලෙස ඔවුන්ට හැඟී ඇත. ඔවුන්ගේ රක්ෂාව සම්බන්ධයෙන් අසල්වැසියන් සමඟ තරඟයක් පැවත ඇති අතර, ඉඩම සම්බන්ධයෙන් උසාවියේ නඩු ද පවතී. තවදුරටත් ඔවුන් පැවසුවේ පිරිස දෙවරක් හෝ තුන්වරක් පැමිණි බවයි. පළමුවෙන් පැමිණි පිරිස විසින් ගිනි තැබූ ඒවා නිවා ඔවුන් දමා පන්සලට ගොස් ඇත. නමුත් ඔවුන් පැමිණෙන විට නැවතත් නිවෙස් ගිනිබත් කොට ඇත. ඔවුන් පැවසුවේ මුදල් හා රන් ආභරණ සොරකම් කොට ඇති බව සහ ඔවුන්ගේ විශ්ව විද්‍යාලයේ දෙවන වසරේ ඉගෙනුම ලබන දරුවාගේ පොත්පත් සහ බඩු මුට්ටු විනාශ කොට දමා ඇති බවයි.

මින් පෙරත් මෙවැනි ජාතිවාදී සිදුවීම් සිදුවී සිය නිවෙස් අසලින් පිරිස් ගමන් ගත්තත් කිසිවෙක් ඔවුන්ට පහර දී නොමැත. ඔවුන් පැවසුවේ තමන් කිසි විටෙකත් මෙවන් දෙයක් බලාපොරොත්තු නොවූ බවයි.

පෙදරේරුවන් ලෙස ඔවුන්ට දර්ගා නගරයේ මුස්ලිම්වරුන්ගේ නිවෙස් ඉදි කර දෙන ලෙස බොහෝ ඉල්ලීම් ලැබෙන බව ඔවුහු පැවසූහ. හෙලා දකින ස්වරයකින් ඔවුන් විසින් සඳහන් කළ ඔවුන්ගේ මුස්ලිම්

ජාතික තරඟකරුවන්ට වඩා වැඩි වැඩ ප්‍රමාණයක් ඔවුනට තිබිණ. ඔවුන් (මුස්ලිම් මිනිසුන්) උගත් අය නොවන බවද ඔවුහු පැවසූහ. ඔවුන් පැවසුවේ තමන්ට නගරයේ මුස්ලිම් අයගෙන් සැලකිය යුතු ගෞරවයක් හා තත්ත්වයක් පැවති බවයි. තමන් කෙතරම් සමීපව සිටියාද කිවහොත් ඒ අයගේ නිවාසවලට ඉදිරි දොරටුවෙන් ඇතුළු වී පිටුපස දොරටුවෙන් පිටවීමට තරම් සමීපව සිටියහ. එහෙත් දැන් ඒ සියල්ල විනාශව ගොස් ඇති බව ඔවුහු පැවසූහ. එසේම මුස්ලිම් ජාතිකයින් ඔවුන්ට තවදුරටත් වැඩ නොදෙන බව දැනගත් පසු ඔවුන් පවසන්නේ කනස්සල්ලෙනි. ඔවුන් පන්සලෙන් ද රජයෙන් තුන් වරක්ම ද සර්වෝදයෙන් ද උපාකාර ලබමින් සිටියහ. මින් පෙර මෙවන් ප්‍රශ්න නොපැවති අතර බොදු බල සේනාවේ රැස්වීම හේතුවෙන් මෙලෙස සිදු වූ බව ඔවුන්ගෙන් කෙනෙක් පැවසූ අතර, අනෙක් පුද්ගලයාට තිබුණේ වෙනත් මතයකි. අනෙක් පුද්ගලයා පැවසුවේ මෙම සිද්ධිය ඇති වූයේ පෝය දිනයේ භික්ෂු නමකට පහර දුන් නිසාවෙන් බවයි. "කොහොමද කවුරුත් ඒකට උත්තර නොදී ඉන්නේ?" යැයි ඔහු පැවසීය. එසේම පැමිණිල්ල ලියා ගැනීමට හෝ පහර දෙනු ලැබූවන් අල්ලා ගැනීමට හෝ අළුත්ගම පොලීසිය විසින් කිසිදු ක්‍රියාමාර්ග යක් ගෙන නොමැත. ඔවුන් පැවසුවේ භික්ෂුව පොලීසියේ රඳවා තබා ගැනීමෙන් භික්ෂුවට අවමන් කර ඇති බවයි. අළුත්ගම පොලීසිය මුස්ලිම් අයට උදව් කළා යයි හැඟීමක් පැවතුණි. ඔවුන්ට හැඟෙන්නේ තමන් පහර දීමට ලක් වූයේ, පිරිස් විසින් තමන්ද පෙරහැරට සහභාගී වූ බව සිතූ නිසාවෙන් බවයි. ඔවුන් පැවසුවේ පහර දෙන්න පැමිණි පිරිසට ඔවුන් "අපි පෙරහරට ගියේ නැහැ. අපිට කරදර කරන්න එපා" යයි පැවසූ බවයි.

පහර දීමේ ආරම්භය හා පහර දුන් රටාව මුස්ලිම් පිරිසගෙන් අප දැනගත් ආකාරය හා සමාන විය. පහර දීම සිදු වූ වේලාව 6.45 හෝ ඊට ආසන්න වේලාවක් වීම, කුමන නිවස කාහට අයිතියිද යන්න පෙන්වීමට ප්‍රදේශවාසීන්ට ඉදිරිපත් වීම, පහර දීමට පැමිණි කණ්ඩායමට 200ක පමණ පිරිසක් ඇතුළත් වීම, ඔවුන් නිවෙස් ගිනි තැබීමට කාමරවලට ටයර් දැමීම යනාදී කරුණු අනෙකුත් ප්‍රදේශවලින් ලබා ගත් කතාවන් සමඟ සමානකමක් පෙන්වන අතර, මෙය අනතුරු හැඟවීමක් මෙන්ම කුතුහලය ද උපදවනු ලබයි. ඒ පැමිණියේ මුස්ලිම් අය බව කීමට සිංහල මිනිසුන්හට කිසිදු සැකයක් නොතිබුණි.

කෙසේ නමුත්, මෙම නිවාස 6 හැරුණු විට අවට වෙනත් කිසිදු නිවසකට හානි වී නොමැත. පහර දීම සිදු වූ වේලාව සලකා බලන කල එය මුස්ලිම් නිවෙස් වලට වූ පහර දීම් වලට පලිගැනීමක් වශයෙන් සිදු කරන ලද්දක් විය නොහැකි බව පෙනේ. වැලිපිටිය සිදුවීම හැර අනෙකුත් ස්ථානවල සිදුවීම්වලට සමගාමීව මෙය සිදු විය. මේ අවස්ථාවේදී විදුලිය නොපැවතුණ අතර, පහර දීම් සිදු වූයේ කළුවරේ පහර දෙන්නන් අත තිබූ එළියෙන්ය. අපට පැවසූ පරිදි, ඉතා දීප්තිමත් ආලෝක ධාරා හේතුවෙන් ඔවුන්ගේ මුහුණු පැහැදිලිව දර්ශනය වී නොමැත. අවස්ථාවට ගොදුරු වූවන් පැවසුවේ තමන්ගේ අසල්වැසින් ඔවුන් කටහඬින් හඳුනාගත් බවයි.

## අධිකාරීගොඩ

පහත දැක්වෙන්නේ අධිකාරීගොඩ විපතට පත් වූ මුස්ලිම් පවුල් සමඟ සිද්ධිය සිදු වූ වහාම සිදු කරන ලද සම්මුඛ සාකච්ඡාවලින් උපුටාගත් කොටස් ය. ප්‍රදේශයෙන් අසන්නට ලැබුණු ප්‍රධානම කරුණු අතරට, විශේෂ කාර්ය බලකාය සිද්ධියට මැදිහත් වීම ප්‍රතික්ෂේප කිරීම, නිරන්තරයෙන් සිදු කළ නිවෙස් වල භාණ්ඩ කොල්ල කෑම්, ගිනි තැබීම සඳහා එම නිවෙස්වලින්ම සෝෆා කොට්ට, මෙට්ට, ඇඳුම්, පොත් වැනි ගිනි ඇවිලෙනසුළු දේවල් හෝ පාවිච්චි කරන ලද ටයර් යොදා ගැනීම ආදිය ඇතුළත් විය. එක් අවස්ථාවකදී, කාන්තාවක් ප්‍රකාශ කළේ, තමන්ගේ අසල්වැසි සිංහල නිවසකින් ගත් ටයර් සිය නිවස ගිනි තැබීමට යොදා ගෙන තිබූ බවයි. ඒවා පැමිණි කලහකාරී පිරිස හට ඔවුන් ලබා දුන්නාද නැතහොත් පිරිස විසින් ඒවා සොරා ගත්තාද යන්න පිළිබඳව ඇය ස්ථිර වශයෙන්ම නොදැන සිටියාය.

පහත සඳහන්ව ඇත්තේ අධිකාරීගොඩ සිදුවීම සම්බන්ධයෙන් වන ඇසින් දුටු සාක්ෂි වේ:

> අපි පොලීසියට දැනුම් දුන්නා. අපි දර්ගා නගරයේ විශේෂ කාර්ය බලකායේ අයට දැනුම් දුන්නාම එයාලා අපේ පපුවට තුවක්කුව තියලා කිවුවේ "තම්බිලා, උඹලා පලයන්, උඹලා පලයන්, අපි බලා ගන්නන්" (අපිට නොහොබිනා විදිහට කතා කරමින් ඒගොල්ලො හැම දෙයක්ම බලා ගන්නන්, අපිට යන්නයි කිවුවා). අපි එයාලාට

කිවුවා අපිට රණ්ඩු වෙන්න ඕනේ නැහැ, අපේ ගෙවල් ගිනි තියලා, අපිට ගිහින් අපේ පවුලේ අය බේරා ගන්න ඕනේ කියලා. උත්තරය විදිහට ඒගොල්ලො කිවුවේ, එයාලාට ඒවයින් වැඩක් නැහැ, ඒ අය (පවුලේ අය) විනාශ වෙන්නේ නැහැ, හැබැයි ඔයාලා එළියට ආවොත්, අපි ඔයාලාට වෙඩි තියනවා කියලායි. ඉතින්, අපි ගමේ මිනිස්සුන්ට කතා කළා ආරක්ෂාව ඉල්ලලා. අපි පොලිස් හදිසි ඇමතුම් අංකය 119 ට කතා කළාම කිවුවේ, "අපි එන්නම්, අපි එන්නම්" කියලා. හැබැයි කවදාවත් ආවේ නැහැ.

ඒගොල්ලො සේරම කබඩ් සුද්ධ කරලා වටිනා බඩු සේරම අරන් ගියා. අපේ ගෙදර, මැද්දෙන් කොටස් දෙකකට වෙන් වෙන්න බිත්තියක් තියෙනවා. ඉතින්, මේ පැත්තෙන් හොරකම් කරලා ඉවර වුණාම ඒගොල්ලො බිත්තය උඩට නැගලා අනිත් පැත්තට පැන්නා. ඒ වේලාවේ කිසිම පිරිමි කෙනෙක් හිටියේ නැහැ. ගැහැණු කට්ටිය විතරයි ගෙදර හිටියේ. ගැහැණු අය 15 දෙනෙක් විතර හිටියා. තරුණ ගැහැණු ළමයි හතර දෙනෙක් සිටියා. තුන් දෙනෙක් ළමයි එක්ක හිටියේ. ඒ වගේම වයසක කාන්තාවන් කිහිප දෙනෙක් හිටියා. මගේ නැන්දාට පොඩි ළමයි 3 දෙනෙක් ඉන්නවා. බාලම කෙනාට වයස මාස ගානයි. ඒගොල්ලො ඒ පුංචි අයට කිවුවේ, "තම්බිලා, උඹලාට ගිනි තියනවා. උඹලාට ඕනේ නම් මේ ඇවිල්ලා උඹලාගේ බඩු අරන් යන්න" (ඔවුන්ට නොහොබිනා අයුරින් බැණ වදිමින්, ගේ ගිනි තියන්නයි යන්නේ, ඕනේ නම් මෙතනට ඇවිත් ඔයාලාගේ බඩු අරගෙන යන්න යැයි පවසා ඇත). ඒ වගේ දේවල් කියමින් සහ සරදම් කරමින් ඔවුන් සතුටු වූවා. වාසනාවකට අල්ලහ් දෙවියො අපේ අයව බේරා ගත්තා. ඒගොල්ලන්ට ඉස්සරහට යන්න ඉඩ දුන්නා නම්, ආපු කට්ටිය ගැහැණු අයව දූෂණය කරන්න ඉඩ තිබුණා.

තරුණ කාන්තාවක් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡාවක්ඃ

එතන 50 ත් 60 ත් අතර කට්ටියක් හිටියා. ඒ අය ඔක්කොම තරුණ අය. ඒ අය සපත්තු (බූට්) දාගෙන හෙල්මට් දාලා මුහුණ වහගෙන හිටියේ.69

69 අධිකාරිගොඩ හෙල්මට් විකුණන සාප්පුවකට කඩාවැදී එය කොල්ල කා ඇතිබව අපට පසුව අසන්-නට ලැබුණා.

ඔව්, අපි පොලීසියට මේ සේරම කිවුවා. ඒත් ඒගොල්ලොත් මේකට සම්බන්ධයි. ඒගොල්ලො පහර දෙන්න ආපු කට්ටියට අවස්ථාව දුන්නා. ඒ අතර හාමුදුරු කෙනෙකුත් හිටියා.

එම ප්‍රදේශයේ ගිනි තබන ලද විශාල නිවසක හිමිකරුවෙක්:

ගෙදරට සිද්ධ වෙච්ච පාඩුව මිලියන 110 ක් විතර ඇති. මගේ බෑණා රත්තරන් බඩු හදන වැඩ කරන්නේ. මම බොරු කියන්නේ නැහැ. මගේ ලඟ තිබුණේ රු. 30,000/- ක් විතරයි. මගේ පුතා ගාමන්ට් ෆැක්ටරි වලට බෑග් වගේ දේවල් හදලා දානවා. එයාලා ළඟ ඒ වෙලාවෙ ලක්ෂ 7 ක් විතර වටිනා බඩු තොගයක් තිබුණා. ඒ අය ඒ සේරම කොල්ල කාලා. එතකොට එයාට රු. 50,000/-, 80,000/- සහ 110,000/- ක් විතර වටිනා එක එක වර්ගයේ ජුකී මහන මැෂින් 4ක් හරි 5ක් හරි තිබුණා. ඒගොල්ලො හොඳ මැෂින් ටිකයි, ඒවායේ කොටසුයි අරගෙන ඉතිරි ඒවාට ගිනි තිබ්බා. රට ඉඳන් ආපු මගේ පුතා එයාගේ මල්ලිගේ වෙඩින් එකට ලක්ෂ 20 ක් විතර වටිනා බඩු ගෙනාවා. මුකුත් ඉතිරි වුණේ නැහැ. ඒගොල්ලො හැම දෙයක්ම හොරකම් කර ගත්තා. ඉතින්, අපි මේ ඔක්කොම ගණන් බැලුවොත්, උදාහරණයක් විදිහට, එතන තිබුණ ගාමන්ට් බඩු වලින් විතරක් මිලියන 15 ක් විතර අපිට නැති වුණා. මගේ බෑණාගේ රත්තරන් බඩු ටික විතරක් මිලියන 40 ක් විතර වටිනවා.

මගේ පුතාගෙයි, බෑණාගෙයි, දුවගෙයි ගිණුම් විස්තර තිබුණ පොත්පත් සහ වාර්තා වගයක් මේසයක් උඩ තිබුණා. මේ පොත් ඔක්කොම ගිනි තිබ්බා. ඔක්කොම විස්තර තිබුණේ ඒ පොත් වල. මේ ලෙජර් නැති වීමෙන් ඒගොල්ලොගේ ලාභය තක්සේරු කර ගන්න බැරි නිසා ඒ අය හිටියේ ගොඩක් දුකෙන්. ආපු කට්ටිය හැම දේටම ගිනි තිබ්බා. ටීවී එකටයි කොම්පියුටර් එකටයිත් ගිනි තිබ්බා. මේක මගේ දුවට අයිති අළුතින් හදපු නිවසක්. මෙහෙ අල්මාරි 7 ක් තිබුණා. ඉතිරි වුණේ කැඩිච්ච යකඩ කැබිනට් එකක් විතරයි. ඒගොල්ලො සාලයේ තිබුණ සෝෆා පවා අරන් ගිහින් තිබුණා. මගේ දුවගේ ආභරණ සහ සල්ලිත් ඒගොල්ලො හොරකම් කරගෙන ගිහින් තිබුණා.

මම ඔයාලාට නාන කාමරය පෙන්වන්නම්. ඒගොල්ලො නාන කාමර උපකරණ පවා ගලවන් ගිහින් තිබුණා. (නාන කාමරය හා මහන මැෂින් 6 හෝ 7ක් විනාශ වූ නිවසේ පිටුපස පෙන්වමින් පවසන ලදී.)

ඒ අය සම්පූර්ණ නිල ඇඳුමෙන් ආවේ. ඒගොල්ලො බූට් සපත්තුයි හෙල්මට්ටුයි දාගෙන හිටියේ. ඒගොල්ලො ආයුධ සන්නද්ධවයි හිටියේ, අපිට එයාලාට කිසි දෙයක් කරගන්න බැරි වුණා.

අධිකාරීගොඩින් කාන්තාවක්:

එදා ජුනි 15 වෙනිදා සවස 6.30ට විතර, අපි අපේ හවස යාච්ඤාව කරමින් හිටියේ. අපිට ඇහුණා මිනිස්සු "තම්බිලා, තම්බිලා" කියලා කෑගහනවා. එතකොට මගේ සහෝදරයා ඇවිත් අපිට කිවුවා සිංහල කට්ටිය අපිට ගහන්න එනවා කියලා. අපිට ඒගොල්ලො කෑගහනවා ඇහෙනකොට අපි යාච්ඤාව අතරමැද නවත්තලා පල්ලියට දුවලා ගියා. අපි සල්ලිවත් වෙන කිසිම දෙයක්වත් අරගෙන ගියේ නැහැ. අපි නිකම්ම දුවගෙන ගියා. අපි එතන කන්ද උඩ තිබුණ ගෙදරට ගියා. හවස 6.45ට 7ට විතර අපිට අහන්න ලැබුණා ගෙවල් කොල්ලකාලා මිනිස්සුන්ට ගහලා කියලා.

ඒගොල්ලො ගේ ඇතුළට ඇවිත් ඉස්සරහ කාමරයේ තිබුණ පුටු සෙට්, වාහන සීට් වගේ බඩු අරගත්තා. ඒගොල්ලො කාමර ඇතුළට ඇවිත් අල්මාරි ඇරලා ලක්ෂ 1 1/2කුයි, රත්තරන් පවුම් 10කුයි අරගත්තා. අනිත් බඩුවලට ඒගොල්ලො ගිනි තිබ්බා. (ඇය අල්මාරියේ ඉතිරි වූ බඩු පෙන්වන ලදී.) තව LCD ටීවී එකයි, මහන මැෂිමයි, ලොකු පාඩම් මේසෙකුයි තිබුණා. ඒගොල්ලො ඔක්කොම එක ගොඩේ දාලා ගිනි තිබ්බා.

ඊට පස්සේ, 6.30ට සිංහල අය හා මුස්ලිම් අය අතර පටන් ගත්ත කෝලහාලය රෑ 11 වෙනකන් තිබුණා. මුස්ලිම් අය මේ පහර දීමට කොහෙත්ම සූදානමින් හිටියෙ නැහැ. පහර දෙන්නන් හෙල්මට් (හිස් ආවරණ) සහ බූට් සපත්තු දාගෙන හිටියෙ. ඒ අය ළඟ පෙට්‍රල් පුරවපු අරක්කු බෝතල් තිබුණා. ඒගොල්ලො මේ

බෝතල් පත්තු කරලා ගෙවල්වල වහලවල් උඩට වීසි කළා. අපේ පිරිමි ටික කොහේ හරි ගිහින් එන්න බැරුව හිර වෙලා හිටපු නිසා අපි ගැහැණු කට්ටිය තනියම හිටියේ.

අපි පොලීසියටයි විශේෂ කාර්ය බලකායටයි කතා කරලා දැනුම් දුන්නා. ඒත්, 11 වෙනකන් කවුරුත් ආවේ නැහැ. විශේෂ කාර්ය බලකාය හවස 6.30ට විතර ආවා. එතකොට අපේ තරුණ කට්ටිය ඒ අයට කිවුවා ඇති වෙමින් පවතින නොසන්සුන් තත්ත්වය. එහෙත් ඔවුන්ට, 'ඕගොල්ලො ඔක්කොම සටන් කරලා මැරෙන්න. අපිට ප්‍රශ්නයක් නැහැ' යයි කියා ඒ අය යන්න ගියා. ඊට පස්සේ, පැය 5ක් විතර යනකන් ඒගොල්ලන් අපේ කිසිම දුරකතන ඇමතුමකට උත්තර දුන්නේවත්, ආවේවත් නැහැ. හැමදෙයක්ම සිද්ධ වෙලා ඉවර වුණාම අපේ සහෝදරයා කොහේ හරි ඉඳලා මතු වුණා. ඒ කාලය අතරතුර ඒගොල්ලො හැම දෙයක්ම ගිනි තියලා ඉවරයි.

## ගිනි තැබීමෙන් නිවස අහිමි වූ අධිකාරිගොඩ සිංහල පවුලක්

එම නිවසේ පුතාට අනුව, සිංහල තරුණයින් කිහිප දෙනෙක් මෝටර් සයිකලයකින් මුස්ලිම් විරෝධී පාඨයන් කෑගසා කියමින් පාර දිගේ ගමන් කරනු ඔහු දැක ඇත. ඉන් ටික වෙලාවකට පසු සිංහල තරුණයින් පිරිස මුස්ලිම් අය ඔවුන්ට පහර දෙන්නේ යයි කියමින් කලබලයෙන් කෑගසමින් පැමිණ තිබේ. ඔහු මුස්ලිම් පිරිසක් විසින් සිංහල කණ්ඩායම් වෙත විලවුන් බෝතල් සහ සිසිල් බීම බෝතල් ප්‍රහාර එල්ල කරමින් පාර දිගේ එනු දැක ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සිංහල කණ්ඩායම් පසු බැස ඇත. පළමුව ඔහුට අසන්නට ලැබ ඇත්තේ එහි කලබලයක් හටගෙන ඇති බව සහ මුස්ලිම් පිරිස හදිසියේ ඔවුන්ගේ නිවෙස් අත්හැර යාමට උත්සාහ කරන බවයි. එනිසා ඔහු සාමාන්‍යයෙන් සිය වෑන් රථය නවතා තබන මුස්ලිම් නිවසට ගොස් වෑන් රියේ ආරක්ෂාව පිණිස එය සිය නැන්දාගේ නිවසට ගෙන ගොස් ඇත. "මුස්ලිම් අයගේ අතින් බෞද්ධ හිමිනමක් අපවත් වූ බව අපට අසන්නට ලැබුණා. ඉතින් අනිවාර්යයෙන්ම, සිංහල කොල්ලොන්ට ගොඩක් තරහ ගියා" යයි ඔහු පැවසුවා.

පිරිස අතර කොට කලිසම් ඇඳගෙන, අතේ පොලු තියාගෙන, අපි කවදාවත් අහපු නැති පරුෂ වචන කියමින් කාන්තාවන් ද සිටියා යැයි ඔහු තවදුරටත් පැවසුවේය. පිරිස අතර "වෘත්තීයමය පුද්ගලයන්" ද සිටි බව තරුණයා විසින් පැවසීය. මෙමඟින් කුමක් අදහස් කළේද යන්න පැහැදිලි නොවූවත්, මෙය පුහුණුවක් ලැබූ පුද්ගලයන් බව පැවසීමට භාවිතා කරන්නට ඇතැයි අපි විශ්වාස කරමු. ඇතැම් විට මොවුන් හමුදාව විය හැකිය. සිංහල පිරිසට බෝතල් වලින් පහර දීම නිසාවෙන් ඔවුන් කලබලයට පත් විය. ඔවුන්ට තුවාල සිදුවිය. ප්‍රාදේශීය සභාවට සම්බන්ධව සිටි තරුණයාගේ නැන්දණිය දිගින් දිගටම පොලීසියට කතා කළත්, ඔවුන්ගේ ඇමතුම් මාර්ග කාර්ය බහුලව තිබී ඇත. ඔහු පැවසුවේ ආසන්නයේ තිබූ හන්දියේ පාලනය මුස්ලිම් කණ්ඩායමක් අත පැවතුණු අතර, ඔහුගේ නිවසට ගිනි තැබූ බවයි. මෙය එම ප්‍රදේශයේ පැවති එකම සිංහල නිවස විය. ඒ පිළිබඳව කථා කරන මුස්ලිම් ජාතිකයින්ට අනුව සිංහල ජාතිකයින් මුස්ලිම් නිවසක් කියා වැරදීමකින් සිංහල නිවසක්ම ගිනි තබා ඇත. එහෙත් එය සිදු විය නොහැකිය. මන්ද ඔවුන් සීවලි ප්‍රතිමාව කඩා බිඳ දමා නිවස ගිනි තැබීමට ඉන්ධන වශයෙන් වෙසක් පහන් කූඩු යොදාගෙන තිබූ බැවිනි. තම නිවස ගිනි තැබූ බව සිංහල ජනතාව දැනගත් පසු ඔවුන් තවත් ප්‍රචණ්ඩකාරී වූ බව ඔහු විසින් පැවසීය. මිනිස්සු 7000 ක් පමණ පැමිණ ඇත. එහි බෝතල් පුරවාගත් ලොරි තිබී ඇත. මුස්ලිම් ජාතිකයින් භාවිතා කළේ 'විලවුන්' බෝතල් වේ. නමුත් සිංහල ජාතිකයින් ළඟ තිබී ඇත්තේ ලොකු බෝතල් වේ. ඉන් බොහෝමයක් අරක්කු බෝතල් විය. තවද විදුලියද විසන්ධිව තිබූ බව ඔහු පැවසීය. විදුලි පහන් නිවා දමා පහර දීම් සිදු කෙරුණේ විශාල ඒක්ෂණාලෝක (ෆ්ලෑෂ් ලයිට්) භාවිතයෙනි. මෙම එළි යොමු කෙරුණේ ඔවුන් වෙත සහ නිවෙස් වෙතටය. තමන්ට පහර දෙන්නේ තමන්ගේ අසල්වැසි මුස්ලිම් අය බව ඔවුන්ගේ කටහඬින් තමන් හඳුනා ගත් බව තරුණයා පැවසීය. එලෙසම ඔවුන් තරුණයාගේ ඥාති සොහොයුරියගේ නම භාවිතා කර ඇත. ඔවුන් ඇය ඇමතීමට පරුෂ වචන යොදා ගෙන ඇත. එනිසා මෙය ඔවුන්ව හඳුනන පිරිසක් විසින් කළ එකක් විය යුතුමය. පිරිසට (සිංහල අයට) සිංහල නිවසක් ගිනි තබා ඇති බව සැලවූ වහාම ඔවුන් පැමිණ ගින්න නිවා දැමීමට උත්සාහ දරා ඇත.

මේ පළාතේ ඉන්න මුස්ලිම් අය දැන් අපිව මඟ හරිනවා. ඒක හරිම අමිහිරියි. අපිත් එක්ක සෙල්ලම් කරපු ළමයි පවා දැන් අපිව ප්‍රතික්ෂේප කරනවා. අපිට කවදාවත් මේ පළාතේ ප්‍රශ්නයක් තිබුණේ නැහැ. අපි බොහෝම සමඟියෙන් එකට ජීවත් වුණා. අපි එකිනෙකාගේ වෙනස්කම් අඳුරගෙන එකට ජීවත් වෙන්න ඕනේ. ඉස්සරහ ගෙදර මළ ගෙදරක් තිබුණ වෙලාවේ, අපියි ඒ අයට ලයිට් දුන්නේ-අනිත් මුස්ලිම් පවුල්වල අය නෙවෙයි. මොකද මුස්ලිම් අය අතරෙත් ප්‍රශ්න තිබුණා. එනිසා ඒ අය අපිත් එක්ක ගොඩක් කිට්ටු වුණා. මේ පළාතේ මිනිස්සු නරක නැහැ. ඒත් කන්ද උඩ ඉන්න අය වෙනස්. ඒ අය ජිහාඩ් අයයි. ඒ අය තමයි අපේ ගෙදරට ගැහුවේ. ඒ අය පුංචි වෑන් වලින් හරක් ගෙනි යනවා. අපි කිහිප වරක්ම මේ පිළිබඳව පොලීසියට දැනුම් දුන්නත් ඒගොල්ලො කිසි දෙයක් කළේ නැහැ. පොලීසිය නීතිය ක්‍රියාත්මක කළා නම් මේ කිසි දෙයක් සිද්ධ වෙන්නේ නැහැ. මුස්ලිම් අය හෙල්මට් දාන්නේ නැහැ. ඒත් පොලීසිය කිසි දෙයක් කරන්නේ නැහැ.

මම මෙහේ තවදුරටත් ජීවත් වෙන්න කැමති නැහැ. මට වෙන කොහේ හරි තැනකට යන්න ඕනේ. මගේ සහෝදරයා බොහොම නිශ්ශබ්ද, තැන්පත් පුද්ගලයෙක්. ඒත් එයාටත් හිරිහැර වෙලා තිබුණා. එදා ඉඳලා එයා බොහොම කණස්සල්ලෙන් ඉන්නේ. ඒ වගේම මෙහෙ තවත් ඉන්න බැහැ, වෙන කොහේට හරි යමු කියලා එයා කියනවා. අපි කොහොමද මෙහෙ මේ මිනිස්සුන්ගේ මූණ බලාගෙන ජීවත් වෙන්නේ? මගේ තාත්තාට දෙමළ තේරෙනවා. මේ මිනිස්සු දැනගෙන හිටියේ නැහැ තාත්තාට ඒගොල්ලො කියන දේවල් තේරෙනවා කියලා. හොඳ වෙලාවට ඒ වෙලාවේ තාත්තා හිටියේ නැහැ. එයා වෙන කොහේ හරි තැනක එන්න බැරුව හිර වෙලා හිටියේ. තාත්තා ගෙදර ඉඳලා, දෙමළෙන් කතා කරන්න පටන් ගත්තා නම්, ඒ අය තාත්තා මුස්ලිම් කියලා හිතලා තවත් වැඩියෙන් කරදර කරන්න ඉඩ තිබුණා.

මෙය දෙපාර්ශ්වයේම "මෝඩ කට්ටිය" අතර ඇති වුණ ගැටුමක් වන බවත්, මෙම ගැටුම කණ්ඩායම් දෙකක ගැටුමක් දක්වා දික් ගැස්සී,

ඔවුනොවුන් එකිනෙකාට පහර දීගෙන එහි ප්‍රතිඵලයක් වශයෙන් තුන්වනුව ඔවුන්ගේ නිවස ගිනි තැබූ බවත් එම පවුලේ මව විසින් පැවසුවාය. ඇය විසින් තවදුරටත් පැවසුවේ තුවාල ලැබුවේ එකට එක කරන්න ගිය අය බවයි. තවද මේ සිදුවීම් සිදුවී හමාර බවත්, දැන් ඉදිරියට ගමන් ගතයුතු බවත් ඇය විසින් පැවසුවාය. එම මව හට ඇයගේ අසල්වැසියන් අතර තිබූ සම්බන්ධතාවන් ඉක්මනින් පෙර තිබූ මට්ටමටම පත්වේ යයි විශ්වාසයක් පැවතුණි. ඔවුන් ඉතා සමීපව අසුරුකර ඇති අතර කාලයත් සමඟ සියල්ල හොඳ අතට හැරේ යයි ඇය විශ්වාස කරන්නීය.

## අළුත් පාර (ෆතා හජියර් මාවත)

මෙය විශාල සහ ඉඩකඩ සහිත නිවෙස්වලින් සමන්විත පැහැදිලිවම ධනවත් වටපිටාවකින් යුක්තවූ ප්‍රදේශයක් විය. අපි යම්කිසි නිල ඇඳුමකින් සැරසුණු සේවකයන් පිරිසක් අතින් ඉතා යුහුසුළුව නැවත ඉදි කරමින් පැවති නිවසකට ගියෙමු. ඒ අය නාවික හමුදාවට අයත් බව අපි පසුව දැනගත්තෙමු. එම නිවස ඉදිරියෙන් පිහිටි එක් මුළුමනින්ම දැවීගිය නිවසක සුන්බුන් සහ වටපිටාවේ තවත් හානියට පත්වූ නිවෙස් අපහට දැක ගැනීමට හැකිවිය. මෙම නිවසේ අයිතිකරුට සේවා බලපත්‍රයක් ඇති බැවින්, ඔහු නිතරම සිය වැඩ කටයුතු සඳහා ඇමරිකාවට යනෙන වෙළෙන්දෙකි. ඔහුගේ ඉඩකඩ ඇති, පහසුකම් සපිරුණු අලුතින් ඉදිකර, 2013 මැයි මාසයේදී වැඩ අවසන් කළ නිවසට 15 වෙනිදා රාත්‍රියේ පහර දී ඇත. ඔහු පැවසුවේ පෙට්‍රල් බෝම්බ සහ වීදුරු ආදිය විසි කරනු ලැබුවත්, තමන් මෝටර් රථය ගේට්ටුවෙන් එළියට පදවාගෙන යාමට සමත්වූ බව සහ එමගින් එය පහරදීමෙන් රැකගැනීමට හැකිවූ බවයි. එවිට ඔහු ඒ ළඟම සිටි විශේෂ කාර්ය බලකා සාමාජිකයන් වෙත ගොස් තමන්ගේ නිවෙස් කඩා දමා ඇති බැවින් පැමිණ මෙයට උදව්වන ලෙස ඔවුන්ට පවසා ඇත. විශේෂ කාර්ය බලකා සාමාජිකයන්ගෙන් කිසිදු ප්‍රතිචාරයක් ලැබී නැත. පසුව ඔහු ආරක්ෂක සේවයේ යෙදී සිටින සිය ඥාති සහෝදරයාට කතාකොට විශේෂ කාර්ය බලකායේ ඔහු ඉහළ නිළධාරියෙකුට කථාකරන මෙන් පවසා ඇත. දර්ගා නගරයේ සිටි එම පුද්ගලයා විශේෂ කාර්ය බලකායේ ඉහළ තැනකට කථාකර ඇති අතර ඔවුන් පිළිතුරු දුන්පසු

ඔහු විස්තරය පවසා ඇත. ඔහු විශේෂ කාර්ය බලකායෙන් කතාකළ නිළධාරියාගේ ඇමතුම දර්ගා නගරයේ සිටි විශේෂ කාර්ය බලකායේ සෙබළුන්ට ඇසෙන්නට සැලැස්වීය. ඔවුන් හොඳයි සර්, හොඳයි සර් අපි දැන්මම කරන්නම් සර් යයි පවසමින් දුරකථනය ඔවුන්ගේ අණදෙන නිළධාරියාට ලබාදී ඇත. මෙයට පිළිතුරු වශයෙන් ඔහු සෙබළුන් යම් ප්‍රමාණයක් යොදවා තිබේ. මේ අනුව විශේෂ කාර්ය බලකා සෙබළුන්, පිරිස විසුරුවා හැරීමට අහසට වෙඩි තබා ඇති අතර, පසුව හටයින් නිවස දෙසට දිවගොස් වතුර ඉස ගින්න නිවා තිබේ. ඔහු විශේෂ කාර්ය බලකායේ එබඳු ඉහළ නිළධාරියෙක් හඳුනන්නේ කෙසේද කියා ප්‍රදේශයේ අණ දෙන නිළධාරියා මුස්ලිම් පුද්ගලයාගෙන් පසුව අසා තිබුණි. ඔවුන් එකිනෙකා හඳුනන බව ඔහු පවසා තිබුණි. ඔවුන් විදේශගතව සිටිනවිට ඔහු ඔවුන්ගේ නිවසට පැමිණ තිබේ. නිවස මුළුල්ලේත් නිවසේ ජනෙල්, දොර ජනෙල් රෙදි ආදියේත් වීදුරු කැබලි විසිර තිබූ බව සහ ගෘහ භාණ්ඩ අළුවලින් වැසී තිබුණු බවත් එක් සෝෆා කට්ටලයක් මුළුමනින්ම පිළිස්සී තිබුණ බවත් අපට දැනගන්නට ලැබුණි. නිවසට ඇතුළු වූ විට අපි දුටුවේ පිළිසකර කිරීම් වැඩ සම්පූර්ණයෙන්ම පාහේ අවසන්ව ඇතිබව සහ විස්සක් පමණ වන නාවික හමුදා සෙබළු පිරිසක් නිවසේ නැවත ඉදිකිරීම් කටයුතුවල නියැළී සිටින ආකාරයයි. මුස්ලිම් නිවැසියා විසින් ඔවුන්ට උදව්කළ විශේෂ කාර්ය බලකා නිළධාරියාගේ නම සඳහන් නොකරන ලෙස අපෙන් ඉල්ලා සිටින ලදී. මන්ද ඔහු තමන් ලද උදව්වට කෘතඥ වන අතරම එම නිළධාරියාව කරදරයේ දැමීමට ඔහුට අවශ්‍ය නොවන නිසාය. මෙය සංවිධානාත්මකව සිදුවූ පහරදීමක ස්වාභාවය පෙන්නුම් කරයි. නිසැකයෙන්ම ඔවුන් සෙබළුන්ට, විශේෂයෙන්ම විශේෂ කාර්ය බලකායට අණ දුන්නේ නම් පහසුවෙන්ම මෙම පහරදීම් නවත්වන්නට තිබුණි. එහෙත් ඔවුන්ට එලෙස නොකරන්නට උපදෙස් ලැබී තිබූ බව මෙයින් පැහැදිලිය.

## මිහිරිපැන්න පාර

පහත සාරාංශයෙන් කියවෙනුයේ දර්ගා නගරයේ මිහිරිපැන්න පාරේ විසූ සිංහල දේපල හිමිකාරිණියක් විසින් පවසන ලද්දයි:

මට දර්ගා නගරයේ, මිහිරිපැන්න පාරේ පර්චස් 66 ක ඉඩමක් අයිතිව තිබුණා. එය නිවාඩු නිකේතනයක් කරන්න නැවත සකස් කරමින් තිබුණේ. අපි ඉඩම මිලදීගෙන නිවස සම්පූර්ණයෙන් ඉදි කරලයි තිබුණේ. කලබලය සිද්ධ වෙන වෙලාවේදී, වත්තේ ගල් අතුරමින් තිබුණා. අපි සාමාන්‍යයෙන් ඉරිදාට වැඩ බලන්න යන්නේ. ඒත් මගේ මහත්තයාගේ නෑදෑයො කතා කරලා කිවුවා, එන්න එපා, මොකද ඒ පළාතේ කලබලයක් කියලා. අපේ ගෙදර වැඩ කරන කෙනාත් අපිට කිව්වා ගෙයින් එළියට බහින්න එපා කියලා.

15 වෙනිදා රෑ 10ට විතර මුස්ලිම් කට්ටිය ඇවිත් අපේ ගෙදරට පෙට්‍රල් බෝම්බ වලින් ගැහුවා. ඒගොල්ලො අපේ මුළු ගෙයයි, අපේ ජීප් එකයි, අපේ බෝට්ටුවයි ගිනි තිබ්බා. හැම දෙයක්ම සම්පූර්ණයෙන්ම ගිනි තිබ්බා. අපේ සේවකයාට තව ටිකෙන් එයාගේ ජීවිතයත් නැති වෙනවා. අපේ ඉඩම තිබුණේ ගඟට කිට්ටුවෙන්. එයා ගඟ ලඟින් තිබුණ නළයක් ඇතුළෙ හැංගිලා තමයි බේරුණේ. එතන මිනිස්සු 40 විතර හිටියා. ඒ අය දෙමළෙන් කතා කළේ. අපිට සිද්ධිය ගැන කලින් මෙහෙ අයිතිකාරයාගෙන් දැන ගන්න ලැබුණා (ඔහු මුස්ලිම් පුද්ගලයෙකි). ඔහු පැමිණි පිරිස මුස්ලිම් අය බව තමන් විසින්ම පැවසුවේ නැතත් අපේ නිවසේ වැඩ කරමින් සිටි පුද්ගලයා එය පැවසුවා.

අපේ ගේට්ටු අළුත් ඒවා, ඒ එකක් ලක්ෂ 5 ක් වෙනවා. ඒවාට සම්පූර්ණයෙන් පොරෝ පාරවල් ගහලා තිබුණා. ඒගොල්ලො අපි අළුතෙන් ගත්ත අපේ ජීප් එකයි, බෝට්ටුවයි ගිනි තිබ්බා. අපිට මිලියන 20ක විතර දේපල හානියක් සිදු වුණා. නාවික හමුදාවෙන් හැම දෙයක්ම නැවත ගොඩනගනවා. අපිට ඒ ගැන සතුටුයි. මේවා අපි අමාරුවෙන් හම්බ කරපු සල්ලි. කාටවත් වෙන කෙනෙක්ගේ දේපල වලට හානි කරන්න අයිතියක් නැහැ. අපි අළුත්ගම පොලීසියෙයි, අපරාධ විමර්ශන අංශයෙයි (සී.අයි.ඩී.) පැමිණිල්ලක් දැම්මා.

විදේශිකයෙකුට අයත්ව සිංහල පුද්ගලයෙකු විසින් පවත්වාගෙන ගිය තවත් නිවසක් පහරදීමට ලක්වුණා. එහෙත් එහි තිබූ අනෙකුත් මුස්ලිම් නිවෙස්වලට හානියක් වී තිබුණේ නැහැ. ඒ නිසා එය අනිවාර්යයෙන්ම මුස්ලිම් අය විසින් සිදුකරන ලද්දක්. අනෙක් පුද්ගලයන්ට පැමිණ

පහසුවෙන්ම මෙය වැළැක්විය හැකිව තිබුණා. එහෙත් ඒ අය එසේ කළේ නැහැ. මම හිතන්නේ මෙතන තිබුණේ ගොඩක්ම ඊර්ෂ්‍යාවයි. පහරදීමට ලක්වූ මුස්ලිම් නිවාස දිහා බැලුවොත් පෙනෙයි, මේ නිවාස අයිතිව තිබූ පුද්ගලයන් හොඳ ආර්ථික මට්ටමක් තිබුණු අය බව.

අපි මුස්ලිම් අයට ගොඩක් හොඳින් සැලකුවා. මම ඔවුන්ට නීතිමය කටයුතු වලදී උපකාර කර තිබෙනවා. මම කිසිදු මුස්ලිම් නීතීඥවරයෙක් උපකාර කිරීමට අකමැතිවූ මුස්ලිම් නීතීඥවරයෙකු වෙනුවෙන් පෙනී සිට ඔහුගේ නීතීඥ බලපත්‍රය අවලංගු වීම වැළැක්වීමට කටයුතු කළා. මගේ සැමියා ඔවුන්ගේ මළ ගෙවල්වලදී ඔවුන්ට උපකාර කළා. ඒත් දැන් අපිට ඔවුන් සමඟ හිනා වෙන්නවත් හිතෙන්නේ නැහැ. මොකද ඔවුන්ට අපිට උදව් කරන්න පුළුවන්කම තිබුණා. ඒත් ඒගොල්ලො එහෙම කළේ නැහැ.

## වැලිපිටිය

වෙඩි තැබීමක් හේතුවෙන් පුද්ගලයන් දෙදෙනෙකුගේ ජීවිත අහිමිවූ ස්ථානය මෙයයි. තවද, වයස අවුරුදු 19ක හා අවුරුදු 17ක දෙදෙනෙකුට වෙඩි පහරවලින් ලද තුවාල හේතුවෙන් සිය එක් පාදය බැගින් අහිමිවිය.

පහත ඇත්තේ සිද්ධිය ඇසින් දුටුවකුගේ සාක්ෂියක සාරාංශයකි:
දර්ගා නගරයේ වැලිපිටියේ කලබලකාරී තත්ත්වය දින ගණනාවක් පැවතුණි. සිකුරාදා එකතුවීමේදී හෝ 13 වෙනිදා ජුම්මා යාච්ඤා අවස්ථාවේදී යාච්ඤාවලට සහභාගී වීමෙන් වැළකී සිට පල්ලියෙන් පිටත සිට කලබල ඇති විය හැකි ප්‍රදේශ දෙසින් තමන්ට පැමිණිය හැකි උපද්‍රවකාරී දේවල් පිළිබඳව විමසිලිමත්වීමට උලමාවරු පුද්ගලයන් කිහිප දෙනෙකුට අවසර ලබා දී තිබුණි.

15 වෙනිදා රාත්‍රියේ කලබලය බෙහෙවින් පැතිර තිබූ අවස්ථාවේදී පිරිස රාත්‍රී යාච්ඤාව පැවැත්වෙන වේලාවේ (ඉෂා වෙලාව) එළියට වී සිටියහ. කලහකාරී පිරිසක් ආවත් ඔවුන් පසු බැස ගොස් ඇත. ඔවුන් ඇතැම් විට පසුබැස්සේ නැවත සංවිධානය වී වඩා ශක්තිමත්ව පැමිණීමට විය හැකිය.

ඉෂා යාච්ඤාව නිම වීමෙන් පසුව, අඹගහ හන්දිය, හමුදා පාර, අධිකාරිගොඩ, සීනවත්ත යන මායිම් ප්‍රදේශවල විවිධ ස්ථාන පිරිස් විසින් ගිනි තබනවා යන පුවත පැතිර ගියේය. මායිම් රැකවල් කිරීම සහ ගමට කට්ටිය ඇතුළුවීම වැළැක්වීමේ අවශ්‍යතාව අපට හොඳින් පැහැදිලිවී තිබුණි. මිනිසුන්ට විමසිලිමත්ව සිටීමට සහ අවශ්‍යතාවක් පැන නැගුණොත් කාන්තාවන් සහ ළමුන්ව පල්ලියට ගෙනෙන ලෙස පල්ලියෙන් දැනුම් දී තිබුණි.

හරියටම 10.59 ට, කාන්තාවන් සහ ළමුන්ව පල්ලියට රැගෙන එන ලෙස නිවේදනය කරන ලදී. වෙනත් පොදු ගොඩනැගිල්ලක් ආසන්නයේ නොතිබුණු බැවින් මුළු ගමම පල්ලිය අසලට රැස් විය. නිවේදනය කරන ලද්දේ කලහකාරී පිරිස් නැවත පැමිණි පසු සහ කලබලය ආරම්භ වූ පසුවය.

15 වෙනිදා උදෑසන, තමන් මුස්ලිම් පුද්ගලයෙක් යැයි හඳුන්වා දෙමින් මේජර් මොහොමඩ් නම් හමුදා බුද්ධි අංශයේ මුස්ලිම් සාමාජිකයෙක් පැමිණියේය. තමන් මුස්ලිම් පුද්ගලයෙකු යයි ඔප්පු කිරීමට ඔහු සුන්නත් කර ඇති බව පෙන්වීමට පවා ඉදිරිපත් විය. ඔහු පැවසුවේ මෙහි කිසිදු ප්‍රශ්නයක් සිදු නොවනබව සහ කිසියම් අපහසුතාවක් ඇති වුවහොත් ඔවුන් ඔහුට කතා කළ යුතු බවත්ය. ඔහු තවදුරටත් පැවසුවේ මෙහි මුර සංචාරයන් 3-4 පමණ සිදු වන බව සහ මුස්ලිම් නිළධාරීන්ද ඇතුළුව ප්‍රදේශයේ මුර සංචාරයන් සිදු වන බවයි.

මේ අවස්ථාවේදී පල්ලියට බොහෝ ආසන්නයේ පිරිස් රැස්ව සිටි අතර, මිනිස්සු ඔවුන්ගේ උපරිමයෙන් එම පිරිස් ඇතුළුවීම වැළැක්වීමට උත්සාහ දැරූහ. මන්ද පිරිස ඇතුළු වූයේ නම් කුමක් සිදුවේද යන්න ඔවුන් හොඳින්ම දැන සිටි නිසාය. පිරිස විශාල පොලු, ගල්, බෝතල්, පෙට්‍රල් බෝම්බ සහ දිගු පිහි භාවිතා කළහ. සෙනඟ පාරේ සිටියවුන් සමඟ රණ්ඩු වීමට පටන් ගත් විට, බොහෝ දෙනා 119 ට කතා කරන්නට උත්සාහ ගත් අතර, සමහරෙක් හමුදා බුද්ධි නිළධාරී මොහොමඩ්හට කථා කළහ. එම අවස්ථාවේදී ඔහු පැවසුවේ තමන් හමුදාවේ කෙනෙක් වන හෙයින් තමාට සම්බන්ධකම් පවතින්නේ හමුදාව සමඟ පමණක් බවත් විශේෂ කාර්ය බලකායේ කිසිවෙකුව හෝ සෙබළුන්ගේ වෙනත්

ශාඛාවක් පවතින තැනක් හෝ ඔහු නොදන්නා බව වූ අතර තමන්ට කුමක් හෝ කළ හැකිදැයි උත්සාහ කර බලන්නම් යනුවෙන් ඔහු පවසා තිබේ. අප පොලීසියට කතා කළ විට ඔවුන් අපි වාර්තා කළ දේ පිළිබඳ පුදුම වූ බවක් හඟවමින් ඉක්මනින් එන බවක් පැවසූ නමුත්, රණ්ඩුව නිම වී පිරිස් පළාත අත්හැර යනතුරු ඔවුන් පැමිණියේ නැත.

රණ්ඩුව අතරතුර එහි වාහන වල ඉදිරිපස ප්‍රධාන පහන් (හෙඩ් ලයිට්) හා සමාන එහෙත් එයට වඩා දීප්තිමත් විදුලි ආලෝකයක් වැලිපිටිය ජනතාව වෙත යොමු කර තිබුණි. ආලෝකය කෙතරම් දීප්තිමත්ද කිවහොත් එහිදී තමන්ට පහර දෙන්නන්ගේ මුහුණු පවා නොපෙනෙන තරමට මිනිසුන්ගේ ඇස් නිලංකාර කොට තිබුණි.

මිනිසුන්ව ශක්තිමත්ව (බිය වීමට ඉඩනොදී) සහ සන්සුන්ව උඩ තට්ටුවේ තබා ගැනීම පැවරී තිබූ, පල්ලියේ උඩ තට්ටුවේ සිට මෙම පහර දීම බලා සිටි, ඇසින් දුටු සාක්ෂිකරුවන්ගෙන් කෙනෙක් පැවසුවේ, ඔහුට හදිසියේම වෙඩි හඬක් ඇසුණු බව සහ ඉන් ටික වෙලාවකට පසු ඔහුගේ ගමේ පුද්ගලයන් කිහිප දෙනෙක් තවත් පුද්ගලයෙක්ව ඔසවාගෙන පල්ලියට එනු දුටු බවත් ය. ඒ වනවිට වෙලාව 12.53 විය. ඇසින් දුටු සාක්ෂිකරුවා පැවසුවේ ඔහු සිතන පරිදි වෙඩි තැබීම 12.30ත් 12.45ත් අතර සිදු වන්නට ඇති බවයි. ඔහු එසැනින් පහළ දිව ගිය අතර, ඔවුන් එම පුද්ගලයාව පල්ලියට යාබදව පිහිටි මඩ්රාසා ගොඩනැගිල්ලට ගෙන ගියහ. එවිටම තවත් පුද්ගලයෙක් ඇතුළට ඔසවාගෙන ගිය අතර, ඒ පිටුපස තව කෙනෙක් ද, ඊටත් පසු තවත් අයෙක් ද ඔසවා ගෙන ගියහ. ඔවුන්ට වෙඩි වැදී තිබුණු අතර ලේ ගලමින් සිටියහ. එක් පුද්ගලයෙකුගේ නළල මත විශාල රතු පාට මලක් පිපුණා වැනි වූ තුවාලයක් තිබූ බව ඔහු ප්‍රකාශ කළේය. තවත් අයෙකුගේ පිටෙහි ද එවැනිම වූ තුවාලයක් තිබුණි. තවත් දෙදෙනෙකුට ඔවුන්ගේ බත්කෙණ්ඩ ප්‍රදේශයට තුවාල වී තිබුණි. තවත් කෙනෙකුට ඔහුගේ පිටුපස ප්‍රදේශයට තුවාල වී තිබුණු අතර, තව කෙනෙකුට ඔහුගේ ශරීරයේ පැත්තකට තුවාල වී තිබුණි. ඔවුන් පවසනු ලැබුයේ උණ්ඩයක් ඔහුගේ ශරීරයේ සිර වී තිබෙන බවයි.

අපි වෙඩි පහර ලැබූවන්ගෙන් ඒ පිළිබඳව ඇසූ විට ඔවුන් අපිට පිළිතුරු සැපයූවේ පහත ආකාරයටයඃ

> "ආරක්ෂක අංශවලට තමන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙලක් තිබෙනවා. පළමුවෙන් ඔවුන් අනතුරු ඇඟවීමක් කරයි, දෙවනුව ඔවුන් කඳුළු ගෑස් භාවිතා කරයි, පස්සෙ ඇතැම් විට රබර් උණ්ඩ පාවිච්චි කරයි, අවසානයේදී තත්ත්වය සැබැවින්ම උත්සන්න වී කලබලයක් ඇති කළහොත් එහිදී ජීව උණ්ඩ භාවිතා කිරීමක් සිදු විය හැකියි. ඒ ආරක්ෂක අංශයෙන් නම්, ඔවුන් අනතුරු ඇඟවීමක් නොකළේ ඇයි? ඇයි ඔවුන් කඳුළු ගෑස් භාවිතා නොකළේ? ඔවුන් එය නගරයේ ප්‍රධාන පල්ලිය අසල 3000 ක් පමණ සෙනඟ විසුරුවා හරින්නට යොදා ගත්තාද? ඇයි අපිට ජීව උණ්ඩ භාවිතා කළේ - අපි 50දෙනෙක් විතර පල්ලිය වට කරගෙන ඇතුළෙ හිටිය සෙනඟ ආරක්ෂා කරමිනුයි හිටියේ. ඒ වගේම වෙඩි තිබ්බට පස්සේ අපිට දිගටම බෝතල් වලින් සහ ගල් වලින් පහර දෙන්න ගත්තා. ඒනිසා ඔවුන් සෙනඟ විසුරුවන්න උඩට වෙඩි තිබ්බ වගේ නෙමෙයි, පහර දීම දිගින් දිගටම සිද්ධ වුණේ ඒ පැත්තෙ කට්ටියගෙන්. ඔවුන් නම් අපිට වෙඩි තැබුවේ, ඇයි අපිට පස්සේ උදව් කළේ නැත්තේ? ඔක්කොටම වඩා අපි තමයි පහරදීමට ලක් වුණේ. ආරක්ෂක අංශයෙන් ඉන්න තිබුණේ පාරේ අපේ පැත්තෙන් අපිව සහ අපේ දේපල ආරක්ෂා කරමින්. නැහැ අපි හිතන්නේ නැහැ අපිට වෙඩි තිබ්බේ හමුදාවෙන් කියලා. අපි හිතන්නේ ඒ ත්‍රස්තවාදීන් කල්ලියක් කියලායි."[70]

ප්‍රචණ්ඩත්වය නැවතීම සම්බන්ධයෙන් ඔහු මෙසේ විස්තර කළේයඃ

> "අපි තුවාල ලැබුවන් ඉක්මනින් රෝහල්ගත කිරීමට උත්සාහ කරමින් සිටියේ, අපිට ප්‍රථමාධාර කිසිත් තිබුණේ නැහැ, අපි යුද්ධයකට සූදානම් වෙලා හිටියේ නැහැ. අපිට වාහනයක් සොයා ගන්න බැරි වුණා. එක් පුද්ගලයෙක් අපිට ලොරියක් දුන්නා, ඒත් ඒ පුද්ගලයා එය එලවන්නට බිය වුණා. ඒ වෙලාවෙදී, විශේෂ

---

70 එදා රාත්‍රියේ සිදුවීම් සම්බන්ධයෙන් විවිධ පැතිකඩයන් පැවතුණි. සවිස්තරාත්මක තොරතුරු සඳහා බලන්න, ඩී.බී.එස්. ජෙයරාජ්. Anatomy of Anti Muslim Violence : How BoduBalaSena mobs caused mayhem in Aluthgama and Beruwela 29th June 2014.http://dbsjeyaraj.com/dbsj/archives/30652

කාර්ය බලකායේද නැතහොත් පොලීසියේද යන්න නිශ්චිතවම කිව නොහැකි, රජයේ ජීප් රථ කිහිපයක්, ගැටුම ඇති වූ දෙසින් නොව අනෙක් පසින් පැමිණ තුවාල වූවන් රෝහල වෙත රැගෙන ගියා. කොහොම හරි, වෙඩි තැබීමේ සිද්ධියෙන් පස්සේ, අපි තුවාල ලැබූවන් පිළිබඳව සැලකිලිමත් වෙමින් කාර්යබහුල වන විට ප්‍රචණ්ඩකාරී තත්ත්වය හදිසියෙන්ම නැවතුණා."

"සිද්ධිය සිදු වන අතරතුරදී අපි රටේ අනෙක් පිරිසට සහ ලෝකයටම කිසියම් බැරෑරුම් දෙයක් සිදුවනබව පැවසීමට අපේ උපරිමයෙන් උත්සාහ කළා. ඒ වගේම අපිට පුළුවන් උපරිමයෙන් අපි සටන් කළා. අපිට පොලු සහ ගල් හැරෙන්න ආයුධ බොහෝමයක් තිබුණේ නැහැ" යයි ඔහු විසින් තවදුරටත් පවසන ලදී.

පසු දින හමුදා බුද්ධි අංශයේ "මුස්ලිම්" නිළධාරියා වැලිපැන්නට පැමිණ තිබේ. ඔහු සිද්ධිය සුළුකොට තැකීමට උත්සාහ දරණ බව ඔවුන්ට හැඟී ගොස් තිබුණි. ඔවුන් සිද්ධිය වැඩි කර පෙන්වීමට උත්සාහ දරණ බව ඔහු විසින් පවසා තිබුණි. මාධ්‍යයේ වාර්තා වූ හැම දෙයක්ම ඇත්තටම සිදු වුණාද? යයි ඔහු විසින් විමසා තිබුණි. එවිට ඔවුන් තමන් විසින් සොයා ගත් උණ්ඩයක කොටසක් ඔහුට පෙන්වා තිබුණි. ඔහු එය බලා, "මේකටද ඕගොල්ලො උණ්ඩයක් කියලා කියන්නේ?" යයි නොසැලකිලිමත් අන්දමෙන් යමක් පවසා ඇත. එහෙත් ඔහු එම උණ්ඩ කොටස සාක්කුවේ දමා ගෙන ඇති අතර, "ඔහු නැවත එය ඔහුගෙන් ඉල්ලීමට අපිට අවස්ථාවක් දුන්නේ නැහැ" යයි අපේ ඇසින් දුටු සාක්ෂිකරු පවසන ලදී.

තවද, ප්‍රචණ්ඩත්වයෙන් සතියකට පසු, සිකුරාදා ජුම්මා වේලාවට ප්‍රථම, රැස්වන්නන් අතට පත් කිරීමට මේජර් මොහොමඩ් විසින් අත් පත්‍රිකා මිටියක් ගෙනැවිත් තිබුණි. අත් පත්‍රිකා මුද්‍රණය කර තිබුණේ තමන් සංහිඳියාව උදෙසා කැප වූ සිංහලයන්, ද්‍රවිඩයන් හා මුසල්මානුවන් යනුවෙන් කියා ගන්නා සංවිධානයක් විසිනි. එලෙසම සදාචාරාත්මකබවට ඉඩ නොදෙන විදේශීය බලවේගයන් විසින් සිංහලයන් හා මුසල්මානුවන් අතර ප්‍රචණ්ඩත්වයන් ඇති කරන අතර ජනතාව මේ පිළිබඳව අවධානයෙන් සිටිය යුතු අතරම මෙයට වගකිවයුත්තන් අල්ලා ගනු ලබන බව එහි සඳහන් වී තිබුණි.

මෙම සංවිධානයට අයත් ලිපිනයක් හෝ දුරකථන අංකයක් අත් පත්‍රිකාවේ සඳහන්ව නොතිබුණි. එය සැක සහිත එකක් බව අපිට තේරුම් ගිය අතර ඒවා පල්ලියේ බෙදා හැරීම අවශ්‍ය යයි අපිට නොසිතුණි. ඇයි ඔහු වැනි රජයේ සේවකයෙක්, අත් පත්‍රිකාවේ තමන්ගේ ලිපිනය හෝ සඳහන් වී නොමැති සංවිධානයක අත් පත්‍රිකා බෙදා හරිනුයේ? ඇයි ඔහුම ඇවිත් අපිට ඒවා දුන්නේ? අපිට එය සැක සහිත වූ බැවින් අපි ඒවා බෙදා හැරියේ නැහැ. මේවා දර්ගා නගරයේ සියලුම ජුම්මා පල්ලි වලට ලබාදී ඇත්තා සේම ගාල්ලේදී ද බෙදා ඇති බව පසුව අපිට අසන්නට ලැබුණා.

## අළුත්ගම නගරය

කවර හෝ අවස්ථාවක මෙවැනි ස්වාභාවයේ සිදුවීමක් දර්ගා නගරයේ සිදුවුවහොත්, අළුත්ගම නගරයේ මුස්ලිම් සාප්පුවලටද නිරායාසයෙන්ම පහර දෙන බව අපට පවසන ලදී. 2006 දී සිංහල පුද්ගලයෙකු හා මුස්ලිම් පුද්ගලයෙකු අතර ජංගම දුරකථනයක් අළලා ඇති වූ හබය පවා අළුත්ගම නගරයේ සාප්පු කිහිපයකටම ගිනි තැබීමට හේතු වූ බව වෙළෙඳසැල් හිමියන් විසින් පවසන ලදී. ඔවුන්ගෙන් කෙනෙක් පැවසූ පරිදි, මෙම ප්‍රදේශ වල නිහාල් (සිංහල ජාතිකයකු) හා මොහොමඩ් (මුස්ලිම් ජාතිකයකු) කෙනෙකු අතර ඇති විය හැකි ඕනෑම ආරවුලක් ජාතිවාදී ගැටුමක් බවට පත් කිරීමේ වැඩි ඉඩකඩක් පවතියි. 2006 දී ඉලක්ක බවට පත් වූ සාප්පුම මෙවරත් ඉලක්ක බවට පත් වී තිබූ බව මෙහිදී සඳහන්ව ඇත. කෙසේ නමුත් මේ ජුනි මාසයේ සිදුවූ සිදුවීම් පසු නැවත ප්‍රකෘති තත්ත්වයට පැමිණීමට හැකිවේදැයි ඔවුනට එතරම් විශ්වාසයක් නැත. 2006 දී සිදු වූ අලාභහානි වලට අදාළව ගැසට් නිවේදනයක් මඟින් ලබා දීමට පොරොන්දු වූ සහනාධාර මේ වනතුරුත් ලබා දී නොමැත.[71]

එක් පුද්ගලයෙක් ගින්නෙන් මුළුමනින්ම විනාශයට පත් වූ, තරමක් විශාල ඇඳුම් සාප්පුවක හිමිකරුවෙක් විය.

71 මෙම තත්ත්වය ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක විසින් නීතිය හා සාමයේ පවතින තත්ත්වය යටතේ 2014 ජූලි මාසයේ පාර්ලිමේන්තු විවාදයේදී සාකච්ඡාවට භාජනය කරන ලදී.

එම සාප්පුව 12 වෙනිදා රාත්‍රියේ හිමිනම සමග ඇති වූ ගැටුමෙන් පසු ගල් මුල් ප්‍රහාර වලට ලක් වූ අළුත්ගම පිහිටි විශාලතම සාප්පු වලින් එකකි. සාප්පුවේ හිමිකරු අපට කියා සිටියේ, 15 වෙනි දින ඔහුගේ සාප්පුවට පහර දෙන ආකාරය, ඔහු තමන්ගේ දුරස්ථ පාලක සැඟවුණු කැමරාව (CCTV) මාර්ගයෙන් දුටු බවයි. සාප්පුවට පහර දෙනු ලැබූයේ සවස 6.50 ට පමණය. සාප්පුවට ගිනි තබනු ලදී. එසේ කර ඇත්තේ පිටුපස දොරෙන් සියලුම බඩු කොල්ල කා ගත් පසුවය. ගොඩනැගිල්ල සහ භාණ්ඩ තොග වලද එකතුවෙන් මිලියන 60 ක පමණ ආයෝජනයකින් සාප්පුව ගොඩනඟා තිබූ අතර, ඔවුන්ට කිසිවෙකුගේ උපකාරයක් නොමැතිව නැවත ප්‍රකෘති තත්ත්වයට පත් වීමට හැකි වෙතැයි හැඟීමක් නැත.

15 වෙනිදා රාත්‍රියේදී යම්කිසි දෙයක් සිදුවේවි යන තොරතුර ඔවුන්ට සිය ගනුදෙනුකරුවන්ගෙන් දැන ගන්නට ලැබුණු අතර, ඒ සඳහා තම ආරක්ෂාව පිණිස පෙර සූදානමක් ඇති කර ගන්නා ලෙස ඔවුන්ට කියා තිබුණි.

ඔවුන් දේශපාලනඥයන්ට කතා කිරීමට උත්සාහ දරමින් - ෆවුසි, අලවි මවුලානා සහ අනුර කුමාර දිසානායක යන දේශපාලනඥයන්ට මේ පිළිබඳව පැවසූ අවස්ථාවේදී, දේශපාලනඥයින් සියලුම දෙනා පවසා තිබුණේ, එහි ප්‍රමාණවත් ආරක්ෂාවක් සපයා ඇති බැවින් කිසිදු ගැටළු ඇති නොවන බවයි. එලෙසම නගරයේ සෑම තැනකම පාහේ-අඩියෙන් අඩිය - පොලීසිය හා විශේෂ කාර්ය බලකායේ සෙබළුන් යොදවා තිබූ හෙයින්, ඔවුන් පවා තම සාප්පු ආරක්ෂිතයැයි සිතන ලදී.

එක් පුද්ගලයෙක් පැවසුවේ, කිසිවක් සිදු වන්නට ඉඩ නොදෙනු ඇතැයි තමාට විශ්වාසයක් පැවතුණත්, කිසිවක් සිදු වන්නට අවස්ථාවක් ඉතිරි නොකළ යුතු යැයි සිතූ ඔහුගේ පුතා සාප්පුව වසා යනවිට වාසනාවකට මෙන් සියලුම භාණ්ඩ තොග සාප්පුවෙන් ඉවත් කරගත් බවයි.

ඇදුම් සාප්පුවේ හිමිකරු සහ තවත් කිහිප දෙනෙකු ද ඇතුළුව බරපතල ලෙස පීඩාවට ලක්වූ පුද්ගලයන් කිහිප දෙනෙකු විසින් ප්‍රකාශ කරනු ලැබූයේ, කලබලය සිදුවී සති දෙකකට පසුව අළුත්ගම

පැවති වාතාවරණය එතරම් හොඳ මට්ටමක නොවූ බවත් කුමක් සිදුවේද යන්න පිළිබඳව ඔවුන් බියෙන් හා අවිනිශ්චිත භාවයෙන් පසු වූ බවයි. අලාභහානි සහ විනාශ සඳහා පහසුකම් සැලසුවා යැයි සිතිය හැකි එක්තරා පුද්ගලයන් කණ්ඩායමක් අළුත්ගම නගරයේ සිටි බව ඔවුන් විසින් පවසන ලදී. සිංහල ව්‍යාපාරිකයන් විසින් පවා නොඉවසූ, පළාතේ "රස්තියාදුකාරයෝ" යයි පවසන පිරිසක් එහි සිටි බව ඔවුහු පැවසූහ. මොවුහු මුස්ලිම් ජනතාව පිළිබඳව තමන්ගේ පවතින, ලෙහෙසියෙන් පහ කළ නොහැකි ජනවාර්ගික උද්වේගයන් පිටකිරීමට උත්සාහ ගත්හ. මෙම පුද්ගලයන් ඇතැම් අවස්ථාවලදී සාප්පු වලට විදේශීය සංචාරකයන් කැඳවා ගෙනවිත් රැගෙනවිත් ඔවුන්ගෙන් ඒ වෙනුවට කොමිස් මුදල් බලාපොරොත්තු වන බව ඔවුහු පැවසූහ. අනික් පසින් ඔවුහු වෙළෙඳසැල් හිමියන් සමඟ එකඟතාවන් ඇති කරගෙන විදේශිකයන්ට අධික මුදලට භාණ්ඩ විකුණා, ඉතිරිය ඔවුන්ගේ සාක්කුවේ දමා ගනිති. ඔවුන් පැවසුවේ මෙම ක්‍රියාවලියට සහභාගි නොවන කිසිවෙකු හෝ කොමිස් මුදල් ලබා නොදෙන කිසිවෙකු හෝ වෙතොත් ඔවුන් එම පුද්ගලයන්ට තර්ජනය කරන බවයි. මුස්ලිම් වෙළෙඳසැල් හිමියන්ට නිතරම තර්ජනය කරනු ලැබූයේ වෙළෙඳසැල ගිනි තබනවා යනුවෙන් පවසමිනි. ඔවුන් පැවසුවේ මේ පිළිබඳව ඔවුන් පොලිසියේ පැමිණිල්ලක් දැමූ බව සහ ඒ සඳහා පොලීසිය විසින් වරදකරුවන්ට අවවාද කිරීම හැර වෙනත් කිසිවක් නොකළ බවයි. ඔවුන්ට හැඟී තිබුණේ මෙම සිද්ධීන් සිදු වූ විනාශයට දායක වූ බවයි.

ඔවුන් තවදුරටත් පැවසුවේ, ගිනිදැල් කොතරම්ද දැඩි වූයේද කියතොත් කොන්ක්‍රීට් පවා පිපිරීමට එය හේතු වූ බවයි. එමනිසා පෙට්‍රල් බෝම්බ වලට අමතරව ගින්දර පැතිරීමට තවත් යමක් භාවිතා කර ඇති බව ඔවුන්ට හැඟී ගොස් තිබුණි. ගිනි තැබීම්වල ස්වාභාවය සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම සඳහා රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව විසින් තවමත් අදාළ ප්‍රදේශවලට පැමිණ නොතිබිණි. අප එහි යන විටත් හමුදාව විසින් සුන්බුන් ඉවත් කර තිබුණි. රෙදිපිළි ගබඩාව මුළුමනින්ම විනාශ වී තිබූ අතර පිළිස්සීමෙන් එන ගන්ධය වාතය තුළ පැතිරී පැවතුණි. වරෙක රෙදිපිළි මධ්‍යස්ථානයක්ව පැවති එම ගොඩනැගිල්ලේ දැන් පවතින එකම සලකුණ වන්නේ විශාල

හිස් අවකාශය හා තට්ටු තුනක් පුරා පැතිරුණු තරප්පු පේළිය පමණි. ව්‍යාපාරික ස්ථාන වූ මෙම ස්ථානවල සැලැස්ම අනුව පිරිස් (පාරිභෝගිකයන්) සඳහා ඒවායේ ඉඩකඩ ප්‍රමාණවත් නොවන බව අයිතිකරුවන්ට හැඟී ගොස් තිබුණු අතර ගොඩනැගිල්ල කඩා දමා නැවත එය ඉදි කළ යුතුබව ඔවුන්ගේ අදහස විය. ඉංජිනේරුවෙකු විසින් ගොඩනැගිල්ල භාවිතයට නුසුදුසු බව තහවුරු කරනතුරු ඔවුහු බලා සිටිති. ඔවුන් ප්‍රකාශ කළේ, රජය විසින් ගොඩනැගිලි නැවත ඉදිකරදීමට ඉදිරිපත් වූවත්, රජයේ නැවත ඉදි කිරීමේ වැයම හරහා ගොඩනැගිලිවල පළුදු තැන් පුරවා, තීන්ත ගා පමණක් දෙනු ඇති බවක් ඔවුන් සිතන බවයි.

## වැලිපැන්න

කණ්ඩායම විසින් දෙවන දින එනම් 16 වෙනිදා කෝලාහලය දියත් වූ වැලිපැන්න ප්‍රදේශයේ සංචාරය කරන ලදී. අපි ගිනි තබන ලද වාහන සේවා මධ්‍යස්ථානය, සාප්පු වලට පහර දෙන ලද නගරය මුළුල්ලේ සහ ආරක්ෂක නිළධාරියෙකු මරණයට පත්වූ සත්ත්ව ගොවිපල කරා සංචාරය කළෙමු. පහර දෙන අවස්ථාවේදී ගොවිපලේ හිමිකරු එහි සිට නොමැති අතර, ඔහුට කලහකාරී පිරිස් හඳුනාගත නොහැකි වී තිබේ. ජීවිතය බේරාගත් ආරක්ෂක නිළධාරියාට දැඩි කළුවර නිසා කිසිවක් නොදුටු බවට පවසන මෙන් තර්ජනය කර ඇත. ගොවිපලේ කාර්යාලය සහ ගබඩා ස්ථානය (මඩුව) ගිනි තබා තිබූ අතර එහි අලාභය ලක්ෂ 5 ක් පමණ වේ. එම ප්‍රදේශයේම පිරිස් විසින් මෙය සිදු කර ඇති බව හිමිකරුවා සැක කරනු ලබයි.

## වැලිපැන්න නගරය තුළ

අපි සහෝදරයින් පිරිසක් සහ ඔවුන්ගේ අසල්වැසියන් සමඟ කථා කළෙමු. මෙම සහෝදරයින් පිරිසට වැලිපැන්න නගරයේ (ටවුමේ) වාහන සේවා මධ්‍යස්ථානයක් අයිතිව පැවතුණි. එහි උද්ගත වූ තත්වය අළුත්ගම සිදුවීමෙන් පැන නැගුණු නමුත් එය වඩාත් ව්‍යාප්ත වූයේ ප්‍රදේශයේ පුද්ගලයින් අතර වූ යම් යම් එදිරිවාදිකම් මත බව ඔවුන්ගේ හැඟීම විය. ප්‍රදේශයේ අසල්වැසි සිංහල මැරයෙකු විසින් මෙම ප්‍රහාරය සිදු කිරීමට පෙළඹ වූ බවක් ඔවුහු චෝදනා කරති. සිද්ධිය

සිදුවූ දින සිංහල මුදලාලිලා දෙනෙකුට මුස්ලිම් ජාතිකයකු සමඟ එක්ව පොලිස් ආරක්ෂාව ඉල්ලා සිටීමට සැලසුම් කර තිබේ. ඔවුන් අතර කිසිදු වාර්ගික එදිරිවාදිකමක් නොපැවති අතර, ඔවුන් පැවසුවේ සහ ඔවුන්ට අවශ්‍ය වූයේ කිසිවක් සිදු නොවන බවට වගබලා ගැනීම බවයි. පොලීසිය ඔවුනට එතරම් උපකාරී නොවීය. මුස්ලිම් පුද්ගලයින් පැවසුවේ, පොලීසියට සැබැවින්ම අවශ්‍ය වූයේ ගිනි ගැනීම් සිදුවනවා බැලීමට බවයි. එලෙසම රාත්‍රියේ යම්කිසි පහරදීමක් සිදුවන්නට යන බව ඔවුන්ට සිංහල මිතුරන් සහ ගනුදෙනුකරුවන්ගෙන් ද දැන ගන්නට ලැබුණු අතර, ඒ සම්බන්ධයෙන් කුමක් හෝ කරන ලෙස සහ අඩු තරමින් කාන්තාවන්ව හෝ නිවෙස්වලින් පිට කරන ලෙස ඔවුනට දැනුම් දී ඇත. එනිසා කාන්තාවන් හා ළමුන්ව ආසන්නයේ පිහිටි ඔවුන්ගේ ඥාතීන් වාසය කරන මුස්ලිම් ගමකට පිටත් කර හැර ඇත. ඔවුන් තවදුරටත් පවසා සිටියේ කොල්ලකෑම් සහ ගිනි තැබීම් සිදුවන අතරතුර පොලිසිය වටේ සිට බලා සිටී බවයි. ඔවුන්ගෙන් කෙනෙක් පොලිස් නිළධාරියෙකුට කෑගසූ විට පොලීසිය පවසා ඇත්තේ "අපිට කිසි දෙයක් කරන්න බැහැ. අපිට නියෝග ලැබිලා නැහැ" යනුවෙනි.

තරුණයන්ගෙන් කෙනෙක් ප්‍රකාශ කළේ තමන් ප්‍රතිප්‍රහාර එල්ල කිරීමට උත්සාහ කළ බවයි. ඔහු පොලිස් ඕ.අයි.සී. මහතාගේ කොලරයෙන් පවා අල්ලා, කිසිවක් නොකරන්නේ ඇයි යනුවෙන් ඔහුගෙන් විමසා ඇත. එවිට පොලිස් නිළධාරියා බවසා ඇත්තේ "මේකෙදී අපිට කරන්න කිසිම දෙයක් නැහැ. ඔයගොල්ලන්ට ඒ අය නවත්තන්න කරන්න පුළුවන් දෙයක් කරන්න" යනුවෙන්ය. ඔවුන් ගල්මුල් වලින් සහ පොලු වලින් නැවත පහර දී ඇත. ඔවුන් ප්‍රතිප්‍රහාර එල්ල කළ බැවින් කලහකාරී පිරිස් අධෛර්යයමත් වී තරමක් දුරට පාලනය වී ඇති අතර සුළු වේලාවකට පසු සාප්පු වලට පහර දීම නැවතී ඇත.

එම රාත්‍රියේ ඔවුන්ට පහර දුන් පිරිස වෙනත් කිසිවෙකුත් නොව තමන් හොඳින් හඳුනන අසල්වැසි ගමේ සිටින ප්‍රදේශයේ මැරයෙකුගේ යහළුවන්, නෑදෑයන් සහ ඔහුට ණය වී සිටි පුද්ගලයන් බව ඔවුහු පැවසූහ. එලෙසම ඔවුන් පැවසුවේ එම මැරවරයා බොදු බල සේනාවේ සාමාජිකයෙකු බවයි. ඉහත සඳහන් කළ සහෝදරයින් අපට පැවසුවේ එම ප්‍රදේශයේ මැරයාටත් ඔවුනට මෙන්ම වාහන සේවා

මධ්‍යස්ථානයක් අයිති බවයි. කලහකාරී පිරිස් විශාල ලොරියක නැගී පැමිණි අතර ඔවුන් සාප්පු සහ ගෙවල්වලට ගිනි තැබීමට ප්‍රථම සාප්පු ආදියෙහි භාණ්ඩ සොරකම් කර සහ කොල්ලකා ලොරියට පටවා ඇත. ඔවුන් බීමතින් සිට ඇත. වාහන සේවා මධ්‍යස්ථානයෙන් පසු ඔවුන් නගරයේ එක් ප්‍රධාන පාරක තිබූ සාප්පුවලට පහර දීමට පටන් ගෙන ඇත. ඔවුන් කාට කුමක් අයිතිව තිබූණේද යන්න දැන නොසිටි අතර බොහෝ සිංහල පුද්ගලයන්ට අයත්ව තිබූ සාප්පුවලට ද පහර දී ඇත.

පසු දින තමන්ට වූ පහර දීම් හා අභිමිවීම්වලින් සිදු වූ හානිය පිළිබඳව පැමිණිලි කිරීමට පොලීසියට ගිය මුස්ලිම් පුද්ගලයන් කිහිප දෙනෙකුවම සිංහල සාප්පුවලට පහර දීම සම්බන්ධයෙන් චෝදනා කර අත් අඩංගුවට ගෙන ඇත. සිංහල සාප්පු හිමිකරුවන් ඔවුන්ගේ සාප්පුවලට පහර දීම සම්බන්ධයෙන් මුස්ලිම් පුද්ගලයන්ගේ නම් ලබා දී ඇත.

එමෙන්ම ආසන්නයේ පිහිටි බෞද්ධ විහාරයට පහර දීම පිළිබඳව සාක්ෂිද ඇත. එහි වීදුරු සහ ගල්වැඩවලට හානි සිදුව ඇත. බලපෑමට ලක්වූ මුස්ලිම් පුද්ගලයන් හා පැවති කතාබහේදී මෙය සාකච්ඡාවට මතු නොවීය.

## බේරුවල

බේරුවල චීන කොටුව ප්‍රදේශයේ පිහිටි පන්සලේ ඝණ්ටාරය නාද වීමෙන් පසු මිනිසුන් බොදු බල සේනාව විසින් අළුත්ගමදී පවත්වන රැස්වීමට සහභාගි වීමට එක්රැස් වී තිබේ. තරුණ පිරිස බස්රථ, ලොරි සහ ටිපර් වලට නංවා රැස්වීමට ගෙන ගොස් තිබේ. එසේම, බේරුවල මුස්ලිම් ජනතාව පැවසුවේ, රැස්වීමෙන් පසු නැවත පැමිණෙන විට මෙම පිරිස විසින්ම බේරුවල, අඹේපිටිය මුස්ලිම් ප්‍රදේශ වලට පහර දුන් බවයි.

පහත දැක්වෙනුයේ සිද්ධිය සිදු වූ විගස එම ප්‍රචණ්ඩත්වය ඇසින් දුටුවෙකුගෙන් ලබාගත් සාක්ෂියකි:

> "මේ පාර පැත්තේ තියෙන සාප්පු ඔක්කොම කුඩු කරන්න. ඒවා තියෙන්න අරින්න එපා" සහ "මේ මුස්ලිම්කාරයෝ විනාශ කරන්න" වැනි දේ කියමින් ඒ අය කෑ ගැසුවා. ඒ අය බසාර් එකට

පැමිණියා, ඒත් අපි 25 දෙනයි එතන හිටියෙ. හිතට ධෛර්යය අරගෙන අල්ලා දෙවියන්ගේ ආශිර්වාදයෙන් අපි ඉස්සරහට ගියා. අපි ඉස්සරහට එනවා දැක්කම ඒගොල්ලෝ හිතුවෙ අපේ පිටිපස්සෙන් ලොකු සෙනඟක් එනවා කියලා. එතකොට ඒගොල්ලො පසු බැහැලා දුවන්න පටන් ගත්තා. අපිත් ඔවුන්ට ගල් වලින් ගසමින් එලවා දැමුවා. අපිට කිසිම ආයුධයක් තිබුණේ නැහැ, ගල් සහ පොලු කිහිපයක් හැරෙන්න. විනාඩි 45ක් 50ක් විතර කාලයක් ඔවුන්ට ඉදිරියට එන්න නොදී අපි වළක්වගෙන හිටියා. අපි ඔවුන්ව එලවා දැම්මා. ඔවුන් ටිකක් දුර දුවලා ගිහින් එකතු වෙලා නැවත ඉදිරියට එන්න උත්සාහ කළා. අපි ඔවුන්ට ගල් ගසමින් එලවා දැමුවා. මේ සටන සෑහෙන වෙලාවක් තිස්සේ ඇදෙමින් තිබුණා. ඔවුන් අපේ තරුණයෙක්ගේ අතක් කැපුවා, එතකොට තව කෙනෙක්ගේ මුහුණේ වීදුරු කැපුමක් තිබුණා. අනිත් අයත් තුවාල ලැබුවා. මේ අතරතුර, අපෙන් සමහරෙක් සහ කාන්තාවන් පොලීසියට සහ 119 එකට අමතන්න උත්සාහ කළා. ඒ අය පොලීසියට අමතන්න පැයක් විතර කාලයක් උත්සාහ කළා. ඒ කාලය තුළ අපි ඔවුන් ඇතුළට ඒම වළවමින් සිටියා. ඔවුන් මුලින්ම මැණික් කපන සාප්පුව විනාශ කළා. ඒක අපි හිටපු තැනට ගොඩක් දුරින් පිහිටියේ.

අපි පොලීසියට ගිහින් මේ ගැන දැනුම් දුන් අවස්ථාවේ පොලීසියේ කවුරුත් හිටියේ නැහැ. පොලිස් ස්ථානාධිපති හෝ වෙනත් කිසිවෙකුවත් හිටියේ නැහැ. (ඔවුන් හැම කෙනෙක්වම අළුත්ගමට පිටත් කරලා තිබුණා.) අපි කොස්තාපල්වරයෙකුට තමයි දැනුම් දුන්නේ. ගැටුම යන අවස්ථාවේදී, පොලීසිය 6 දෙනෙක් විතර එතනට ආවා. ඒගොල්ලො කලහකාරී පිරිසට තව ඉස්සරහට එන්න එපා කිව්වා. ඒත් ඒ පිරිස පොලීසිය හිටියත් ඉස්සරහට ආවා. ඉතින් පොලීසිය ඉන්න අවස්ථාවේදී උනත් අපිට ඉස්සරහට ගිහින් කට්ටියව එලවලා දාන්න සිද්ධ වුණා. පැයකට විතර පස්සේ හමුදාවෙන් ආවා. ඒත් විශේෂ කාර්ය බලකායෙන් නෙවෙයි. ඊට පස්සේ ඒගොල්ලො අනතුරු ඇඟෙව්වා ඉස්සරහට එන්න එපා කියලා. අපිට ගෙවල් වලට යන්න

කිවුවා. ඔවුන් පිරිස හිටිය පැත්තට කඳුළු ගෑස් ගැහුවා. ඒත් මේ සෙනඟ විසිරිලා ගියේ නැහැ. ඒ අය අපේ ගබඩා වලින් එකක් කුඩු කරලා දැම්මා. පොලීසියෙන් හා හමුදාවෙන් හැම මීටර් 100ක පරතරයක් තුළම හිටියා. ඒත් ඒගොල්ලො ඔවුන් ඉදිරිපිටම ගබඩාව කඩලා, බඩු ටික පාරට ඇදලා දාලා ගිනි තිබ්බා. ඒවා ලක්ෂ 15ක් විතර වටිනා බඩු. හමුදාවන් පොලිස් විශේෂ කාර්ය බලකායන් නිකන් බලා ගෙන හිටියා. ඔවුන් කට්ටියව වළක්වන්න කිසි දෙයක් කළෙත් නැහැ, අපිට ඉස්සරහට යන්න දුන්නෙත් නැහැ. අපි කට්ටියට පහර දෙමින්, ඔවුන් ඉදිරියට ඒම වළක්වන විට, ඒ පිරිස නිකන් බලා සිටියා. හමුදාවෙන් සහ පොලීසියෙන් එතන සිටිය අවස්ථාවේදී පවා පිරිස ඉදියට ඇවිත් සාප්පු කොල්ලකමින්, බඩු පාරට ඇද දමමින් ගිනි තබනු ලැබුවා. ඔවුන් ලක්ෂ 20 ක් පමණ දේවල් කොල්ලකා තිබුණා."

## වෛද්‍යවරයාගේ කතාව

අප විසින් කතා කළ අය අතරින් එක් අයෙක් වෛද්‍යවරයෙක් විය. ඔහු කලහකාරී පිරිසට සහ ඇදිරි නීතියට කොටුවී සිටින්නන්ට වෛද්‍ය ආධාර සැපයීම පිණිස සිද්ධිය සිදු වූ ප්‍රදේශයට ගොස් තිබුණි. බොහෝ පුද්ගලයන්-වෛද්‍යවරුන් ද ඇතුළුව ඔවුන්ට එම ප්‍රදේශයට වහාම පැමිණෙන ලෙස ඉල්ලා තිබුණි. මන්ද ඔවුන්ට ඖෂධ සහ උපකරණ අවශ්‍යව තිබූ අතර, මිනිසුන් තුවාලව සිටි අතරම කිසිදු වෛද්‍ය ආධාරයක් ලැබී නොතිබුණි. ඔවුන්ට අසන්නට ලැබී ඇත්තේ, නාගෙ ාඩ රෝහලේ ප්‍රතිකාර ලැබීමට ගිය තුවාලකරුවන් එහිදී නොසලකා හරින බව සහ ඇතැම් අවස්ථාවල ඔවුන්ගේ තත්ත්වය මේ හේතුවෙන් උත්සන්න වී ඇති බවයි. නම සඳහන් කිරීමට අකමැති වෛද්‍යවරයෙකු විසින් සඳහන් කළ පරිදි ඔහුට සහන සේවා සහ සංවර්ධන පදනමක් විසින් ගිලන් රථයක් ලබා දී ඇති අතර තනි දායකයකු විසින් වෛද්‍ය සැපයුම් පහසුකම් උපකරණ ලබා දී තිබේ. ඔවුන් ගිලන් රථය, වෛද්‍ය උපකරණ, රසායනඥයෙකු හා බේරුවල පොලීසියේ ස්ථානාධිපති හඳුනන වෙනත් පුද්ගලයෙකු මෙන්ම වෛද්‍යවරයාව කැඳවාගෙන එහි ගොස් තිබේ. පිරිස් තවමත් අවට රැඳී සිටී බැවින් ඔවුන්ට පොලිස් ආරක්ෂාව පිට පැමිණෙන ලෙස දන්වා තිබුණි. ඔවුන් කළුතරින්

නැවතී, මියගිය අය වෙනුවෙන් කෆන් රෙදි එනම් භූමිදානයට අවශ්‍ය රෙදි එකතු කර තිබේ. ඔවුන් බේරුවල පොලීසිය වෙත ළඟා වූ පසු පොලීසිය විසින් ඔවුන්ට පවසා තිබුණේ, එය බොහෝ අවදානම් සහගත බව සහ පොලීසියේ අයත් අනතුරට පත් වන බැවින් ඔවුන්ට පොලිස් ආරක්ෂාව සැපයිය නොහැකි බවයි. ඔවුන්ට කියා තිබුණේ කලහකාරී පිරිසේ ප්‍රමාණය වැඩි බැවින් පොලිසියට අවදානමක් ගත නොහැකි බවයි. කළ යුත්තේ කුමක්දැයි සිතා ගත නොහැකිව පිරිස බේරුවල පොලිස් ස්ථානය අසල පැය කිහිපයක් රැඳී සිට තිබේ. මේ අතරතුර, ඔවුන්ට පැමිණෙන ලෙස ආයාචනා කරමින් දුරකථන ඇමතුම් ගලා එන්නට විය.[72] එක් ඇමතුමකින් කියා සිටියේ භික්ෂූන් පිරිසක් නාගොඩ රෝහලට කඩා වැදී, ප්‍රතිකාර ලබමින් සිටි මුස්ලිම් අයගේ සේලයින් බට ගලවා ඇති බවයි. ඔවුන් අසරණ වී ඇති බවක් හැඟුණු හෙයින් ඔවුහු බලවත් යයි සිතන කිහිප දෙනෙකුටම කතා කොට ඇත. කෙසේනමුත්, කිසිවෙකුටවත් ඔවුන්ට උදව් කිරීමට හෝ කළ යුත්තේ කුමක්දැයි පැවසීමට හැකි වී නොමැත.

එවිට ඔවුහු කන්දෙ විහාරය පාරෙන් ප්‍රදේශයට පැමිණීමට තීරණය කළහ. වෛද්‍යවරයා පැවසුවේ පාරේ මැරයන් සිටි බව සහ විශේෂ කාර්ය බලකා සෙබළුන් 3-4 දෙනෙක් දුටු බවයි. මැරයෝ යකඩ පොලු, බෝතල් සහ ලී පොලු අත දරාගෙන සිටියහ. ඔවුන් ගිලන් රථයේ නලා හඬට ඉවත් වී තිබේ. ඇත්තෙන්ම, ඔවුන්ට එය ඇසුණු විට ඔවුන් දිවගිය බව වෛද්‍යවරයා පැවසීය. ඔවුන් ප්‍රථමයෙන් සවිය පාරේ තේරු පල්ලියට ගොස් ප්‍රදේශයේ වෛද්‍යවරු ගිලන් රථයට නංවාගෙන තිබේ.

ඔවුන් වැලිපිටිය, අධිකාරිගොඩ සහ සීනවත්තට ගියහ. ඇතුළත පාරවල්වල කලහකාරී පිරිස නොවූ අතර ඔවුන්ට වැඩ කිරීමට හැකියාව ලැබුණු බව වෛද්‍යවරයා පැවසීය. තුවාල වූ පුද්ගලයන්ට ප්‍රතිකාර කිරීම සඳහා සෑම ප්‍රදේශයකම වෛද්‍යවරයෙක් හෝ වෛද්‍ය ශිෂ්‍යයෙකුව ඖෂධ සමඟ ගිලන් රථයෙන් බස්සවන ලදී.

72 වෛද්‍යවරයා පැවසුවේ ඔහු පොලිස් ස්ථානයේ සිටියදී පුද්ගලයෙක් තමන්ගේ සාප්පුව ගිනි ගන්නවා, උදව් වන ලෙස ඉල්ලීමට පොලීසියට දිව ආ බව දුටු බවයි. පොලිසිය පැවසුවේ ඔවුන් ජීප් එකක් එවන්නම් කියාය. ඔහු එළියේ ගිනි නිවන රථ දෙකක් නවතා තිබෙනු දුටු බව පැවසුවා. රථය ගෙන යාමට එහි ඉන්ධන නොමැති බව එක් ගිනි නිවන රථයක රියදුරු පවසා ඇත.

වැඩි ආරක්ෂාව පිණිස ඔවුන් කාන්තාවන් කණ්ඩායමක් අධිකාරිගෙ ාඩ සිට තේරුපල්ලිය වෙත කැඳවාගෙන ගොස් තිබේ. වැලිපිටියේ පුද්ගලයන්ට වෙඩි පහරවලින් ලද තුවාල ද විය. අනෙක් අයට බෝතල් සහ වෙනත් වීදුරුවලින් ලද කැපුම් තුවාල, හිසේ තුවාල සහ පිළිස්සුම් තුවාල විය. තාප්පයෙන් පනින්නට ගොස් අතේ සන්ධි පනින ලද අවුරුදු 16 ක දැරියකද එහි සිටි බව ඔහු පැවසීය. ඇය පැය 18+ කිසිදු වෛද්‍ය ප්‍රතිකාරයක් නොමැතිව සිට ඇත.

කටකතා ලැව් ගින්නක් මෙන් පැතිරෙන්නට විය. එහි සිටි එක් අයෙක් පැවසුවේ වැලිපිටිය මුස්ලිම් පල්ලියේදී මරා දැමූ පුද්ගලයන් දෙනොගේ භූමිදානයෙන් පසු මුස්ලිම් පිරිස සිංහල අයට පහර දෙනු ඇති බවට කතාවක් පවතින බවයි. ඇත්තෙන්ම, එවන් පහර දීමක් සිදු නොවන බව සහ භූමිදානයන් මේ වන විටත් සිදු වී හමාර බව ප්‍රදේශයේ සිංහල අයට දැනුම් දෙන ලෙස ප්‍රදේශවාසීන් විසින් වෛද්‍යවරයාගෙ න් ඉල්ලා තිබුණි.

ජුනි 16 වන දින ප.ව. 5.30 ට ඔවුන් සීනවත්ත සිට බේරුවල බලා පිටත් වී තිබේ. පළමු මීටර් 100 කිසිදු කරදරයක් නොමැතිව පසු කළ බව වෛද්‍යවරයා පැවසීය. ඉන් පසු ඔවුන්ට ප්‍රචණ්ඩ පිරිස් හමුවී ඇත. එහි 1000 කට අධික පිරිසක් සිටි බව සහ සියල්ලන් අතේම බයිසිකල් චේන් සහ වෙනත් ආයුධ තිබූ බව වෛද්‍යවරයා පැවසීය. ඔවුන් වෑන් රථය වට කර එයට පහර දෙන්නට පටන් ගත්තා. ඔහු පැවසුවේ, රථය පදවමින් සිටී අත්දැකීම් සහිත රියදුරු මහතා විසින් කෙසේ හෝ පිරිසගෙන් මිදී ගාලුපාරට පිවිසුන බවයි. අවාසනාවකට මෙන් කලබලයට පත්වූ රියදුරු රථය බේරුවල වෙනුවට ගාල්ල දෙසට හරවා තිබේ.

නැවත බේරුවලට හැරවිය නොහැකි බව තීරණය කළ ඔවුන්, අධිවේගී මාර්ගයට පිවිසුම සොයාගෙන කොළඹට පැමිණ ඇත.

කලහකාරි පිරිස අතරට තරුණ පිරිමි සහ ගැහැණු අය ඇතුළත්ව සිටි බව වෛද්‍යවරයා විස්තර කළේය. බොහෝමයක් කාන්තාවන් පන්සල් යන්නට මෙන් සුදු ඇඳගෙන සිටී බව වෛද්‍යවරයා විසින් පැවසීය. සමහර අයට තුවාල සිදුව ඇති ආකාරය පැහැදිලිව පෙණුන

අතර අනෙක් අයගේ මුහුණු වල ග්‍රීස් ගෑවී ඇති බවක් දිස්විය. "ඔවුන් නූගතුන් බවයි පෙණුනේ".

**සිදුවීම් පිළිබඳ කතාවලින් කළ මූලික සොයා ගැනීම් සහ ප්‍රදේශයේ නිරික්ෂණ**

1. කලින්ම එම ස්ථානවල රැඳවූ පිරිස් විසින් මෙම පහරදීම් සමගාමීව සිදුකර තිබේ. උදාහරණයක් වශයෙන් අධිකාරිගොඩ, සීනවත්ත, පතිරාජගොඩ සහ හමුදා පාරෙහි පහර දීම් පටන් ගැණුනේ 6.45 ට පමණ ඇඳිරි නීතිය ප්‍රකාශයට පත් කළ වහාමය.

2. ඉහත සඳහන් කළ ප්‍රදේශ හතරෙහිම විශේෂ කාර්ය බලකා සෙබළුන් සිටි නමුත් ප්‍රචණ්ඩත්වය උත්සන්න වූ අවස්ථාවේ සහ පහර දීම් සිදු වී හමාර වූ පසු ඔවුන් පහර කෑ පුද්ගලයන්ට උපකාර වීම ප්‍රතික්ෂේප කර තිබේ.

   බොහෝමයක් ප්‍රදේශවල පුද්ගලයන් ප්‍රකාශ කර සිටියේ කලහකාරී පිරිස් අතරින් පතරට එම ප්‍රදේශ වල පුද්ගලයන් ද සිටි බවයි. මෙය පහර කෑ මුස්ලිම් අය සහ ඉලක්කයක් වූ සිංහල නිවෙස් මගින්ද තහවුරු කරන ලදී.

3. සෑම ප්‍රදේශයකම, විශේෂයෙන් සීනවත්තේ පුද්ගලයන් පුන පුනා පැවසුවේ විශේෂ කාර්ය බලකාය විසින් ඇඳිරි නීතිය වෙලාවේදී මුස්ලිම් අයට නිදහසේ ගමන් ගැනීමට ඉඩ ලබා නොදුන්නත්, සිංහල ජාතිකයින්ට හට කිසිදු බාධාවකින් තොරව ගමන් ගැනීමට ඉඩ ලබා දුන් බවයි.

4. අනතුරට පත් වූ පුද්ගලයන්ගේ ප්‍රකාශවලට අනුව, අනතුරට පත් වූවන් වෛද්‍ය ප්‍රතිකාර සඳහා ගෙන යාමට, ගිනි නිවීමට හෝ කොයියම් හෝ ආකාරයකින් ආරක්ෂාවක් සැපයීමට හමුදා නිලධාරීන් ඉදිරිපත් නොවී ඇත. (මීට ව්‍යාතිරේක අවස්ථා දෙකක් සඳහා පහත බලන්න)

5. එක් අවස්ථාවක් වූයේ අළුත් පාරේ විශේෂ කාර්ය බලකායේ ජ්‍යෂ්ඨ නිළධාරින්ගේ මැදිහත් වීම බලාපොරොත්තු වූ අවස්ථාවේදී පහර දෙන්නන්ව විශේෂ කාර්ය බලකායෙන්

අහසට වෙඩි තබා විසුරුවා හැරීමයි. අනෙක වූයේ පිරිස විසින් විශේෂ කාර්ය බලකා නිළධාරින්ට හමුදා පාරේ විසූ වැඩිහිටි කාන්තාවක්ව "භාරදුන්" පසුව නිළධාරින් ඇයට සුරක්ෂිත ස්ථානයක් සොයා ගැනීමට උපකාරී වීමයි. මේ අතරතුර පිරිස විසින් ඇයගේ නිවස කොල්ලකෑම සහ අවට නිවෙස්ද කොල්ලකෑම සිදුකරන ලදී.

6. පහරදීම් සිදුවූ ආකාරවල සමානතා දක්නට ලැබේ. එනම් භාවිතා කළ ආයුධ සහ පහරදෙන්නන් විසින් ක්‍රියාකාරකම් ගෙනගිය ආකාර ආදියෙහි සමානතා පවතී. ඔවුන් පිරිස් වශයෙන් ගමන් ගත් අතර පෙට්‍රල් පිරවූ වීදුරු බෝතල් (සාමාන්‍යයෙන් අරක්කු බෝතල්) ගෙන ගියහ. ඔවුන් අත මුගුරු සහ යකඩ පොලු විය. සිද්ධිය ඇසින් දුටුවන් පැවසුවේ ඔවුන් ගිනි ඇවිලෙන සුළුද්‍රව්‍ය, එනම් කුෂන්, රෙදි, මෙට්ට හෝ ඇතැම් අවස්ථාවල ටයර් කාමර මැදට එකතු කර ගිනි ඇවිල වූ බවයි.

සාක්ෂිකරුවන් පැවසුවේ පහර දෙනු ලැබූවන් මිනිස් දඩයමට උනන්දුවක් නොදක්වූ බව සහ ඔවුන් ඇත්තෙන්ම එවන් පහර දීම් මඟ හැරි බවයි. අවස්ථාවන් කිහිපයකදීම ඔවුන් මිනිසුන්ට 'අපි ඔයගොල්ලන්ගේ ගෙවල් ගිනි තියන්න යනවා. පිට වෙන්න' යනුවෙන් පවසා තිබේ. ඇතැම් අවස්ථාවල ඔවුන් නිවෙස්වල බඩුවලට මිනිසුන් වෙනත් කාමරවල හැංගී ඉන්නා විටම ගිනි තැබූහ. වරදකරුවන් සොරකමට හා ගෙවල් ගිනි තැබීමට වඩා නැඹුරුව සිටි අතරම විරෝධතා පෑ ඇතැම් අවස්ථාවලදී හැරුණු කොට මිනිසුන්ට හානි පැමිණවීමට ඔවුන් එතරම් නැඹුරු වී නොමැත. එක් විරෝධය පෑ අවස්ථාවක් ලෙස වැලිපැන්නේ ලංකා ගොවිපොළේ දෙමළ ආරක්ෂක නිළධාරියාගේ සිද්ධිය ගත හැකිය. පහර දෙන්නන් විසින් ඔහුව කපා කොටා මරා දමන ලදී. තනි පුද්ගලයන්ට දරුණු ප්‍රචණ්ඩත්වයන් ඇති නොවීම මහත් අස්වැසිල්ලක් වුවද රටේ අත්දුටු වෙනත් ජාති අරගලයන්ගෙන් වෙනස් ස්වරූපයක් සනිටුහන් කරන මෙම සිදුවීම කුතුහලය දනවන්නකි.

7. කොල්ලකෑම් මෙම පහරදීම්වල සුවිශේෂී අංගයක් විය. දැඩි ප්‍රයත්නයක් දරා රන් ආභරණ සහ මුදල් උදුරා ගන්නා ලදී. නව උපකරණ, යන්ත්‍ර අමතර කොටස්, ගෘහ භාණ්ඩ ආදිය වටිනා දේවල් ලෙස සැලකූ අතර, නානකාමර උපාංග ක්‍රමිකව කොල්ලකා වාහනවලට පටවා තිබේ. බොහෝ නිවෙස්වල අල්මාරි සහ කබඩ් කඩා මුදල් සහ ආභරණ සොරකම්කර ඇත. ගෘහ භාණ්ඩ සහ ගබඩාවල තිබූ තොග ක්‍රමිකව හිස්කර ගෙන ගොස් තිබුණි.

8. නිවාස, සාප්පු, වාහන, භාණ්ඩ තොග, ව්‍යාපාර වලට යොදා ගත් යන්ත්‍රෝපකරණ වැනි වත්කම් ඉලක්ක වූ අතර ඒවා එක්කෝ කොල්ලකෑ අතර නැත්නම් විනාශ කළහ. මෙය තමන්ගේ ආර්ථික දියුණුවට සිදු වූ පහර දීමක් බව ඊට ඉලක්ක වූ මුස්ලිම් අයට පැහැදිලි කරුණක් විය.

9. විදුලිය විසන්ධි වීම හේතුවෙන් අධික දීප්තියෙන් යුත් විදුලි පහන් (ලයිට්) යොදා ගැනීමේ සිදුවීම් පතිරාජගොඩ, අධිකාරිගෙ ාඩ සහ වැලිපිටිය ප්‍රදේශ වලින් වාර්තාවීම මීට සමාන තවත් සිදුවීමකි.

10. කලහකාරී පිරිස අතර සිටි අයගේ වයස බොහෝ දුරට අවුරුදු 15-35 අතර විය. කාන්තාවන්ද මෙම පහර දීම් වලට සම්බන්ධ වී තිබේ. ඔවුන් සාමාන්‍යයෙන් පිරිමි පුද්ගලයන්ව පහර දීම් වලට යොමු කළ අතර ඇතැම් විට ඔවුන්ම ප්‍රචණ්ඩ ක්‍රියා වලට සම්බන්ධ වී තිබේ. පිරිසට භික්ෂූන් (අවම වශයෙන් එක් භික්ෂුවක්) සහ මත් වූ පිරිස් ඇතුළත් බව වාර්තා වී ඇත.

11. මෙම ප්‍රචණ්ඩත්වය තුළ පැහැදිලි පන්ති භේදයක් විය. ඉලක්ක වූ සියලුම නිවෙස් ගෘහ භාණ්ඩ, පරිගණක, රූපවාහිනි, කාර් සහ ආභරණ ඇති ධනවත්, ඉහළ මධ්‍යම පාන්තික සහ මධ්‍යම පාන්තික පවුල් විය. කලහකාරී පිරිස් දුගී පැළැන්තියට අයත් තරුණ පිරිමි අය සහ ඇතැම් අවස්ථාවල කාන්තාවන්ගෙන් ද සමන්විත වී තිබේ. කලහකාරී පිරිස් පිළිබඳව මධ්‍යම පාන්තික අය විග්‍රහ කළ ආකාරයෙන් යමක් ගම්‍ය විය. ඔවුන් සියල්ලන්ම

"නූගත්" පෙනුමැති වූ අතර, "ඔවුන්ගේ මුහුණු රෞද්‍ර පෙනුමැති විය", "කාන්තාවන් විසින් අපි කිසි දිනෙකත් අසා නැති අසභ්‍ය වචන භාවිතා කළා". මේ සියල්ලක්ම මධ්‍යම පන්තිය විසින් අඩු ආදායම් මට්ටමේ ජන කොටස් හැඳින්වීම සඳහා යොදා ගන්නා මිනුම් දඬුය. පූජ්‍ය ඥනසාර හිමි විසින්ද ඔහුගේ කථනයේදී "දැන් රස්තියාදු ගැහුවා ඇති" යයි පවසමින් එවන් කණ්ඩායම් "රස්තියාදුකාරයෝ"[73] යැයි ඇමතූ බව එක් අයෙක් පැවසුවේය.

12. ඉහත 11 ට අනුව, සිද්ධිය සිදු වූ ප්‍රදේශයේ ජාති සම්බන්ධයන් අභිභවා තාවකාලිකව පන්ති සම්බන්ධයන් හඬ නැංවූ බව පෙනේ. සමීපව සිටි ප්‍රජාවන් ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන්, තවදුරටත් එකිනෙකා සමඟ කතා බස් නොකරන තැනට පත් විය. බොහෝ මුස්ලිම් ජාතිකයින් සිතනුයේ ඔවුන්ගේ අසල්වැසියන් ඔවුන්ට අනතුරු ඇඟවූයේ නැති බව සහ ඔවුන්ද පිරිස් සමඟ එකතුව සිටි බවයි. ඔවුන් මුස්ලිම් ජනතාව කරදරයට පත් වූ අවස්ථාවලදී උදව් වීමට ඉදිරිපත් වී නොමැත. බලපෑමට ලක් වූ සිංහල පුද්ගලයන් ඔවුන්ට මුහුණ දෙන්නට වූ දේපළ හානිය හේතුවෙන් දැඩි සේ පීඩාවට පත් ව ඇතිවාක් මෙන්ම කිසිවෙකුත් උදව් නොකළාය යන්නත් එක් අවස්ථාවකදී, ඔවුන් දන්නා හඳුනන මුස්ලිම් ජාතිකයින් පවා ඔවුන්ට විරුද්ධව ප්‍රචණ්ඩ ක්‍රියා වල යෙදී ඇති බවත් ඔවුනට සිතාගන්නටවත් නොහැකිය. මොවුන්ගේ සමීපස්ථයන් වූ සිංහල ජාතිකයින් මෙම සිදුවීම පිළිබඳ කතාවේ හරි වැරැද්ද ක්‍රමවත්ව දැක්වීම හෝ අඩුම තරමින් ඔවුන්ගේ ජාතියට අයත් කණ්ඩායමේ අයගේ ක්‍රියාවන් විස්තර කිරීම හෝ අපහසු බව දක්වන නමුත් සිදු වූ දෙය පිළිබඳව තවමත් විවේචනය කරති.

13. සම්බන්ධතාවයන් බිඳ වැටීම ඛේදනීය වේ. ඔවුන් අතර හොඳ සම්බන්ධතාවන් ප්‍රකාශ වන ඉතා සුළු අවස්ථාවන් කිහිපයක් පමණක් අපි දුටුවෙමු. අප විසින් එක් කළ කතාවන් සියල්ල අතරින් පහර දෙන්නන් වැළැක්වූ සහ ගින්න නිවීමට මුස්ලිම්

73 රස්තියාදුකාරයෝ යනු සිංහල කතා ව්‍යාවහාරයේ පවතින විශේෂයෙන් කිසිවක් කිරීමට නොමැතිව "අතන මෙතන ඇවිදින" පුද්ගලයන් අර්ථ දක්වයි. පූජ්‍ය ඥානසාර හිමියන් "රස්තියාදු" යන වචනය භාවිතා කරමින් පැවසුවේ "අතන මෙතන ඇවිද්දා ඇති" යන්නයි.

ජාතිකයින්ට උපකාරී වූ සිංහල ජාතිකයින් පිළිබඳව සොයා ගත හැක්කේ අවස්ථාවන් දෙකකදී පමණි. මෙය, පැතිර ගිය කටකතාවන්ට පැවති බිය සහ පසුගිය වසර දෙක මුළුල්ලේ බොදු බල සේනාව සහ එහි සහාය කණ්ඩායම් විසින් පවත්වා ගෙන ගිය කෲර වෛරී ව්‍යාපාරයන් නිසාවෙන් සිදු වූවක් බව අපි විශ්ලේෂණය කරමු.

14. වැලිපිටිය මුස්ලිම් පල්ලියට සිදු වූ ප්‍රහාරය බොහෝ සෙයින් ඛේදනීය ය. මන්ද එහිදී තමන්ගේ ආරක්ෂාව සපයා ගන්නට තැත් කළ පුද්ගලයන්ට මරණය සහ වෙඩි පහරවල් උරුම වූ බැවිනි. විශේෂයෙන්ම ප්‍රචණ්ඩත්වය පැවති අවස්ථාවේදී හා ඉන් පසුව එහි හමුදාවේ නිළධාරින් සිටීම පිළිබඳව සඳහන් කර තිබීම් අපි සැලකිල්ලට ගෙන එන්නෙමු. එය කුතුහලයට පාත්‍ර වන කරුණක් වන අතර වඩාත් පරීක්ෂාවට ලක්විය යුතු කරුණකි.

## සිතියම් I : කළුතර දිස්ත්‍රික්කයේ සිද්ධිය ඇති වූ ප්‍රදේශ




## සිතියම II : දර්ගා නගරයේ සිද්ධිය ඇති වූ ප්‍රදේශ



# 5 වන පරිච්ඡේදය
# සිද්ධියෙන් පසු තත්වය

## අළුත්ගම සිදුවීමට රජයේ ප්‍රතිචාරය

බොදු බල සේනා යුගයෙහි ගැටළුවලට අදාළව ඔවුන්ට ඇති කරදර හා පීඩා පිළිබඳව බලගතු පුද්ගලයින් යැයි ඔවුන් සිතන පාර්ශ්ව සමගින් සංවාදයේ යෙදීම තුළින් බලධාරීන් මීට සම්බන්ධ කරගැනීමේ ක්‍රමෝපායයක් අනුගමනය කරන්නට මුස්ලිම් සිවිල් සමාජය කටයුතු කර තිබේ. උදාහරණයක් වශයෙන්, මුස්ලිම් කවුන්සිලය, ACJU සහ තරුණ මුස්ලිම් සංවිධානය ඇතුළු අනෙකුත් සංවිධාන විශේෂ අවස්ථාවන්හීදී ආරක්ෂක ලේකම්වරයා සමගින් තම ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීමට බොහෝ අවස්ථාවල පෙළඹී තිබේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ඇතැමුන් තමන්ට හමුදා නිළධාරින් සමඟ මනා සම්බන්ධතාවන් පවතින බව පැවසූ අතර තමන්ට විසදා ගත යුතු ප්‍රශ්න පවතින විට ඔවුන්ට දුරකතන ඇමතුම් ලබා දෙන බව ඔවුහු පැවසූහ. ජූනි 15 වන දින මෙම ප්‍රචණ්ඩ සිදුවීම සිදු වූ අවස්ථාවේදීද ඔවුන් සුපුරුදු ක්‍රියා පිළිවෙතම අනුගමනය කරමින් නිළධාරින් සමඟ රැස්වීමක් කැඳවන ලදී.

## 2014 ජූනි 15 වන දින දෙහිවල මුස්ලිම් පල්ලියේ රැස්වීම

අළුත්ගම කෝලාහලයක් ඇති වූ බව දැන ගත් පසු, මුස්ලිම් සිවිල් සමාජ සාමාජිකයන් දෙහිවල මුස්ලිම් පල්ලියේදී එක්වී ආරක්ෂක අංශයේ නියෝජිතයන් (හමුදා නිළධාරින්) සමඟ රැස්වීමක් පැවැත්වීමට ඉල්ලන ලදී. මෙම රැස්වීමේදී, අළුත්ගම සිදු වන්නේ කුමක්ද සහ බලධාරීන් විසින් කුමන ක්‍රියාමාර්ගයන් අනුගමනය කරයිද යන්න සාකච්ඡාවට ගැණුනි. සුරේෂ් සාලි සහ බ්‍රිගේඩියර් හෙන්දවිතාරණ රැස්වීමට සහභාගි වූ අතර මුස්ලිම් ජාතිකයින්ට උද්ගතව ඇති තත්ත්වය පැහැදිලි කරන ලදී. ඔවුන් පැවසුවේ බොදු බල සේනාව අළුත්ගම රැස්වීම පවත්වා එය අවසන් වී ඇති අතර පිරිස කිසිදු සිදුවීමකින් තොරව විසිරී ගිය බවයි. එසේම, මුස්ලිම් ජාතිකයින් පෙරහැරට ගල් ගැසීම හේතුවෙන් ප්‍රචණ්ඩ ක්‍රියා ඇති වූ බවයි. ඔවුන් තවදුරටත් ප්‍රකාශ

කළේ මුස්ලිම් ජාතිකයින් කෝලාහලයට මුල පිරූ බවට විවිධ කටකතා පවතින බවයි. එනම් මුස්ලිම් ජාතිකයින් වෑන් රථයක් පිරෙන්නට සිටි භික්ෂූන්ට පහර දුන්නා වැනි කට කථා ඊට අයත් විය. සියලු චෝදනා මුස්ලිම්වරුන් පිට පමණක් වැටේ යයි සිතා කලබලයට පත්වූ මුස්ලිම් සිවිල් සමාජ සාමාජිකයන්ගෙන් උණුසුම්කාරී වාතාරණයකට මුහුණ පෑමට හමුදා නිළධාරින්ට සිදුවිය. රැස්වීම අවසානයේදී, අනාගතයේදී ගන්නා ක්‍රියා මාර්ගය පිළිබඳ මුස්ලිම්වරුන්ට පැහැදිලි බවක් නොවූ නමුත් මේ වන විට ගෙන ඇති ක්‍රියා මාර්ග පිළිබඳව දැන ගැනීමට ඔවුහු නිරන්තරයෙන් හමුදා නිළධාරීන් වෙත දුරකතන ඇමතුම් ලබා දෙන ලදී. ඔවුන් පවසා තිබුණේ ක්‍රියා මාර්ග ගන්නා බවමුත්, පසුව ඔවුන්ට දැන ගන්නට ලැබුණේ ඔහුට සමීප මුස්ලිම් නියෝජිතයන්ට, නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් පවසා තිබුණේ පිරිස බොහෝ විශාල සහ බොහෝ ප්‍රචණ්ඩ වන නිසා තමන් ඔවුන්ව පාලනය කිරීමට උත්සාහ දැරුවත් එය කිරීමට අපහසු බවයි.

## ජූනි 16 වන දින කළුතර කච්චේරියේදී පැවති රැස්වීම

සිද්ධියෙන් පසු ගත වූ පළමු දිනයේදී අග්‍රාමාත්‍යවරයා විසින් කළුතර කච්චේරියේදී රැස්වීමක් කැඳවන ලදී. අපට එම රැස්වීමට සහභාගි වූ මුස්ලිම් නියෝජිතයෙකු හමුවීමට අවස්ථාව ලැබුණි. එම අවස්ථාවට අග්‍රාමාත්‍යවරයා සහ අමාත්‍ය බැසිල් රාජපක්ෂ, එස්.බී. දිසානායක, ඩලස් අලහපෙරුම, කුමාර වෙල්ගම, රෝහිත අබේගුණවර්ධන, ප්‍රසන්න රණතුංග, ඒ.එච්.එම්. ෆවුසි, මොහොමඩ් අස්ලාම් සහ කළුතර නගරාධිපති ජවුෆර් මහ්රූෆ් සහභාගී වූ බව ඔහු විසින් ප්‍රකාශ කරන ලදී. ඊට අමතරව පොලිස්පති එස්. කේ. ඉලංගකෝන් සහ උප පොලිස්පති අනුර සේනානායකද එයට සහභාගි විය. මෙම අවස්ථාවට ප්‍රදේශයේ මුස්ලිම් සහ බෞද්ධ ආගමික පැවිද්දන්ට පැමිණීමට ආරාධනා කර තිබූ අතර බොදු බල සේනාවේ පූජ්‍ය ඥානසාර හිමි ඔහුගේ පිරිවරද සමඟ එහි පැමිණියහ. ආරම්භයේදීම, පූජ්‍ය ඥානසාර හිමියන්ට මෙම රැස්වීමට ආරාධනා කිරීම අවශ්‍ය යැයි රජයේ නියෝජිතයන් සිතීම සැලකිල්ලට ගැනීම වැදගත්ය. මන්ද අළුත්ගම පැවති රැස්වීම සහ එහිදී ඔහුගේ කථනය ප්‍රචණ්ඩ ක්‍රියා හට ගැනීමට විවිධ ආකාරයෙන් රුකුල් දුන් බැවිනි. බොදු බල සේනාව විසින් අළුත්ගම සම්බන්ධයෙන්

පැතිර වූ කථා වලට පමණක්ම එම සිද්ධිය සීමා කිරීමට රජයේ පැවති සැලසුම ඉන් ගම්‍ය වන බව අපගේ හැඟීමයි. අපේ තොරතුරු සපයන්නා විසින් පැවසූ පරිදි එම රැස්වීමේදී තත්ත්වය පාලනය කිරීම පිණිස නැගෙනහිර ප්‍රදේශයේ හමුදාව ස්ථානගත කිරීමට එකඟ වී ඇති අතර, සිද්ධිය හා සම්බන්ධයෙන් අත් අඩංගුවට ගත් එකොළොස් දෙනාගෙන් නව දෙනෙකු නිදහස් කිරීමට පූජ්‍ය ඥානසාර හිමියන් සහ පොලිස්පතිවරයා අතර එකඟතාවක් ඇති වී තිබේ. ඒ වෙනුවට, පූජ්‍ය ඥානසාර හිමි මාවනැල්ලේදී පැවැත්වීමට තිබූ බොදු බල සේනා රැස්වීම අවලංගු කිරීමට එකඟ වී ඇත. අපට තවදුරටත් දැන ගන්නට ලැබුණු පරිදි සාකච්ඡාව අතරතුර රජයේ කිහිප දෙනෙක්ම බොදු බල සේනාවේ මතවාදයන්ට විරුද්ධව අදහස් පල කිරීමට උත්සාහ දරා තිබේ. එක් අවස්ථාවකදී, අමාත්‍ය කුමාර වෙල්ගම මහතා මැදිහත්වූ විටදී, පූජ්‍ය ඥානසාර හිමියන් විසින් ඔහුට කෑගසූ අතර එහි ප්‍රතිඵලය වශයෙන් කාමරයෙන් ඉවත්ව යන ලෙස කුමාර වෙල්ගම මහතාගෙන් ඉල්ලා තිබේ.[74]

## අළුත්ගම කෝලාහලය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ නියෝජිතයන්ගේ නිල ප්‍රකාශ

අළුත්ගම සිද්ධිය සම්බන්ධයෙන් විධායකයේ ප්‍රථම ප්‍රතිචාරය වශයෙන් දක්නට ලැබෙනුයේ ජනතාවට සන්සුන්ව ක්‍රියා කරන ලෙසට ජනාධිපති රාජපක්ෂ මහතා විසින් ට්විටර් හරහා කළ අවවාදයයි. මීළඟ පරිච්ඡේදයේ සඳහන් වන පරිදි, සිද්ධියෙන් පසුව සිදු වූ මාධ්‍යය ආවරණයන් සීමිත වන අතර, රජය විසින් නිරන්තරයෙන් සිද්ධිය යට ගැසීමට උත්සාහ ගන්නා ලදී. එමෙන්ම කිසිසේත්ම සිදු නොවූ කතාවක් සිද්ධිය සම්බන්ධයෙන් ප්‍රචාරය කිරීමට උත්සාහ දරණ ලදී. රජය විසින් කිසිදු අවස්ථාවක මෙම ප්‍රචණ්ඩත්වයේ ප්‍රමාණය, සිද්ධිය ඇති වූ ප්‍රදේශයන්ගේ සම්බන්ධතාවල සිදු වූ බලවත් බිඳ වැටීම, යුද්ධයෙන් සාමයට පරිවර්තනය වන මෙවන් මොහොතක මෙවැනි සිදුවීම් සිදු වීමේ බරපතලකම, හෝ දකුණේ මුස්ලිම් ජනතාවගේ

74 2014 ජූලි 6 වන දින සිලෝන් ටුඩේ පුවත් පතට ජාතික හෙල උරුම ප්‍රාදේශීය සභා සාමාජික උදය ගම්මන්පිල මහතා විසින් 16 වන දින රැස්වීම පිළිබඳව කරුණු දක්වනු ලබන අතර, මුස්ලිම් පල්ලිය පසු කරමින් ගිය සාමකාමී පෙරහැරට ගල් ගසා බාධා පැමිණවීමේ කතාව නැවත නැවත කියාපානු ලබයි. මෙයට භික්ෂුවට පහර දීම සම්බන්ධ මතභේදකාරී කතාව කරුණක් ලෙස ඇතුළත් අතර, කතාව පොලිස්පතිවරයාට දක්වනු ලබයි.

හැඟීම්වලට සිදු වූ බලපෑම පිළිබඳව පිළිගැනීමක් කර නොමැත. සිද්ධියේ බරපතලකම යට ගැසීමට රජය විසින් ගත් ප්‍රයත්නයේදී ඔවුන්ට ප්‍රජා අතර අවශ්‍ය සංහිඳියා මාර්ග ගැනීමට තිබූ අවස්ථාව මගහැරුණි. මෙලෙස සිදු කිරීමෙන් රජය නැවත වරක් මුස්ලිම් ජනතාව කොන් වූ ජන කොටසක් බවටත්, සිංහල බෞද්ධයන් උසස් බවටත් වන මතවාදය ශක්තිමත් කර තිබේ. මේ හේතුවෙන් බොදු බල සේනාව තවදුරටත් නීතියේ ආධිපත්‍යයට යටත් නොවී දඬුවම් නොලබා හැසිරෙනු ලබයි.

උදාහරණයක් වශයෙන්, දැනට පැවැත්වෙන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිල සැසියේදී සිද්ධිය පිළිබඳ විමසනු ලැබූ ප්‍රශ්න වලට රජයේ ප්‍රතිචාරය වූයේ පහත සිද්ධි අනුපිළිවෙල ඉදිරිපත් කිරීමයි :

ජුනි 12 වන දින, ආරවුලක් හේතු කොටගෙන මුස්ලිම් තරුණයන් තිදෙනෙක් විසින් බෞද්ධ භික්ෂුවකට පහර දෙන ලදී. සැකකරුවන් තිදෙනා මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කොට රිමාන්ඩ් භාරයට ගත් අතරතුර, පොලීසියේ පැමිණිල්ල දැමූ භික්ෂුව රෝහලට ඇතුළත් විය.

ජුනි 15 වන දින, හිමිනම තවත් භික්ෂූන් සහ ගිහි පුද්ගලයන්ද පිරිවරා පන්සල වෙත යන අතරවාරයේදී, දර්ගා නගරයේ මුස්ලිම් පල්ලිය පසු කර යන විට ඔවුන්ට ගල් ප්‍රහාර එල්ල විය. මෙම සිදුවීම ජුනි 16 වෙනි දින වන විට බේරුවල දක්වා ප්‍රචණ්ඩත්වය පැතිරීමට හේතු පාදක විය. පොලීසියට තත්ත්වය පාලනය කිරීමට කඳුළු ගෑස් ගැසීමට සහ ඇඳිරි නීතිය දැමීමට සිදු විය.[75]

ඉහත පළමු ඡේදයේ මුස්ලිම් තරුණයන් භික්ෂුවට පහර දීමට හේතු වූ ආරවුල පැහැදිලි කර නොමැත. තවද, මෙහි වැදගත් වනුයේ, කිසිදු බාහිර තුවාලයක් නොමැතිව රෝහල්ගත වූ භික්ෂුවගේ, ඔහුගේ තුවාල සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය වාර්තාවක් නොමැති වීම පිළිබඳ එහි සඳහනක් නොවීමයි. මුස්ලිම් ජනතාව හා දේපළ විනාශ කිරීම පිළිබඳ පැය දෙකක් මුළුල්ලේ පැවති ප්‍රචණ්ඩත්වය සපිරි වෛරී කථන සහිත රැළියකින් පසුව එම භික්ෂුව නැවත පන්සල වෙත යමින්

75 https://www.colombotelegraph.com/index.php/prompt-action-on-aluthgama-violence-taken-sri-lanka-tells-unhrc/

සිටි බවත් භික්ෂුව කැටුව ගිය ගිහි පිරිස ද එවන් රැළියකට පසු නැවත යමින් සිටි අය බවටත්, දෙවන ඡේදයේ සඳහන් කර නොමැත.[76] තවද, මුස්ලිම් පල්ලිය පසු කරමින් ගිය භික්ෂූන්ට හා ගිහි පිරිසට ගල් ගැසීම ප්‍රචණ්ඩත්වය පැතිරීමේ සිදුවීම වශයෙන් නිරූපණය කර තිබේ. නගරයේ අනෙක් ප්‍රදේශ වල සිදුවූ සංවිධානාත්මක පහර දීම් පිළිබඳව හෝ සිදු වූ බොහෝමයක් පොලිස් ඇඳිරි නීතිය ක්‍රියාත්මක වන අවස්ථාවේදී සිදුවීම යන කාරණය පිළිබඳ කිසිදු තොරතුරක් වාර්තාගත වී නොමැත. මින් පසුව පවා එක් පරිච්ඡේදයක සිදු කළ ප්‍රකාශයක මෙම සිද්ධිය පිළිබඳව සඳහන් වනුයේ, "බෞද්ධ භික්ෂුවකට පහර දීම හේතුවෙන් හට ගත් ප්‍රචණ්ඩත්වය" ලෙසටයි.

මුස්ලිම් ප්‍රජාවේ ක්‍රියා හේතුවෙන් ප්‍රචණ්ඩත්වය ඇරඹුණු බවට වූ මතයෙහි රජය ස්ථාවරව එල්බ සිටින ලදී. විපක්ෂ නායකවරයාගේ ප්‍රකාශයකට ප්‍රතිචාර වශයෙන් 2014 ජුනි 17 වන දින අග්‍රාමාත්‍යවරයා විසින් සඳහන් කළේ, ප්‍රචණ්ඩත්වය පිට දමන්නට පටන් ගත්තේ තුවාල ලද බවක් සඳහන් වන හිමිනමව පිරිසක් විසින් එහිමියන්ගේ දර්ගා නගරයේ පිහිටි පන්සලට රැගෙන යනවිට සිදුකල පහරදීමෙන් බවය. කණ්ඩායම දර්ගා නගරයේ ප්‍රධාන මුස්ලිම් පල්ලිය පසුකළ පසු එක් අවස්ථාවකදී කුමන හෝ කණ්ඩායමකින් ඔවුන්ට ගල්වලින් පහර දෙන්නට පටන්ගත් බව ඔහු පැවසුවේය. ඉන් පසුව ප්‍රචණ්ඩ ක්‍රියා පැතිරීමට පටන්ගත් බව සඳහන් විය.[77]

2014 ජුනි 21 වන දින දිවයින මුළුල්ලේම නොසන්සුන්කාරී තත්ත්වයන් පැතිර යන්නාවූ සන්දර්භය තුළ ජනාධිපතිතුමා විසින් බදුල්ලේ මුස්ලිම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් රැස්කොට විනාඩි දෙකක පටිගත කළ ප්‍රකාශයක් නිකුත් කරන ලදී.[78] අළුත්ගම හා සම්බන්ධ ප්‍රකාශයෙහි සඳහන් වනුයේ මෙය ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ අභිවෘද්ධිය අවතක්සේරු කිරීම සඳහා වන බටහිර කුමන්ත්‍රණයක් විය හැකි බව

76 අද, භික්ෂුවට පහර දුන්නා යයි චූදිත තරුණයන්ගේ සහෝදරයෙකු වන මවුලවීවරයෙකු, ජුනි 12 වන දින අළුත්ගම පොලිස් ස්ථානයේදී බෞද්ධ භික්ෂුවගෙන් බෙල්ලට පා පහරක් ලැබීම සම්බන්ධයෙන් පොලිස්පතිවරයාට පැමිණිලි කරන ලදී. පැමිණිල්ලේදී ඔහු විසින් ඔවුන් භික්ෂුවට පහර දුන්නාය යන්න සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරනු ලබයි.

77 සිරස නිවුස් ෆස්ට්, සවස 7 ට විකාශය වන ප්‍රයිම් ටයිම් නිවුස්, මෙම වීඩියෝව https://www.youtube.com/watch?v=4cTARXgaQKI වෙබ් අඩවියෙන් නැරඹිය හැක.

78 http://colombogazette.com/2014/06/21/mr-orders-police-action-over-hatred/

සහ රටක් යනු "අන් අයගේ" අදහස්වලට ගරු කළ යුතු ස්ථානයක් විය යුතු බවත් එය ශිෂ්ට සම්පන්න සමාජයක ගති ලක්ෂණය වන බවත්ය. සිදුවූ දෙයෙහි බරපතලකම ආසන්න වශයෙන් හෝ පිළිගන්නා මෙම වැඩදායී ප්‍රකාශය සිදු කළ දිනට පසු දිනම ජනාධිපතිවරයා විසින් පවසා ඇත්තේ මිනිසුන් "පොඩි සිද්ධීන්" " මහ ලොකු හර්තාල්"[79] යැයි පවසන බවයි. මාතර අන්තර්ජාතික මහින්ද රාජපක්ෂ ගුවන් තොටුපොළේ සහ මාගම්පුර වරායේ ඉන්ධන ගබඩා කිරීමේ පහසුකම සහ ඉන්ධන පිරවුම් ස්ථානය විවෘත කරන අවස්ථාවේදී, ජනාධිපතිවරයා විසින් විවේචනාත්මක අයුරින් කථා කරමින් කියා ඇත්තේ අළුත්ගම සිදුවීම පමණට වඩා උලුප්පා පෙන්වා ඇති බවයි.[80] ඔහු කියා සිටියේ එල්.ටී.ටී.ඊ. සංවිධානයෙන් කාත්තන්කුඩිහි මුස්ලිම් ජනතාව මරා දමන විට, පැය දෙකක දැන්වීමකින් උතුරෙන් මුස්ලිම් ජනතාව එළවා දැමූ විට හර්තාල් නොකළ අය, අද හර්තාල් කරන බවය. ඔහු තවදුරටත් කියා සිටියේ අළුත්ගම සිදු වූ සිදුවීම හමුදාව ගෙන යාමට තරම් වූ සුවිශේෂී සිද්ධියක් නොවන බවය.[81]

බලයේ සිටි පුද්ගලයින් විසින් සිදු කළ, එකිනෙකට ප්‍රතිවිරුද්ධ එවැනි කථා මාධ්‍ය හරහා බහුලව ප්‍රචාරය වූ අතර, සිදුවීමෙන් අනතුරුව ද සති දෙකක් පමණ යනතුරුත් නොසන්සුන්කාරී තත්වය පැවතීමට ඒවා දායක විය. ජූලි මස මුල් කාලයේදී පවා, රජය විසින් පතිරාජගොඩදී භික්ෂුවකට පහර දීම හේතුවෙන් ඇති වූ සිද්ධියට මීට මුල් වූ බවට දිගින් දිගටම චෝදනා එල්ල කළ අතර, ප්‍රචණ්ඩ ක්‍රියා හට ගත්තේ එම පහර දීමට ලක් වූ භික්ෂුව නැවත පන්සල වෙත රැගෙන යද්දී දර්ගා නගරයේ මුස්ලිම් පල්ලිය ඉදිරිපිටදී සිදුවූ ගල් ගැසීම් වලින් පසුව යන මතයේ අඛණ්ඩව එල්බ සිටියහ. 2014 ජූලි 10 දී, විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා විසින් පුද්ගලික දැන්වීමක් මඟින් විමසන ප්‍රශ්න හරහා අළුත්ගම සහ බේරුවල සිද්ධියේදී සිදු වූ අලාභ හානි පිළිබඳව

79 https://www.youtube.com/watch?v=6Sxl9lYNndk, also see https://www.colombotelegraph.com/index.php/maha-loku-hartals-are-organized-for-minor-incidents-mahinda-slams-mulsim-hartals/ දර්ගා නගරයේ සහ බේරුවල සිටි ජනතාව මෙම කථනය සම්බන්ධයෙන් කතා කළ අතර ඔවුන් ඒ ගැන බෙහෙවින් කණස්සලු වූ අතර එය විවේචනය කළෝය.

80 අළුත්ගම සිද්ධිය අලලා රට පුරා මුස්ලිම් සාප්පු සහ ව්‍යාපාර වසා දමමින් හර්තාලයක් දියත් කිරීමට සැලැස්මක් විය. කෙසේනමුත්, මෙය ප්‍රදේශ කිහිපයක පමණක් සාර්ථක විය. මුස්ලිම් ප්‍රජාවන් සියල්ලකටම පාහේ කිසිදු ආකාරයක විශාල නොසන්සුන් තත්ත්වයක් අවශ්‍ය නොවීය.

81 16 වන දින ප්‍රචණ්ඩ ක්‍රියා නැවැත්වීම පිණිස හමුදාව කැඳවනු ලැබුවත්, අද ඔවුන් ප්‍රදේශ වල සිටින අතර විනාශ වූ දේපල නැවත ගොඩනැංවීමේ නියැලී සිටී.

අග්‍රාමාත්‍යවරයාගෙන් විමසන ලදී. විපක්ෂ නායකවරයාගේ ප්‍රශ්න සඳහා පිළිතුරු වශයෙන් අග්‍රාමාත්‍යවරයා නැවතත් ඉහත කථනයේ සඳහන් කරුණුම ප්‍රකාශ කරන ලදී.[82]

පොලිස්පතිවරයා විසින් සිද්ධිය සිදු වූ වහාම (ජුනි 16 වන දින) නිකුත් කළ ප්‍රකාශය තුළින් ද රජයේ ප්‍රකාශයම ස්ථිර කරන ලද අතර, පොලීසිය සහ විශේෂ කාර්ය බලකායේ සෙබළු එහි නොසිටින්නට සිද්ධිය මීට වඩා බරපතල වීමට ඉඩ තිබුණු බව ඔහු විසින් පවසන ලදී. බොදු බල සේනාව තහනම් කිරීම පිළිබඳ රැස්වීමක් සඳහා සිවිල් සමාජ, යොමු වී දැයි පොලිස්පතිවරයාගෙන් විමසූ විට ඔහු පැවසුවේ, රජය විසින් ප්‍රදේශයේ බෞද්ධ සහ මුස්ලිම් නායකයන් සමඟ පුළුල්ව සාකච්ඡා පැවැත්වූ බවත් එහිදී ඔවුන් දෙපක්ෂය විසින්ම කිසිදු ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදු නොකිරීමටත්, සිද්ධිය ආගමානුකූල ස්වරූපයෙන් නිම කරන බවත් පැහැදිලිවම ප්‍රකාශ කරන ලද බවත් වේ.[83] එමනිසා, ප්‍රචණ්ඩ ක්‍රියා ඇති වේ යැයි රජය බලාපොරොත්තු නොවීය. පොලීසිය සහ විශේෂ කාර්ය බලකාය විසින් ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමට ක්‍රියා නොකළාය යන චෝදනාවට පිළිතුරු වශයෙන් පොලිසිපතිවරයා ප්‍රකාශ කළේ, පොලීසිය සහ විශේෂ කාර්ය බලකාය විසින් අවශ්‍ය, සුදුසු ක්‍රියාමාර්ග නොගත්තේ නම් අළුත්ගම සහ අසල පිහිටි ප්‍රදේශ වල තත්ත්වය මීට වඩා බරපතල වනු ඇති බවයි. ඔහු පැවසුවේ හමුදාවේ සහ පොලීසියේ කැපවීම හේතුවෙන් තත්ත්වය සමනය වු බවයි.[84] මෙය සැබැවින්ම සිදු වූවා විය හැකිය - එනම් පොලීසිය විසින් මුස්ලිම්වරු පහර දෙන්නන් සමඟ ගැටීම වැළැක්වූයේ නැත්නම්, එසේනම් එහි තවත් ලේ වැගිරෙන්නට ඉඩ තිබුණි. කෙසේ නමුත්, කැරලි කණ්ඩායම්වලට එක් මිනිස් කොට්ඨාශයක ගෙවල් හා දේපල ක්‍රමිකව ඉලක්ක කිරීමට ඉඩ හැරීම, කැරැල්ල පාලනය කිරීමට සහ ජීවිත හානි අවම කිරීමට තමන් විසින් යොදාගැනීමට සුදුසු ක්‍රමවේදය බවක් පොලීසිය විසින් සැලකීම අතිශයින්ම ගැටළු උපදවන්නකි.

---

82 2014 ජූලි 10 වන දින හැන්සාඩ් වාර්තාව, පි. 353. ගරු අබ්දුල් හකීම් මහතා විසින් බොදු බල සේනාව විසින් පැවති නොසන්සුන් තත්ත්වයෙන් ප්‍රයෝජන ගත් ආකාරය සහ වෛරී කථනයන් පිළිබඳ ඇතැම් වැදගත් කරුණු විදහා දක්වයි. එහි පූජ්‍ය ඥානසාර හිමියන්ගේ 'අබ සරණයි' යන ප්‍රකාශයට විවේචනයක් විය. එහි අර්ථය 'ඔවුන් විනාශ වේවි' යන්නයි.

83 ප.ව. 7.00 ට සිංහල බසින් විකාශය වන සිරස නිවුස් ෆස්ට් ප්‍රවෘත්ති වැඩසටහන, https://www.youtube.com/watch?v=kPijsObJA3U

84 http://colombogazette.com/2014/06/16/police-did-not-expect-clash-after-rally/

ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් 2014 ජූලි 1 වන දින ඩේලි මිරර් (Daily Mirror) පුවත් පතට අළුත්ගම සිද්ධියට අදාළව ඉතා පුළුල් සම්මුඛ සාකච්ඡාවක් ලබා දෙන ලදී. මෙම සාකච්ඡාවේදී ඔහු සිදුවීම සම්බන්ධයෙන් සිය "කණගාටුව" ප්‍රකාශ කර සිටී අතර, බොදු බල සේනාව හා එවන් වෙනත් කණ්ඩායම් සමඟ කිසිදු සම්බන්ධතාවක් නොමැති බවද ප්‍රකාශ කරන ලදී. ඔහු බොදු බල සේනාව විසින් සංවිධානය කරන ලද අවස්ථාවකට සහභාගී වීමේ සිද්ධිය සම්බන්ධ සාක්ෂිය මෙම ස්ථාවරත්වයෙන්ම නිශ්ප්‍රභා කරන ලදී.

මුස්ලිම් ජනතාව පිළිබඳව කථා කරමින් ඔහු පහත කරුණු සඳහන් කරන ලදීඃ

> මුස්ලිම් ප්‍රජාව ගැන විශේෂයෙන් කතා කරනවා නම්, සිංහල බෞද්ධයන්ට පමණක් නොවේ සිංහල කතෝලිකයන්ටත් ඔවුන් සමඟ ඇතැම් ගැටළු තිබෙනවා. මන්නාරමේ සිංහලයන් නැහැ. නමුත් එහි මුස්ලිම් ජනතාව සහ දෙමළ ජනතාව අතර ප්‍රශ්න තිබෙනවා. ත්‍රිකුණාමලයේ දෙමළ ජනතාව පිළිබඳ කුමක්ද කියන්නේ? ඒ අයටත් ප්‍රශ්න තියෙනවා. එතකොට මට මේ ප්‍රශ්න ගෙනා වත්තල හා ජා-ඇල ප්‍රදේශ වල කතෝලිකයන් පිළිබඳ මොනවද කියන්නේ? මේ නිසායි මම මුස්ලිම් අයත් සමඟ කතා කළ යුතුයි කියන්නේ. මම දැනට ඒ අය එක්ක පුළුල් සාකච්ඡා පවත්වමින් යනවා. සීමිත මුස්ලිම් ජන කොට්ඨාශයක් තමයි මට කිවුවේ ඔවුන්ට මුස්ලිම් ප්‍රජාවේ ඇතැම් අන්තවාදී අංගයන් සමඟ ගැටළු පවතින බව. ඔවුන් මට එවන් අය පිළිබඳව පැවසුවා. අපි මෙම මධ්‍යස්ථ අය සමඟයි වැඩ කරන්නේ. මම කියන්නේ නෑ රටේ මුස්ලිම් ත්‍රස්තවාදියෝ ඉන්නවා කියලා. ඉන්දියාවට විරුද්ධව ක්‍රියා කිරීමට ශ්‍රී ලංකාව තුළ ඉස්ලාමීය ත්‍රස්තවාදීන් ඇතිවීමේ ප්‍රවණතාවක් පවතින බව ඉන්දීය බුද්ධි අංශය විසින් මට පැවසුවා. අපි මේ පිළිබඳව පරීක්ෂා කළත් එවන් දෙයක් සඳහා මෙහි කිසිදු ඉඩකඩක් නොමැති බව අපි සොයා ගත්තා. අපේ බුද්ධි ඒකක මේ සම්බන්ධ ගැටළු වලදී ඉතා ක්‍රියාශීලීයි. නමුත් ආරක්ෂක අංශ හා රජයෙන් ඔබ්බට යන ඇතැම් කරුණු

තියෙනවා. ආගමික නායකයන් එක්වී මේ සම්බන්ධයෙන් කටයුතු කළ යුතුයි. මම මේ සම්බන්ධයෙන් උපරිමයෙන් ක්‍රියා කළා. මම මුස්ලිම් ප්‍රජාවන් සහ ආගමික නායකයන්ව කිහිප විටක්ම මුණ ගැසුණා; අපේ බුද්ධි අංශ මෙවන් ප්‍රශ්න වැළැක්වීමට ඔවුන් සමඟ කටයුතු කර තිබෙනවා.[85]

ඉහත උපුටා ගැනීමේදී, ආරක්ෂක අමාත්‍යවරයා විසින් රටේ ඉස්ලාමීය ත්‍රස්තවාදීන් සම්බන්ධ සාක්ෂි අල්ප බව පවසමින්, කෙසේ හෝ මුස්ලිම් ජනතාව "ගැටළුවක්"ය යන්න ප්‍රකාශ කරන බව පෙනේ. ඔවුන් සිංහල ජනතාවට පමණක් නොව සිංහල කතෝලිකයන්ට, දෙමළ කතෝලිකයන්ට, නැගෙනහිර පළාතේ දෙමළ ජනතාවට සහ වත්තල සහ ජා-ඇල ප්‍රදේශවලට කතෝලිකයන්ට ද ගැටළුවක් බව ඔහු පෙන්වයි. මීට අමතරව ඔහු විසින් තවදුරටත් ප්‍රකාශ කරනුයේ " සාම්ප්‍රදායික මුස්ලිම් අය" හා "අන්තවාදී මුස්ලිම් අය" අතර වෙනසක් පවතින බවයි. මුස්ලිම් ජනතාව සමඟ සම්බන්ධකම් ඇති කර ගැනීම යහපත් බව ආරක්ෂක ලේකම්වරයා විසින් පැවසීම වැදගත් වන නමුත් දිවයිනේ විවිධ ප්‍රදේශවල පුද්ගලයන් හා ප්‍රජාවන් අතර ඇතිවන ගැටළු පොදු "මුස්ලිම් ගැටළුවක්" ලෙස සීමා කර පෙන්වන අදහස් ඔහු විසින් ද පැතිරවීම ගැටළු සහගතය. එවන් සීමා කිරීමකින් අදහස් වනුයේ සියලුම මුස්ලිම් ප්‍රජාවන් කොයි ආකාරයෙන් සිටියත්, ඔවුන්ගේ පන්තිය, කලාපීය, නිකායික, භාෂාමය සහ ප්‍රතිසංස්කරණවාදී විවිධත්වය ආදිය කුමක් වුවත් ශ්‍රී ලංකාවේදී ඔවුන් සියළු දෙනා එකම ආකාරයක පුද්ගලයින් ලෙස සලකනු ලබන බවයි. මෙය ආරක්ෂක අමාත්‍යවරයාට පමණක් සීමාවූ සත්‍යයක් නොව, සියල්ලන්ටම පොදුය සත්‍යකි. මෙවන් ගැටළු පොදුවේ "මුස්ලිම් අය සමඟ පවතින ගැටළු" වශයෙන් හඳුන්වමින් ආරක්ෂක ලේකම්වරයා බොදුබල සේනාවේ හඬ ප්‍රතිරාව නංවන අතරම ඔහුගේ සහ මුස්ලිම් ජනතාව පිළිබඳව බොදුබල සේනාවේ පවතින්නාවූ මතවාදය අතර පවතින මූලික සමානකම් හෙලිදක්වනු ලබයි.

85 http://www.dailymirror.lk/news/49090-if-proven-i-will-resign-gota.html

## අළුත්ගම සිද්ධිය සම්බන්ධයෙන් විපක්ෂය වන එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිචාරය

මාධ්‍යය සාකච්ඡාවලදී සහ පාර්ලිමේන්තුවේදී එක්සත් ජාතික පක්ෂය විසින් මෙම ගැටළුව පිළිබඳ ගෙනහැර පෑම හේතුවෙන් මෙම සිදුවීම ප්‍රසිද්ධ ලේඛන වල සඳහන් වූ කරුණක් බවට පත් වී තිබේ.[86] ජුනි 20 වන දින පාර්ලිමේන්තුවේදී විපක්ෂ නායකවරයා විසින් කැඳවන ලද රැස්වීම, ජුනි 30 වික්‍රමසිංහ මහතා අළුත්ගමට යාම සහ එහිදී ඔහු කළ කතාව මෙන්ම ජුනි 19 සහ ජූලි 10 මෙම ප්‍රශ්නය පාර්ලිමේන්තුව හමුවේ ගෙනහැර දැක්වීම ඇතුළුව විපක්ෂය මගින් සුවිශේෂී මැදිහත් වීමක් මෙයට ලබා දෙනු ලබයි.

තවද, එ.ජා.ප. පාර්ලිමේන්තු මන්ත්‍රී පාලිත තෙවරප්පපෙරුම මහතා දර්ගා නගරයේ වූ සිදුවීම ඇසින් දුටු සාක්ෂිකරුවෙකි. තිගැස්ම හේතුවෙන් හෘදයාභායක් වැළඳී මිය ගිය වැලිපැන්න ප්‍රදේශයේ පුද්ගලයෙකුගේ මළ ගෙදරකට සහභාගී වීම සඳහා පවුලක් කැටුව ඒමට වැලිපැන්නේ සිට දර්ගා නගරයට යාමට මන්ත්‍රීවරයා 16 වන දින සවස කැමැත්තෙන් ඉදිරිපත් වී තිබේ.

මියගිය අයගේ පවුලේ සාමාජිකයින් වන ළමුන් සහ කාන්තාවන් පිරීගිය වෑන් රථයක නැගී ආපසු පැමිණෙමින් සිටි ඔවුනට ඒ වන තුරුත් දර්ගා නගරය අවට සැරිසරමින් සිටි කලහකාරීන් පිරිසක් විසින් පහර දී තිබේ. තෙවරප්පෙරුම පවසනුයේ පිරිස කඩු සහ විශාල ලී මුගුරු වලින් සන්නද්ධව සිටි බව සහ සිය ගණනක් පොලීසිය බලා සිටියදී නිදහසේ ඒ මේ අත ඇවිදිමින් සිටි බවයි. ඔහු පැවසුවේ ඔහුගේ වාහනයට පහර දෙනු ලැබූයේ විශාල කොන්ක්‍රීට් කැල්ලකින්

86 පළාත් සභික ඒ. අසීම් විසින් අළුත්ගම සිද්ධිය හෙළා දකිමින් යෝජනා කරන ලද මෝසම උතුරු පළාත් සභාවේදී සම්මත විය. ආනන්දි සෂීදරන් මෝසම සම්බන්ධයෙන් අදහස් දක්වමින් කියා සිටියේ ඔවුන් අළුත්ගම සිදුවීම හෙළා දකින බවයි. කෙසේ නමුත් ඇය පෙන්වා දෙන පරිදි, වෙල්ලමුල්ලිවෙක්කාල් සිදුවීම අවස්ථාවේදී මුස්ලිම් ජාතිකයින් දෙමළ ජාතිකයින් වෙනුවෙන් එසේ කථා කර නොමැත. තවද ඇය ප්‍රකාශ කළේ ප්‍රභාකරන් මියගිය විට මුස්ලිම් අය ද රතිඤ්ඤා පත්තු කළ බවයි. එසේ වුවද අද දෙමළ ජාතිකයින් මුස්ලිම් ජාතිකයින් සමඟ සිටිනු ඇත. මුස්ලිම් ජාතිකයින් යුද්ධය පවතින විටදී සහ ඉන් පසුවත් රජය සමඟ සිටීම සැලකිල්ලට ගත යුතු කරුණකි. දෙමළ සහ මුස්ලිම් ජාතිකත්වය අතර පවතින සංකීර්ණත්වය පිළිබඳව කතාවෙහි අන්තර්ගත නොවූවත්, මෙය සුළුතරය අතර පවතින වෙනස්කම් මෙන්ම වඩා හොඳ විශ්වාසයක් ගොඩනැංවීමේ අවශ්‍යතාව සහ අවස්ථාවල වැදගත්කම සිහි ගන්වනු ලබයි. නැගෙනහිර පළාත් සභා මුස්ලිම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විසින් අළුත්ගම සිදුවීම නැගෙනහිර පළාත් සභාවේදී ඉදිරියට ගෙන ඒමට දැරූ උත්සාහය අසාර්ථකවූ බවද මෙම අවස්ථාවේදී ප්‍රකාශ කිරීම වැදගත් වේ. (දිවයින, 2014 ජුනි 27, පි.1)

බවයි. එයින් විසි වූ කැල්ලක් ඇතුළේ සිටී කාන්තාවකගේ ඔළුවේ පැත්තක වැදුණි. තවත් කැල්ලක් අවුරුදු 9 ක දරුවෙකුට වැදුණි. ඔහු පැවසුවේ ඔහු වාහනයේ ඉදිරිපස තිබූ වීදුරුවේ කුඩා සිදුරකින් බලාගෙන පිරිස අතරින් එලවාගෙන ගිය බවය. තෙවරප්පෙරුම මහතා 2014 ජුනි 18 වන දින පාර්ලිමේන්තුවේදී මෙම අදහස් ප්‍රකාශ කරන ලදී.[87] ඩේලි මිරර් පුවත් පතේ අන්තර්ජාල සංස්කරණයට ලබා දුන් සම්මුඛ සාකච්ඡාවකදී ප්‍රචණ්ඩත්වයට රජය වගකිවයුතු බව කියමින් තෙවරප්පෙරුම මහතා රජයට චෝදනා කරන ලදී. ඔහු පැවසුවේ අලාභයට පත් වූ එක් මුස්ලිම් පල්ලියක ඇත්ත වශයෙන්ම ක්ලේමෝ බෝම්බයක් පුපුරා ගිය බවයි. ඔහු එසේ පැවසුවේ හිටපු හමුදා සාමාජිකයෙකු වශයෙන් එවන් පිපිරුම් ද්‍රව්‍ය පිළිබඳව අවබෝධයක් පවතින නිසා සහ පල්ලිය ඇතුළත සිදු වී ඇති හානියට හේතුව පෙට්‍රල් බොම්බයකින් සිදු වූවක් නොවන නිසාය.[88] තෙවරප්පෙරුම තවදුරටත් කියා සිටියේ පොලිස්පතිවරයා ඉල්ලා අස් නොවුවහොත් ඔහු ඉල්ලා අස් වන බවයි. එලෙස පොලිස්පතිවරයා අස් නොවූ තැන මන්ත්‍රීවරයා සිය අස්වීමේ ලිපිය විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා අතට භාර දුන්නේය.[89]

අධිකරණ වෛද්‍ය වාර්තා අනුව වැලිපිටියේදී ඝාතනයට ලක් වූ තරුණයන් දෙදෙනාගෙන් එක් අයෙකුගේ මරණය සිදු වූයේ කැපුම් තුවාල හේතුවෙනි. මීට ප්‍රතිචාර වශයෙන් එ.ජා.ප. මන්ත්‍රී මංගල සමරවීර මහතා විසින් මාධ්‍යය සාකච්ඡාවක් කැඳවා ප්‍රචණ්ඩත්වයට හේතු වීම සම්බන්ධයෙන් හා සිද්ධියෙන් පසු කරුණු වසන් කිරීම පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශයට චෝදනා නගන ලදී. ඔහු මෙම සිද්ධියට සම්බන්ධ යැයි කියන හමුදා නිළධාරීන් තිදෙනෙකුගේ නම් සඳහන් කරන ලදී. එවිට ඔහුට රාජ්‍ය රහස් පනත යටතේ නීතියෙන් තර්ජන එල්ල කරන ලදී.[90]

87 http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=105387 (Thewarapperuma complains that Police STF watched as thugs attacked him, some Muslims. 2014 ජුනි 19 දින අයිලන්ඩ් පුවත්පතේ වෙබ් සංස්කරණය)

88 https://www.colombotelegraph.com/index.php/stf-police-watched-the-savages-run-riot-claymore-bomb-was-used-on-mosque/

89 විපක්ෂ නායකවරයා එය භාරගැනීම ප්‍රතික්ෂේප කළ බව අමුතුවෙන් කිවයුතු නොවේ.

90 2014 ජුනි මස 28 දින අයිලන්ඩ් පුවත්පත Arrest those who assist BBS in committing crimes against Muslims.

ජූනි 29 වන දින රනිල් වික්‍රමසිංහ මහතා එ.ජා.ප. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කණ්ඩායමක් ද කැටුව අළුත්ගම දර්ගා නගරයට ගියේය. අධිකාරිගොඩ මැඩ්රාසතුල් රහුමාන් මුස්ලිම් පල්ලියේදී ප්‍රදේශයේ මුස්ලිම් සහ සිංහල නියෝජිතයින් විශාල පිරිසක් විපක්ෂ නායකවරයා සමඟ එක්වී මූලික කරුණු කිහිපයක් ගෙනහැර දක්වන ලදී. 1. මෙම ප්‍රදේශය ශ්‍රී ලංකාවේ සියලුම ආගම් සහ ජාතිකත්ව කණ්ඩායම් එක්ව දිගු කාලයක් එකට ජීවත් වූ ප්‍රදේශයකි. විවිධ ආරවුල් ඇති වූ අවස්ථාවන්හීදී ආගමික සහ ප්‍රජා නායකයන් එක්ව දේශීය යාන්ත්‍රණයන් සහ දේශීය මැදිහත්වීම් හරහා එවන් කරදර පොදුවේ සමථයකට පත් කර තිබේ. කෙසේනමුත්, මෙම සිද්ධියේදී පිටින් ආ පිරිස්වලට ප්‍රචණ්ඩත්වය වර්ධනය කිරීමට අවසර ලබා දී ඇත. 2. අළුත්ගමදී 15 වෙනිදා බොදු බල සේනාව විසින් පවසන ලද අසභ්‍ය කතා දැන් ලොව පුරාම උපසිරසි සමඟ ප්‍රචාරය වේ. මෙය සිංහලයන් පිළිබඳව ඉතා වැරදි සහගත ආකල්පයක් ගොඩ නංවනු ලබයි. 3. මුස්ලිම් සාප්පු සහ ව්‍යාපාරවලට සිදු වූ හානිය සිංහල ජන සමාජයට ද බලපානු ලබයි. මෙය ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයට ද බලපානු ඇත. 4. ඔහු විසින් පවසන ලද්දේ සියලුම ජනතාවට ඉදිරියට පැමිණ එකට එක්වී තමන් අතර ඇති භේද දුරලීමට කාලය පැමිණ ඇති බවයි. එසේම සිංහල බෞද්ධයන් පසුගාමී සහ ම්ලේච්ඡ පුද්ගලයන් නොවන බව ලොවට පෙන්විය යුතු බවයි.

වඩාත්ම බලපෑමට ලක්වූයේ කවුරුන්ද යන්න පිළිබඳව ඍජුව සඳහන් කිරීම මගහැර යමින්, වගකීම සඳහා ඉදිරිපත් වන ලෙස රජයෙන් ඉල්ලා සිටි විපක්ෂ නායකවරයා සඳහන් කළේ අද මුස්ලිම් ජනතාවගේ සාප්පු ඉලක්ක වූවත්, හෙට නිත්‍ය වශයෙන්ම සිංහල සාප්පු ඉලක්ක විය හැකි බවයි. තවද ඔහු සිද්ධියෙන් අලාභ හානි සිදුවූ සියලුම ජනතාව වෙත ඔහුගේ කණගාටුව ප්‍රකාශ කර සිටි අතර මෙරට කිසිදු ආකාරයක අන්තවාදයකට ඉඩ නොමැති බව ප්‍රකාශ කරන ලදී.[91]

2014 ජූනි 26 වන දින පාර්ලිමේන්තුවේ දී සහජීවනය පිළිබඳව පැවැත් වූ විශේෂ රැස්වීමකදී වාර්ගික සමගිය රැක ගැනීමට සහ 1983 ඇති වූ

91 ඉහත ප්‍රකාශය 2014 ජූනි 30 වන දින ලංකාදීප පුවත්පතේ (1 පිටුවේ සහ 10 පිටුවේ) පළ වූ ප්‍රකාශයක අනුවාදයකි.

ආකාරයේ කැරළි යළි ඇති වීම වැළැක්වීම සඳහා ඔවුන්ගේම ජාතික බහු ආගමික කමිටුවක් ඇති කර ගැනීමට එ.ජා.ප.ය විසින් කටයුතු කරන ලදී. තමන්ට 1983 කැරැල්ල නැවැත්වීමට නොහැකි වූ බව පිළිගත් විපක්ෂ නායකවරයා විසින් මෙම මූලාරම්භය තුළ පොදු හා ස්වාධීන ප්‍රවේශයක් පවතිනු ඇති බවත් එය රජයේ උදව් සහ අදහස් මත නොරැඳෙනු ඇති බවත් තවදුරටත් සඳහන් කරන ලදී. කමිටුව තුළ පහත අංගයන් අඩංගු බව පුවත් පත් මගින් වාර්තා කරන ලදී.

> යෝජිත කමිටුව ප්‍රධාන වශයෙන් "අළුත්ගම සහ බේරුවල සිදු වූ ගැටීමෙන් උගත් පාඩම්වලින් බහු ආගමික සංහිඳියාවක් ගොඩ නංවමින් ඒ සම්බන්ධයෙන් වාර්තා වී ඇති කරුණු නිවැරදි කිරීමටත් රටේ සියලුම ආගමික විශ්වාසයන්ට ව්‍යාවස්ථාපිත අයිතියක් තහවුරු කිරීමටත්, සෑමවිටම යුක්තිය හා සමානාත්මතාව පවත්වා ගන්නා අතරතුර නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කිරීමට සහ අනාගත තීන්දු තීරණයන් ගැනීමේදී සියලුම ආගමික නායකයන්ගෙන් අදහස් විමසීමටත්" රජයට බල කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත.[92]

පුවත්පත් වාර්තාවෙන් තවදුරටත් ප්‍රකාශ කළේ:

> 1983 ජූලි කැරැල්ල නැවැත්වීමට එ.ජා.ප.යේ අපොහොසත් වීම පිළිගත් විපක්ෂ නායකවරයා පැවසුවේ: "බොදු බල සේනාවට රජයෙන් සහාය ලැබේ. රජය විසින් මෙවන් දේ සිදුවීමට ඉඩ නොදිය යුතුය. මෙම සිදුවීම යම් හෙයකින් තවත් කළු ජූලියකට මඟ පෑදුවහොත්, අපි කිසිවෙකුටත් ඉන් වන හානිය පිළිබඳව සිතා ගත නොහැකි වනු ඇත" යනුවෙනි.

## අළුත්ගම සිද්ධිය පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණ (ජ.වි.පෙ.) දක්වන ලද ප්‍රතිචාරය

අළුත්ගම සිද්ධියේදී ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වය ඉතා ක්‍රියාශීලී විය. ඔවුන් ප්‍රදේශයට පළමුවෙන්ම පැමිණි පිරිස අතර වූවා සේම ඔවුන් විසින් ප්‍රදේශවාසීන්ට සිය කණගාටුව ප්‍රකාශ කරන ලදී. මීට

92 UNP Raps Government. 2014 ජූනි 27 ඩේලි එෆ් ටී බලන්න. (1 පිටුව) තවද ජූනි 27 දින දිවයින පුවත්පත බලන්න.

අමතරව, ඔවුන් පාර්ලිමේන්තුවේදී ද සිද්ධියට කිහිප වරක් අවධානය යොමු කරන ලදී.

මෙම ප්‍රචණ්ඩ ක්‍රියා පිටුපස සිටීම පිළිබඳව ඔවුන් විසින් රජයට ප්‍රසිද්ධියේ චෝදනා නඟන ලදී.[93] රටේ නීතිය හා සාමයේ පිරිහීම පිළිබඳව 2014 ජූලි 10 වන දින කළ විවාදය අතරතුරදී, ජ.වි.පෙ. නායක අනුර කුමාර දිසානායක මහතා විසින් රටේ නීතිය හා සාමය පිරිහීමට අළුත්ගම සිද්ධිය ඍජුවම සම්බන්ධ කරන ලදී. එසේම ඔහු විපක්ෂ නායකවරයාගේ ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් අග්‍රාමාත්‍යවරයා විසින් හානිවූ දේපල සම්බන්ධව දුන් සංඛ්‍යා දත්ත නිවැරදි කරන ලද අතර, දේපල හානි පිළිබඳ නිවැරදි දත්ත වාර්තා කරන ලදී. ඔහු පැවසුවේ මුස්ලිම් පල්ලි තුනකට හානි සිදුව ඇති බවත් බුද්ධ ප්‍රතිමාවක් පිහිටුවා තිබූ ස්ථානයක වීදුරුවක් බිඳී තිබුණු බවත් මෙම සිදුවීම රටේ ඉතිහාසයට කළු පැල්ලමක් බවත් ය. තවද හානි වූ දේපළ නැවත ඉදිකිරීම සඳහා ලබා දීමට පොරොන්දු වූ රුපියල් මිලියන 200 ඒ සඳහා ප්‍රමාණවත් නොවන බව ඔහු පැවසීය. අළුත්ගම පිහිටි මල්ලිකාස් රෙදි සාප්පුව පිළිබඳව කතා කරමින් ඔහු පැවසුවේ 2006 දී සිදුවූ මෙවැනිම සිදුවීමක් හේතුකොට ගෙන ඔවුන්ට රජය විසින් ලබා දීමට පොරොන්දු වූ වන්දිය මේ වනතුරුත් ලබා දී නොමැති බවයි. එනිසා, ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මෙම අවස්ථාවේදී ගෙවන බව සඳහන් වන මිලියන 200 සම්බන්ධයෙන් රජයේ විශ්වාසනීයත්වය පිළිබඳ ඔහු බරපතල ලෙස ප්‍රශ්න කළේය.

## දෙමළ ජාතික සන්ධානය

2014 ජුනි 17 වන දින දෙමළ ජාතික සන්ධානයේ නායක ආර්. සම්බන්දන් මහතා විසින් අළුත්ගම සිද්ධිය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරන ලදී. ඔහු විසින් පූජ්‍ය ගලගොඩඅත්තේ ඥානසාර හිමියන් පවත්වන ලද වෛරය සහ ප්‍රචණ්ඩත්වය උලුප්පන කථාව සහ සිදුවීම අතරතුර පොලිසියේ අකාර්යක්ෂමතාව පිළිබඳව ඉස්මතු කර දක්වන ලදී. පෙරහැර නොනැවැත්වූයේ ඇයි දැයි ඔහු ප්‍රශ්න කළ අතර, එහෙත් වැටුප් වැඩි කිරීම් සහ විවිධ ප්‍රශ්නවලට විරෝධය දක්වන සිසුන් මැඩ පැවැත්වීමට

93 http://www.srilankanews.lk/index.php/news/general-news/3637-those-who-sparked-aluthgama-clashes-backed-by-government-jvp

නම් රජය ඉතා ක්‍රියාශීලීව කටයුතු කරන බව ප්‍රකාශ කළේය. මෙවන් සිදුවීම්වලට සමගාමීව නොසන්සුන්බව ඉහළ මට්ටමක පවතින අවස්ථාවක එවන් පෙරහැරක් යාම නොවැළැක්වූයේ මන්ද යන කරුණ පිළිබඳව ඔහු සිය විශ්මය පළකරන ලදී.[94]

## "අළුත්ගම පිළිබඳ 'සත්‍ය කතාව'"

විපක්ෂයේ දේශපාලන පක්ෂ මෙම සිදුවීමේ වගකීම රජයට පවරන්නා වූ හේතු සාධක විශ්ලේෂණය කරන අතරතුර, රජයේ ආයතන සහ නිළධාරීහු භික්ෂුවට පහර දීම හා පෙරහැරට ගල් ගැසීම යන සිද්ධීන් සම්බන්ධ වූ ඔවුන්ගේ කථාවේම එල්බ සිටියහ. මේ අතරතුර ජාතික හෙල උරුමය මෙම සිදුවීම මුස්ලිම් විරෝධී ව්‍යාපාරයක් වශයෙන් පෙන්වීමට තවදුරටත් ප්‍රයත්න දැරීය. අළුත්ගම සිද්ධියෙන් අනතුරුව එහි වාර්ගික-ආගමික නොසන්සුන්තාවන් දිගින් දිගටම ඇවිල යාමට ජාතික හෙල උරුමය විසින් කරගෙන ගිය මෙම ව්‍යාපාරය හේතු වූ අතර, එහි සාමාජික චම්පික රණවක මහතා මුස්ලිම්වරුනට වරද පටවන්නා වූ හා සිංහලයන් විපතට පත්වූවන් ලෙසින් පෙන්නුම් කරන ආකාරයේ කරුණු දක්වමින් මෙම සිදුවීම නැවත කියා පෑමට උත්සාහ කළේය.

ජාතික හෙල උරුමයේ පාර්ලිමේන්තු මන්ත්‍රී පාටලී චම්පික රණවක මහතා අළුත්ගම කැරැල්ල සිදු වූ සැනින්ම රූපවාහිනී මාධ්‍යයෙන් ජනතාවට සන්සුන් වන ලෙස ඉල්ලා සිටියේය. කෙසේ නමුත්, භික්ෂුන් වහන්සේට පහර දීම සහ පෙරහැරට ගල් ගැසීම යන සිද්ධීන් දෙක ඉස්මතු කරමින් මන්ත්‍රීවරයා දක්වන අදහස්, සිද්ධිය සම්බන්ධයෙන් රජයේ දැක්ම ඉස්මතු කර දක්වන්නක් වේ. භික්ෂුව හා මුස්ලිම් තරුණයන් අතර ඇති වූ සුළු ආරවුල විශාල හබයක් බවට පත් කළ අය ඔහු විසින් විවේචනය කරන ලදී. තවද මෙවන් සිදුවීමක් පොසොන් පොහොය දිනක සිදුවීම මුළු බෞද්ධ සමාජයට ම විශාල නිග්‍රහයක් වන බවත් ඔවුන් ගෙන ගිය මෙම "අන්තවාදී ක්‍රියාපිළිවෙල" පිළිබඳව මුස්ලිම් පිරිස සිංහල බෞද්ධ ජනතාවගෙන් සමාව අයැද සිටිය යුතු බවත් ඔහු උදක්ම ප්‍රකාශ කර සිටියේය. මෙම

94 2014 ජූනි 20 දින අයිලන්ඩ් පුවත්පත, පි.3.

සිද්ධියේදී සිංහලයින් මුස්ලිම්වරුන්ට පහර දුන් ආකාරයක් පෙන්නුම් කිරීමට ඇතැමුන් උත්සාහ දැරුවත්, ඇත්තෙන්ම සිද්ධිය මුස්ලිම් "ජිහාඩින්" ගේ සංඥා අනුව සිදුවූවක් බව ඔහු පැවසීය. එලෙසම ඔහු තවුහීඩ් ජමාත් සංවිධානය "අන්තවාදී" සංවිධානයක් බව කියා සිටි අතර, බොදු බල සේනාව සහ අනෙකුත් බෞද්ධ කණ්ඩායම් වෙත අවධානය යොමු කිරීමට මත්තෙන් ඔවුන් (තවුහීඩ් ජමාත් සංවිධානය) සහ අනෙකුත් "අන්තවාදී" කණ්ඩායම් පිළිබඳව වගබලා ගත යුතු බව ද ඔහු පැවසීය.[95]

ජූනි 21 වන දින දෙවන මාධ්‍යය සාකච්ඡා වද කැඳවන ලදී. මෙම මාධ්‍යය සාකච්ඡාවේදී විපතට පත් වූ පතිරාජගොඩ සිංහල පවුල් පිළිබඳ විනාඩි 14 ක වීඩියෝ දර්ශනයක් ද පෙන්වන ලදී. මෙම වීඩියෝ දර්ශනය, ලිඛිත ශිර්ෂ පාඨයන් සහ සංගීත පාඨයන් ඇතුළත් කර, පිළිස්සුනු නිවෙස්වල දර්ශන මෙන්ම අවසාන අවධියේදී වැලිපැන්නේ විනාශ වූ ගොඩනැගිල්ලක පවතින බුද්ධ ප්‍රතිමාවක දර්ශනයක් ද සහිතව සංස්කරණය කොට තිබිණි. මෙම දර්ශන තුළින් ගොඩනැගිල්ලේ හානියට පත් වූ ජනෙල් සහ අභ්‍යන්තර බිත්ති ආදිය විස්තර කොට දක්වයි. තොරතුරු විමසන ලද එක් පුද්ගලයෙක් පැවසුවේ වටේම පොලීසිය සිටි අතර ඔවුන් පහර දෙනු ලබන කලහකාරි පිරිස් හට - "පහර දුන්නාට කමක් නැහැ (ගොඩනැගිලි වලට හානි පැමිණවීමට) ඒත් ගිනි තියන්න එපා" යැයි පවසන ලද බවයි. "සිංහල" පාර්ශ්වයේ කතාව පැවසීමට යාමේදී, මෙම සිදුවීම සම්බන්ධයෙන් රණවකගේ මැදිහත්වීම වාර්ගික හැඟීම් අවුස්සන සුළු එකක් විය. ජූනි 15 වන දින වන විට සිද්ධියෙන් පසු ප්‍රදේශයේ දෙපාර්ශ්වයේම පිරිස් විවිධ ආකාරයෙන් ප්‍රචණ්ඩ ක්‍රියා වලට ගොදුරුව සිටි අතර, මෙය ප්‍රදේශවාසීන්ට සිද්ධිය මඟ හැරීමට යම්කිසි දෙයක් කිරීමට නොහැකි අවස්ථාවක් ලෙස හඳුනාගත හැකිය. මෙම සිදුවීම සිංහල-මුස්ලිම් ගැටුමක් (සහ ඔවුන් විසින්ම ඇති කරගත් දෙයක්/ මුස්ලිම් අයගෙ න් ආරම්භ වූ ක්‍රියාවක්) වශයෙන් බැලීම මෙන්ම අළුත්ගම සිදුවීමේ "සත්‍ය කතාව" වශයෙන් දැක්වීමට සිදුවීම දුර්භාග්‍යයකි.[96]

95 http://www.gossiplankahotnews.com/2014/06/patali-champika-ranawaka-on-muslim.html

96 සිංහල ජාතිකත්වය සහ සිද්ධිය පිළිබඳ දේවසිරිගේ විශ්ලේෂනයද බලන්නඃ https://www.colombotelegraph.com/index.php/an-alternative-analysis-of-aluthgama/

වීඩියෝ දර්ශනය සමඟ පවතින ඔහුගේ ප්‍රකාශයෙහි, රණවක විසින් මුස්ලිම් ජනතාව ජිහාඩ්වරු වශයෙන් දක්වා ඇත. ඔහු විසින් තවදුරටත් ප්‍රකාශ කර සිටියේ පොලීසිය විසින් දර්ගා නගරයේ මුස්ලිම් පල්ලියේ පුද්ගලයන් තුන් දහසකට රැස්වීමට අවසර ලබා දුන් බව සහ පිරිස් අතර සිංහල විරෝධී සහ බෞද්ධ විරෝධී අදහස් පැතිරවීමට කොළඹ සිට පුද්ගලයන්ට පැමිණීමට අවසර ලබා දුන් බවයි.[97] පෙරහැරට ගල් ගැසීම සංවිධානාත්මක ක්‍රියාවක් වශයෙන් ඔහු විසින් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. නිර්මාල් දේවසිරි (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාසය පිළිබඳ අධ්‍යයන අංශය) ට අනුව, රණවකගේ මාධ්‍යය ප්‍රකාශය පිළිබඳ වෙනත් ආකාරයකින් පවසන්නේ නම්, එය සත්‍යයේ මිශ්‍රණයක්, අර්ධ සත්‍යයක් සහ බොරුවකි. විශ්ව විද්‍යාලයට යන තරුණයින්ට හා තරුණියන්ට තොප්පිය පැළඳීමට හා බුර්කාව ඇඳීමට බලකරන්නා වූ[98] කුඩා ජිහාඩ් කණ්ඩායම් මධ්‍යස්ථ මුස්ලිම් පිරිස් අතර සිටින බව රණවක විසින් ප්‍රකාශ කරන ලදී. තවද 1929 දී සමස්ථ ලංකා ජමඉයියතුල් උලමා සංවිධානය පිහිටවූයේ කාන්තාවන්ට ඡන්දය අයිතිය අහිමි කිරීම තහවුරු කිරීම සඳහා බවත් 2012 දී හලාල් අනිවාර්යකරණය සඳහා දර්ගා නගරයේ පුද්ගලයන් මුල් වූ බවත් ඇතුළත්ව බොහෝ ප්‍රශ්නකාරී ප්‍රකාශයන් රණවක විසින් සිදු කරන ලදී.[99] මීට අමතරව ඔහු පකිස්ථානය, ඇෆ්ගනිස්ථානය සහ සිරියාව වැනි රට වල සිදු වන "විනාශය", නයිජීරියාවේ බොකෝ හරාම් හි වර්ධනය පිළිබඳ අවධානය යොමු කළ අතර, ඒ සියල්ලම ජිහාඩ් මතවාදයන්ගේ වර්ධනයට ආරෝපණය කරන ලදී. ඉරාකයේ සහ සිරියාවේ සිදු වූ විනාශය හා සමාන විනාශයක් ශ්‍රී ලංකාවේ ද ඇති විය හැකි බව ඔහු විසින් ප්‍රකාශ කරන ලදී. හමුදා නිළධාරින් නිසි පියවර නොගත් බව ඔහු සඳහන් කළ අතර, එමනිසා ඔවුන් රටේ ඉස්ලාමීය අන්තවාදය වර්ධනය වීමට වගකිව යුතු බව සඳහන්

97 එවන් රැස්වීමක් පිළිබඳව සිද්ධිය සම්බන්ධයෙන් වන ආවරණයන් කිසිවක සඳහනක් නොමැත. අපේ සාකච්ඡාවන් වලදී එදින දර්ගා නගරයේ එවන් සිදුවීමක් සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් පෙන්නුම් නොකරයි.

98 විශ්ව විද්‍යාල වල ඇඳුම් අනිවාර්යකරණය සම්බන්ධයෙන් විවිධ කථා පවති. මෙය අවසානාවන්ත තත්ත්වයක් වුවත්, ජාතිකත්වයට/ආගමකට විශේෂිත එකක් නොවේ. උදාහරණයක් වශයෙන්, තරුණියන්ට තුන්කාල කලිසම් ඇඳීමට අවසර නොමැත. එමනිසා ඇඳුම් පාලනය කිරීමට ක්‍රියාමාර්ග ගැනීම සිදුවන බවක් පෙනුණද එවන් හැසිරීම් "ජිහාඩ්කරණය" වශයෙන් පැවසීම බොහෝ දුරට වැරදි සහගතය.

99 මෙම ප්‍රකාශයන් දෙකම වැරදි සහගතය.

කරන ලදී. රණවකගේ ප්‍රකාශය සැබැවින්ම සත්‍යය, අර්ධ සත්‍යය සහ නිහීන අසත්‍යයේ අධ්‍යයනයකි. කෙසේනමුත් නොසන්සුන්කාරී තත්ත්වයන් අවම කිරීම වැළැක්වීම සහ මුස්ලිම් විරෝධී මතවාදයන් වියැකී යා නොදී මන්දගාමීව පවත්වාගෙන යාම අරමුණු වූ බව මෙයින් පැහැදිලිව ගම්‍ය වේ.

## බිම් මට්ටමේ කතා සමඟ සැසඳීම

අළුත්ගම සහ බේරුවල සිංහල හා මුස්ලිම් ජනතාව වෙත අප සිදු කළ චාරිකාවේදී, පෝය දින සිදුවීම සම්බන්ධයෙන් අපි විවිධ කතා එක්රැස් කර ගත්තෙමු. ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් වූ සහ නොවූ සිංහල සමාජ නියෝජිතයින් විසින් වෙනත් ආගම්වල අසල්වැසියන් සමඟ අන්තර්ක්‍රියා කරමින් ලත් තමන්ගේ ම අත්දැකීම් සහ අර්ධ වශයෙන් තමන් මාධ්‍යයෙන් ඇසූ සහ දක්නට ලැබූ දේවල් එක් කරමින් සිදු වූ දෙය විස්තර කිරීමට උත්සාහ කරන ආකාරය වාර්තා කිරීම සිත්ගන්නාසුළුය. සිංහලයින් අතර භික්ෂුවට පහර දුන් බවට කියන කාරණය සම්බන්ධයෙන් කිසිදු වාදයක් නොමැත. අනෙක් පසින් මුස්ලිම් අය අපහට පැවසුවේ භික්ෂුව සහ රියදුරා යන දෙදෙනාම දූන් ඉදිරියට පැමිණ තමන්ට තුවාල සිදු නොවූ බව කීමට කැමති බවය. මෙම සිද්ධිය සම්බන්ධයෙන් මුස්ලිම් ජනතාව ගේ මතය වනුයේ, කෝලාහලය සංවිධානය කරන ලද පුද්ගලයන් විසින් කුමන හෝ ආකාරයක මුලපිරුමක් බලාපොරොත්තුවෙන් සිටි බව මෙන්ම මෙම හබය නොවූයේ නම් වෙනත් ආකාරයකින් හෝ එය සිදු වන බවයි. සිංහල ජනතාව පැවසුවේ පෝය දිනකදී භික්ෂුවකට පහර දුන් පසු බෞද්ධයන් එලෙස ප්‍රතිචාර දැක්වීම සම්පූර්ණයෙන්ම ස්වාභාවික බවයි. මෙම සිද්ධිය තවත් සංකීර්ණ කරමින්, රෝහල් දෙකක්ම භික්ෂුව ඇතුළු කර ගැනීමට ප්‍රතික්ෂේප කිරීම මෙන්ම භික්ෂුවගේ තුවාල සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය නිළධාරිවරයෙකුගේ වාර්තාවක් නොමැති වීම භික්ෂුව පහර දීමට ලක් නොවූ බව සනාථ කිරීමක් වශයෙන් මුස්ලිම් ජනතාව දකිති. සිංහල කතාවන්ගෙන් ප්‍රකාශ වනුයේ පොලීසිය විසින් භික්ෂුවගේ පැමිණිල්ල භාර ගැනීම සහ අපරාධකරුවන් අල්ලා ගැනීම ප්‍රමාද කිරීම හේතුවෙන් ගැටුම පැතිරී ගිය බවයි. එක් පුද්ගලයෙක් පැවසුවේ පොලීසිය විසින් භික්ෂුව

රඳවා ගැනීමෙන් ඔහුට නිගරු කළ බවයි. රජයේ මතය බොහෝමයක් සිංහලයන්ගේ මතය සමඟ සමාන වීමෙන් මෙම කතිකාව ජාතික මට්ටමට යන ලදී.

ජාතික සූරි සභාව විසින් මාධ්‍යය ප්‍රකාශයක් නිකුත් කරමින්, භික්ෂුවට පහර දීම සම්බන්ධයෙන් අත් අඩංගුවට පත් මුස්ලිම් තරුණයන් තිදෙනාගෙන් එක් අයෙකු විසින් අළුත්ගම පොලිස් ස්ථානයේදී ඔවුන් අත්විඳි හිරිහැරයන් පිළිබඳව පොලිස්පතිවරයාට පැමිණිල්ලක් කොට ඇති බව ප්‍රකාශ කරන ලදී. එක් පුද්ගලයෙක්, එනම් මවුලවිවරයෙක්, කියා සිටියේ පොලිස් ස්ථානයේදී ඔහු සහ ඔහුගේ සහෝදරයාව දණ ගස්වා භික්ෂුව වෙත දණින් ඇවිද්දවූ බව සහ ඔහු දණින් යන විට භික්ෂුව විසින් ඔහුගේ බෙල්ලට පයින් ගැසූ බවයි. මෙය බොහෝ පොලිස් නිළධාරින්, මුස්ලිම් ජනතාව සහ සිංහල නියෝජිතයන් සිටි ස්ථානයක සියල්ලන් ඉදිරියේ සිදු වූවක් විය. ආගමික නායකයෙක් වශයෙන්, මවුලවිවරයා විසින් ඔහුට සිදුවූ අසාධාරණයට පිළියම් සෙවීය. පැමිණිල්ලේදී මුස්ලිම් තරුණයන් තිදෙනා භික්ෂුවට කොයියම් හෝ ආකාරයකින් පහරදීම සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන ලදී. ඔවුන් පැවසුවේ එහිදී රියදුරුත් සමඟ ගුටි හුවමාරුවක් සිදු වූ බවයි.[100] (ඇමුණුම I බලන්න)

මුස්ලිම් සහ සිංහල මතයන්ගේ පවතින වෙනස්කම් සමඟ මෙම සිදුවීමට පාදක වූ සිද්ධිය මතභේදාත්මක වන අතර අප කථා කළ අධිකාරීගොඩ, සීනවත්ත සහ පතිරාජගොඩ සිංහල පවුල් ද බෙහෙවින් කතාබහට ලක්වූ අදහස් මත වැඩි වශයෙන් රැඳී සිටියහ. පළමු ගල විසිකළේ කවුද? රජයේ මතයෙන් කොටසක්ද "සාමකාමීව" විසිර යන පිරිසට ගල් ගැසීමෙන් 15 වන දින ප්‍රචණ්ඩත්වය හටගත් බව යන කරුණ මත රැඳේ. අප විසින් කතා කළ සිංහල පවුල් කිහිපයක මතය වූයේද මුස්ලිම් අය සාමකාමීව විසිර යන පෙරහැරට මුස්ලිම් අය ගල් නොගැසුවේ නම් ප්‍රචණ්ඩත්වයක් හට නොගන්නා බවයි. මුස්ලිම් පිරිස් විසින් ප්‍රචණ්ඩ ක්‍රියාවලට උල්පන්දම් දුන් බව පෙන්වීම බොහෝ සිංහල ජාතිකයින්ට වැදගත් වූ බව පෙනේ.

100 2014/07/16 වන දින ජාතික සූරි සභා මාධ්‍යය ප්‍රකාශය.

කලහකාරී පිරිස් විසින් වෙනත් ස්ථාන කිහිපයකම එකම අවස්ථාවේ තම දේපළවලට පහර දීම සහ ඔවුන්ගේ ආර්ථික වත්කම්වලට පහර දුන් ක්‍රමානුකූල ආකාරය ද, එම පිරිස් කවුරුන් වෙත හා කුමකට පහර දිය යුතුද යන්න හොඳින් දැන ගෙන සිටීම ද යන කරුණු මුස්ලිම් ජනතාවට වඩාත්ම වැදගත් වූ අතර, එමඟින් "පළමු-ගල-ගැසුවේ-කවුද" යන්නෙහි ඔවුනට ඇති වැදගත්කම අඩු කර තිබේ. සැබැවින්ම කියතොත්, ඉහත සාක්ෂි, බලපෑමට ලක් වූ බොහෝ මුස්ලිම් පුද්ගලයන් වෙත ඉස්මතු කර දැක්වූයේ ඊට වඩා ඉතා බරපතළ කරුණකි. එනම් ඔවුනට එරෙහි පහරදීමට රජයේ තිබූ සම්බන්ධයයි. ඔවුන්ට වඩාත් වැදගත් වූයේ පහර දීම් ගෙන ගිය ආකාරයේ සමාන බව, එනම් භාවිතා කළ ආයුධවල, නිවෙස්වලට පිරිස් විසින් ගිනි තැබූ ආකාරයේ, විශේෂයෙන්ම එම හේතුවටම වාහන ගෙන එමින් කොල්ලකෑම් සිදු කළ සංවිධානාත්මක ආකාරයේ, සමාන බව වූ අතර පොලීසිය සහ විශේෂ කාර්ය බලකාය සමූහයක් වශයෙන් අක්‍රීය වීම තනි පුද්ගලයින්ගේ අරමුණුවලින් ඔබ්බට ගිය, වඩාත් පුළුල් හා වැදගත් ලක්ෂණ ලෙස ඔවුහු දකිති.

ප්‍රචණ්ඩත්වය පැවති දින දෙක මුළුල්ලේ මුස්ලිම් ජාතිකයින් පිළිබඳව පතුරවන ලද බොහෝ කටකතා පිළිබඳ කථාද අපට අසන්නට ලැබුණි. මිනිසුන්ට අසන්නට ලැබුණේ මුස්ලිම් ජනතාව විසින් පන්සල්වලට පහර දෙන බවත්, සාමනේර හිමිවරුන් පැහැරගෙන ගොස් කපා ඇති බවත්, අසළ පිහිටි පන්සලක භික්ෂූන් වහන්සේලා දෙදෙනෙක් මරා වළලා ඇති බවත් මළ සිරුරු සොයා ගැනීම සෙනග වුවමනාකර ඇති බවත්ය. බොහෝ සිංහල ජාතිකයින් පැවසුවේ පහරදීමක් දක්වා මිනිසුන් කැළඹවීමට පත් කිරීමට මෙම හේතූන් ප්‍රමාණවත් වූ බවයි. "හාමුදුරු නමක්ව කපා ඇති බව දැන ගත් විට මිනිසුන් වෙන කුමක් කරාවිද?" යනුවෙන් ද ඔවුන් පවසන ලදී. මුස්ලිම් ජාතිකයින් විසින් ආසන්න වශයෙන් කරන ලදැයි පැවසෙන පහර දීම් පිළිබඳව ද කටකතා පවතී. දැනටමත් වාර්තා වී ඇති පරිදි, පෙර දින රාත්‍රියේ මරණයට පත් වූ දෙදෙනාගේ ආදාහනයෙන් පසුව 16 වන දින මුස්ලිම් ජනතාව විසින් සිංහල ජනතාවට පහරදීම සම්බන්ධ බියක් ද මෙහිදී පැවතුණි. කලහකාරී පිරිස් ප්‍රචණ්ඩ ලෙස හැසිරීම සාධාරණීකරණය කරන පසුබිමක ජනතාව සිටීමේ හේතුව නීතිය හා සාමයේ දැඩි බිඳ වැටීම පිළිබඳව හඟවන කටකතාවන් ය.

ප්‍රජාවන් අතර සම්බන්ධතාවන් බිඳ වැටීමෙන් සියලුම දෙනා පීඩාවට පත්ව තිබේ. සිය නිවෙස් ගිනිබත් වූ පතිරාජගොඩ පෙදරේරුවෝ ඔවුන්ට තවදුරටත් මුස්ලිම් සේවාලාභීන්ගෙන් වැඩ නොලැබේ යන කටකතාව පිළිබඳව කරදර වෙමින් සිටියෝය. වැලිපැන්නේදී අපට අසන්නට ලැබුණේ සිංහල මිනිසුන්ට වැඩ ලබා නොදෙන ලෙස මුස්ලිම් පල්ලියෙන් මුස්ලිම් ජාතිකයින්ගෙන් ඉල්ලා සිටි බව සිංහල ජනතාව සිතා සිටින බවයි. බලවත් කණගාටුවෙන් යුතුව අධිකාරීගොඩ සිංහල ජනතාව කියා සිටියේ, මෙම සිදුවීමට දින කිහිපයකට පෙර තමන් සමඟ සමීපව සම්බන්ධකම් පැවැත්වූ පුද්ගලයන් තවදුරටත් ඔවුන් සමඟ කතා නොකරන බවත්, අහක බලා ගන්නා බවත්ය. ඇතැම් සිංහල පුද්ගලයන් සිදුවීමෙන් බෙහෙවින් කැළඹී සිටි අතර, ඔවුන් අපහට කියා සිටියේ සිදු වූ දෙය සම්බන්ධයෙන් සහ ඔවුන් සමඟ ඉතා හොඳ සම්බන්ධතාවන් පැවැත්වූ අසල් වැසියන්ට සිදු කර තිබූ දේවල් පිළිබඳව ඔවුන් ලැජ්ජා වන බවය. සිද්ධිය විස්තර කිරීමේදී කාන්තාවන් දෙදෙනෙක් සැබැවින්ම කඳුළින් බරව සිටියහ. සහෝදරයාගේ අවමංගල්‍ය අවස්ථාවේදී මිනී පෙට්ටිය ඔසවා ගෙන ගිය අය අතර ඔවුන්ගේ මුස්ලිම් මිතුරන්ද සිටි බවත්, එම අසල්වැසියන් තමන්ට එතරම් සමීපව සිටී බවත් පවසමින්, ඔවුන් එකිනෙකා සමග වූ සම්බන්ධතාවන් හෙළි කරන ලදී. අප විසින් සිංහල බෞද්ධයන් කිහිප දෙනෙකුව මුණ ගැසෙන ලදී. ඔවුන් අතරින් මෙම සිදු වීම සම්බන්ධයෙන් නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට වෙර දරන බෞද්ධ භික්ෂුවක් විසින් මෙම සිදු වීම සම්බන්ධයෙන් තමන්ගේ දැඩි කණගාටුව ප්‍රකාශ කරන ලදී.

වැලිපැන්නේදී, මුස්ලිම් ජාතිකයින් සඳහන් කළේ මීට දින තුනකට හෝ හතරකට මත්තෙන් ඔවුන් අත්දුටු ගංවතුර තත්ත්වය සහ එහිදී ඔවුන් මුස්ලිම් පල්ලිය වෙත ලැබුණු සහනාධාර භාවිතා කරමින් ප්‍රදේශයේ සියලුම දෙනාට ආහාර බෙදා දුන් ආකාරයයි.[101] සීනවත්තේදී, මුස්ලිම් පවුලක් කියා සිටියේ ජලය හිඟව තිබූ කාලයේදී ඔවුන් මුළු ගමටම

101 මෙම කතාව පසුව එජාප පාර්ලිමේන්තු මන්ත්‍රී පාලිත තෙවරප්පෙරුම විසින් ඩේලි මිරර් පුවත් පතට ලබා දුන් මාධ්‍යය සාකච්ඡාවකදී සනාථ කරන ලදී. ඔහු පවසා සිටියේ එම අවස්ථාවේදී වැලිපැන්න ජනතාවට කිසිදු උපකාරයක් නොලැබුණු බව සහ ඔවුන් ප්‍රජාව අතර යහපත් අසල්-වැසි සම්බන්ධතාවන් මත යැපුන බව මෙන්ම මුස්ලිම් පල්ලියට ලැබුණු සහනාධාර වලින් ජීවත් වූ බවත්ය.

ඔවුන්ගේ වතුර ට්‍රක් එකකින් වතුර සැපයූ බවයි. ගිනිබත් වූ නිවසක් හිමි සිංහල කාන්තාවක් විසින් පැවසුවේ ඇය සහ ඇයගේ සැමියා මුස්ලිම්වරුන්ට උදව් කළ ආකාරයයි. මෙම කථා සලකා බැලීමේදී බොහෝමයක් දෙනාට හැඟී ගොස් තිබුණේ තමන්ගේ අසල්වැසියන් තමන්ට ද්‍රෝහි වූ බව සහ විපතට පත් දෙපාර්ශ්වය විසින්ම තමන්ගේ අසල්වැසියන්ට මෙයට වඩා තමන්ට උපකාර කළ හැකිව තිබූ බවක් වන බවයි. මුස්ලිම් ජනතාවට තමන්ව පාවා දීමට ලක්වූවා යැයි හැඟුණ අතර, විශේෂයෙන් බෞද්ධ අය පැහැදිලිවම බෞද්ධ කොඩි සහ පහන් කූඩු එල්ලීමෙන් මැරයන්හට සිංහල නිවෙස් මඟ හැරීමට සැලැස්වූ බව සිතූහ.[102] සම්බන්ධතාවන් බිඳ වැටීම සම්බන්ධයෙන් සැනින් පිළිතුරු සෙවූයේ නැත්නම් එය ප්‍රජාවන් අතර දිගුකාලීන ප්‍රශ්න ඇතිකළ හැකි බරපතළ මෙන්ම සැලකිය යුතු ගැටළුවක් බවට පත් වේ. පරමාදර්ශීයව රජය විසින් ප්‍රජා මට්ටමේ පවතින ගැටළු නිරාකරණය කිරීමට කඩිනම් පියවර ගත යුතුය. සිදුවන වේගවත් නැවත ඉදි කිරීම් එය සිදු කිරීමේ ක්‍රමයක් වශයෙන් පෙනෙන නමුත් එය පමණක් ම ප්‍රමාණවත් විය නොහැකිය.

## සිද්ධිය සම්බන්ධයෙන් මුස්ලිම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිචාරය

අළුත්ගම සිදුවීම සිදුවූ වහාම රජයේ සාවද්‍යතාව (දඬුවම් ලැබිය යුතු බව), පූජ්‍ය ඥානසාර හිමියන්ගේ වෛරී කථනයන් සහ විපතට පත් වූවන්ට සහනාධාර සැපයීමේ අවශ්‍යතාව පිළිබඳ සඳහන් කෙරුණු දැඩි වචන සහ සාක්ෂි සහිතව දැඩි හැඟීමකින් යුතුව සිදුකළ ප්‍රකාශයන් හරහා ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රස් නායක රවුෆ් හකීම් ඉදිරියට පැමිණෙන ලදී. ශ්‍රී ලංකාවේ යුද්ධයට සම්බන්ධ වූ පාර්ශව දෙකෙන්ම සිදුවී ඇති දැඩි උල්ලංඝනය කිරීම් සහ මානව හිමිකම් කඩවීම් මෙන්ම ඒ සම්බන්ධිත අපරාධයන් පිළිබඳව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහා කොමසාරිස්වරිය විසින් කරනු ලබන පරීක්ෂණ පිළිබඳ පාර්ලිමේන්තුවේ විවාදය සිදුකළ අවස්ථාවේදී ඔහුගේ පාර්ලිමේන්තු ප්‍රකාශය මගින් හකීම් පවසා සිටියේ මහා කොමසාරිස්වරිය විසින් රටේ

102 ඇත්ත වශයෙන්ම එය පොහොය දිනට දින කිහිපයක් පසුව වන බැවින් පෙනෙන සැටියට මෙහිදී සිංහල නිවෙස් ඇතැම් විට සරසා තිබුණේ පෝය නිසාවෙන් විය හැකිය.

ආගමික ප්‍රචණ්ඩත්වය පිළිබඳව කර ඇති ප්‍රකාශ තව දුරටත් "මිත්‍යා ප්‍රබන්ධයක්" ලෙස පැවසිය නොහැකි බවයි. ඔහු ශ්‍රී ලංකාව තුළ ද බලාත්මක අන්තර්ජාතික සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය පනතේ (ICCPR Act) 3 වන වගන්තියට අවධානය යොමු කරන ලද අතර, ඒ යටතේ වෛරී කථනයන් සහ පෙළඹවීම්වලට සම්බන්ධවූවන්ට දඬුවම් නොපමුණුවන්නේ මන්දැයි ප්‍රශ්න නඟන ලදී. ඔහු තවදුරටත් අනතුරු අඟවමින් කියා සිටියේ මෙරට විසින් අත්සන් තබන ලද අන්තර්ජාතික සම්මුතීන් ඉක්මවා යාමෙන් රට "ප්‍රපාතයක්" කරා ගමන් ගන්නා අතරම මෙම තත්ත්වයෙන් තවත් මැදිහත්වීම් පවා සිදුවිය හැකි බවයි. ගැටළුවල වගකීම පූජ්‍ය ඥානසාර හිමියන්ගේ වෛරී කථනයන් මත තබමින් හකීම් කියා සිටියේ:

> අළුත්ගම සිදු වූ දෙය අපේම පනත් යටතේ විසඳිය හැකි වැරදි වලට උදාහරණයක්. ඉතින්, ඇයි අපි මිනිසුන්ව ප්‍රචණ්ඩත්වයට පොළඹවන සහ වෛරය පතුරවන එම පුද්ගලයාව අත් අඩංගුවට නොගන්නේ? මෙම රජය විසින් ඉටු කිරීමට බැඳී සිටින රාජකාරිය එයයි. අපි ගොළු මුර භටයන් ලෙස සිටිමින් මෙම නියෝග පිළිබඳව වාචිකව සඳහන් කරමින් දත් නැත්තවුන්සේ ඒවා ඉදිරිපත් කරනවාද? ව්‍යාවස්ථායික විධිවිධාන පවතිද්දී, අපහට මෙවන් ක්‍රියාවන්ට දඬුවම් ලබා දීමට ප්‍රමාණවත් මෙවලම් පවතින බව ලොවට ප්‍රකාශ කිරීම පමණක් ප්‍රමාණවත් නැහැ. අද අප මේ ඇද වැටෙන්නට යන ගැඹුරු අගාධය සලකා බලන කළ ලිපියේ පූර්ණ ක්‍රියාකාරීත්වය සහ විධිවිධාන නිසි පරිදි ක්‍රියාත්මක කිරීම අනිවාර්යයෙන්ම කළයුතු බවයි.[103]

මීට අමතරව, 2014 ජුනි 17 වන දින අල්ජසීරාහී "ඇතුලාන්ත කතාව" මඟින් පැවැත්වූ සාකච්ඡාවකදී, රවුෆ් හකීම් ජනතාව කුපිත කරවන සුළු කථනයන් පිළිබඳව බෙහෙවින් කතා කළ අතර, මේ පිළිබඳ රජයේ ප්‍රතිචාර දැඩිව විවේචනය කරන ලදී. ඔහු බීබීසී ය සමඟද සම්මුඛ සාකච්ඡා වලට සහභාගි වූ අතර එහිදී ඔහු මෙම සිදුවීම පිළිබඳව බලවත් කණගාටුවෙන් පසු වූ බව දක්නට තිබූ අතරම ඒ පිළිබඳ බොහෝ දැඩිව කතා කරන ලදී. ඔහුගේ සිංහල භාෂාව කතා කිරීමේ

103 හැන්සාර්ඩ් වාර්තාව, 2014 ජුනි 17, පි. 752.

හැකියාව උපයෝගී කර ගනිමින් දේශීය මාධ්‍යය තුළින් ද අළුත්ගම සිද්ධියේදී නීතිය බලාත්මක කිරීමේ ආයතනයන්ගේ ප්‍රතිචාරයන් සම්බන්ධයෙන් දැඩිව විවේචනය කරන ලදී. මෑතකදී ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය විසින් සිද්ධියෙන් විපතට පත්වූ ජනතාව සහ ඔවුන්ගේ තක්සේරු කරන ලද අලාභයන් පිළිබඳව පුළුල් දත්ත රැගත් වාර්තාවක් නිකුත් කරන ලදී.

කෙසේ නමුත් වර්තමානයේදී, අළුත්ගම සිද්ධිය සම්බන්ධයෙන් දේශපාලන ක්‍රියාකාරීන් සැලකිය යුතු අන්දමින් මුනිවත රැකීමක් දක්නට ඇත. 2014 ජූලි 10 වන දින විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ විසින් අළුත්ගම සිදු වූ අලාභ හානි පිළිබඳව පාර්ලිමේන්තුවේදී "පෞද්ගලික දැන්වීමකින් ප්‍රශ්න කරන ලදී". මේ අවස්ථාවේදී සැබැවින්ම පාර්ලිමේන්තුවේ කිසිදු මුස්ලිම් නියෝජිතයෙක් පැමිණ සිටියේ නැත.

## සිද්ධිය සම්බන්ධයෙන් වන අනෙකුත් දේශීය හා අන්තර්ජාතික ප්‍රකාශන

සිදුවීමෙන් පසු කිසිදු උද්ඝෝෂණයක් නොපැවතුණි. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහලේකම් නවනිදම් පිල්ලේ මහත්මිය, රටේ ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරික සමාගම් සහ සිවිල් සමාජ ඇතුළු බොහෝ අන්තර්ජාතික හා ජාතික කණ්ඩායම් සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා හෙලා දකිමින් ප්‍රකාශයන් මාලාවක් නිකුත් කරන ලදී.[104] එම ප්‍රකාශන නාමාවලියක් සහ ඒවායෙහි අන්තර්ගතයට පුරුක් ලයිස්තුවක් ග්‍රවුන්ඩ්විව් වෙබ් අඩවිය තුළ සම්පාදනය කොට ඇත. එය මෙතනින් ලබා ගත හැකිය. https://docs.google.com/document/d/1LLYyXN40uJE4p7R8CY48b7ckd8mxBIkuKzdipkhawX0/edit?usp=sharing

104 ජනාධිපතිවරයා සාමාජිකත්වය දරණ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉහත ප්‍රකාශයන් වැදගත් වේ. මෙම ප්‍රකාශයේ ප්‍රචණ්ඩත්වය හෙලා දකිමින්, පක්ෂය සිය මධ්‍යම ප්‍රතිපදාව නැවත නැවතත් කියාපාමින් ජනතාවට අන්තවාදයට නැඹුරු නොවීමට බල කර සිටී. මෙම සිදුවීම බොහෝ දුෂ්කරතා මැද දිනාගත් යුද්ධය හා සංහිඳියාව අවතක්සේරු කිරීමටත්, ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් අතීතයේ සිට මුස්ලිම් ජන සමාජයත් සමඟ පවත්වා ගෙන පැමිණි යහපත් සම්බන්ධතාව පළුදු කිරීමට ගත් උත්සාහයක ප්‍රතිඵලයක් ලෙසත් සැක කරන බව එයින් තවදුරටත් ප්‍රකාශ කර සිටී. මෙම ප්‍රකාශයෙන් කිසිදු ජන කොට්ඨාශයකට වරද නොපටවා සිටීමට වගබලා ගත් අතර, ජනතාවගේ සාමූහික මනුෂ්‍යත්වය කියාපෑමේ අවශ්‍යතාව ඉස්මතු කර දක්වා ඇත්තා සේම එයට ජාතිකත්ව හෝ ආගමික සම්බන්ධයක් නොමැති බව කියා සිටී. බලන්නඃ දිනමිණ, 2014 ජුනි 18, පි. 1. ශ්‍රිලංනිප ප්‍රකාශනය (අළුත්ගම ප්‍රචණ්ඩත්වය පිළිබඳ).

# 6 වන පරිච්ඡේදය

## අළුත්ගම කෝලාහලය පිළිබඳ මාධ්‍යය ආවරණය

ප්‍රධාන පෙළේ සාම්ප්‍රදායික මාධ්‍යයන්ගෙන් සමාජ මාධ්‍යයන් වෙන් කරනු ලබන සීමාව තව තවත් අපැහැදිලි වෙමින් පවතී. බොහෝමයක් පුවත්පත් සහ රූපවාහිනි විකාශන සේවාවන් සමාජ මාධ්‍යයන් තුළින් 24/7 පුවත් ආවරණයන් සිදු කරනු ලබයි. පුද්ගලික ජනමාධ්‍යවේදීන් ඔවුන් බද්ධව සිටින මාධ්‍ය ස්ථාවරත්වය සඳහා තමන්ගේම බ්ලොග් අඩවි සහ ට්විටර් ගිණුම් ස්වාධීනව පවත්වාගෙන යනු ලබයි. වර්තමාන මාධ්‍යයන්ගේ පවතින මෙම සියුම් වෙනස්කම් අළුත්ගම සහ බේරුවල කෝලාහලය පුරාවටම දක්නට ලැබුණි.

## සාම්ප්‍රදායික මාධ්‍යය[105]

වර්තමානයේදී, පුවත්පත් සහ රූපවාහිනි පුවත් සපයන්නන් විසින් ට්විටර් ගිණුම් පවත්වාගෙන යාම මඟින් ඔවුන්ගේ පුවත් සතියේ දින 07 මුළුල්ලේම පැය 24 පුරා මුදා හරිනු ලබයි. කෙසේනමුත්, අළුත්ගම සහ බේරුවල සිදුවීම දිග හැරුණු ආකාරය පිළිබඳ මෙම මාධ්‍යය දෘවැන්තයන්ට ප්‍රකාශ කිරීමට පැවතියේ ඉතා සුළු දෙයක් බව කිව හැකිය. අද දෙරණ මඟින් ප.ව. 8.30 ට පමණ අළුත්ගම ප්‍රදේශ වලට අමතරව බේරුවල ප්‍රදේශවලත් ඇදිරි නීතිය ක්‍රියාත්මක කරන ලද බව ප්‍රසිද්ධියට පත් කරන ලදී.[106] ඉන් අනතුරුව විකාශය කර ඇත්තේ නීතිය අතට ගන්නා ඕනෑම අයෙකුට දඬුවම් පමුණුවන බව සඳහන් කරමින් ජනාධිපතිවරයා විසින් පසුදින පෙ.ව. 6.41 ට නිකුත් කළ පණිවුඩයක් වේ.[107] ඩේලි මිරර් තුළින් ද ඒ හා සමාන පුවතක් ට්විටර්හී පළ කරන ලදී. අනෙක් පසින් ලංකාදීපය මෙම සිදුවීම නොසලකා හරින බවක් දක්නට ලැබුණි.[108]

105 මෙම කොටසින් ප්‍රධාන ඉංග්‍රීසි සහ සිංහල මාධ්‍යයන්ට සහ රාවය පුවත්පත වැනි ඇතැම් විකල්ප සිංහල මාධ්‍යයන්ට යොමු සපයමින් විශ්ලේෂනයන් සපයනු ලබයි. මෙයින් කිසිදු දෙමළ මාධ්‍යයක් ආවරණය කරනු නොලබයි.

106 ඇතැම් ට්විටර් පුවත්වල දර්ශනයන් මෙහිදී දැකගත හැකිය:
https://app.box.com/s/frnz8fg4khjj6zeq04iq/1/2092435554

107 එම.

108 එම.

ඇතැම් ප්‍රමුඛ පෙළේ ජාත්‍යන්තර හා ජාතික ස්වාධීන මාධ්‍යවේදීන් මෙම සිදුවීමේ වැදගත් තොරතුරු ට්විටර් මාර්ගයෙන් ජනතාව අතරට ගෙන යාමේදී පුළුල් කර්තව්‍යයක් සිදු කරන ලදී. බීබීසි හී චාර්ල්ස් හැවිලන්ඩ් (Charles Haviland), ඩේලි එෆ්ටී හී දරිශා බැස්ටියන් සහ අල් ජසීරා හී දිනුක් කොළඹගේ විසින් 15 වන දින රාත්‍රියේ ඇඳිරි නීතිය අතරතුර අළුත්ගමදී සිදුවූ හිංසාවන් පිළිබඳව ස්ථිරසාර තොරතුරු සපයන ලදී. "#දර්ගා නගරයේ මුස්ලිම් පල්ලියේදී ශ්‍රී ලංකා ඇමති රවුෆ් හකීම් කඳුලින් බර වෙයි: #මුස්ලිම් කාන්තාවන් බලහත්කාරකම් පිළිබඳ තර්ජන වලින් පසු කැලෑ වලට පලා ගිය බව පවසයි. #අළුත්ගම #ශ්‍රී ලංකාව"("#srilanka Minister Rauff Hakeem in tears at Dharga Town mosque: says #muslim women fled to jungles after rape threats. #Aluthgama #SriLanka"), යන්න චාර්ල්ස් හැවිලන්ඩ් විසින් ට්විටර් අඩවියෙහි පළ කරන ලදී. ඔහු තවදුරටත් ට්විටර්හී, "පිටතින් පුද්ගලයින් පැමිණි බවත් දෙපාර්ශ්වයේම ප්‍රචණ්ඩත්වය පැවති බවත් අළුත්ගම ප්‍රදේශයේ සිංහල බෞද්ධ ජනතාව පවසති." (Local Sinhalese Buddhist people #aluthgama say Buddhist hardliners had come from outside & there was violence on both sides.) #srilanka #lka"' යන්න පළ කරන ලදී. කැරැල්ල පිළිබඳ හා එයින් සිදු වූ හානිය ඒ ආකාරයෙන්ම ඡායාරූප ඔස්සේ පළ කිරීම තුළින් මෙම මාධ්‍යයවේදීන් විසින් ජනතාවට අදාළ තොරතුරු ලබා දීමට නව තාක්ෂණය උපරිමයෙන් ප්‍රයෝජනයට ගනිමින් ප්‍රධාන පුවත් සපයන්නන් විසින් ඇති කළ අඩුව පිරවීය.

16 වෙනිදා උදෑසන මුද්‍රිත පුවත්පත් පිට වූ පසු, එතුළින් ඔවුන් අළුත්ගම සිද්ධියේ බැරෑරුම්බව දිගහැරුමට සුළු ආවරණයක් කොට තිබුණි.[109] බොහෝමයක් පුවත්පත් මඟින් පළ කර තිබුණේ රජයේ අධිකාරයන් විසින් ප්‍රචාරය කරන ලද තොරතුරුමය. මුස්ලිම් පිරිස් විසින් සාමකාමී බෞද්ධ පෙරහැරට ගල් ගැසීමෙන් පසු බෞද්ධයන් හා මුසල්මානුවන් අතර ගැටුම් ඇති වී අළුත්ගම ඇඳිරි නීතිය ක්‍රියාත්මක කළ ආකාරය ඒවායින් විස්තර විය.[110] මෙහිදී බොදු බල සේනාවේ රැළිය සහ

109 2014 ජුනි 16 වන දින ඩේලි මිරර් මාර්ගගත (වෙබ්) සංස්කරණයේ අවස්ථා කිහිපයක් මෙහි දැක්වේ: https://app.box.com/s/frnz8fg4khjj6zeq04iq.

110 බලන්න "Police Curfew in Aluthgama and Beruwala", Ceylon Today, 2014 ජුනි 16; "Curfew in Aluthgama and Beruwala", Daily Mirror, 2014 ජුනි 16; "අළුත්ගමට බේරුවලට පොලිස් ඇඳිරි නීතිය", දිවයින, 2014 ජුනි 16.

ඥානසාර හිමියන්ගේ ජනතාව කුපිත කරවන කතාව පිළිබඳව සඳහන් වී නොමැත. මෙතුළින්ද පොලීසිය විසින් තත්ත්වය පාලනය කිරීම පිණිස හොඳින් ක්‍රියා කර ඇති බව ප්‍රකාශ කර ඇත.

සිද්ධියෙන් පසු දිනදී පවා මුද්‍රිත මාධ්‍යයන්ට සිදුවීම පිළිබඳව ගැඹුරු ආවරණයක් කිරීමට නොහැකි ව තිබූ බව දක්නට ලැබේ. බිම් මට්ටමෙන් බහුවිධ තොරතුරු සොයා ගැනීම වෙනුවට, මාධ්‍යය ආයතන විසින් උනන්දුවක් දක්වන කණ්ඩායම්වල මාධ්‍යය දිග හැරුම් පළ කරන ලදී. සිංහල පුවත්පත් මඟින් ජනාධිපතිතුමාගේ, පොලිස්පතිවරයාගේ, ඇමති රවුෆ් හකීම්ගේ, විපක්ෂයේ සාමාජිකයන්ගේ සහ බොදු බල සේනාවේ ප්‍රකාශයන් සපයන ලදී.[111] බොදු බල සේනාවේ හෝ සිහල රාවයේ හෝ රාවණා බලයේ ක්‍රියාවන් හේතුවෙන් කිසිදු ජීවිතයකට හානි සිදු නොවූ අතර සිදු වූ ජීවිත හානි දෙක සහ දේපල හානි වලට මුස්ලිම් අන්තවාදී කණ්ඩායම් වගකිව යුතුය යන ප්‍රකාශය ඇමති පාටලී චම්පික රණවක විසින් සිදුකල බව වාර්තා විය.[112]

ඉතාම සුළු පුවත්පත් සංඛ්‍යාවක කතුවැකිවලින්, නිල වාර්තාවන්ට විරුද්ධ නොවීමට වග බලා ගනිමින්, තත්ත්වය පාලනය කිරීමේදී නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනවල පැවති ඔතැනි ස්වරූපය පෙන්වාදීමට සමත් විය.[113] අනෙකුත් ලිපි සමඟ පළ වූ මෙම කතුවැකි තුළින්, ප්‍රචණ්ඩත්වය නැවැත්විය යුතු බව සහ ආගමික සහජීවනයේ වැදගත්කම ඉස්මතු කර දක්වීමේ පණිවුඩය ගෙන යන ලදී.[114] කෙසේ නමුත්, බොහෝමයක් සිංහල මුද්‍රිත මාධ්‍යයන් තුළින් බොදු බල සේනාවේ මතයන් ගෙනහැර දක්වීය. උදාහරණ වශයෙන්, මත්ද්‍රව්‍ය වෙළෙඳාම සම්බන්ධයෙන් හසු කරගත් මුස්ලිම් පුද්ගලයෙකුගේ ආගම අනවශ්‍ය පරිද්දෙන් ලිපියක ඉස්මතු කර දක්වීම,[115] ඉස්ලාම් ඇඳුම් අඳිමින් කාන්තාවක් මෙන් වෙස්වලා ගත් පුද්ගලයෙක් පිළිබඳ වාර්තාව,[116] හිමිනමක් ඔහුගේ විහාරස්ථානයේදී ඝාතනය කර ඇති බව

111 දිවයින පුවත්පතේ නිවේදන සහ මාධ්‍යය දිග හැරුම්, 2014 ජූනි 17 බලන්න.
112 "නීතිය සාධාරණ ක්‍රියාත්මක වී නොමැත", 2014 ජූනි 17 දින ලංකාදීප බලන්න.
113 "The IGP Must Resign", 2014 ජූනි 22 දින ද නේෂන් බලන්න,
114 ලංකාදීප සහ මව්බිම කතුවැකි, 2014 ජූනි 17 දින දිවයින බලන්න.
115 "ලක්ෂ 8 ක් වටිනා මත්ද්‍රව්‍ය සමඟ ජාවාරම්කරු අල්ලා ගනී", 2014 ජූනි 17 දින ලංකාදීප බලන්න.
116 "මුස්ලිම් ඇඳුම් වලින් කාන්තාවක් මෙන් වෙස්වලා ගත් පුද්ගලයෙක් අත් අඩංගුවට", 2014 ජූනි 17 දින දිවයින බලන්න.

කියවෙන, මීට කිසිදු සම්බන්ධයක් නොමැති කතාව[117] ගත හැකිය. මෙහි ලිපි කිහිපයක් ඒකීයත්වය පිළිබඳව කතා කිරීම හේතුවෙන් පොදුවේ තත්ත්වය අනුමත කිරීමට සුළු හඬක් නැගුණි.

රාවය සහ ඩේලි එෆ්ටී වැනි පුවත්පත්, පටන් ගැන්මේ සිට මේ දක්වාම සිද්ධිය සම්බන්ධයෙන් නිල වශයෙන් වූ ප්‍රධාන මතවාදයට හා දේශනයට විරුද්ධ මතයන් සපයන ලදී.[118] අනෙක් පුවත්පත්වල නොමැති විමර්ශනාත්මක කොටස් පළ කරන ලද්දේ මෙම පුවත්පත් වලින් පමණක් නොවේ. එහෙත් මොවුන් පවතින ගැටළු පිළිබඳව දනුම් තේරුම් ඇතිව විශ්ලේෂනාත්මකව ලිපි ඉදිරිපත් කර ඇත.[119] කෙසේනමුත් මෙම පුවත්පත් කියවන ජනකොටස සීමාසහිතය.

### සමාජ මාධ්‍යය

ප්‍රචණ්ඩත්වය ඇති වීමට පෙරත්, එය අතරතුර සහ ඉන් පසුවත් සමාජ මාධ්‍ය මගින් ඇතිකළ බලපෑම සුපරික්ෂාකාරීව අධ්‍යයනය කළ යුතුය. සමාජ මාධ්‍යය යන වචනය තුළ, වෘත්තීයමය වශයෙන් මාධ්‍යවේදීන් නොවන අයට පවා යමක් පළ කිරීමේ හැකියාව ඇති ෆේස්බුක්, ට්විටර්, බ්ලොග්කරණය, යූ ටියුබ් සහ අනෙකුත් එවන් අවකාශයන් සහ ඉඩ ප්‍රස්ථාවන් අන්තර්ගත වේ.

කෝලාහලය පටන් ගැනීමට පෙර සිටම, සමාජ මාධ්‍ය හරහා ප්‍රචාරය කරනු ලැබූ වෛරී කථනයන් තුළින් ප්‍රජාවන් දෙක අතර පවතින නොසන්සුන්කාරී තත්ත්වය හොඳින් තේරුම් ගත හැකි විය. ෆේස්බුක් කණ්ඩායම් එනම්, සිංහල බෞද්ධයන්ගේ සහ ඥානසාර හිමියන්ගේ පුද්ගලික පිටුවේ මුස්ලිම් ප්‍රජාවට අතිශයින්ම අහිතකර අන්දමේ ඡායා

117 "බකමූණේදී භික්ෂූන් වහන්සේ නමක් සාතනය කෙරේ", 2014 ජුනි 29 දින ලංකාදීප බලන්න. මෙම ලිපිය ඇමති වාසුදේව නානායක්කාර විසින් අළුත්ගම ඇඳිරි නීතිය අතරතුර සහ පසුව සිදු වූ දේ-වල් සම්බන්ධයෙන් නිවැරදි කිරීම් කළ සම්මුඛ සාකච්ඡාවකට ආසන්නයෙන් පළ කර තිබුණු බව සලකන්න. මෙහිදී ඔහු මාධ්‍යවේදීන් විසින් සිංහල හා මුස්ලිම් ජනතාව ප්‍රචණ්ඩත්වය හේතුවෙන් සමාන අන්දමින් විපතට පත් වූ බවට කරන ප්‍රකාශයන්ට විරුද්ධ වේ.

118 "Alas Aluthgama" 2014 ජුනි 16 දින ඩේලි එෆ්ටී; "No investigations on Gnanasara, says IGP", "The unpleasant memories of Dharga Town", 2014 ජුනි 29 දින රාවය; "Govt. 'blatantly misinformed' UNHRC about Aluthgama clashes: Muslim Council" 2014 ජූලි 2 දින ඩේලි එෆ්ටී බලන්න.

119 "Did social media add fuel to the fire?", 2014 ජුනි 29 දින රාවය; "Aluthgama, A game without winners", 2014 ජූලි 3 දින ඩේලි එෆ්ටී බලන්න.

රූප නිදහසේ පළ කර තිබුණි.[120] බොදු බල සේනාවේ බොහෝමයක් විරෝධතාවන් මෙවන් මාධ්‍යය තුළින් ප්‍රචාරයට පත් කෙරුණු අතර සෑම ද්වේශසහගත ඡායාරූපයකටම ෆේස්බුක් තුළ දහසකුත් කැමැත්ත ප්‍රකාශ කිරීම් (likes) ලැබුණි. මෙම වෙබ් පිටු සඳහා ලැබී තිබුණු අදහස්වල මිනිසුන්ගේ මනස පුරා පැතිරී තිබුණු වෛරය සහ ප්‍රචණ්ඩත්වය දිස්විය. ග්‍රවුන්ඩ්විව් ප්‍රධානී සංජන හත්තොටුවට අනුව, අන්තර්ජාලය හරහා ආගමික වෛරය පතුරවනු ලබන මාර්ගගත කණ්ඩායම් 35 කට අධික ප්‍රමාණයක් පවතින බව අධ්‍යයන මගින් සොයාගෙන තිබේ.[121] අළුත්ගම ප්‍රදේශයේ මුස්ලිම් ජනතාව රැළිය සහ එය පසුපස පැවති මුස්ලිම් විරෝධී මතය පිළිබඳව දැන ගත්තේ මෙම නාලිකාවන් මාර්ගයෙන් බව සත්‍යයකි.[122]

ගැටුම් අතරතුර සහ ගැටුම්වලට මඟපෑදූ ක්‍රියාවන් තුළ අවධානයට ගත යුතු කරුණු කිහිපයක්ම පවති. පළමුවෙන්ම, බොදු බල සේනාව ඔවුන් විසින් කරනු ලබන පොදු භාෂණයන් යූ ටියුබ් හරහා විකාශය කිරීම සාමාන්‍ය පුරුද්දක් වන අතර, ජුනි 15 වන දින සිද්ධිය විස්තර කළ මුස්ලිම් අය ප්‍රකාශ කර සිටියේ, ඔවුන් ඥානසාර හිමියන් අළුත්ග මදී 'අබ සරණයි' (එහි අර්ථය මුසල්මානුවන් විනාශ වනු ඇත යන්නයි) වැනි වචන භාවිතා කරමින් කරන ලද කතාව බලා සිටි බවයි.[123] සමාජ මාධ්‍ය ඔස්සේ මුස්ලිම් ජනතාව මෙම කතාවට සවන් දීමෙන් ඔවුන්ට බොදු බල සේනාවෙන් මෙහෙයවූ රැළිය තුළින් මතු කර දක්වන තර්ජනය පිළිබඳව අවබෝධයක් ඇති කරවීය.

දෙවනුව, සිංහල බෞද්ධ ජනතාව කුපිත කරවූ කටකථා පැතිරවීමටද සමාජ මාධ්‍ය භාවිතා කරන ලදී. මෙහිදී ප්‍රමුඛවම පැතිර ගිය කටකතා තුනක් විය. ඉන් පළමුවැන්න දර්ගා නගරයේ පන්සලට පහර දීම සහ බුද්ධ ප්‍රතිමාව විනාශ කර ඇති බවයි. දෙවැන්න, මුස්ලිම් පල්ලිය තුළ භික්ෂු නමක් කපා කොටා මරා දැමීම සහ තුන්වැන්න, ඝාතනය කිරීම

120 "Facebook Bans 'Bodu Bala Sena' and GnanasaraThera" 2014 ජුනි 20 දින ඒෂියන් මිරර් බලන්න.

121 ඔහු මෙම අදහස 2014 ජූලි 17 රාජකීය විදුහලේදී පැවති පොදු සාකච්ඡාවකදී පළ කරන ලදී.

122 අළුත්ගම සහ බේරුවල මුස්ලිම් සහ සිංහල ප්‍රදේශවාසීන් සමඟ පැවති සම්මුඛ සාකච්ඡා මඟින් දැන ගන්නා ලදී.

123 කෝලාහලයෙන් පසු සම්මුඛ සාකච්ඡාවට පෙනී සිටි සියලුම මුස්ලිම් ජනතාව කියා සිටියේ මෙම කණ්ඩායම විසින් ඇති කළ තර්ජනයන්ගේ බැරෑරුම්කම සහ ඔවුන්ට ඔවුන්ගේ ජීවිත පිළිබඳව බියක් ඇති කළ ආකාරය පිළිබඳවයි.

සඳහා සාමණේර භික්ෂූන් වහන්සේලාව පන්සලෙන් පැහැරගෙන යාමයි.[124] මෙම කටකතා ලැව් ගින්නක් මෙන් සමාජ මාධ්‍යයන් සහ ජංගම දුරකථනයේ කෙටි පණිවුඩ හරහා පැතිර ගියේය.[125] සාම්ප්‍රදායික මාධ්‍ය නිහඬව බලා සිටි හෙයින්, මෙම බොරු ප්‍රචාරයන් පලවා හැරීමට ක්‍රියා කරන බවක් මෙහිදී දක්නට නොලැබුණි. මේනිසා, ඇතැම් සිංහල බෞද්ධයන් ධර්ම යුද්ධයක් සේ සලකමින් ප්‍රචණ්ඩ ක්‍රියාවල නිරත වීමට පෙළඹුණා විය හැකිය. එය එසේ සිදු නොවූවත්, මෙයින් නිසැක වශයෙන්ම සිදු වූයේ ප්‍රචණ්ඩ ක්‍රියා සිදු කිරීම වැළැක්වීමට කටයුතු නොකර සිටීමට බෞද්ධයින්ව පෙළඹවීම සහ මුස්ලිම් ජනතාවට විරුද්ධව කෙරෙන මෙම ප්‍රහාරය ඇත්ත වශයෙන්ම සාධාරණ එකක් බව ඔවුන්ට ඒත්තු ගැන්වීමයි.

එසේම සමාජ මාධ්‍යයන් හරහා, විශාල බෞද්ධ රැස්වීම් තුළ සහ ඇතැම් සාම්ප්‍රදායික ප්‍රධාන මාධ්‍යයන් තුළ ගලා ගිය වෛරී හැඟීම් මාලාවකට පසුව මෙම සිද්ධිය ඇති වූ බව ද සැලකිල්ලට ගත යුතුය. එමනිසා, තමන් පිළිතුරු සැපයිය යුතු තර්ජනයක ආකාරයෙන් මෙම කටකතාවන් ඇසීමට හා තේරුම් ගැනීමට සැලසෙන අන්දමේ පසුබිමක් සිංහල බෞද්ධ මාධ්‍ය භාවිතා කරන ජනතාවට සකස් වී තිබුණි.

තුන්වන සහ වැදගත්ම කරුණ වන්නේ ගැටුම අතරතුර සහ ඉන්පසුව සාම්ප්‍රදායික මාධ්‍යයන් මඟින් නොසලකා හරින ලද විකල්ප තොරතුරු පළ කරමින් සමාජ මාධ්‍යයන් විසින් ලබා දුන් දායකත්වය පිළිගත යුතු බවයි. ඇඳිරි නීතිය මඟින් රටේ අනෙකුත් ප්‍රදේශ හා අළුත්ගම නගරයේ පැවති සම්බන්ධතාවය බිඳ හෙළූ අවස්ථාවේ, නගරයේ සිදුවන්නේ කුමක්ද යන්න, ස්මාර්ට් ෆෝන් යාවත්කාලීන කිරීම් සමඟ නිරන්තරයෙන් රැඳී සිටි සාමාන්‍ය ජනතාව එක්කළ ට්විටර් පණිවුඩ හරහා දැන ගන්නට ලැබුණි.[126] අළුත්ගම නගරයේ වීදි

124 මෙම කටකතාවන් සිංහල සහ මුස්ලිම් දෙපාර්ශ්වයේම සාක්ෂිකරුවන් විසින් ලබා දුන්නාවූ තොරතුරු වල සංකලනයකි.

125 සිංහල ප්‍රජාව අතර විවිධ කටකතා සැනෙකින් කෙටි පණිවුඩ හරහා ලැබුණු බව සහ ගැටුම් ඇතිවීමට පෙර ෆේස් බුක් හරහා ප්‍රචාරය වූ බවට සීනවත්තේ සිංහල පවුලක් විසින් තොරතුරු ලබා දෙන ලදී.

126 "අළුත්ගම කෝලාහලයඃ ශ්‍රී ලංකාවේ මාධ්‍යයන්ගේ ලැජ්ජා සහගත නිහඬබව සමාජ මාධ්‍යන් විසින් බිඳ දමයි", 2014 ජුනි 17 දින ඔස්ට් පෝස්ට් බලන්න.

සැරිසැරූ කලහකාරී පිරිස් සහිතව ස්මාර්ට් ෆෝන් සහ සීසීටීවී කැමරා වලින් ගත් දර්ශන රාශියක් යූ ටියුබ්හී පැවතුණි.[127] පොලීසියේ සහ විශේෂ කාර්ය බලකායේ දර්ශන ද ඔවුන්ගේ ක්‍රියාවන් හෝ ඒවායෙහි අඩුපාඩුකම් ද පටිගතකොට අන්තර්ජාලයට මුදාහැර තිබුණි. එක් පුද්ගලයෙක් පැවසුවේ ඔහුගේ පුතා විසින් පහර දීම් සියල්ල ඔහුගේ ස්මාර්ට් ෆෝන් වර්ගයේ දුරකථනයෙන් පටිගත කොට වට්ස්ඇප් (WhatsApp) හරහා තමන්ගේ මැදපෙරදිග සිටින ඥාතීන්ට යැවූ බවයි. ඔවුන් දැනගැනීමටත් පෙර අළුත්ගමින් පිට සිටි අය කෝලහාලයේ සැබැවින්ම සිදුවන්නේ කුමක්ද යන්නට සාක්ෂි අන්තර්ජාලයට මුදා හරින්නට පටන්ගෙන තිබේ.

සිද්ධිය දිග හැරුණු වහාම පුරවැසි මාධ්‍යකරණයට වේදිකාවක් වන ග්‍රවුන්ඩ්විව් මගින් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි අනුපිළිවෙල ක්‍රමයකට පෙල ගස්වන ලදී.[128] මෙය, ප්‍රධාන මාධ්‍යයන් තුළින් මුලින් අසන්නට ලැබුණු කරුණුවලට වඩා වෙනස් මත දරණ පුද්ගලයන්ට ඔවුන්ගේ හඬ අවදි කළ හැකි ස්ථානයක් ද වේ. රිපබ්ලික් ස්ක්වෙයාර් (Republic Square) වැනි අනෙකුත් වෙබ් අඩවි තුළින් ද හිංසනයේ පැතිරීම සම්බන්ධ නිවැරදි සාක්ෂි මාර්ගගත තොරතුරු පර්යේෂක වෙත (Online researcher) සපයන ලදී.[129] කෙසේ නමුත්, සමාජ මාධ්‍යයන් විසින් සිදු කර ඇති බලපෑම පිළිබඳව සහ ඒවා හරහා ගෙනහැර දක්වා ඇති සාධක අතරින් නීත්‍යානුකූල තත්ත්වයෙන් පවතින දෑ තෝරා බේරා ගැනීමට හැකියාව ඇත්තේ, මාධ්‍යය පිළිබඳ සැලකිය යුතු දැනුමක් පවතින පාඨකයෙකුට හෝ දකින්නෙකුට (විශ්ලේෂකයෙකුට) පමණකි.

127 බලන්න, "CCTV footage. BBS Aluthgama attack. 15/6/2014", YouTube: https://www.youtube.com/watch?v=n1DkG7nO9fg; "CCTV footage of Aluthgama attack- Gossip-booklk", Youtube: https://www.youtube.com/watch?v=WZw6Rw72dDk.

128 බලන්න, "Aluthgama riots and deaths: Vital updates" Groundviews, 2014 ජුනි 16

129 බලන්න, "What happened in Aluthgama, a verified account", The Republic Square, 2014 ජුනි 15.

# 7 වන පරිච්ඡේදය

## අළුත්ගම කෝලාහලයෙන් පසුඃ නීතිමය ප්‍රතිචාර

කෝලහාලයෙන් පසු තමන්ගේ වටිනා සම්පත් සහ සියලුම දේපළ විනාශයට පත්වූවන් අතර තම අසරණභාවය පිළිබඳ හැඟීමක් පැවතිණි. මොවුන්ට පැවති නීතිමය ආධාරයන් ඉතා අල්ප බව තේරුම්ගත හැකිය.[130] අපරාධකරුවන් ලෙස හඳුනාගත් පුද්ගලයන්ට විරුද්ධව පැමිණිලි කරන්නට ඇතැමුන් එඩිතර වූ අවස්ථාවලදී පොලීසිය විසින් පැමිණිලිකරුවන්වම අත්අඩංගුවට ගත් අවස්ථාවන් පිළිබඳව මුස්ලිම්වරුන් විසින් විස්තර කරන ලදී. එමනිසා, බලාපොරොත්තු විරහිතබවේ හැඟීමක් පොදු මහජනතාව තුළට කෙමෙන් කා වද්දා ඇත.[131]

අළුත්ගම කෝලාහලයෙන් විපතට පත්වූවන්ට පිහිටට පැමිණි පළමුවැන්නා වූයේ පෞද්ගලික නීතිඥවරුන්ගේ සංගමයයි.[132] ශ්‍රී ලංකා නීතිඥවරුන්ගේ සංගමය රජයට සහ නීතිපතිවරයාගේ දෙපාර්තමේන්තුවට බොදු බල සේනාව විසින් ආගමික අසමගිය කරා ජනතාව පෙළඹවීම පිළිබඳව අනතුරු අඟවා ඇත. ඔවුන් තවදුරටත් 2014 ජුනි 15 සහ 16 දිනවල සිදු වූ සිද්ධියෙන් සිය දේපළ හා ආරක්ෂාව අහිමි වීමෙන් නීතියේ පිහිට බෙහෙවින් අවශ්‍යවූවන් හට නීති සේවාවන් සැපයීමට (කඳවුරු) පවත්වන ලදී.[133]

---

130 රජයේ ආයතන සිය රාජකාරි නිවැරදිව ඉටු කරන්නේ ද යන්න සහතික කර ගැනීමට පවතින විවිධ අධිකරණ ක්‍රියාමාර්ග පිළිබඳව, ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව සාක්ෂි දරූ සහ ඒවාට ගොදුරුවූවන් නොදැනුවත්ව සිටි බව මෙහිදී පැහැදිලි විය.

131 බේරුවල සාක්ෂිකරුවන් විසින් ඔවුන් තමන්ගේ දේපලවලට සිදුකළ හානිය පිළිබඳව පැමිණිලි කිරීමට යාමේදී පොලීසිය විසින් ඔවුන් ඉලක්ක කරගනිමින් හිංසා පැමිණවූ ආකාරය විස්තර කරන ලදී. ඔවුන්ට විරුද්ධව පැමිණිලි 12ක් කර තිබූ අතර, ඔවුන්ගෙන් ඇතැමෙක්ව අත් අඩංගුවට ගෙන ඇත. එමනිසා, මෙය අනෙක් අයව ඔවුන්ගේ නැතිවූ දේවල් පිළිබඳව පොලීසියට පැමිණිලි කිරීමට යාමෙන් වළක්වන ලදී.

132 කෝලාහලයෙන් විපතට පත් අළුත්ගම හමුදා පාරේ විසූ එක් වැඩිහිටි කාන්තාවක් කියා සිටියේ සිද්ධිය සිදු වී හමාර වනවාත් සමගම ඇයගේ පිහිටට ශ්‍රී ලංකා නීතිඥවරුන්ගේ සංගමය පැමිණි බවයි. මෙම කතාව කෝලාහලයෙන් අනතුරුව වහාම එහි ක්‍රියාත්මක වූ කළ නීතිඥවරුන්ගේ සාක්ෂි වලින් සනාථ වේ.

133 කෝලාහලයෙන් විපතට පත්වූවන් සමග ක්ෂේත්‍රයේ වැඩ කළ නීතිඥවරයෙකුට අනුව ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපති සහ ලේකම් පෞද්ගලිකවම මෙම ගැටළුව සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ලදී.

ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපති උපාලි ජයසූරිය සහ ලේකම් අජිත් පතිරණ පෙනී සිටි මරණ විමසුම් දෙකක් ආරම්භ කරන ලදී. පළමු නඩුව සිංහල මුස්ලිම් කෝලාහලයේ ප්‍රතිඵයක් වශයෙන් මුස්ලිම් පුද්ගලයන් දෙදෙනෙක් මියයාම සම්බන්ධයෙන් කළුතර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී.ආර්. 1501/14 යටතේ ගොනුකර තිබුණි. මෙයින් මූලික වශයෙන් අධිකරණ වෛද්‍ය වාර්තාවේ මරණ සම්බන්ධයෙන් පැවති නොගැළපීම් පැහැදිලි කිරීමට උත්සාහ දරා ඇත. වෛද්‍ය වාර්තාවේ කැපුම් තුවාල මඟින් මරණ සිදුව ඇති බව සඳහන්ව තිබුණත් සිරුරුවල වෙඩි ප්‍රහාරවලින් ලද තුවාල ද පැවතුණි. ගැටළුව වැඩිදුරටත් විමර්ශනය වනබව දැනගත් පසු පොලීසිය විසින් එම අධිකරණ වෛද්‍ය වාර්තා තාවකාලික ඒවා බව ප්‍රකාශ කරන ලදී. සභාව විසින් අධිකරණ වෛද්‍ය වාර්තාවේ විශ්වාසනීයත්වය පිළිබඳව සැක පළකළ විට වෛද්‍යවරයාව කැඳවන ලදී.[134]

දෙවන නඩුව අලාභයන් හා සම්බන්ධ වේ. රජයේ රස පරීක්ෂකවරු විසින් සිද්ධිය විමර්ශනය කළා යන්නට කිසිදු නිදර්ශනයක් එහි නොවීය.[135] රජයේ රස පරීක්ෂකවරුන් විසින් පරීක්ෂණ පවත්වන තුරු කිසිඳු පිරිසිදු කිරීමක් සිදු නොකරන ලෙස අධිකරණය විසින් පොලීසියට නියෝග කර ඇත. අනෙක් ප්‍රදේශවලත් ගිනි තැබීම් සිදුවූවත් රජයේ රස පරීක්ෂකවරුන්හට නියෝග ලැබී තිබුණේ වැලිපිටිය සම්බන්ධයෙන් පමණි. රජයේ රස පරීක්ෂකවරුන්ට කඩිනමින් පරීක්ෂණ දියත් කිරීමට ඉල්ලා සිටි නඩු 15 ක් පමණ තිබුණි. සුන්බුන් ඉවත්කිරීමේ මෙහෙයුම් නවතන ලෙසට තවත් නඩුවක් ගොනුකර තිබුණි. කෙසේනමුත්, නියෝගය ලැබුණේ ප්‍රමාදවීය. මන්දයත් සුන්බුන් ඉවත්කිරීමේ ක්‍රියාවලියේ කටයුතු භාගයක්ම ඒ වනවිටත් ආරම්භ කර තිබූ හෙයිනි. දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන යටතේ දේපළවලට සිදුවූ අලාභ සම්බන්ධයෙන් ක්‍රියාකරන ලෙස ඉල්ලා කළුතර මහේස්ත්‍රාත් අධිකරණයේ පැමිණිලි විස්සකට අධික ප්‍රමාණයක් ගොනුකර ඇත.[136]

134 මෙය නඩු අංක බී.ආර්. 1501/14 හා එහි ව්‍යංගත්වයන් පිළිබඳව නීතිඥවරයෙකුගේ මතය මත පදනම් වේ.

135 මෙය නීතිඥවරයෙකු විසින් ලබා දුන් තොරතුරු මත පදනම් වේ. අළුත්ගම සහ බේරුවල ප්‍රදේශවල විපතට පත්වූවන්ගෙන් ලබාගත් සාක්ෂි වාර්තාවලින් මෙයට විරුද්ධ මතයක් පළ නොවීය.

136 මෙය කළුතර මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනුවූ වාර්තා මත පදනම් වේ.

ජනතාවට තමන්ගේ අයිතිවාසිකම් බලගැන්විය හැක්කේ කෙසේද යන්නට නිසි මඟ පෙන්වීමක් මෙහිදී සපයා නොතිබුණි. මෙහිදී සහන ලබාදීමට සම්බන්ධ විවිධ අංශ විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු යටතේ හසුරුවනු ලැබීය.[137] නිල ලේඛනගත වීමේ ක්‍රියාවලියට ඇතුළත් වී ඇත්තේ විනාශ වූ දේවලින් ඉතා අල්පයකි. ඉදිරියට පැමිණි නීති උපදෙස් අවශ්‍ය අයට උපකාර කිරීමට නීති ආධාර කොමිසම සහ නීතිපති දෙපාර්තමේන්තුව  අපොහොසත් වී ඇත.[138] කෙසේ නමුත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම අළුත්ගමට පැමිණි අතර එහිදී කෝලාහලය හේතුවෙන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූවන්ගෙන් දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින ලදී.[139]

මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වයෙහි ගොදුරක් වූ, දර්ගා නගරයේ වැසියෙකු වූ මොහොමඩ් ජුනායිඩ් මොහොමඩ් ඉම්රාන් විසින් ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 17 වන සහ 126 වන වගන්ති ප්‍රකාර මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩුවක් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කිරීමට මූලාරම්භය ගන්නා ලදී. මෙය ඔහුගේම කැමැත්තෙන් සහ මහජනතාවගේ කැමැත්ත මත, පොලිස්පති, බස්නාහිර පළාත් ජ්‍යෙෂ්ඨ උප පොලිස්පති, ශ්‍රී ලංකා විශේෂ කාර්ය බලකායේ අණදෙන නිළධාරී, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් සහ නීතිපතිවරයාට විරුද්ධව එය ගොනුකර ඇත.[140] ජුනි 15 වන දින දර්ගා නගරයේ මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් වෙඩි ප්‍රහාරයකින් තුවාල ලැබූ පෙත්සම්කරු නීතියේ ආධිපත්‍යය පිහිටුවීමට සහ තමන්ගේ රාජකාරිය සහ බැඳීම් ඉටු කිරීමට පොලිස් දෙපාර්තමේන්තුව පාර්ශ්වයෙන් පූර්ණ සහ ක්‍රමික වශයෙන් අපොහොසත්වීම තම අයදුම සඳහා හේතු ලෙස ඔහුගේ ඉල්ලුම්පතෙහි  සඳහන් කරනු ලබයි.[141]

---

137 රජයේ දෙපාර්තමේන්තුවලින් විපතට පත්වූවන්ට පිළියම් සැපයීමේදී පවතින අඩු සම්බන්ධීකරණය ජනතාව අතර ව්‍යාකූලත්වයක් සහ බලාපොරොත්තු විරහිතභාවයක් ඇතිකර ඇතිබව කතුවරුන් විසින් නිරීක්ෂණය කරන ලදී. කතුවරුන්හට නිරන්තරයෙන්ම සිය සම්මුඛ සාකච්ඡාවන් අතරතුරදී, ඔවුන් කුමන රජයේ නිළධාරීන්ට කතාකළ යුතුද යනාදි වශයෙන් තොරතුරු සපයමින් පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීමට සිදුවිය.

138 මෙය පුද්ගලික නීතිඥවරුන්ගේ සංගමයේ සාමාජිකයෙකු විසින් සපයන ලද සාක්ෂි මත පදනම් වේ.

139 අළුත්ගමදී විවිධ සාක්ෂිකරුවන්ගෙන් ලද සාක්ෂි මත පදනම් වේ.

140 SC (FR) Application Number: 203/14.

141 "AluthgamaGun-Shot Victim Goes to SC; Full Text off The Petition", Colombo Telegraph, 2014 ජූලි 17 බලන්න.

පෙත්සමට අනුව, පොලිස් දෙපාර්තමේන්තුව 1865 අංක 16 දරණ පොලිස් ආඥා පනතේ 56 සහ 77 වගන්තියත්, 1979 අංක 15 දරණ අපරාධ විධිවිධාන පනතේ 107 වගන්තියත් අනුව කටයුතු කිරීමට අපොහොසත් වී ඇත. මුස්ලිම් ජනතාව සහ අනෙකුත් ආගමික සුළුතරයට විරුද්ධව දියත්වන වෛරී ව්‍යාපාරයන්ට විරුද්ධව කිසිදු වැළැක්වීමේ හෝ දඬුවම් පැමිණවීමේ ක්‍රියාමාර්ගයක් ගැනීමට පසුගිය වසර දෙකහමාර තුළදීම පොලීසිය අපොහොසත් වී අතර, මෙය සමාජය 'කෝවය' ක් (ඉක්මනින් ගිනි ඇවිලෙන සුළු දෑ පවතින ස්ථානයක්) බවට පත් කර තිබේ. පොලීසිය විසින් සම්පූර්ණයෙන්ම නොසැලකිලිමත්, අලස, අක්‍රීය සහ උදාසීන පිළිවෙතක් මෙහි අනුගමනය කළ බව සහ මුසල්මානුවන්ට සිදු කෙරුණු පහරදීම්වලට පොලීසිය සහ විශේෂ කාර්ය බලකාය සහායවූ බව අළුත්ගම සහ බේරුවල මුස්ලිම් ජනතාවට පැහැදිලි දසුනක් වූ බව පෙත්සමෙහි සඳහන් වේ.

## නිගමන සහ නිර්දේශ

### නිගමන

මුසල්මානුවන්ට එරෙහි හැඟීම් උත්පාදනය කළා වූ වෛරී කථනයන් මගින් එකිනෙකා පිළිබඳව ප්‍රජාවේ සාමාජිකයින් තුළ වූ දැක්මට ඉතා හානිකර බලපෑමක් සිදුකර තිබූ බවට සාක්ෂි විය. භික්ෂූන් වහන්සේලාට සහ පන්සල්වලට මුස්ලිම් පිරිස් විසින් ප්‍රචණ්ඩකාරී අයුරින් පහර දෙනවා යනාදිය පිළිබඳ කථා කරමින් සිද්ධියෙන් පසු කටකතා ව්‍යාප්ත කළ විට, මිනිසුන් එම කථා එකහෙලා විශ්වාස කරමින්, මුසල්මානුවන්ට විරුද්ධව ප්‍රචණ්ඩත්වය පතුරවන කලහකාරී පිරිස්වලට එක්වීම සමාජයේ නීතිය හා සාමයේ තත්ත්වය පිළිබඳ පවතින අනුවේදනීය නිදර්ශනයකි.

රජය විසින් කිසිඳු අවස්ථාවකදී මෙම සිදුවීමෙහි ප්‍රචණ්ඩත්වයේ තරම හෝ බලපෑමට ලක්වූ ප්‍රදේශයන්හී සම්බන්ධතාවන්වල සිදුවූ බරපතල බිඳ වැටීම හෝ යුද්ධයෙන් සාමයට පරිවර්තනය වන මෙවන් අවධියක මෙවැනි ආකාරයේ සිදුවීමක් ඇති වීමේ බරපතලකම හෝ දකුණේ මුස්ලිම් ජනතාවගේ හැඟීම්වලට බලපෑම් සිදුවූ ආකාරය හෝ පිළි

නොගන්නා ලදී. මේ සම්බන්ධයෙන් රජයෙන් ලද ප්‍රතිචාරයෙන් ඔවුන් උත්සාහ දරා තිබුණේ ජාත්‍යන්තර සමාජය තුළ තම කීර්තිනාමය රඳවා ගැනීමට සිදුවීමේ බරපතලකම අඩු කර දැක්වීමට සහ අලාභ අවම කර පෙන්වීමටයි. රජයේ ප්‍රතිචාරයෙන් අඟවනු ලැබූයේ රජය විසින් අස්ථිර හෝ වර්ගවාදී හැඟීම් සමඟ කටයුතු කරමින්, තමන්ගේ කීර්තිනාමයට හානියක් සිදු නොවන ආකාරයේ සිද්ධීන් ඉදිරියට ගෙනයාම කෙරෙහි සැලකිල්ලක් දක්වන බවයි. එලෙස සිදු කිරීමෙන්, රජයට ප්‍රජාව කෙරෙහි ඉටු කිරීමට තිබූ ප්‍රතිසන්ධාන කටයුතු සිදු කිරීමට තිබූ අවස්ථාව මඟ හැරුණි. රජය විසින් තවදුරටත් මුස්ලිම්වරුන්ගේ පහත්භාවය, බෞද්ධයන්ගේ ශ්‍රේෂ්ඨත්වය සහ බොදු බල සේනාවට විනිර්මුක්තව කටයුතු කිරීමට හැකි බව යන කරුණු නැවත ස්ථිර කරනු ලබයි. මෙවන් සිදුවීම්වලින් පුද්ගලයන්ට සහ ප්‍රජාවන්ට කෙතරම් දුරට හානි සිදුවන්නේද යන්න අවබෝධ කර ගැනීමට රජයට ඇති සීමිත හැකියාව ඉන් හෙලිදරව් කරයි. නිවාස සහ ගොඩනැගිලි ඉදි කිරීමට රජය විසින් දුන් කඩිනම් ප්‍රතිචාරයෙන් පවා පෙන්වා දෙන්නේ රජයේ උපාය මාර්ගයන් පවතින්නේ යටිතල පහසුකම් හා සම්බන්ධ ගැටළු පිළිබඳව කටයුතු කිරීමට පමණක් බවයි. සමාජයේ සම්බන්ධතා, සුළුතරයේ අනාරක්ෂිතභාවය, බහුතර ආධිපත්‍යය වැනි විශාල, වඩා සංකීර්ණ සහ බරපතල ගැටළු රජය විසින් නොසලකා හැර හෝ නැත්නම් හඳුනාගෙනවත් නොමැති බවක් පෙනේ.

දර්ගා නගරයේ මුස්ලිම් නිවෙස්වලට සිදුවූ පහරදීම්වලට අමතරව, පතිරාජගොඩ සිංහල මිනිසුන්ට අයත්ව තිබූ නිවෙස් හයක් සහ මිහිරිපැන්න පාරේ එක් නිවසක් පහරදීම්වලට ලක්විය. පතිරාජගොඩ පහරදීම් සිදුවීමට පටන් ගත්තේද දර්ගා නගරයේ අනෙකුත් පහරදීම් සිදුවන වේලාවේදීමය. අධිකාරිගොඩ පිහිටි සිංහල නිවසකට ද පසුව පහරදී ඇති අතර එය පලි ගැනීමකට සිදු කරන ලද්දක් විය හැකිය. පතිරාජගොඩ නිවෙස්වලට පහරදීම සිදු වූයේද දර්ගා නගරයේ මුස්ලිම් නිවෙස්වලට පහරදෙන වේලාවේදීම වීම නිසා එය පලි ගැනීමකට සිදු වූවක් නොවන බව අපට හැඟේ. කලහකාරී පිරිස්වලට මඟ පෙන්වමින් පැමිණි පුද්ගලයින් අතර සිටි තම අසල්වාසී මුස්ලිම් පිරිස් තමන් හඳුනාගත් බව පීඩාවට පත්වූවන් විසින් අපට කියන ලද කථා අප පිළිග න්නා අතරම, සාක්ෂි මඟින් පෙන්වා දෙන්නේ සිංහල නිවෙස්වලට

පහරදුන් පිරිස් සංවිධානය වී සිටි බව සහ පහරදීම් ක්‍රියාත්මක වූයේ මුස්ලිම් නිවෙස්වලට පහරදුන් ආකාරයට සමාන ආකාරයකින් බවයි. මෙම සමානකම්වලට පුද්ගලයන්ට අවම වශයෙන් හානි පැමිණවීම, සංවිධානාත්මක සහ ක්‍රමික ආකාරයෙන් ස්වර්ණාභරණ සහ මුදල් කොල්ලකෑම, ගෘහ භාණ්ඩ, පොත්පත් සහ මෝටර් රථ ටයර් ගිනි තැබීම්වලට යොදා ගැනීම ආදිය ඇතුළත් වේ. මෙම සමානකම් තුළින් නිරායාසයෙන්ම කියාපාන්නේ මෙම පහරදීම් සිංහල පිරිස් හෝ මුස්ලිම් අසල්වැසියන් විසින් කරන ලද්දක් නොව, එහෙත් විශාල සංවිධානාත්මක උපායමාර්ගයක් තුළින් සිදු වූවක් බවයි. මෙහිදී තවත් සැකයට තුඩු දෙන කාරණයක් වනුයේ සිංහලයින්ට විරුද්ධව සිදුවූ පහරදීම් මෙම නිවාස හයට සීමාවීම සහ ඒ අවට පිහිටි අනෙක් සිංහල නිවෙස්වලට සුළු හෝ හානියක් සිදු නොවීමයි.

සතියක් ඇතුළත රජය විසින් නැවත ඉදිකිරීම් කටයුතුවලට හමුදා නිළධාරීන් එවීම සහ නැවත ඉදිකිරීම් කටයුතු ඉදිරියට කෙරීගෙන යන බව යන කරුණුවලින් කුමන හෝ අයුරකින් සිද්ධියේ ප්‍රතිවිපාකවලට පිළියම් සෙවීමෙහි රජය නිරතව සිටින බවට මුස්ලිම් ප්‍රජාවට සතුටුදායක පණිවුඩක් ලබා දෙයි. කෙසේනමුත්, අපරාධවල වැරදිකරුවන් හසුකර ගැනීමේදී සහ දඬුවම් පැමිණවීමේදී පෙන්නුම් කරන සීමාසහිත ප්‍රගතිය, තවමත් වෛරීත්වයට ජනතාව පොළඹවන්නන් විශාල වශයෙන් සිටීමට සහ පෙනෙන සැටියට ඔවුන්ගේ වැඩ කටයුතු දිගටම පවත්වාගෙන යාමට හේතුවකි. රජය විසින් සිද්ධිය පිළිබඳ සීමිත ක්‍රියාමාර්ග ගැනීමෙන් අපරාධ ක්‍රියාවන් තුළින් සමාජයේ ගෙන ගිය වාර්ගවාදී සහ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් යළි තහවුරු කිරීමේ පණිවුඩය ලබා දෙයි.

හමුදා නිළධාරින් පිරිසිදු කිරීම් සහ නැවත ඉදිකිරීම් කටයුතුවල නියුතුව සිටීම ප්‍රදේශයේ ප්‍රජාවන් මත සැලකිය යුතු බලපෑමක් සිදුකරනු ලබයි. රජය විසින් යම් මුදලක් සහතික වීම සහ හමුදා නිළධාරීන් දනටමත් නැවත ඉදිකිරීම් කටයුතුවල නිරතව සිටීම යම් පමණකට සුභවාදීය. ප්‍රදේශයේ මෙවැනි විශාල හමුදා නිළධාරින් ප්‍රමාණයක් සිටීම පිළිබඳ ව ඇතමුන් කල්පනාකාරී වූ නමුත් අනෙක් අය හමුදාවත් සමඟ යහපත් සම්බන්ධතාවක් ගොඩනගා ගෙන තිබේ. ඇතැම් පවුල්

ඉවුම් පිහුම් සඳහා හමුදාවට වළං සහ ළිප් සැපයූ අතර, ඉදිකිරීම් සිදුවන අතරතුර ඔවුනට සිය නිවාස පවා පාවිච්චි කිරීමට අවසර ලබා දී තිබුණි. අධිකාරිගොඩ සිටි හමුදා නිළධාරීන්ද නිවෙස්වල බිත්ති එහා මෙහා කරමින් තිබූ සැලැසුම්වල සුළු වෙනස්කම් කරමින් ඉදිකිරීම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් නම්‍යශීලීත්වයක් පෙන්වන ලදී. මෙම දර්ශනය රජයේ එක් නිළධාරියෙකුට "සැබැවින්ම මෙය වෙස්වලා ගත් ආශිර්වාදයක්" සහ ඇතැමුන්ට තිබුණාටත් වඩා හොඳ නිවෙස් ලැබෙනු ඇතැයි ලෙස පැවසීමට ඉඩක් ලබා දුන්නේය.[142]

සිද්ධිය සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් ගැටළුවක් ඉතිරි කරන අතර, එතුළින් රජය විසින් එම දින දෙක තුළ සිදුවූ දේවල් පිළිබඳ විශ්වාසනීය තොරතුරු සැපයීමට උනන්දුවක් නොදක්වන බව පෙන්වා දෙයි.

රජය විසින් ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව විස්තර කිරීම් ලබා දීමේදී, විශාල වශයෙන් සිදුවූ ප්‍රචණ්ඩ ක්‍රියාවලට ජනතාව පොළඹවන්නන් ලෙස මුස්ලිම් ජනතාව නම් කිරීම තුළින් මුස්ලිම් විරෝධී මනෝභාවයන් වැඩිදුරටත් ව්‍යාප්ත කිරීමට දායක වූ අතරම මුස්ලිම් සහ සිංහල ජනතාව අතර සම්බන්ධතාවන් විනාශ කිරීම කෙරෙහිද එය බලපාන ලදී. විස්තර කිරීම්වලින් ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වනුයේ සිදුවූ දේවල්වලට කිසිදු ආකාරයකින් සිංහල ප්‍රජාවන් කණගාටුවී හෝ දොස් තබාගෙන නොමැති බව සහතික කිරීමයි. මෙය ජන කණ්ඩායම් දෙක විසින්ම විශාල වශයෙන් සමාග්‍රහණය කරගත් (ඇතුළු කරගත්), වාර්ගික ප්‍රජාවන්ගේ ධූරානුක්‍රම ස්ථානගතවීම් ශක්තිමත් කරනු ලබයි. මෙයට විරුද්ධව කිසිදු ශක්තිමත් පදනමක් දැමීමට විපක්ෂයේ පක්ෂ පවා අපොහොසත් වීම අතිශයින් කණගාටුදායකය. සියලුම කණ්ඩායම් විසින් 'සමානාත්මතාව' පිළිබඳව කතා කරනු ලැබූවත්, මෙහිදී මෙම සමානාත්මතාව සිංහල ශ්‍රේෂ්ඨත්වය පිළිගනු ලබන රාමුවක් තුළ පවතින බව නිසැක පිළිගැනීමක් පවතියි.

සිද්ධියෙන් ඇතිවූ වඩාත් අවාසනාවන්ත විපාකයන්ගෙන් එකක් වන්නේ ප්‍රදේශයේ සිංහල හා මුස්ලිම් අසල්වැසියන් අතර පැවති

142 මෙම ප්‍රකාශයත් සමග පර්යේෂණ කණ්ඩායම එකඟ නොවන බව පැවසීමට අවශ්‍ය නොවේ!

සම්බන්ධතාවන් බිඳවැටීමයි. මෙම සම්බන්ධතාවන් වර්ධනය වේ යැයි බලාපොරොත්තු වූ ඇතැමුන්ව අපට හමුවිය. අනෙක් අය පැවසුවේ දඬුවම් නොලබා සැම තැනම ඇවිදින ප්‍රචණ්ඩත්වයේ අපරාධකරුවන් දෙස බැලීමට පවා ඔවුන්ට අපහසු බවයි.

මුස්ලිම් දේශපාලන පක්ෂ, විශේෂයෙන් ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය සහ එහි නායක රවුෆ් හකීම් සිද්ධියෙන් පසු ඉතා දොඩමලු වූ අතර, අලාභ හානියට පත්වූ දේපළ නැවත ඉදි කිරීමට අවශ්‍ය මූල්‍ය උපකාර ඉල්ලීමත් සමඟ වාර්තාවක් පක්ෂය විසින් ළඟදී ඉදිරිපත් කරන ලදී. සිදු වූ දේ පිළිබඳව ප්‍රලේඛනයට කැපවීම සහ නිවැරදි සහ ස්ථිර තොරතුරු සැපයීම ප්‍රශංසනීය වන අතර ඉස්මතු කරන ලද ගැටළු සම්බන්ධයෙන් මහජනතාව සමගින් සම්බන්ධ වී ක්‍රියා කිරීමට අපි නායකත්වය උනන්දු කරවමු.

එජාප, ද්‍රජාස (ද්‍රවිඩ ජාතික සන්ධානය) සහ ජවිපෙ වැනි විපක්ෂයේ දේශපාලන පක්ෂ ආණ්ඩුව විවේචනය කිරීමෙහිලා මුඛරිව සිටි අතර, ඇතැමෙක් සිදුවීම්වලට උල්පන්දම් දීම සම්බන්ධයෙන් රජයට වරද පැටවීමට තරම් දුර ගියහ. සියලුම දේශපාලන පක්ෂ මෙවන් තත්ත්වයකට මඟපෑදූ රටේ පවතින ගැටුම්කාරී නීතිය හා සාමයට දොස් නඟන ලදී. පාර්ලිමේන්තුවේදී දේශපාලන පක්ෂ නියෝජිතයන් විසින් කරන ලද බොහෝමයක් මත ප්‍රකාශ කිරීම්, සංවාදයන් සහ විවාදයන් තුළින් මෙම සිද්ධියේ බොහෝමයක් කතාවන් රටේ ඓතිහාසික වාර්තාවල කොටසක් වන බව සහතික කරන ලදී.

අනෙක් පසින් ජාතික හෙල උරුමය තමන්ගේම දේශපාලන වාසි ලබා ගැනීමට සිද්ධිය ප්‍රයෝජන ගැනීමට උත්සාහ කර තිබේ. ප්‍රචණ්ඩ ක්‍රියාවලින් පීඩාවට පත්වූ සිංහල ජනතාවට ලැබුණු මාධ්‍ය ආවරණය මුස්ලිම් ජනතාවට විරුද්ධව වූ පහරදීම් සඳහා ලැබුණු ආවරණයට වඩා අඩු බවට තර්ක කළ හැකි නමුත් සිදුවීම පිළිබඳව විශේෂයෙන්ම සිංහල බෞද්ධ කතාවක් සැපයීමට ජාතික හෙල උරුමය කටයුතු කළ ආකාරයෙන් තත්ත්වය ලිහිල් කිරීමට නොව එය වඩා අවුල් කිරීමට හේතු විය. ජාතික හෙල උරුමයේ සාමාජිකයන් වන උදය ගම්මන්පිල සහ චම්පික රණවක විසින් කළ මාධ්‍යය මැදිහත්වීම් සිද්ධියෙන් පසු

පැවති නොසන්සුන්කාරී තත්ත්වයන් දිගටම පවත්වාගෙන යාමට දායක විය.

මෙම කෝලාහලය පිටුපස සිටියේ කවුරුන්ද යන්න සහතිකව කියාපෑම අපහසු කර්තව්‍යයක් වුවත්, එය සංවිධානාත්මකව සහ සැලසුම් සහගතව සිදු කෙරුණු බවට සලකුණු පැහැදිලිව දක්නට තිබූ බව අවධානයට ගැනීම වැදගත් වේ. කොල්ලකෑ භාණ්ඩවලට ප්‍රවාහන පහසුකම් සැලසීම්, ප.ව. 6.30 වන විට පහරදෙන්නන් අත තිබූ ආයුධ, ඔවුන්ට වීදුරු බෝතල්, පෙට්‍රල් සහ දිග පොලු සහ යකඩ පොලු මෙන්ම දිග බයිසිකල් චේන්, යකඩ පෙට්ටිවල කොටස් යනාදිය ලබා ගැනීමට තිබූ හැකියාව මෙන්ම අප දුටු හා ඡායාරූප ගත කළ ලෝහ කැනිස්ටර් බඳුන් කොටස් යනාදිය මගින් මෙය නිරායාසයෙන් සිදුවූ විනාශයක් යැයි කියාපෑමට ඇති ඉඩ ප්‍රස්ථාව අහුරවනු ලබයි.

තමන් කළ යුතු දෑ පැහැරහැරීම මගින් විශේෂ කාර්ය බලකාය පහරදීම්වලට සහාය වූ බව අපට සහතිකවම පැවසිය හැකිය. විශේෂ කාර්ය බලකාය විසින් මිනිසුන්ට උදව්වීමට ප්‍රතික්ෂේප කළ බොහෝ අවස්ථාවන් පමණක් නොව, උදව් පතා පැමිණි මුස්ලිම් පුද්ගලයන්ට බැණ වැදුණු අන්දම පිළිබඳ කථාද අප වෙත ඇත. විශේෂ කාර්ය බලකායේ සාමාජිකයන්ගේ පාර්ශ්වයෙන් පවතින්නා වූ මෙවන් ඇතැම් මනෝභාවයන් වෛරී කථනයන් තුළින් ඇති කළාවූ සැහැසිකම සහ පසුගිය වසර කිහිපය පුරාවට වැපුරුවා වූ පොදු මුස්ලිම් විරෝධී ආකල්පයන් හේතුවෙන් ඇතිවූවාත් විය හැකි නමුත් පුළුල්ව දක්නට ලැබුණු උදව් කිරීමට ප්‍රතික්ෂේප කිරීමේ ස්වාභාවය තුළින් පෙනෙන්නේ විශේෂ කාර්ය බලකාය පාර්ශ්වයෙන් එය ක්‍රමානුකූල ස්වරූපයකින් සිදුව ඇති බවකි.

ප්‍රචණ්ඩත්වය පැවති කාලය අතරතුර මාධ්‍යයේ භූමිකාව ඉතා තීරණාත්මකය. එක් අන්තයකින් සාම්ප්‍රදායික මාධ්‍යය නිහඬව බලාසිටි අතර මාධ්‍යය මත පවතින රජයේ බලපෑම සහ මෙම සිද්ධිය සම්බන්ධයෙන් රජයේ ස්ථාවරත්වය එමගින් පෙන්වා දෙයි. අනෙක් අන්තයෙන් සමාජ මාධ්‍යය සහ නව මාධ්‍යය තාක්ෂණය යොදා ගනිමින් සිද්ධිය මුළු ලොව පුරා පතුරවාලන ලදී.

# නිර්දේශ

අළුත්ගම සහ ඒ අවට ස්ථානවල සිදුවූ සිද්ධිය සම්බන්ධයෙන් රජයෙන් පුළුල් සහ අපක්ෂපාතී පරීක්ෂණයක් පැවැත්වීම දැඩි මෙන්ම අත්‍යවශ්‍යය අවශ්‍යතාවකි. මෙම පරීක්ෂණය තුළින් වෛරී කථනයේ බලපෑම, පොලීසියේ සහ විශේෂ කාර්ය බලකායේ අක්‍රීය බව, කොල්ලකෑම්, විපතට පත්වූවන් විඳදරාගත් අලාභහානි සහ ප්‍රජා සම්බන්ධතාවන්ගේ බිඳ වැටීම් ඉස්මතු කර දැක්විය යුතුය.

නීතිය, සමානාත්මතාව සහ යහ පාලනයට බැඳෙමින් බොදු බල සේනාවේ ප්‍රචාරයන්වලට විරුද්ධව දේශනයක් පැවැත්වීම මෙන්ම එතුළින් ශ්‍රී ලංකාවේ පුරවැසියන් ලෙස මුස්ලිම් ජනතාවගේ ඓතිහාසික හා සංස්කෘතික විශේෂත්වයන් හෙළි කරමින් අවශ්‍ය තොරතුරු සැපයීම සහ එයින් වෛරී කථනයන්ගෙන් තවදුරටත් ඇතිවිය හැකි බලපෑම් අවම කිරීමේ දැඩි අවශ්‍යතාවක් පෙන්වා දෙයි. උදාහරණයක් වශයෙන් ජාතික හෙල උරුමය මඟින් ඇතිකළ තත්ත්වය මුළුමනින්ම ප්‍රතිපත්තිවලට හානි පමුණුවන අතර මෙහි ප්‍රතිවර්තනයක් අවශ්‍ය වේ.

මුස්ලිම් සිවිල් සමාජ විසින් තමන් ප්‍රජාවක් ලෙස අත්විඳින්නාවූ දේවල් සහ දෙමළ ප්‍රජාවට විරුද්ධව පවතින ඇතැම් ක්‍රියාවන් අතර පවතින ඓතිහාසික සමානකම් පිළිබඳව වඩාත් දැනුවත් විය යුතු අතර ඒ පිළිබඳ විශ්ලේෂණයක් කිරීම වඩා සුදුසුය. උදාහරණයක් වශයෙන් 2014 ජුනි සිදුවීම 1983 ජූලි සිදුවීම පිළිබඳව ප්‍රතිරාව නංවන අතර විපක්ෂයේ දේශපාලනඥයන් ඇතුළු අර්ථ දක්වන්නන් විසින් පවා මේ බව පෙන්වා දී ඇත. වාසනාවකට මෙන් ජුනි මාසයේදී ඇති වූ ප්‍රචණ්ඩ ක්‍රියා දකුණේ ප්‍රදේශවලට ව්‍යාප්ත නොවූ නමුත් ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවෙමින් පැවති කාලය තුළදී එවැන්නක් සිදුවන්නට යන්නාක් මෙන් පෙනුණි.[143]

රජය සමඟ නිරන්තරයෙන් සම්බන්ධව සිටීමේ ක්‍රමෝපායන් පවත්වාගෙන යන අතරතුර අයිතිවාසිකම් හා විනිර්මුක්තභාවයන්

143 ජුනි 15 රාත්‍රියේදී දෙහිවල හාකට් ඖෂධ මධස්ථානයට පහරදීම එවන් එක් සිදුවීමකි. තරුණයන් කිහිප දෙනෙක් සාමාන්‍යය අන්දමෙන් පරිශ්‍රයට ඇතුළු වී කවුන්ටර් විනාශ කරමින් පෙට්‍රල් බෝම්බ ඒ දෙසට විසි කරනු සීසීටීවී (සැඟවුණු කැමරා) දර්ශනවලින් පෙන්වන ඔවුන්ගේ අංග ලක්ෂණවලින් මැනවින් දිස්වේ. සතියකට පසු නෝලිමිට් ආයතනයේ ඇඳුම් විශාල ප්‍රමාණයක් ගිනි තැබීමෙන් මෙම හැඟීම තවත් වැඩි කරනු ලබයි.

පිළිබඳ මැදිහත්වීම් සිදුකිරීම සම්බන්ධයෙන් ඉතිහාසයක් පවතින අනෙකුත් ආයතන සමඟද සම්බන්ධතාවන් වර්ධනය කර ගැනීමට මුස්ලිම් සිවිල් සමාජ සංවිධාන විසින් ඒ හා සමාන පරිශ්‍රයක් දැරීම ඉතා වැදගත් වේ.

යුද්ධයෙන් පසු ශ්‍රී ලංකාව තුළ මානව හිමිකම් පිරිහීම කෙරෙහි බොදු බල සේනාව විසින් දායකත්වය සපයන ආකාරයට එරෙහිව පෙත්සම් අත්සන් කිරීමට සහ තම මතය ප්‍රකාශ කිරීමට සිවිල් සමාජ සංවිධාන විසින් කටයුතු කර තිබේ. පාලකයින් තම සීමා ඉක්මවා කටයුතු කිරීමට එරෙහිව ස්ථවරයක් ගන්නා, ජාතිය මත පදනම් නොවූ සංවිධාන විසින් පාලකයින් සම්බන්ධයෙන් ඔවුන් කරන විවේචනයට වර්තමානයේ සිංහල බෞද්ධ ජාතිකත්වය සහ බොදුබල සේනාව මතුකර ඇති මුස්ලිම් ප්‍රශ්නය පිළිබඳවද විශ්ලේෂණයක් ද ඇතුළත් කිරීම සුදුසුය. එසේ නැත්නම්, මෙරටේ සිදුවන පශ්චාත් යුධ පරිවර්තනයේ සංකීර්ණත්වයෙන් මතු වන මුස්ලිම් ගැටළුවල ස්වභාවය ඔවුන්ගේ විවේචන තුළින් මුළුමනින්ම ගිලිහී යනු ඇත.

බොදු බල සේනාව සහ එහි සහචර කණ්ඩායම් විසින් පතුරවන ලද සහ පසුව ප්‍රචණ්ඩ ක්‍රියා මඟින් වඩාත් අවුලවන ලද මුස්ලිම් විරෝධී ආකල්ප තුළින් ඇතිවූ පරතරයන් යා කිරීමට උත්සාහයන් පැවතීම ඉතා වැදගත්ය. මෙවන් මැදිහත්වීම් සිදුකිරීමේදී ඕනෑම උත්සාහයකදී සිදුවීමට ඉඩ ඇති පරිදි තත්ත්වය තවත් උත්සන්න නොකිරීමට වගබලා ගත යුතුය.

ප්‍රචණ්ඩ ක්‍රියාවලට සහභාගි වූ බොහෝමයක් දෙනා තරුණ පුරුෂයන් (භික්ෂූන් මෙන්ම ගිහි පිරිස්) හා සුළු ප්‍රමාණයක් කාන්තාවන් වූ බවට සාක්ෂි පවති. තරුණ කාන්තාවන් සහ පුරුෂයන් සමඟ වැඩ කිරීමට මුල පිරීමට, විශේෂයෙන් අධ්‍යාපනයේ සහ රැකියාවේ බිඳවැටීම් වලට භාජනය වූවන් කෙරෙහි අවධානය යොමු කිරීම අතිශයින්ම අවශ්‍ය වන්නේ මෙවැනි ස්වභාවයේ සිදු වීම්වලට ඔවුන්ව ග්‍රහණය කරගෙන මෙහෙයවීමට වඩා පහසු වන නිසාය.

බෞද්ධ භික්ෂූන් විසින් තමන්ගේ අනුගාමිකයන් (සාමාජිකයන්) හට සංහිඳියාව සහ ප්‍රජාවන් අතර සම්බන්ධතාව ශක්තිමත්

කරගැනීමේ වැදගත්කම, විශේෂයෙන්ම වෙනස්කම් තවත් වර්ධනය කිරීම වෙනුවට ඒවා යාකරමින් වෙනස්කම් අවම කිරීමේදී ආගමක පවතින කාර්යභාර්ය පිළිබඳව අධ්‍යාපනයක් (අවබෝධයක්) මෙන්ම සංවේදීභාවයක් ලබාදිය යුතුය.

විරුද්ධ පක්ෂ විසින් මතවාදීය බෙදීම් දුරලා සුළුතර ප්‍රජාවන්ගේ විශ්වාසය වර්ධනය කර ගැනීමට මාර්ගයක් සොයා ගැනීම අවශ්‍යය. ආධිපත්‍යය (රාජ්‍ය පාලනය) පිළිබඳව ඔවුන්ගේ විශ්ලේෂණය සහ එහි ප්‍රතිඵල, ජනවාර්ගික සම්බන්ධතාවන් පිළිබඳ වන ගැටළු සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කළ යුතු අතර යටත් විජිතවාදයේ ප්‍රතිඵලයක් ලෙස ජනවාර්ගික සමගිය පිරිහී තිබීම වැනි වාර්ගික සම්බන්ධතා ඉතා සරළ කොට සලකන තත්ත්වයන්ගෙන් ඔබ්බට යා යුතුය.

ප්‍රතිසංස්කරණ කටයුතු ඉතා වේගයෙන් සිදුවීම ප්‍රශංසනීය කරුණක් වූවත්, බොහෝමයක් ප්‍රදේශවල පිරිසිදු කිරීම්වලට අමතරව කිසිවක් සිදු නොවූ බවට සාක්ෂි පවතී. පීඩාවට පත් සියලුම පුද්ගලයන්ට රජයෙන් යම්කිසි සහනයක් ලැබීම අවශ්‍යයෙන්ම සිදුවිය යුතුය. මෙම අවස්ථාවේදී විපතට පත්වූ සියලුම පුද්ගලයන්ට ප්‍රතිඵල ලබාදෙන තුරු රජය විසින් ප්‍රතිසංස්කරණ කටයුතු නොනවත්වා පවත්වාගෙන යාම ඉතා වැදගත්ය. පුද්ගලයන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය (REPIA - Rehabilitation of Persons, Properties & Industries Authority) විපතට පත්වූවන් අතර ඔවුන්ගේ අලාභයන් පිළිබඳව සඳහන් කිරීමට පෝරමයක් බෙදා හරින ලදී. ජනතාව හට තමන්ගේ ජීවිත නැවත සාදාගැනීමට මෙම ක්‍රියාවලීන් ද ඉක්මනින් ක්‍රියාවට නැංවීම වැදගත් වේ.

අළුත්ගම සහ අනෙකුත් ප්‍රදේශවල සිදුවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් රජය විසින් සිදුකරන ප්‍රතිසංස්කරණ කටයුතු සරළවම නිවාස සහ ගොඩනැගිලි නැවත ඉදිකිරීමෙන් නොනැවතී ඉන් ඔබ්බට ගොස් මෙම සිදුවීම්වලින් මෙම ප්‍රජාවන්ගේ ආර්ථිකයට සිදුවූ බරපතල හානිය පිළිබඳවද සැලකිලිමත් විය යුතුය. තවද සිය ජීවනෝපායන් නැවත ඇති කර ගැනීමට ජනතාවට ඇති හැකියාව තහවුරු කිරීම ඉලක්ක කරගත් විශේෂ මැදිහත්වීම් ලබාදීම අවශ්‍යය වේ.

## ඇමුණුම I

මාධ්‍යය ප්‍රකාශය - 2014 ජූලි 16 වන දින

**ජාතික සූරි සභාව විසින් 12 වෙනිදා සිද්ධිය සම්බන්ධයෙන් අපක්ෂපාතී පරීක්ෂණයක් දියත් කිරීමට බල කරනු ලබයි.**

**අළුත්ගම පොලිස් ස්ථානයේ දී දණ ගසා සමාව ඉල්ලීමට බලකළ අවස්ථාවේ දී භික්ෂු නම විසින් තමන්ට පා පහරක් එල්ල කළ බව මවුලවීවරයා විසින් පොලිස්පතිවරයාට පැමිණිලි කරන ලදීඃ**

ජාතික සූරි සභාව, එනම් මුස්ලිම් සංවිධාන, වෘත්තිකයන්, විද්වතුන් සහ ක්‍රියාකාරීන්ගෙන් සමන්විත ජාතික මට්ටමේ කණ්ඩායම විසින් මුස්ලිම් දේවධර්මධරයකු වන මවුලවී මොහොමඩ් අමීන් මොහොමඩ් අෂ්කර් අලී විසින් ඔහු සහ ඔහුගේ සහෝදරයන් දෙදෙනා අතින් කිසිවිටෙකත් සිදු නොවූවක් වන අළුත්ගම පතිරාජගොඩ විහාරය ආසන්නයේදී බෞද්ධ භික්ෂුවකට පහරදීමේ චෝදනාව මත අසාධාරණ ලෙස හසු කරගැනීම සහ ජුනි 12 වෙනි දින සිට රිමාන්ඩ් භාරයට ගැනීම හේතුවෙන්, සහෝදරයන් තිදෙනාම ඔවුන්ගේ අත් අඩංගුවට පත්වීමත් සමඟ අළුත්ගම පොලිස් ස්ථානයේදී භික්ෂූන් කිහිපදෙනෙක් අතරින් දණ ගසා ගොස් සමාව ඉල්ලීමට බලකළ අවස්ථාවේදී, ඔහුගේ බෙල්ලට භික්ෂුව විසින් පයින් ගැසීම පිළිබඳව පොලිස්පතිවරයාට කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් අපක්ෂපාතී සහ විනිවිදභාවයෙන් යුක්ත පරීක්ෂණයක් දියත් කිරීමට අධිකාරයන් වෙත බල කරනු ලබයි.

මේ අයුරින් ජුනි 12 වෙනිදා භික්ෂුවක් විසින් මවුලවීවරයෙකුට, එනම් ගෞරවාන්විත මුස්ලිම් දේව ධර්මාචාර්යවරයෙකුට පයින් ගැසීමේ මහත් පිළිකුල් සහගත සිදුවීම සිදුව ඇත්තේ, පොලීසියේ ජ්‍යෙෂ්ඨ නිළධාරින්, ප්‍රදේශයේ ඉහළ පෙළේ දේශපාලනඥයින් සහ සිය ගණන් සෙනඟක් බලා සිටියදී බව ජාතික සූරි සභාව විශ්වාස කරයි.

පතිරාජගොඩදී ඇති වූ සිදුවීම තම සොහොයුරා සහ භික්ෂූ නමගේ රියදුරා අතර පහරදීම් කිහිපයක් හුවමාරු වූ සුළු බහින් බස්වීමක් වූ අතර එය සමාව ගැනීමෙන් අවසන් වූ බවත්, කිසිදු අවස්ථාවක භික්ෂූ නම කිසිවෙකුගේවත් අතින් පහර නොකෑ බවත් දන්වමින් මවුලවීවරයා විසින් පැමිණිලි කර ඇත.

මවුලවී අෂ්කර් අලී විසින් ඔහු සහ ඔහුගේ සහෝදරයන් දෙදෙනා රිමාන්ඩ් භාරයේ සිට නිදහස් වූ පසු පොලිස්පතිවරයාට කරන ලද පැමිණිල්ලට අනුව, රියදුරා මහතාව අළුත්ගම පොලිස් ස්ථානයේදී ප්‍රශ්න කිරීම්වලට ලක් කරන අවස්ථාවේදී, සිද්ධියෙන් තමන්ට කිසිදු ප්‍රහාරයක් එල්ල නොවූ බව භික්ෂුව විසින් පොලිස් ස්ථානාධිපතිවරයාට ප්‍රකාශ කර ඇත. භික්ෂුව පොලිස් ස්ථානයේ පැය තුනකට හතරකට වැඩි කාලයක් කිසිදු අපහසුතාවක් නොමැතිව රැඳී ඇත. කෙසේ නමුත්, පොලු දරාගත් මුස්ලිම් පිරිසක් විසින් භික්ෂුවකට පහරදී ඇත යන අසත්‍ය කටකතාවත් සමඟ භික්ෂූන් සහ ගිහි පිරිස් එතැනට එක්රැස් වූ පසු, මවුලවීවරයා විසින් පොලිස්පතිවරයාට කරන ලද පැමිණිල්ලට අනුව ක්‍රියාකළ පොලිස් ස්ථානාධිපතිවරයා පීඩනයට පත්විය. ඔහු විසින් නඩුවක් ගොනුකරන ලෙස තමන්ට බල කරනු ලබන භික්ෂූන්හට පවසා සිටියේ, සහෝදරයන් තිදෙනා උසාවියට ඉදිරිපත් කිරීමට නම්, පහරදීම සම්බන්ධයෙන් චෝදනා එල්ල කරනු බලන භික්ෂුව රෝහල් ගතවිය යුතු බවයි.

පළමුවෙන්ම භික්ෂු නම රෝහල්ගත කිරීමට ගෙනගිය රෝහලෙන් ඔහු භාරගැනීම ප්‍රතික්ෂේප කොට ඇත්තේ භික්ෂුවහට කිසිදු තුවාලයක් නොතිබුණි බැවින් බව ජාතික සූරිසභාව තේරුම් ගෙන තිබේ. දෙවනුව ගෙනගිය රෝහලේ භික්ෂු නම ඇතුළත් කරගනු ලැබූවත්, රෝහල මඟින් ඉදිරිපත් කරන වෛද්‍ය වාර්තාවෙන් කිසිදු තුවාලයක් නොමැති බව අනාවරණය වේ. කෙසේ නමුත්, භික්ෂුවට පහරදීම පිළිබඳ විවිධාකාර කටකතාවන් පැතිරීමට ඉඩ සලසමින්, දෙවන රෝහලෙන් භික්ෂුවව දින තුනක් පුරාවට නේවාසිකව තබාග න්නා ලදී. එම නිසා මෙහි සත්‍ය ස්ථාපනය කිරීමෙහිලා මෙම සියලුම කාරණාවන් පිළිබඳව පුළුල් පරීක්ෂණ පැවැත්වීම අවශ්‍ය වේ.

පොලිස්පතිවරයාට කරන ලද පැමිණිල්ලට අනුව, පොලිස් ස්ථානයේ සිටි මවුලවීවරයා ඇතුළු සහෝදරයන් තිදෙනා හට පොලිස් ස්ථානයට රැස්ව සිටි භික්ෂූන් පිරිස මැද්දෙන් දණ ගා ගෙන ගොස් සමාව අයදින ලෙස බල කිරීම සහ සහෝදරයන් තිදෙනා දණ ගා ගෙන භික්ෂූන් අතරින් යන විට, මවුලවීවරයාට එක් භික්ෂුවක් පයින් ගැසීමත් එම පහර ඔහුගේ බෙල්ලට වැදීමත්, ඉන් පසු ඔවුන්ව පොලිස් කූඩුවට දැමීමත් යනාදිය ජාතික සූරි සභාව විසින් සඳහන් කරන්නේ දැඩි කම්පනයෙන් යුතුව වේ.

රටේ ඉතිහාසයේ කිසිදු අවස්ථාවක මුස්ලිම් පුද්ගලයන් අතින් භික්ෂුවක් පහර කෑමට ලක්ව නොමැති අතර මෙම සිදුවීමේදී ද රියදුරන් දෙදෙනා අතර සිදුවූ සිද්ධියේදී භික්ෂුවට පහරදීමේ ක්‍රියාවක් දක්නට නොමැත. එලෙසම කිසිදු අවස්ථාවක භික්ෂුවක් විසින් බෞද්ධ භික්ෂුන් හා සමානවම ජනතාව ඉතා ඉහළින් ගරු කරන මුස්ලිම් දේවධර්මාචාර්යවරයෙකුට පහර දීමක් සම්බන්ධයෙන් චෝදනා එල්ල කළ සිදුවීම් පෙර නොතිබුණි.

මවුලවීවරයා විසින් නීතිපතිවරයා වෙත කරන ලද පැමිණිල්ල අලළා කටයුතු කරමින් ඔහු විසින් කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් විධිමත් පරික්ෂණයක් පවත්වන මෙන් පොලිස්පතිවරයාහට නියෝග කළ ශ්‍රී ලංකා නීතිඥ සංගමයට ජාතික සූරි සභාව කෘතඥ පූර්වක වේ. එසේම සාක්ෂි පවතින්නන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන බවට නීතිපතිවරයා විසින් ශ්‍රී ලංකා නීතිඥ සංගමය වෙත ලබා දුන් සහතික වීමද මෙහිදී ජාතික සූරි සභාව විසින් කෘතඥ පූර්වක සිහි කරනු ලැබේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම් සභාවේ සහභාගිත්වය ඇතිව පොලීසිය මඟින් ස්වාධීන, අපක්ෂපාතී සහ විනිවිදභාවයෙන් යුතු පරීක්ෂණයක් පවත්වා සත්‍යය සොයා බලන මෙන් ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාව විසින් ඉල්ලා සිටියි. සිද්ධියෙන් දින තුනක් ඇතුළත එම ප්‍රදේශයේ බරපතල 'මුස්ලිම් විරෝධී' ව්‍යාපාර දියත් කිරීමට බෞද්ධ භික්ෂුවක් හට පහර දුන්නාය යන අසත්‍ය කටකතාව බොදු බල සේනාව විසින් පතුරන ලදී. මෙහි ප්‍රතිඵලය වූයේ, ඊළඟ පැයේදී මුස්ලිම් පුද්ගලයන් තිදෙනෙක් සහ දෙමළ පුද්ගලයෙකුගේ මරණය, ගණන් කළ නොහැකි තරම් තුවාල වූවන්, මුස්ලිම් පුද්ගලයන්ට අයත් දේපලවලට අප්‍රමාණ හානි සිදුවීම සහ දහසක් කාන්තාවන්, දරුවන් සහ වැඩිහිටියන්හට සිදුවූ බරපතල අප්‍රසන්න වදවිභාගයන් යනාදිය එක් භික්ෂුවකගේ අඬගැසීමකින් සිදුවීමය.

ටරීක් මහ්මුඩ්
සභාපති
ජාතික සූරි සභාව

# ඇමුණුම II

අළුත්ගම ප්‍රදේශයේ මුස්ලිම් පුද්ගලයන්ට විරුද්ධව සිදුවූ කෝලාහලයේදී අහිමි වූ සංචල හා නිශ්චල දේපල (උපුටා ගැනීම - Aftermath of Aluthgama: Fact finding report of Aluthgama Anti-Muslim pogrom: 2014 ජුනි; ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ මුල පිරුමක්/ ආර්ථික සහ අධ්‍යාපන සංවර්ධන පදනමේ ප්‍රයත්නයකි)

| හානියට පත් වූ ව්‍යාපාර | # | විනාශවීම් (රු.) |
|---|---|---|
| අළුත්ගම සහ දර්ගා නගරයේ සාප්පු | 36 | 250.14 M |
| අළුත්ගම/ මතුගම මහා පරිමාණ ව්‍යාපාර (ගේට් වේ ඇඟළුම් කර්මාන්ත ශාලාව) | 01 | 50.00M |
| අළුත්ගම මහා පරිමාණ ව්‍යාපාර (බැරක් එළු ගොවිපොළ) | 01 | 7.5 M |
| මුළු ව්‍යාපාර අහිමි වීම් | 38 | 307.64 |
| එක් ව්‍යාපාරයක අහිමිවීම් සාමාන්‍යය | 307.64M/38 | 8.09M |

(උපුටාගත් අකාරයෙන්ම දත්ත දක්වා ඇත-sic)

සටහන 13: හානියට පත් වූ ව්‍යාපාර වල දත්ත සටහන (2014) (sic)

| හානියට පත්වූ නිවාස (ගොඩනැගිලි සහ උපකරණ) | # | විනාශවීම් (රු.) |
|---|---|---|
| අළුත්ගම සහ දරගා නගරය | 84 | 302.21M |
| බේරුවල | 13 | 7.13M |
| තුඩුව | 18 | 5.68M |
| එකතුව | 115 | 315.02M |

| | | |
|---|---|---|
| එක් නිවසකට අහිමිවීම් සාමාන්‍ය | 315.02M/115 | 2.73M |

සටහන 14: හානියට පත්වූ නිවෙස් වල අහිමිවීම් සාරාංශය ඇතුළත් දත්ත සටහන (2014) (sic)

අලාභයන් ප්‍රදේශ අනුව - අලාභ ප්‍රදේශ අනුව ප්‍රතිශත අකාරයෙන් දැක්වීම (2014)

| | |
|---|---|
| අළුත්ගම | 96% |
| බේරුවල | 2.2% |
| තුඩුව | 1.8% |

| හානියට පත්වූ ආගමික ස්ථාන | අහිමිවීම් (රු.) |
|---|---|
| මස්ජිඩුන් නූර්, 93 මරිකාර් වීදිය | 5M |
| පරසල්තොටා මස්ජිඩ් | 0.15M |
| මුළු අහිමිවීම් | 5.15 |

හානියට පත්වූ මුස්ලිම් පල්ලිවල අහිමිවීම් ඇතුළත් දත්ත සටහන (2014) (sic)

| මුළු දේපල | # | LKR |
|---|---|---|
| ව්‍යාපාරවල මුළු අලාභ හානිය | 38 | 307.64M |
| නිවාසවල මුළු අලාභ හානිය | 115 | 315.02M |
| මුස්ලිම් පල්ලිවල මුළු අලාභ හානිය | 2 | 5.15M |
| එකතුව | 155 | 627.81M |

ව්‍යාපාර, නිවාස සහ මුස්ලිම් පල්ලිවලට සිදුවූ මුළු අහිමිවීම් ඇතුළත් දත්ත සටහන (2014)

**හානිවීම් ප්‍රතිශතය විවිධ අංශ වශයෙන්**

| | | |
|---|---|---|
| නිවාස | - | 50.17% |
| ව්‍යාපාර | - | 49% |
| මුස්ලිම් පල්ලි | - | 0.82% |

ඉහත දත්ත සටහන් ව්‍යාපාර සහ නිවාසවල අහිමිවීම්වලට සිදු වූ අලාභහානි තක්සේරු කිරීමේ සාරාංශ වේ. අළුත්ගම සහ දර්ගා නගරයේ ව්‍යාපාර ස්ථාන 38 ක් විනාශ කිරීම්, මංකොල්ල කෑම් සහ ගිනි තැබීම්වලට ලක්ව ඇත. මෙම ව්‍යාපාර 38න් 2ක් ආදායම් මට්ටමෙන් (sic) සහ සේවක සංඛ්‍යාවෙන් මහා පරිමාණ ව්‍යාපාර වශයෙන් සැලකේ. ප්‍රචණ්ඩ ක්‍රියාවලින් සිංහල සේවකයන් 400ක් පමණ සේවයේ නියුතු ගේට් වේ ඇඟළුම් ආයතනයේ යන්ත්‍ර පේළියක් මුළුමනින් දැවී යාමේ ප්‍රතිඵලයක් වශයෙන් රුපියල් මිලියන 50ක් පමණ අලාභ හානි සිදු විය. කර්මාන්ත ශාලාව පිහිටා ඇත්තේ සිංහල ගම්මානයක ය. මෙහි ඉමහත්ම ඛේදවාචකය වනුයේ, ව්‍යාපාරය මුළුමනින්ම ගිනි තැබීම ඉලක්ක කරගත් ප්‍රචණ්ඩ ක්‍රියාවෙන් පසු සහ ව්‍යාපාරය විසින් ඇණවුම් අපනයන කිරීම් ප්‍රතික්ෂේප කළ පසු (sic) (ශිරාස්, ෆාරූක් 2014) සේවකයන් 75%ක් පමණක් සේවයට වාර්තා කර ඇති අතර මේ අවස්ථාව වන විට පරිපාලනය විසින් සේවකයන්ගේ වැටුප් ගෙවීමට මහත් පරිශ්‍රමයක් දරණ බව දැන ගන්නට ලැබුණි.

| අලාභහානි පරාසය රු. මිලියන වලින් | # ව්‍යාපාර වල | % |
|---|---|---|
| 1< | 10 | 26 |
| 1-3 | 15 | 34.5 |
| 3-5 | 1 | 3 |
| 5-7 | 4 | 10.25 |
| 7-10 | 1 | 2.6 |
| 10-50 | 2 | 5.12 |
| 50-100 | 3 | 8 |

දත්ත සටහන මගින්, සිදුව ඇති අලාභ හානියේ පරාසය අනුව ව්‍යාපාර සංඛ්‍යාව සහ එහි ප්‍රතිශත පෙන්නුම් කර තිබේ. (2014)